විචාරශීලී ගවේෂණයේ පෙරදැක්ම...

# තිරසාර 2022

THIRASAARA

## ශාස්ත්‍රීය සංග්‍රහය



සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

# තිරසාර

ශාස්ත්‍රීය සංග්‍රහය

විචාරශීලී ගවේෂණයේ පෙර දැක්ම...

සියලු හිමිකම් ඇවිරිණි.

පළමු ප්‍රකාශනය 2022 අගෝස්තු

**ISSN 2950-7103**

කැලණිය විශ්වවිද්‍යාලයේ, භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ, සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය විසින් 2022 අගෝස්තු මස ප්‍රකාශයට පත් කරන ලදී.

**උපදේශක මණ්ඩලය**

භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපතිතුමා ඇතුළු සියලුම ආචාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්

**නියාමනය හා අධීක්ෂණය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගල ජයරත්න මහතා,
ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික,
සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය.

**මෙහෙයවීම**

පූර්ණිමා ශ්‍රීමාලි විජේවංශ
සභාපති
සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය

වත්සානි යශෝධරා
ලේකම්
සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය

**සංස්කාරක මණ්ඩලය**

උපේක්ෂි රංජනා ප්‍රනාන්දු
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර

මිහිරිනී ලියනගේ
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

**පිට කවර නිර්මාණය**

පේසල පෙරෙව් විජේමාන්න,
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

**පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැකසීම**

එච්. ලක්මාල් පුෂ්පකුමාර විජේසිංහ
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

**සෝදුපත් කියැවීම**

එච්.එල්.අයි. මිහිරිනී
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

කේ.ජී.පී.ඒ. පුන්සරා
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

බී.ඒ.ඕ. රවිහාරි
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

ඩබ්.ඕ.කේ.පී.එල්. විජේසිංහ
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

ඩබ්.කේ.එන්.කේ. විතාරන
ශාස්ත්‍රවේදී සාමාන්‍ය දෙවන වසර

ඩබ්.එම්.ටී.එච්. වාසල
ශාස්ත්‍රවේදී සාමාන්‍ය ප්‍රථම වසර

**ලේඛක මණ්ඩලය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නිශාන් සකලසූරිය මහතා
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගල ජයරත්න මහතා
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

ආධුනික කථිකාචාර්ය ආර්.ඒ. චෙසිකා කාංචනා
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

ආධුනික කථිකාචාර්ය ඩී. ආර්. අප්සරා කේ. දනසේකර
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

සහකාර කථිකාචාර්ය ආර්. එම්. කළිඳු රත්නායක
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය

සහකාර කථිකාචාර්ය හර්ෂනී මහේෂා හරිස්චන්ද්‍ර
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

එස්. පූර්ණිමා ශ්‍රීමාලි විජේවංශ
සංවර්ධන අධ්‍යයන ශ්‍රාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර

කේ.එම්.මහේෂි පවිත්‍රා කුමාරි කැකුලන්දර
සංවර්ධන අධ්‍යයන ශ්‍රාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර

කේ.ඒ. ඊෂානි උපේක්ෂා කොඩිතුවක්කු
සංවර්ධන අධ්‍යයන ශ්‍රාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර

එම්.එම්. තාරුනී ප්‍රියංගිකා
සංවර්ධන අධ්‍යයන ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර

කේ. නදීශානි සෙව්වන්දි කුමාරි
සංවර්ධන අධ්‍යයන ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර

නිර්භීතා චාරුනි තිලකරත්න
භූගෝල විද්‍යා ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර

එච්.යළින්දු කුංචන ජයවීර
සංවර්ධන අධ්‍යනය ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර

වයි.එල්.එම්. ඉසුරු උදාකර යකන්දාවල
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

## විමර්ශන මණ්ඩලය


මහාචාර්ය ඒ.ජී. අමරසිංහ මහතා

විශ්‍රාමික මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි මහතා

විශ්‍රාමික මහාචාර්ය යූ.ඒ. චන්ද්‍රසේන මහතා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නිශාන් සකලසූරිය මහතා

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගීතිකා වනිගනෙත්ති මහත්මිය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගල ජයරත්න මහතා

ආධුනික කථිකාචාර්ය කුෂාන් ගයාත්‍රි පෙරේරා මහතා



## සමාජීය විද්‍යා පීඨාධිපතිතුමාගේ පණිවුඩය

කැලණිය විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ සංවර්ධන අධ්‍යයනය ශිෂ්‍ය සංගමය විසින් ප්‍රථම වරට එළිදක්වනු ලබන තිරසාර ශාස්ත්‍රීය සංග්‍රහයේ ප්‍රථම කලාපය වෙනුවෙන් සුභාශිංසන පණිවුඩයක් එකතු කරන්නේ ඉමහත් වූ සොම්නසිනි.

සංවර්ධන අධ්‍යයනය උපාධි පාඨමාලාව හදාරනු ලබන විද්‍යාර්ථීන්ගේ ශාස්ත්‍රීය ඥානය පුළුල් කරමින් ශාස්ත්‍රීය කුසලතා වර්ධනය කිරීමෙහිලා මහගු දායකත්වයක් මෙවැනි ශාස්ත්‍රීය සංග්‍රහයක් තුළින් සිදු වන බව මාගේ විශ්වාසයයි. එහිදී මෙවැනි ශාස්ත්‍රීය සංග්‍රහයක් එළිදැක්වීම සඳහා මග පෙන් වූ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයටත්, ඇපකැප වී ක්‍රියා කළ සියලුම විද්‍යාර්ථීන්ටත් සුභාශිංසන පිරිනමන අතර ශාස්ත්‍රීය උන්නතිය වෙනුවෙන් මෙම කාර්යයෙහි අඛණ්ඩ පැවැත්ම සඳහා ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරමි. ඔබ සැමගේ අනාගතයට මම සුභ පැතුම් එක් කරමි.

මහාචාර්ය එම්.එම්. ගුණතිලක,
පීඨාධිපති,
සමාජීය විද්‍යා පීඨය,
කැලණිය විශ්වවිද්‍යාලය.



## අංශාධිපතිතුමාගේ පණිවුඩය

සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය මගින් ප්‍රථම වරට මෙවැනි ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයක් එළි දැක්වීමට ක්‍රියා කිරීම අගය කරමි. මෙම කාර්යය සාර්ථක කරගැනීම ගැනීම සඳහා සහාය වූ සැමට මාගේ ප්‍රශංසාව මෙයින් ප්‍රකාශ කරමි.

ක්ෂේත්‍ර අධ්‍යයනයක ප්‍රතිඵල හෝ සාහිත්‍ය විමර්ශනයක දාර්ශනික විග්‍රහයක් ශාස්ත්‍රීය ලිපියක අන්තර්ගත වේ. භාෂාමය ලේඛන ප්‍රයෝග ඇසුරු කර ගනිමින් නිර්මාණය කරන ලිපි ප්‍රකාශයට පත්කිරීම මගින් නව දැනුම අදාළ හා අවශ්‍ය ජන කණ්ඩායම් අතර ව්‍යාප්ත වීම සිදු වේ. රටක සංවර්ධනයට හා මානව ප්‍රජාවේ ඉදිරි ගමනට උපකාරී වන නව මංපෙත් විවර කිරීමට අවශ්‍ය පසුබිම සකස් වන්නේ මෙලෙස ජනගත වන දැනුම මගිනි. එබැවින් ශාස්ත්‍රීය ලිපි ලිවීම හා එම ලිපි එළිදැක්වීම විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ හා ශිෂ්‍ය ප්‍රජාවේ යුතුකමක් හා වගකීමක් ලෙස සැලකිය හැකි ය. මෙකී යුතුකම් හා වගකීම් නිසියාකාරව හා හරියාකාරව ඉටුවන්නේ ක්ෂේත්‍ර අධ්‍යයනයක ප්‍රතිඵල හෝ සාහිත්‍ය විමර්ශනයක දාර්ශනික විග්‍රහයක් ඇතුළත් භාෂාමය ලේඛන ප්‍රයෝග ඇසුරු කරගනිමින් ලියන ලද ශාස්ත්‍රීය ලිපි මගිනි.

කැලණිය විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යනාංශයේ සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමයේ නිර්මාණයක් වන තිරසාර ශාස්ත්‍රීය සංග්‍රහය 2022 මගින් ඉහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ වී තිබේදැයි පරික්ෂා කිරීම පාඨක ප්‍රජාවගේ වගකීමක් ලෙස සැලකිය හැකි ය. එසේම ආධුනික පර්යේෂකයන් හා ලේඛකයන් ධෛර්යමත් කිරීමට ද පුහුණු කිරීමට ද මෙම ශාස්ත්‍රීය සංග්‍රහය භාවිත කිරීමේ හැකියාවක් පවතී. මෙම පසුබිම අනුව තිරසාර ශාස්ත්‍රීය සංග්‍රහය 2022 පර්යේෂකයන්ගේ සොයාගැනීම් ජනගත කරන මාධ්‍යයක් ලෙස ද ශාස්ත්‍රීය ලේඛකයන් පුහුණු කිරීමේ යාන්ත්‍රණයක් ලෙෂ ද භාවිතයට ගත හැකි ය. එබැවින් මෙවැනි පුළුල් විභවතාවක් සහිත මෙම ශාස්ත්‍රීය සංග්‍රහය මෙරට සංවර්ධනයට හා සමාජ ප්‍රගමනයට ඉමහත් දායකත්වයක් සැපයීමට හැකි වන මූලාශ්‍රයක් වීමට ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය ඒ.ජී.අමරසිංහ,
අංශාධිපති,
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.



## ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකතුමාගේ පණිවුඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ, භූගෝලවිද්‍යා අධ්‍යයනය අංශයේ සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය විසින් අභිනවයෙන් සම්පාදනය කරන ලද "තිරසාර"සඟරාවේ මංගල කලාපය එළිදැක්වීමට ලැබීම එහි ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරයා වශයෙන් මා ඉමහත් සතුටට පත්වෙමි. රටතුල පවතින සමාජ, ආර්ථික, දේශපාලනික අස්ථාවරභාවය හමුවේ ශිෂ්‍ය සංගමයක් වශයෙන් ක්‍රියාත්මක වීම සඳහා විවිධ අභියෝග පැමිණිය ද ඒ සියලු අභියෝගයන්ට ඉතා සාර්ථකව මුහුණ දෙමින් සගරාව යථාර්තයක් බවට පත්කර ගැනීමට හැකිවීම සංගමයක් ලෙස අප ලැබූ අති විශිෂ්ඨ ජයග්‍රහනයක් ලෙස මා දකිමි. අගය කරමි.

එසේම නව දැනුම් මානයන් ගවේශනාත්මකව නිෂ්පාදනයෙහි ලා ලිපි ලබාදෙමින් සහයෝගය ලබාදුන් සියලුම දෙනා කෘතඥපූර්වකව සිහිපත් කරන අතර ඔවුන් ලබාදුන් සහයෝගය ගෞරවයෙන් සිහිපත් කරමි. ලොව තිරසර භාවය තහවුරු කිරීම සදහා අප යන මේ ගමනේ නව දැනුම බෙදා දෙන මෙම ශාස්ත්‍රීය සගරාව ලිපි සංග්‍රහයක් වශයෙන් ඉදිරි කලාප වලින් ද එළි දැක්වීමට ශක්තිය සහ ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර ප්‍රථම කලාපය එළිදැක්වීම සඳහා සහයෝගය ලබාදුන් අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන තුමා ඇතුළු සියලුම ආචාර්ය මණ්ඩලයටත්, සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමයේ සියලුම කාර්යය මණ්ඩලය ප්‍රමුඛ සාමාජික සාමාජිකාවන්ටත් මාගේ හදපිරි ස්තුතිය පිරිනමමි.

මංගල ජයරත්න,
ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික,
සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය,
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

## සංස්කාරක සටහන

නව දැනුම තුළින් අර්ථාන්විත හෙට දවසක් විද්‍යාර්ථීන් වෙත ළගා කරවීම උදෙසා භූගෝල විද්‍යා අධ්‍යයන අංශයෙන් සිදු කරනුයේ මනා වූ පිටිවහලකි. මෙම භෞම පියස තුළ ක්ෂේත්‍ර ගණනාවක සුසංයෝගයෙන් සැදුම්ලත් සංවර්ධන අධ්‍යයනය විෂය කැලණිය විශ්ව විද්‍යාලයට පමණක් ආවේණික වූ නිරන්තරයෙන් යාවත්කාලීන වෙමින් පවතින විෂයක් බවට සඳහන් කරනු කැමැත්තෙමු. එකී විෂයානුබද්ධ සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමය විසින් නව ලොවකට අරුණලු ගෙනෙමින්, නව්‍ය දැනුම උත්පාදනය සහ සංවර්ධන ක්ෂේත්‍රය තුළ පවතින සබැඳියාවේ සාරය කැටි කර ගනිමින් ස්ථිරසාර ලෝකයට එක්ව අත්වැල් බැඳ යන ගමනේ "තිරසාර - පළමු කලාපය" කාලීන අවශ්‍යතාවක් ඉටු කළ බවට පවසනුයේ ඉමහත් වූ සොම්නසිනි.

කැලණිය විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ සංවර්ධන අධ්‍යයන විෂයානුබද්ධ සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමයේ තිරසාර පළමු කලාපය එළි දැක්වීම වෙනුවෙන් නිරන්තර ගුරුහරුකම් ලබාදෙමින්, අඩුපාඩු පෙන්වාදෙමින්, සියලු සකලවිධ කාර්යන්හි අපව දිරිමත් කළ අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය ඒ. ජී. අමරසිංහ මහතා ඇතුළු ආචාර්ය මණ්ඩලයට අපගේ ගෞරව පූර්වක ස්තුතිය පිරිනමමු. සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමයේ ප්‍රථම සඟරාමය අත්දැකීම වෙනුවෙන් සුභාශිංසන පණිවිඩ එකතු කරමින් අප හා ශක්තියක් වූ සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය එම්. එම්. ගුණතිලක මහතා, භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය ඒ. ජී. අමරසිංහ මහතා, සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගල ජයරත්න මහතා ඉතාමත් ගෞරවයෙන් යුතු ව සිහිපත් කරමු.

තිරසාර සඟරාවේ අභිවෘද්ධිය පිණිස අප විසින් සිදු කළ වෙහෙසකර වෑයමේ දී අපට නිසි මඟ පෙන්වාදෙමින් දිරිගැන් වූ සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගල ජයරත්න මහතාට අපගේ හෘදයාංගම ස්තුතිය පළ කර සිටිමු. සංවර්ධනය යන විෂය පථය හා සමගාමී ව අර්ථාන්විත ලිපි සපයාදෙමින් මෙම කාර්යය සාර්ථක කර ගැනීම උදෙසා සහාය වූ භූගෝල විද්‍යා අධ්‍යයන අංශයේ ගුරුභවතුන්ට හා විද්‍යාර්ථීන්ට බොහොමත් ම ස්තුතිවන්ත වෙමු. තිරසාර සගරාව එළි දැක්වීම පිණිස අප හා සම්බන්ධ වූ සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමිය, ලේකම්තුමිය ඇතුළු සෙසු නිලධාරී මණ්ඩලයටත්, පරිගනක පිටු සැකසුම් සිදු කිරීමේ දී පිටකවර නිර්මාණය කිරීමේ දී

හා සෝදුපත් කියවීමේ දී සහාය වූ සැමටත් නන් අයුරින් උපකාර කළ සියලු දෙනාටත් ස්තුති පූර්වක ප්‍රණාමය පළ කර සිටිමු.

සැම ආකාරයකින්ම රට තුළ උද්ගත ව තිබූ අර්බුදකාරී වටපිටාවත් සමඟ තාක්ෂණික සබඳකම් මූලික කරගනිමින් අප දැරූ අප්‍රතිහත ධෛර්යයයේ ප්‍රතිඵලයක් ලෙසට වසර කිහිපයක සිට නතර වී තිබූ "තිරසාර" මෙලෙස උප්පත්තිය ලැබූ බව කියනුයේ බෙහෙවින් ම ආඩම්බරයෙනි. අප ගත් වෑයමෙන් ඔබ නිසි ප්‍රයෝජනයක් ලබන්නේ නම් එය අප ලබන සාර්ථකත්වය වන අතර ම ඉදිරියටත් තිරසාර දෙවන කලාපයක් වෙනුවෙන් අනුබලයක් වේවා යැයි අප ඉතසිතින් ප්‍රාර්ථනා කරන්නෙමු.

සඟරා සංස්කාරක,

උපේක්ෂි ප්‍රනාන්දු
මිහිරිනි ලියනගේ

## 2019/20 සංවර්ධන අධ්‍යයන ශිෂ්‍ය සංගමයේ නිලධාරී මණ්ඩලය

**සභාපති** - එස්. පූර්ණිමා ශ්‍රීමාලි විජේවංශ
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර

**ලේකම්** - පී.ජී.ඩබ්.වයි. නයනමාලි බොකලවෙල
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර

**ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මංගල ජයරත්න මහතා
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

**උපසභාපති** - එච්.යළිඳු කුංචන ජයවීර
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර

**උපලේකම්** - එස්.ඒ.එම්.ඩී.කේ. සමරසිංහ
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

**සඟරා සංස්කාරක** - කේ.ඒ. උපේක්ෂි රංජනා ප්‍රනාන්දු
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර

අයි. මිහිරිනී ලියනගේ
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

**ප්‍රධාන සංවිධායක** - ටී.එම්. සුරේෂ් වීරරත්න
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර

ඩබ්.කේ.ඒ.එන්.කේ. විතාරන
ශාස්ත්‍රවේදී සාමාන්‍ය දෙවන වසර

**කනිෂ්ඨ භාණ්ඩාගාරික** - එච්. ලක්මාල් පුෂ්පකුමාර විජේසිංහ
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර

| | | |
|---|---|---|
| **කාරක සභික** | - | බී.ආර්. අමාලි උදේශිකා බස්නායක<br>සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර |
| | | එම්.ඩී. හංසි මධුෂිකා ගුණවර්ධන<br>සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර |
| | | වයි.එල්.එම්. ඉසුරු උදාකර යකන්දාවල<br>සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර |
| | | ආර්. දිල්මි කවීෂා ද සොයිසා<br>ශාස්ත්‍රවේදී සාමාන්‍ය ප්‍රථම වසර |

# පටුන


1. ලෝක කෘෂිකර්මාන්තයේ ආරම්භය හා විකාශනය 14
2. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි කෘෂිකර්මාන්තයේ දායකත්වය 24
3. An Introduction to the Ecosystem Services in Wetland 32
4. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය සහ ආර්ථික සංවර්ධනය අතර පවතින සම්බන්ධතාවය 46
5. ශ්‍රී ලංකාවේ ශ්‍රම අනාගතයේ තාක්ෂණික පරිවර්තනය මෙරට සංවර්ධනය කෙරෙහි ඇති කරන අභියෝග 59
6. Resilience and recovery of Sri Lanka tourism beyond the impacts of Covid-19 70
7. ශ්‍රී ලංකාවේ නාගරීකරණය 79
8. Challenges of Urbanization towards Sustainable Development 89
9. ප්‍රාදේශීය සංවර්ධන විෂමතා හමුවේ ශ්‍රී ලංකාව 105
10. සාම්ප්‍රදායික සන්නිවේදනය සමාජ සංවර්ධනයට සිදු කරන බලපෑම: ශ්‍රී ලංකාවේ පහතරට නර්තන සම්ප්‍රදාය ඇසුරින් කෙරෙන අධ්‍යයනයක් 139
11. සංවර්ධන සන්නිවේදනය 151
12. තිරසාරත්වය, තිරසාර සංවර්ධනය සහ ශ්‍රී ලංකාවේ ගෝල්ෆේස් අරගලය 160
13. චීනය සංවර්ධන ක්‍රියාවලියේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ පදනම් කරගැනීමේ යෝග්‍යතාවය පිළිබඳ අධ්‍යනයක් 170
14. අල්ලස, දූෂණය හා වංචාව නිසා ආසියාතික රටවලට ගෙවීමට සිදු වී ඇති සංවර්ධන පිරිවැය 187

# ලෝක කෘෂිකර්මාන්තයේ ආරම්භය හා විකාශනය

සහකාර කථිකාචාර්ය ආර්. එම්. කළිඳු රත්නායක
ශාස්ත්‍රවේදී ගෞරව භූගෝලවිද්‍යාව
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

sandeeprathnayaka@gmail.com

## සංක්ෂේපය

මිනිසුන්ගේ ප්‍රයෝජනය සඳහා ශාක හා සතුන් කළමනාකරණය කිරීමේ කලාව, විද්‍යාව සහ ව්‍යාපාරය කෘෂිකර්මාන්තයි. මානව පරිනාමයේ දී මිනිසා ගල් යුගය, දඩයම් යුගය, එඬේර යුගය, ගොවි යුගය හා නව තාක්ෂණික යුගය යනාදි විවිධ යුග පසු කොට වර්තමාන තොරතුරු තාක්ෂණ මුලික කරගත් යුගයකට සම්ප්‍රාප්ත වී ඇත. අදින් වසර 10000 කට පමණ ඉහතදී කෘෂිකර්මාන්තය ආරම්භ වූ බවට සාක්ෂි හමුවේ. මානවයා විසින් ගොවි යුගයට පැමිණීමත් සමඟම වගා කටයුතු කිරීමට නැතහොත් කෘෂිකාර්මික කටයුතුවල නියුක්ත වීම ආරම්භ කරන ලදී. ආරම්භයේ සිට ම මිනිසුන්ගේ මුලික අවශ්‍යතා අතර ඔවුන්ගේ ආහාර අවශ්‍යතාව ප්‍රමුඛ විය. කෘෂිකර්මාන්තයේ ආරම්භය හා විකාශනය පිළිබඳව අධ්‍යයනය කරන විට එය ප්‍රධාන අවධි 04ක් ඔස්සේ අධ්‍යයනය කළ හැකිය. එනම්, පූර්ව ඓතිහාසික අවධිය, රෝමානු අවධිය, වැඩවසම් අවධිය හා විද්‍යාත්මක අවධිය යන අවධීන්ය. ඒ අනුව මෙම ශාස්ත්‍රීය ලිපිය මඟින් අධ්‍යයනය කරනු ලබන්නේ එම එක් එක් අවධියේදී කෘෂිකර්මාන්තයෙහි සිදු වූ වෙනස්කම් පිළිබඳවයි.

මුඛ්‍ය පද - කෘෂිකර්මාන්තය, ආරම්භය, විකාශනය

## හැඳින්වීම

අදින් වසර ලක්ෂ දෙකකට පමණ පෙර ප්ලෙයොසේටීන යුගයේ දී හෝමෝ සේපියන් මානවයාගේ පරිණාමික ලක්ෂණයන් ක්‍රමක් ක්‍රමයෙන් දියුණුවීමත්, දේශගුණික ක්‍රියාවලීන්ගේ බලපෑමත් මත ස්වාභාවික යැපීම් ක්‍රමයන් බිඳ වැටීමත් සමඟ ප්ලයිස්ටෝසීන සහ හෙලෝසීන සංක්‍රාන්ති අවධියෙහි දී ශාක සහ සත්ව ගෘහස්ථකරණය කෙරෙහි අවධානය යොමු වන්නට විය (කෘෂි ඉතිහාසය, 2003). දේශගුණික සාධකයන්ගේ වෙනස් වීමත් සමඟ ආහාර සොයා සංක්‍රමණ කළ මානවයා තමන්ට හුරු පුරුදු ශාක සහ සත්වයින් තම

ප්‍රදේශයන් වෙත ගෙනයාමට ගත් උත්සාහයන් මෙන්ම ශාක කෙරෙහි දැක් වූ විශේෂ අවධානයත් ශාක ගෘහස්තකරණයේ මූලාරම්භය ලෙස හඳුනාගත හැකිය. එය ලෝකය කෘෂිකාර්මික කටයුතුවලට යොමුවීමේ මූලික පියවර ලෙස විද්‍යාඥයන් මත පළකරයි (මෙසපොතේමියානු ශිෂ්ඨාචාරය, 2006). සිය භාවිතයෙන් අනතුරුව ශාක ඇට වර්ග, දඬු, කඳන්, පත්‍ර ආදිය සිය වාසස්ථාන වූ ගල්ගුහා, ගස් බෙන හෝ වෙනත් ආරක්ෂිත ස්ථාන අවට ඉවත දැමීමෙන් අනතුරුව ඒවා ඒ ආශ්‍රිතව වැඩීම මිනිසාට ප්‍රථම කෘෂිකාර්මික පාඩම පරිසරය විසින් කියා දෙන ලදී (සියවසක අභිමානය, 2012). ඒ අනුව අදින් වසර 10000 පමණ ඉහතදී කෘෂිකර්මාන්තය ඇරඹූ බව විද්වත් පිළිගැනීමයි (Society, 2019).

කෘෂිකර්මය යනුවෙන් සාමාන්‍යයෙන් අදහස් කරන්නේ භෝග වගාව සහ සත්ත්ව පාලනය යන අංශ ද්විත්වයම වන හෙයින් කෘෂිකර්මයෙහි මුලාරම්භය ගැන කතා කිරීමට මිනිසා විසින් පැලෑටි සහ සතුන් පරිහරණයට මුලින් ම යොමුවූ කාලය දක්වා අතීතයට යා යුතුය. "කෘෂිකර්මාන්තය" යන්නෙහි නිවැරදි වූ අර්ථකථනය අනුව, භූමි වගා කිරීම, අස්වනු නෙළීම, සැලසුම් සහගත ජල සම්පාදනය යනාදි සියළු දෑ එයින් අර්ථ ගැන්වේ. කෘෂිකර්මාන්තය යනුවෙන් හඳුන්වන්නේ මිනිසුන්ගේ පරිභෝජනය සඳහා ගස් සහ පැලෑටි වර්ග වගා කිරීම සහ සතුන් ඇති කිරීමයි. මෙම හැඳින්වීමට අනුව ගස් පැලෑටි සහ සතුන් ආශ්‍රිතව කරනු ලබන නිෂ්පාදනයන් සම්බන්ධවන අංශය කෘෂිකාර්මික අංශය යනුවෙන් හැඳින්විය හැකිය. කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන ක්‍රියාවලීන් පහත සඳහන් ලෙසට වර්ග කළ හැකිය.

- ගොවි නිෂ්පාදන
- ගොවීන් හැර අනෙකුත් සැපයුම්කරුවන් නිපදවන කෘෂිකාර්මික සාධක
- ගොවීන් විසින් නොකරන කාර්යයන් එනම් විකුණුම්, ප්‍රවාහන සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළියෙළ කිරීම වශයෙනි.

කෘෂි කර්මාන්තයේ දියුණුව ලෝක ව්‍යාප්ත සමාජ - ආර්ථික වෙනස්වීම් කෙරෙහි වැදගත් සාධකයක් වී තිබීම හේතුවෙන් කෘෂිකර්මයෙහි ඉතිහාසය මානව ඉතිහාසයේ ප්‍රධාන පැතිකඩකි. "කෘෂිකාර්මික නිෂ්පාදකයා" යන වදන මුලින්ම යොදාගෙන ඇත්තේ ක්‍රි.පූ 5,500 දී පමණ විසූ "සුමේරියානු" ජන කොට්ඨාසයයි. කෘෂිකර්මයේ උපත පිළිබඳව මෑත කාලීනව සොයාගැනීම් බොහෝ දුරට පදනම් වී ඇත්තේ "කාබන් 14 ක්‍රමය" මඟින් කළ ගවේෂණය මතය. එම ගවේෂණවලට අනුව ක්‍රිස්තු පූර්ව 7000 දී තරම් ඉපැරණි කාලයේ දී පවා ලෝකයේ

එකිනෙකට ප්‍රතිවිරුද්ධ කලාප දෙකක පිහිටි මැද පෙරදිග සහ මෙක්සිකෝවේ කෘෂිකර්මය පැවති බවට සාක්ෂි හමුවී තිබේ (භෝග වගාව හා ආර්ථික කටයුතු, 1985).

කෘෂිකාර්මික කටයුතුවල ආරම්භය පිළිබඳව නිශ්චිත කාල වකවානුවක් දැක්වීම තරමක් අපහසුය කාර්යයකි . නමුත් ක්‍රි. පූ 9000 දී පමණ ගිනිකොන දිග ආසියාවේ පුරාණ මිනිසුන් මස් සපයා ගැනීම සඳහා සතුන් ඇතිකර තිබෙන බවටත් ඊට පසු කාලයේ දී ඔවුන් තෘණ බිම්වල සුදුසු තැන්වල ධාන්‍ය බීජ වගා කිරීම පටන් ගෙන ඇති බවටත් සාක්ෂි හඳුනාගෙන ඇත. ඒ අනුව කෘෂිකාර්මික කටයුතුවල ආරම්භය දැනට අවුරුදු 10000 කට පමණ පෙර සිදු වී ඇති බව වර්තමාන පිළිගැනීමයි. විවිධ රටවල් විවිධ භෝග පදනම් කර ගනිමින් සිය සංස්කෘතිය ගොඩනගා ගෙන ඇත. ඒ අනුව ආසියාව සහල් සංස්කෘතියේ මූලික මධ්‍යස්ථානය ලෙස සැලකේ. යුරෝපය තිරිඟු සංස්කෘතියේ ද අප්‍රිකාව මඤ්ඤොක්කා සංස්කෘතියේ ද මූලස්ථාන වේ (සියවසක අභිමානය, 2012). ලෝක කෘෂි කර්මාන්තය පිළිබඳව අවධායන යොමු කරන විට ප්‍රධාන අවධීන් 04ක් ඔස්සේ අධ්‍යයන කළ හැකිය. එනම්,

1. පූර්ව ඓතිහාසික යුගය (නියෝලිතික අවධිය)
2. රෝමානු අවධිය
3. වැඩවසම් අවධිය
4. විද්‍යාත්මක අවධිය

වශයෙනි.

**පූර්ව ඓතිහාසික යුගය (නියෝලිතික අවධිය)**

ගංගාධාර මුල් කර ගනිමින් පළමුවෙන්ම මානව ශිෂ්ඨාචාර බිහි වූ අතර කෘෂිකාර්මික හා සත්ත්ව පාලන දිවිපෙවතක් ආරම්භ කොට ඇති බවට පුරා විද්‍යාත්මක සාක්ෂි ලැබෙනුයේ නියෝලිතික යුගය ආරම්භ වීමත් සමඟය. ඒ අනුව අදින් වසර 7000කට පමණ ඉහත දී තිරිඟු වගා කළ බවට සාක්ෂි හමු වනු ලබයි (කෘෂි ඉතිහාසය, 2003). ඒ අනුව සාරවත් තැනිතුම් ආශ්‍රිතව ඔවුන් සිය වගාවන් සිදු කළ අතර මොසපොතේමියාව ආශ්‍රිතව එනම් වර්තමානයේ ඉරානය, ඉරාකය, සිරියාව, ලෙබනන් හා ඊශ්‍රායලය ආශ්‍රිත කලාපයේ ආදී මානවයින් කෘෂි ආර්ථික කටයුතු සිදු කළ බවට සාක්ෂි හමුවේ. එම කාලයේදී ඔවුන් තිරිඟු, බාර්ලි, කව්පි, පරිප්පු ආදී ධාන්‍ය වර්ග වගා කළ අතර වන සතුන් ලෙස එළුවන්, බැටළුවන්, හා බල්ලන් සිය නිවාස ආශ්‍රිතව ඇති කරන ලදී. එමෙන්ම අග්නිදිග ආසියාවේ යැන්සි හා කහ ගඟ

ආශ්‍රිතව වී, මෙනේරි, කංසා ආදී වගාවන්ද ගවයන්, ඌරන්, බල්ලන් සහ කුකුළන් වැනි සත්තුන්ද ඇති කෙරූ බවට සාක්ෂි හමුවේ (Karl Obispo, 2014).

ගල් යුගයේම අවධියක්වන නියෝලිතික අවධියේදී මානවයින් ගල් ආයුධ භාවිතා කළ අතරම ශාක හා සතුන් නිවාස ආශ්‍රිතව ගෘහස්තකරණය කරන ලදී. ලෝකයේ සතුන් ගෘහස්තකරණය පිළිබඳව තොරතුරු ඉතා ඈත අතීතයෙන් හමුවනු ලබයි. ඒ අනුව බැටළුවන් ක්‍රි.පු. 9000 දී පමණ ඉරාකයේද, එළුවන් ක්‍රි. පූ. 8000 දී පමණ ඉරානයේද ඌරන් ක්‍රි.පූ. 8000 දී පමණ තායිලන්තයේ දී හා ක්‍රි.පු. 7000 දී පමණ ග්‍රීසියේද, ගවයන් ක්‍රි.පු. 6500 දී පමණ ද අශ්වයින් ක්‍රි.පූ. 4350 දී පමණ යුක්රේනයේ දී ද ගෘහස්තකරණය සිදු වී ඇති බවට සාක්ෂි හමුවේ (Karl Obispo, 2014).

එමෙන්ම විවිධ භෝග වර්ගයන්ද ගෘහස්තකරණයට යොමුවූ කාල සීමාවන් හඳුනා ගත හැකි වේ. ඒ අනුව තිරිඟු හා බාර්ලි ක්‍රි.පූ. 8000 දී පමණ මැදපෙරදිග කලාපයෙන්ද, වට්ටක්කා ක්‍රි.පූ. 8000 දී පමණ මෙක්සිකෝවෙන්ද බෝංචි ක්‍රි.පූ. 6000 දී පමණ මෙසිඩොනියාවෙන්ද මෙනේරි හා සහල් ක්‍රි.පූ. 5500 දී පමණ ආසියාවෙන්ද ගෘහස්තකරණය සිදු වී ඇති බවට සාක්ෂි හමුවේ (Karl Obispo, 2014).

**රෝමානු අවධිය**

මෙම අවධිය ක්‍රි.පූ. 2500 පමණ සිට ක්‍රි.ව. 500 පමණ දක්වා වූ කාල සීමාවෙහි ව්‍යාප්තව ඇත. ග්‍රාමීය කෘෂිකාර්මික ජන සමාජය බිහිවීම, යකඩ සොයා ගැනීම මෙන්ම වහල් වෙළඳාමද මෙම කාලයේදී සිදු විය. යකඩ සොයා ගැනීමත් සමගම කෘෂි කර්මාතයේද විශාල පිබිදීමක් සිදු විය. ඊට හේතු වුයේ යකඩ උපකරණ විවිධ කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කිරීමට හැකි වීමයි. පුරාණ රෝමවරුන් කෘෂිකර්මාන්තට මූලික වැදගත්කමක් දක්වන ලදී. රෝමය ගොවි ප්‍රජාවක් ලෙස ආරම්භ වූ අතර ගොවිතැන් කටයුතු රෝම අධිරාජ්‍යය පුරා ප්‍රධාන ආර්ථික කටයුත්තක් ලෙස ව්‍යාප්ත කරන ලදී. ඔවුන් කෘෂිකාර්මික ක්‍රමවේදයන් වැඩිදියුණු කළ අතර මෙම වැඩිදියුණු කිරීම් විවිධ ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීමට උත්සාහ ගෙන ඇත. රෝම අධිරාජ්‍යයේ ප්‍රධාන භෝග වූයේ ධාන්‍ය (තිරිඟු සහ බාර්ලි) මිදි, ඔලිව් සහ අත්තික්කා ආදියයි. මීට අමතරව ඇපල්, පීච්, පෙයාර්ස්, වැනි පලතුරු වර්ගයන් ද එළවළු සහ ඖෂධ පැළෑටි වර්ගද වගා කොට ඇත (Roman agriculture, 2013).

රෝම ගොවීන් මූලික වශයෙන් ප්‍රමාණවත් වර්ෂාපතනයක් හෝ වාරිමාර්ගයක් සහිත පහත් බිම්වල ධාන්‍ය රෝපණය කිරීමට වැඩි උනන්දුවක් දක්වා ඇත. මොවුන් උතුරු ඉතාලියේ

පෝ ගංගා නිම්නය සහ රෝමයට ආසන්න ප්‍රදේශ රැසක ධාන්‍ය වගා කොට ඇත. දේශගුණය හා පාංශු තත්ත්වය සුදුසු සෑම තැනකම ගොවීන් මිදි, ඔලිව් සහ වෙනත් භෝග වගා කොට ඇත. රෝමයේ නැගෙනහිර පළාත් සහල්, කපු සහ කංසා නිෂ්පාදනය සඳහා ප්‍රසිද්ධ වූ අතර රෝමවරු බොහෝ ගෘහාශ්‍රිත සතුන් ඇති දැඩිකරන ලදී. අධිරාජ්‍යය පුරාම ගොවීන් සීසාන කටයුතු සඳහා කොටළුවන් සහ බූරුවන් යොදාගෙන සීසෑම හා වෙනත් කාර්යයන් සිදු කරන ලදී. බොහෝ රෝමානුවන් යැපෙන කම්කරුවන් විය. එමෙන්ම 6 වන ශතවර්ෂයේ අග භාගය වන විට ඉඩම්වල පෞද්ගලික අයිතිය පිළිබඳ සංකල්පය වර්ධනය වූ අතර මෙම වර්ධනය පිටුපස වූ දේශපාලන පරමාර්ථය වූයේ ආයුධ සන්නද්ධ කිරීමට හැකි කුඩා වතු හිමියන්ගෙන් යුත් විශාල හමුදාවක් බිහිකිරීමයි. වහල්භාවයේ සිටින සතුරන් ඔවුන්ගේ ප්‍රධාන කෘෂිකාර්මික ශ්‍රම බලකාය ලෙස යොදා ගන්නා ලදී (Roman agriculture, 2013).

**වැඩවසම් අවධිය**

රෝමන් අධිරාජයේ බිඳ වැටීමත් සමඟම වැඩවසම් අවධිය ආරම්භ විය. ක්‍රි.ව. 1100 පමණ කාලය වැඩවසම් කෘෂි කර්මාන්තයේ ස්වර්ණමය කාලයයි. මෙම අවධියේදී සමාජ ස්ථාරායනයක් දැක ගත හැකි වූ අතර එය රජුගේ සිට වහල් ජනතාව දක්වා පැහැදිලිව හඳුනා ගත හැකි ධුරාවලියකින් සමන්විත විය. පසුව 16 වන සියවසේ දී යුරෝපයේ සිදු වූ ජන සංඛ්‍යා ස්පෝටනයත් සමඟම යටත් විජිත කෘෂිකර්මාන්තය ආරම්භ විය. මෙම කාලයේදී වානිජමය භෝග වගා කිරීම ප්‍රමුඛ වූ අතර විශේෂයෙන්ම උක්, කපු, දුම්කොළ, තේ හා සත්ව ලොම් ආදිය ඉන් ප්‍රමුඛ විය. 15 හා 19 වන සියවස් වලදී වහලුන් වගා කිරීම් කටයුතු සඳහා යොදා ගෙන ඇත. උදාහරණ ලෙස ඉන්දියානු වහලුන් මෙක්සිකෝවේ ගොවිපලවල වහලුන් ලෙස සේවයට ගෙන ඇත.

**විද්‍යාත්මක අවධිය**

විද්‍යාත්මක අවධියේදී නවීන තාක්ෂනය භාවිතා කරමින් කෘෂි කර්මාන්තය පවත්වාගෙන යන ලදී. ඒ අනුව විවිධ කෘෂිකාර්මික අවධීන් පසු කරමින් පරිණාමය වූ මානවයාගේ වැදගත් කෘෂිකාර්මික සන්ධිස්ථානයක් ලෙස විද්‍යාත්මක අවධිය හඳුනා ගත හැකිවේ. වැඩිවන ජන සංඛ්‍යාවට අවශ්‍ය ආහාර සපුරාලීම සඳහා මෙම අවධියේදී කෘෂිකාර්මික අංශයේ විශාල වෙනස්කම් රාශියක් සිදු විය. ඒ අතර හරිත විප්ලවය හා ජාන තාක්ෂණය සඳහා සුවිශේෂී තැනක් හිමිවේ (Mazoyer & Roudart, 2006).

මෙක්සිකෝවේ ජනාධිපති මැනුවල් ඇවිලා කැමර්චෝ සහ රොක්ෆෙලර් පදනම අතර ඇති වූ සහයෝගිතාවය මත විශේෂ අධ්‍යයනයන් සඳහා වූ ආයතනය පිහිටු වීමත් සමඟ 1943 වසරේ දී හරිත විප්ලවය ආරම්භ විය. හරිත විප්ලවයේ පියා යනුවෙන් හඳුන්වනු ලබන්නේ ඇමරිකානු කෘෂි විද්‍යායෙක් වන නෝමන් බෝර්ලොග් (Norman Borlaug) හරිත විප්ලවය 1940 ගණන්වල මෙක්සිකෝවේ ආරම්භ වී පසුකාලීනව එනම්, 1950 හා 1960 ගණන්වල මුළු ලොව පුරා ව්‍යාප්ත වන්නට විය. (Zarnain Khan, 2015).

ඉහළ එලදායී ධාන්‍ය වර්ග භාවිතය, ජල සම්පාදනය, දෙමුහුන් බීජ භාවිතය කෘතිම, පොහොර භාවිතය, පලිබෝධ නාශක භාවිතය හා යන්ත්‍ර සූත්‍ර භාවිතය ආදි ක්‍රම හරිත විප්ලවය මඟින් හඳුන්වා දෙන ලදී. 1943 දී මෙක්සිකෝවේ ඉරිඟු වගාව සම්බන්ධව ආරම්භ වූ හරිත විප්ලවයේ දී ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් ජාතීන්ගේ ලෝක අහාර සංවිධානය හා රොකර්ෆෙලර් පදනම මුලිකත්වය ගෙන කටයුතු කළේය. 1962 දී එම ව්‍යාපෘතිය අවසන් වුවද 1963 දී ලෝක ආහාර හා කෘෂිකාර්මික සංවර්ධනය සඳහාවන ලෝක සැලැස්ම නම් වැඩසටහන ඇරඹීමත් සමඟ මෙම ක්‍රියාවලිය හරිත විප්ලවය (Green Revolution) නමින් ලොව පුරා ප්‍රචලිත වන්නට විය. ස්වාභාවික යැපුම් කෘෂිකර්මය වෙනස් කරමින් රසායනික වූ කෘෂිකර්මයක් බිහි වූ අතර ඉන් අනතුරුව ස්වභාවික හිමිව තිබූ බොහෝ දෑ මිහිතලයෙන් ඉවත් කිරීමට ද එයට ශක්‍යතාවය තිබිණි. හරිත විප්ලවය ආශ්‍රිත කෘෂිකාර්මික තාක්ෂණය ප්‍රධාන අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක විය.

01.නව මාදිලියේ වැඩි එලදායී බීජ වර්ග නිපදවීම

02.නවීන තාක්ෂණික ශිල්පක්‍රම කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීම

නව මාදිලියේ වැඩි එලදායී බීජ වර්ග නිපදවීම ප්‍රධාන ආකාර කිහිපයක් යටතේ සිදු කරනු ලබයි. එනම්,

**මුහුන් බීජ -** එකම විශේෂයකට අයත් වෙනස් ලක්ෂණ සහිත ශාක දෙකක් මුහුන් කර හිතකර ලක්ෂණ සහිත ශාක ප්‍රභේද නිපදවීම. මෙයට උදාහරණ ලෙස IR 8 වී ප්‍රභේදය, නෙරිකාස් ප්‍රභේදය, IR 36 වී ප්‍රභේදය, TN - 1 ප්‍රභේදය වැනි බීජ වර්ග පෙන්වා දිය හැකිය. මෙම වී වර්ග ගත් විට පලිබෝධවලට ඔරොත්තු දීමේ හැකියාව, ආයු කාලය කෙටි වීම, වැඩි අස්වැන්නක් ලබා දීම වැනි සාධනීය ලක්ෂණ රැසකින් සමන්විත වේ.

**දෙමුහුන් බීජ -** මෙය වැඩි ඵලදායී බීජ වර්ග නිපදවීමේ ක්‍රමයක් වන අතර මෙහි දී ජානමය වශයෙන් එකිනෙකට වෙනස් ජාන සංයුතියක් යුත් ශාක විශේෂ දෙකක් අතර පරාගණය කිරීමෙන් නව ශාකයක් ජනනය කිරීම සිදු වේ. මෙහි දී මවුපිය ශාක දෙකේ ම හිතකර ලක්ෂණ නව ශාකයට ලැබේ. දෙමුහුන් බීජ වර්ගයකට උදාහරණ ලෙස BG 407 H වී ප්‍රභේදය, Norin 10 තිරිඟු ප්‍රභේදය පෙන්වා දිය හැකිය.

**පටක රෝපණය -** වැඩි ඵලදාවක් ලබා ගැනීම සඳහා අනුගමනය කළ තවත් ක්‍රියාමාර්ගයක් ලෙස පටක රෝපණය ද වැදගත් වේ. රසායනාගාරයක දී සිදු කෙරෙන ක්‍රියාවලියක් මඟින් ශාකවල ඇති පටකවලින් ඉහළ ගුණාත්මක අගයක් ඇති පැළ රාශියක් ලබා ගැනීම මේ මඟින් සිදු කෙරේ. මෙසේ හරිත විප්ලවය ආශ්‍රිත කෘෂිකාර්මික තාක්ෂණය මඟින් වැඩි ඵලදායී බීජ වර්ග නිෂ්පාදනය සඳහා වැඩි අවධානයක් යොමු විය. එම බීජ ලොව පුරා භාවිතයට ගැනීම නිසා විශාල ලෙස ලෝක ධාන්‍ය නිෂ්පාදනය ඉහළ ගිය අතර මිලියනයක පමණ ජනතාවක් සාගින්නෙන් මුදවා ගැනීමට හැකිවිය.

නවීන තාක්ෂණික ශිල්ප ක්‍රම කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීමේ දී ප්‍රධාන අංශ කිහිපයක් යටතේ සිදු කරයි.

**කෘෂිකාර්මික කටයුතුවල දී යන්ත්‍ර භාවිතය -** බීජ වැපිරීමට බිම් සැකසීමේ සිට අස්වැන්න නෙලීම දක්වා කටයුතු යන්ත්‍ර සූත්‍ර භාවිතා කොට සිදු කිරීම නිසා අවශ්‍ය වනු ලබන මිනිස් ශක්ති ප්‍රමාණය අවම වන අතර ගත වන කාලය ද අවම වනු ලබයි.

**කෘත්‍රිම පොහොර භාවිතා කිරීම -** වැඩි දියුණු කළ බීජ වර්ග වලින් ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සඳහා කෘතීම පොහොර භාවිතය අත්‍යවශ්‍ය වන අතර කෘතිම පොහොර භාවිතයෙන් ලබන අස්වැන්න කිහිප ගුණයකින් වැඩි කර ගත හැකිවේ.

**කෘමි නාශක හා වල් නාශක භාවිතය -** කෘමි උවදුරු හා වල්පැළ මර්දනය සඳහා කෘමි නාශක හා වල් නාශක යෙදීම මඟින් වගාවන්ට සිදුවන හානි වළකා ගත හැකි අතර අස්වැන්න ආරක්ෂා කර ගැනීම මෙන්ම, වැඩිකර ගැනීමට ද එමඟින් හැකියාව ලැබී ඇත.

**කෘෂිකර්මය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය -** වෙළඳපළ තත්ත්වය, පලිබෝධ නාශක යෙදීම, ජල සම්පාදනය ආදී සියලු අංශ සඳහා තොරතුරු තාක්ෂණය වර්තමානයේ උපකාරී කරගනු ලබයි.

ලෝකයට හරිත විප්ලවය මගින් ඇති වූ අයහපත් ප්‍රතිඵලවලින් මිදී අහාර නිෂ්පාදනය තවදුරටත් ඉහළ නැංවීමේ ක්‍රමෝපායක් ලෙස ජාන තාක්ෂනය හඳුන්වා දෙන ලදී. එය දෙවැනි හරිත විප්ලවය ලෙස ද හඳුන්වනු ලබයි. ජාන තාක්ෂනය මගින් එක් ජීවියෙකුගේ හෝ ශාකයක ජානයක් තවත් ජීවියෙකුට හෝ ශාකයකට මුහු කිරීම සිදුවේ. එමගින් පළමු ජීවියාගේ හෝ ශාකයේ ගුණාංගවලට වෙනස් ගුණාංග ඇති නව සත්වයෙකු හෝ ශාකයක් බිහි කරයි. ජාන ඉංජිනේරු තාක්ෂණය මගින් කෘෂිකාර්මික අංශ කිහිපයක් සඳහා අවධානය යොමු විය. එනම්, ධානය නිෂ්පාදනය, එළවළු හා අල වර්ග නිෂ්පාදනය පලතුරු වර්ග නිෂ්පාදනය, සත්ත්ව නිෂ්පාදනය වශයෙනි. මේ අනුව ලෝකයට හරිත විප්ලවය හා ජාන තාක්ෂණය මගින් විශාල වශයෙන් ආහාර නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවා ගැනීමට හැකි විය. ඒ වගේ ම අහාර සුරක්ෂිතතාව වැඩි දියුණු කිරීම, දේශගුණික වෙනස්වීම් වලට මුහුණ දිය හැකි භෝග වර්ග හඳුන්වා දීමට හැකිවීම, අවම පරිසර සාධක හමුවේ ඉහළ ඵලදාවක් ලබා ගත හැකි භෝග වර්ග හඳුන්වා දීම, භෝගවලට වැළදෙන රෝග ප්‍රමාණය අවම කර ගැනීමට හැකිවීම, විවිධ පරිසර තත්ත්වයන්ට ගැලපෙන භෝග වර්ග හඳුන්වා දීමට හැකිවීම, අස්වැන්න අපතේ යාම වැලක්වීමට හැකිවීම යනාදි වශයෙන් විශාල වාසි රැසක් ලෝකයට අත් විය (මානුෂ භූගෝල විද්‍යාව, 2008).

## නිගමනය

පෘථිවිය වසර බිලියන 4.54 කට පමණ ඉහතදී නිර්මාණය වූ අතර ඊටත් වසර බිලියන කිහිපයකට පසුව මානව සම්භවය සිදු විය. මානව සම්භවය සිදුවීමෙන් අවුරුදු දහස් ගණනකට පසුව ඔවුන් මුල්ම කෘෂිකාර්මික කටයතු ආරම්භ කරන ලදී. මීට වසර 10000 කට පමණ ඉහතදී ලොව කෘෂිකාර්මික කටයුතු ආරම්භවූ බවට වර්තමාන පිළිගැනීමයි. එදා සිට අද දක්වා කෘෂි කර්මාන්තයේ සිදු වූ පරිනාමය ප්‍රධාන අවධි 04ක් ඔස්සේ අධ්‍යයනය කල හැකිය. එනම්, පූර්ව ඓතිහාසික අවධිය, රෝමානු අවධිය, වැඩවසම් අවධිය හා නව තාක්ෂණික අවධිය වශයෙනි. මෙම අවධීන් වලදී කෘෂිකර්මාන්තයේ විවිධ වෙනස්කම් සිදු වූ අතර එහි සුවිශේෂී වෙනස්කම් රැසක් සිදු වූ අවධියක් ලෙස නව තාක්ෂණික අවධිය හඳුනාගත හැකිවේ. එතෙක් සම්ප්‍රදායිකව පැවති කෘෂිකර්මාන්තය මෙම අවධියේදී නවීන තාක්ෂනය සමඟ ඒකාබද්ධ වී නවීකරණය වන්නට විය. ඒ අනුව කෘෂිකර්මාන්තයේ ආරම්භය හා විකාශනය අතීතයේ සිට විට මේ දක්වා විශාල වෙනකම් රැසකට මුහුණ දී ඇති බව පැහැදිලි වේ.

## විමර්ශන මූලාශ්‍ර


1. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව(2008), මානුෂභූගෝල විද්‍යාව - 01 කොටස, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, බත්තරමුල්ල.
2. ඒකනායකල ඒ. එච්. (2015) බැබිලෝනියානු ශිෂ්ටාචාරය, ඇස් ගොඩගේ සහෝදරයෝ, කොළඹ.
3. ඒකනායකල ඒ. එච්. (2006) මෙසපොටේමියානු ශිෂ්ටාචාරය, ඇස් ගොඩගේ සහෝදරයෝ, කොළඹ.
4. කරුණානන්දල, යූ. (2010) සුමේරියානු ශිෂ්ටාචාරය, ඇස්. ගොඩගේ සහෝදරයෝ.
5. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (2012), සියවසක අභිමානය), කොළඹ 06.
6. ධනපාල, ඒ. එච් (1985) භෝග වගාව සහ ආර්ථික කටයුතු - ආර්ථික භූගෝල විද්‍යා ප්‍රවේශය, මධුෂාන් ප්‍රකාශන, අංගොඩ.
7. පූර්ණිමා,චතුරි, දකුණු ආසියාවේ කෘෂිකර්මාන්තයේ මෑත කාලීන දිශානතිය (භෞමවිද්‍යා 11 වන කලාපය), කැලණිය විශ්වවිද්‍යාලය.
8. සිරිවීර, ඉ. (2005) ශ්‍රී ලංකාවේ කෘෂි ඉතිහාසය, ඇස් ගොඩගේ සහෝදරයෝ, කොළඹ.
9. සේනානායකල, එස්. එම්. පී. (2008) කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව, කොළඹ.
10. Karl Obispo. (2014). *The Origin of Agriculture* [Education]. https://www.slideshare.net/KarlLouisseObispo/the-origin-of-agriculture
11. Mazoyer, M., & Roudart, L. (2006). *A History of World Agriculture: From the Neolithic Age to the Current Crisis*. NYU Press.
12. McCormick, P., Wilson, Abraham Lincoln, Charles Newbold, John Deere, Cyrus. (n.d.). *A Brief History of Agriculture—Ppt download*. Retrieved March 28, 2021, from https://slideplayer.com/slide/13101927/
13. Publishing, B. E. (2012). *The History of Agriculture*. Britannica Educational Publishing.
14. *Roman agriculture*. (2013.). Oxford Reference. https://doi.org/10.1093/oi/authority.20110803095356559

15. Society, N. G. (2019, August 19). *The Development of Agriculture*. National Geographic Society. http://www.nationalgeographic.org/article/development-agriculture/
16. Zarnain Khan. (2015). *Agriculture and its history* [Food]. https://www.slideshare.net/ZarnainKhan/agriculture-and-its-history
17. *Agricultural Revolution—An overview | ScienceDirect Topics*. (n.d.). Retrieved December 25, 2020, from https://www.sciencedirect.com/topics/agricultural-and-biological-sciences/agricultural-revolution
18. *B2196i.pdf*. (n.d.). Retrieved December 25, 2020, from http://repiica.iica.int/docs/b2196i/b2196i.pdf
19. Clark, G. (n.d.). *The Agricultural Revolution and the Industrial Revolution: England, 1500-1912*. 46.
20. *The Agricultural Revolution | Boundless World History*. (n.d.). Retrieved December 25, 2020, from https://courses.lumenlearning.com/boundless-worldhistory/chapter/the-agricultural-revolution/

# ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි කෘෂිකර්මාන්තයේ දායකත්වය

කේ.එම්.මහේෂි පවිත්‍රා කුමාරි කැකුලන්දර
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
maheshipavithra6@gmail.com

## සංක්ෂේපය

ලෝකයේ සෑම රටකම පාහේ ආර්ථික වර්ධන ක්‍රියාවලියේ දී කෘෂිකාර්මික අංශයේ දායකත්වය අති මහමහත්ය නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂිකර්මාන්තයේ දායකත්වය ක්‍රමයෙන් කාර්මික හා සේවා අංශ වලට සාපේක්ෂව පහළ මට්ටමක් දක්නට ලැබේ. නමුත් ග්‍රාමීය දිළිඳු ප්‍රජාවට සේවා නියුක්තිය සැපයීමේදී සුවිශේෂී කාර්යභාරයක් කෘෂි අංශය සතුව පවතී. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තය මගින් දක්වන දායකත්වය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් මෙහිදී අපේක්ෂා කෙරේ.

## හැඳින්වීම

ආර්ථික සංවර්ධනයක් ඉටුකරගැනීමට බලාපොරොත්තු වන මූලික අරමුණ ජීවන තත්ත්වය එසවීමයි. වැඩිපුර භාණ්ඩ හා  සේවා ප්‍රමාණයක් පරිහරණය කිරීමේ හැකියාව ජනතාවට ලබාදීමයි. සංවර්ධනයේදී ආර්ථික ව්‍යුහය වෙනස් වෙයි. එහිදී දැකිය හැකි ක්‍රියාදාමය නම් ප්‍රාථමික අංශය සංකෝචනය වී ද්වීතියික අංශය ප්‍රසාරණය වීමයි. එයින් අදහස් වන්නේ ජාතික නිෂ්පාදිතයට ප්‍රාථමික අංශයෙන් එකතු වන කොටසට වඩා ද්විතියික අංශයෙන් එක්වන කොටස පුළුල් වන බව ය. ප්‍රාථමික අංශය තුළ නිෂ්පාදනය ප්‍රධාන තැනක් ගනී. කාර්මික නිෂ්පාදනය ද්විතීක අංශයේ ආධිපත්‍යය උසුලයි. ඒ අනුව ආර්ථික සංවර්ධනයේදී කෘෂි නිෂ්පාදනයට වඩා කාර්මික නිෂ්පාදනය ශීඝ්‍රයෙන් පුළුල් වෙයි.

ලෝකයේ සෑම රටකම ආර්ථිකයේ ගාමක බලවේගය වන්නේ කෘෂිකර්මාන්තයයි. කෘෂිකර්මාන්තය කාර්මික හා අනෙකුත් සේවා අංශයන්ට අවශ්‍ය කරන පදනම සකස් කර දෙනවා සේ ම පරිසර හිතකාමී චිරස්ථායි සංවර්ධනයක් ඇති කිරීමෙහි ලා ඉතා වැදගත් කොට සැලකේ. සෑම රටකම ප්‍රධාන සංවර්ධන ක්‍රියාවලියේ දී කෘෂි අංශයට  වැදගත් තැනක් හිමිවේ. වර්තමාන ලෝකයේ මුල් පෙළේ ආර්ථික, කාර්මික හා තාක්ෂණික බලවතුන් බවට

පත්වී සිටින ඇමරිකාව, ජපානය වැනි රටවල වර්තමාන අභිවෘද්ධිය පසුපස ඇත්තේ සැලසුම්සහගත කෘෂිකාර්මික සංවර්ධනය යි. විශේෂයෙන්ම කෘෂිකාර්මික ප්‍රතිපත්ති කෙරෙහි දැක්වූ සුවිශේෂී අවධානයත් මූලික වශයෙන් රැකියාව හා ජාතික ආදායම් ඉහළ නැංවීමේ ප්‍රධාන මූලාශ්‍රය බවට කෘෂිකර්මාන්තය පත් කිරීමත් මෙහිදී ඉතා වැදගත් වේ. නමුත් වර්තමානය වන විට සාපේක්ෂව දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂි අංශයේ දායකත්වය ක්‍රමයෙන් හීන වෙමින් පවතී. එසේ වුවත් ආසියානු, අප්‍රිකානු හා ලතින් ඇමෙරිකානු රටවල් ප්‍රමුඛ සංවර්ධනය වෙමින් පවතින රටවල් කේන්ද්‍ර කොට ගනිමින් වර්ධනය වන ජනගහනයට අවශ්‍ය ආහාර හා අනෙකුත් අවශ්‍යතා සපුරාලීමෙහිලා කෘෂිකාර්මික අංශය පුළුල් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එය ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වන රටවල් තුළ මෙන්ම අනෙකුත් සංවර්ධිත රටවල් තුළ ද ප්‍රායෝගිකව දක්නට ලැබෙන්නේ කි. (අතුකෝරළ. පී සහ ජයසූරිය. එස්, 1994)

කෘෂිකාර්මික අංශයට ඇතුළත් වන්නේ මිනිස් ජීවිතයේ මූලික අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය වන ආහාර ද්‍රව්‍ය හා කාර්මික භාණ්ඩ නිපදවීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය නිෂ්පාදන අංශයේ දායකත්වය ඉහළ අගයකින් යුක්ත වීම සංවර්ධනය වන රටවල් වල සාමාන්‍යයෙන් දැකිය හැකි ලක්ෂණයකි. ආර්ථික සංවර්ධනයේ ඉහළ අදියරට ළඟා වීමේදී කෘෂිකාර්මික අංශයේ සාපේක්ෂ වැදගත්කම ක්‍රමයෙන් අඩුවන ආකාරයේ ව්‍යුහාත්මක වෙනස්වීම් ආර්ථිකය තුළ සිදු වේ .

**තෝරාගත් රටවල් වල දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මාන්තයේ දායකත්වය ප්‍රතිශතයක් ලෙස**

| | 1965 | 1970 | 1960 | 1995 |
|---|---|---|---|---|
| ඉන්දියාව | 44 | 45 | 38 | 29 |
| බංග්ලාදේශය | 53 | 55 | 50 | 31 |
| පිලිපීනය | 26 | 30 | 25 | 22 |
| තායිලන්තය | 32 | 26 | 23 | 11 |
| ජපානය | 10 | 6 | 4 | 2 |

ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාව

## ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි කෘෂිකර්මාන්තයේ දායකත්වය

ශ්‍රී ලංකාව සලකා බැලූ විට කෘෂිකාර්මික රටක් ලෙස බොහෝ අවස්ථාවලදී හඳුනා ගැනෙන්නේ අතීතයේ සිටම බහුතරයක් වූ පුරවැසියන්ගේ ජීවනෝපාය කෘෂි කර්මාන්තය හෝ ඊට සම්බන්ධ ඍජු හෝ වක්‍ර රැකියා ආශ්‍රිත වන හෙයිනි. වර්තමානයේදී කෘෂිකර්මයට ඉතා වැදගත් තැනක් හිමිවේ. මන්ද තිරසර සංවර්ධනයක් උදෙසා ගමන් කිරීමේදී කෘෂිකාර්මික අංශයේ රටක සංවර්ධනයට විශාල කාර්යභාරයක් ඉටුකරයි. කෙසේ නමුත් ඈත අතීතයේ සිට පැවතගෙන ආ හෙළ ගොවිතැන යටත්විජිතකරණය සමඟ එනම් පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසින්ගේ අවශ්‍යතාවන්ට අනුව විවිධ වෙනස්කම් වලට භාජනය විය. ඔවුන් ගේ ආගමනය අනුව මෙරටට වතු වගාව හඳුන්වා දුන් අතර කෘෂි අංශය යටතේ තේ, පොල්, රබර් හා සුළු අපනයන බෝග ව්‍යාප්ත කෙරිණි.

වතු වැවිලි ආර්ථිකය ඇරඹීමත් සමග එතෙක් සම්ප්‍රදායානුකූලව ක්‍රියාත්මක වූ යැපුම් කෘෂිකර්මික අංශය තවදුරටත් ග්‍රාමීය ආර්ථිකයේ අවශ්‍යතා සපුරාලීම සඳහා සිදු කළ අතර නවීන අංශය හෙවත් වැවිලි අංශය විවිධ වගාවන්ගෙන් සමන්විත වී කැපී පෙනෙන වශයෙන් ඉදිරියට ගමන් කළේය. ඒ අනුව කෘෂිකාර්මික අංශය මෙරට දළ දේශීය නිශ්පාදිතය ,සේවා නියුක්තිය, විදේශ විනිමය ඉතිරි කිරීම් ,දායක වන ප්‍රධාන අංශයක් වශයෙන් ව්‍යාප්ත විය.

මෑත කාලීන වශයෙන් ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට කාර්මික අංශයේ දායකත්වය වැඩි වීමක් සිදු වුවත් ශ්‍රී ලංකාවේ කාර්මික අංශයේ විශාල වශයෙන් දියුණු වීමක් සිදු වී නොමැති අතර ශ්‍රී ලංකාව වර්තමානයේ ද කෘෂිකාර්මික රටකි. 1990 දී දළ ජාතික නිෂ්පාදනයට කෘෂි අංශයේ දායකත්වය සියයට 23 ක් වූ අතර 1995 දි සියයට 20.3 ක් විය. මෙහිදී තේ ,පොල් රබර්, වී අනෙකුත් කෘෂි බෝග වැදගත් වන අතර වී නිෂ්පාදනය වඩාත් වැදගත් වේ. 1995 දී දළ ජාතික නිෂ්පාදිතයට වී නිෂ්පාදන අංශයේ දායකත්වය සියයට 4.3 ක් විය. ඒ අනුව දළ ජාතික නිෂ්පාදිතය වර්ධනය කරගනිමින ගනිමින් ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමේ දී කෘෂි අංශය සංවර්ධනය කිරීම වැදගත් වේ. (උපාලි හෙට්ටිආරච්චි, 1998)

පසුව ලෝකයේ කාර්මීකරණය ආරම්භ වීමත් සමඟ කෘෂිකර්මාන්තය වැදගත්කම අඩු විය. 2006 වර්ෂය වන විට ආර්ථික අංශය ලෝක ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් සේවයට ගැනීම නිසා ඉතිහාසයේ ප්‍රථම වතාවට සේවා අංශය කාර්මික අංශය අභිබවා ගියේය. ලෝක ජනගහනයෙන් තුනෙන් එකක් කෘෂිකර්මාන්ත අංශයෙහි සේවය කළා වුවද ලෝක

නිෂ්පාදනයේ කෘෂි නිෂ්පාදන වලට ඇත්තේ සියයට 5 ට අඩු ප්‍රතිශතයකි. (ශ්‍රී ලංකා මහා බැංකු වාර්ෂික වාර්තාව)

දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මාන්තයෙන් ලැබෙන දායකත්වය දිගුකාලීනව පහත වැටීම සහ සේවා වලින් ලැබෙන දායකත්වය ඉහළ යාම දේශීය ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනසකට තුඩු දී ඇත. පශ්චාත් ගැටුම් පැවති කාලය තුළ 2009 න් පසු ආර්ථික වර්ධනය සඳහා ඉදිකිරීම්, සංචාරක, සන්නිවේදනය, වෙළඳ හා මූල්‍ය සේවා ප්‍රධාන දායකත්වයක් ලබා දුන් අතර දළ දේශීය නිෂ්පාදනය සඳහා 2010දී 8 5% ක් වූ කෘෂිකර්මාන්තයේ දායකත්වය 2018 දී 7% කට පහත වැටී ඇත. 2018 දළ දේශීය නිෂ්පාදනයේ කොටස් වල දායකත්වය වූයේ කෘෂිකර්මාන්තය 7 % ක්, කර්මාන්ත 26. 1% ක්, සේවා 57.7 % ක් සහ බදු ලෙසය. සහනාධාර 9.2% ක් ලෙසය. කෘෂිකාර්මික අංශය තවදුරටත් මෙරට ආර්ථිකය තුළ වැදගත් තැනක් ගනී. 2017 දී කම්කරු ශ්‍රමයෙන් සියයට 24.3 ක් කෘෂිකර්මාන්තයට අයත් විය.

2013 සිට 2010 දක්වා කාල සීමාවේදී මුළු අපනයනයෙන් 14% කට කෘෂිකර්මාන්තය ට අයත් වූ අතර 2018 දී මුළු කෘෂිකාර්මික අපනයන වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 2579 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය සමස්ත ජාතික අපනයනය 21.7% කට සමාන විය. (ශ්‍රී ලංකා මහා බැංකු වාර්ෂික වාර්තාව)

රටේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ජීවත් වන ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තයයි. කෙසේ වෙතත් කෘෂිකර්මාන්තයේ නිරත අයගෙන් සියයට 24.31 ක් දේශීය නිෂ්පාදිතයේ වටිනාකමින් 7.0% ක් පමණ උපයා ඇති අතර එමගින් කෘෂිකර්මාන්තයට යොදා ගනු ලබන ශ්‍රමය ප්‍රාග්ධනය සඳහා අඩු ප්‍රතිලාභ ආදායම් ලැබෙන බව පෙනී යයි.

පසුගිය වර්ෂය පහක කාලසීමාව ඇතුළත එක් එක් අංශයෙන් දළ ජාතික නිෂ්පාදිතය නැංවීමට දක්වන දායකත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වේ. ඒ අනුව 2015 සිට 2019 දක්වා කාල සීමාවේදී දළ ජාතික නිෂ්පාදනය සඳහා ඉහළම දායකත්වයක් සේවා අංශයෙන් ද කර්මාන්ත අංශය හා කෘෂිකර්මාන්ත අංශය පිළිවෙලින් දෙවන සහ තෙවන වශයෙන් දායකත්වය සපයන බව අනාවරණය කරගත හැක.

**2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ දළ ජාතික නිෂ්පාදිතය සඳහා එක් එක් ක්ෂේත්‍රයේ දායකත්වය ප්‍රතිශතයක් වශයෙන්**

| | 2015 | 2016 | 2017 | 2019 |
|---|---|---|---|---|
| කෘෂිකර්මාන්තය | 7.9 | 7.1 | 7 | 7 |
| කර්මාන්ත | 26.2 | 26.8 | 26.1 | 26.4 |
| සේවා අංශය | 56.6 | 56.5 | 37.7 | 57.1 |

ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව

2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ දළ ජාතික නිෂ්පාදිතය සඳහා එක් එක් ක්ෂේත්‍රයේ දායකත්වය ප්‍රතිශතයක් වශයෙන් ගත් විට වැඩිම දායකත්වයක් ලබාදී ඇති අංශය වන්නේ සේවා අංශයයි. එය ආසන්න වශයෙන් 57% ක දායකත්වයක්ද කර්මාන්ත අංශයෙන් ආසන්න වශයෙන් 28% ක දායකත්වයක්ද කෘෂිකර්මාන්ත අංශයේ ආසන්න වශයෙන් 8% දායකත්වය දක්වා ඇති බව අනාවරණය වේ.

අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයෙන් සෞභාග්‍යවත් වූ රටක් ලෙස හැඳින්වුවද වර්තමානයේ කර්මාන්ත හා සේවා අංශ දෙක සමඟ සැසඳීමේ දී කෘෂි අංශය දළ ජාතික නිෂ්පාදිතය සවිමත් කිරීම සඳහා  දක්වා ඇති දායකත්වය සාපේක්ෂ වශයෙන් ඉතා අවම මට්ටමක පවතින බව පැහැදිලිය. එසේම කෘෂිකර්මාන්තය ආර්ථික සංවර්ධනය කෙරෙහි දක්වන දායකත්වය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී කෘෂි අංශයේ සේවා නියුක්තිය කෙරෙහිද අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. අතීතයේ ශ්‍රී ලංකාවේ මුළු සේවා නියුක්තිය වැඩි ප්‍රතිශතයක් සේවා නියුක්ත ව සිටියේ කෘෂි අංශය තුළ ය. නමුත් වර්තමානයේ දී සේවා නියුක්තිය වැඩි  වශයෙන් දක්නට ලැබෙන්නේ සේවා අංශය තුළ ය.

**සේවා අංශය කාර්මික අංශය හා කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය ප්‍රතිශතයක් වශයෙන්**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| කෘෂිකර්මාන්තය | 28.7 | 27.1 | 26.1 | 25.5 | 25.3 |
| කර්මාන්ත | 25.8 | 26.4 | 28.4 | 27.9 | 27.6 |
| සේවා අංශය | 45.6 | 46.5 | 45.5 | 46.6 | 47.1 |

ශ්‍රී ලංකා මහා  බැංකු වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳු ජනතාවගෙන් 90% ක් පමණ තවමත් කෘෂි ආර්ථිකය තුළ ජීවත් වේ. මේ නිසා කෘෂිකර්මය සත්ත්ව පාලනය ධීවර අංශයන්හි සේවා නියුක්ති ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී. සේවා නියුක්තිය උත්පාදනය කිරීමේ මූලාශ්‍රය ලෙස 1950 ගණන්වල සිට 1980 දක්වා කාලය තුළ කෘෂි අංශය ඉතා වැදගත් තැනක් ගෙන ගෙන තිබුණි. 1953 වන විට කෘෂි අංශයේ සේවා නියුක්තිය 53% ක් වූ අතර එය 1963 දී 52.9% ක් හා 1971 දී 50.4% විය. 1997 ආර්ථික ලිහිල්කරණයත් සමග කෘෂි අංශයේ සේවා නියුක්තිය පහළ වැටීමක් සිදු වී ඇත. 1953 සිට 1996 කාලය තුළ වැවිලි අංශයේ සේවා නියුක්තිය විසින් 29% සිට 20% දක්වා අඩු වී ඇතත් එය දළ දේශීය නිෂ්පාදිතයට කෘෂි අංශයේ දායකත්වය පහත වැටුනු තරම් ප්‍රමාණයට වඩා අඩු අගයකි. 1980 පමණ වන විට 51% ක් පමණ වූ එය 1995 වන විට 36% ක් දක්වා වෙනස් වී ඇත.

කෘෂි අංශයේ සේවා නියුක්තියෙන් වැඩිපුර ප්‍රමාණයක් ඌන සේවා නියුක්තිය ලෙසට සැලකේ. ඉහත දක්වා ඇති දත්තයන්ට අනුව ප්‍රතිශතයක් ලෙස කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය ක්‍රමයෙන් අඩු වීමක් දක්නට ලැබේ. ඊට හේතුව වන්නේ කෘෂි අංශයේ ශ්‍රමය එම අංශයෙන් පිටතට ඇදී යාමයි. කාර්මික හා සේවා අංශයන්හි ව්‍යාප්තියත් සමග කෘෂි සේවා නියුක්තියෙන් කොටසක් සේවා අංශයටත් කාර්මික අංශයේ ගොවිපල නොවන ආදායම් මාර්ග වලට යොමු වීමයි. නමුත් ආදායම් උත්පාදන රාශියකට වඩා සේවා නියුක්ති උත්පාදන මූලාශ්‍රයක් ලෙස කෘෂි අංශය වර්තමානයේ දී වැදගත් තැනක් හිමි කරගෙන ඇත .

රටක ආර්ථික සංවර්ධනය සඳහා කාර්මික අංශය හා සේවා අංශය පමණක් නොව කෘෂිකාර්මික අංශයේ ද සංවර්ධනයට අත්‍යවශ්‍ය වේ. දියුණු කළ හැකි දියුණු කළ යුතු කෘෂිකර්මාන්ත අංශය ගැන නොසලකා නොතකා කාර්මික වීම සඳහා දරන ප්‍රයත්නයන් එතරම් සුදුසු නොවේ. ශ්‍රී ලංකාව දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීමෙහි ලා ඉතා වැදගත් ස්ථානයක් කෘෂිකර්මාන්ත අංශය දරන බවයි. එස්.ආර් සෙන් මහතා පෙන්වා දෙන්නේ කෘෂිකාර්මික දියුණුව ගැන නොසලකා කාර්මික වීමට උත්සාහ ගන්නා රටවල් බලවත් දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවන බවත් කෘෂිකර්මය මත පදනම් වී ඇති ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂිකාර්මික දියුණුව ගැන නොසලකා කෙරෙන ආර්ථික සංවර්ධනයක් ගැන සිතීම මුළාවක් බව පෙනේ .දැනට පවතින ආර්ථිකය දියුණු නොදියුණු බව තීරණය කරනු ලබන්නේ කෘෂිකර්මාන්ත අංශයේ දියුණු නොදියුණු බව තුළිනි කෘෂිකාර්මික දියුණුවෙන් තොරව කාර්මික දියුණුව ළඟා කර ගැනීම අපහසු වන්නේ කාර්මික අංශය නඟාලීමට අවශ්‍ය

වෙළෙඳපොළ සහ ප්‍රාග්ධන සම්පත් සපයා ගන්නේ කෘෂිකාර්මික අංශය මගින් බැවිනි. (රංජිත් රලපනාව, 1979)

කෘෂිකාර්මික අංශයේ තත්වය පහත් නම් එහි අනිවාර්ය වන්නේ ජාතික ආදායම පහතට වැටීමයි. ඒ තුළින් ඒක පුද්ගල ආදායම ද පහතට වැටෙයි. මූලික අවශ්‍යතාවන් සංතර්පණය කරගත්පසු ඉතිරි කිරීමට හෝ කාර්මික භාණ්ඩ මිලදී ගැනීම සඳහා ක්‍රය ශක්තිය ජනතාවට නොලැබී යයි. මෙමගින් පැහැදිලි වන ප්‍රධාන කරුණු දෙකකි.

1. ඉතුරුම් නොමැතිව නම් ප්‍රාග්ධන සම්පත් පහත් මට්ටමක පැවතීම

2.කාර්මික භාණ්ඩ මිලදී ගැනීමේ ශක්තිය මත වෙළෙඳපොළ සංකෝචනය වීම

මෙම කරුණු දෙක වෙනස් කළ හැක්කේ කෘෂිකාර්මික දියුණුව මගින් ජාතික ආදායම ඉහළ නැංවීම මගින් කාර්මික භාණ්ඩ මිලදී ගැනීමේ ශක්තිය හා ඉතුරුම් වර්ධනය ට සානුබලය ලබාගත හැකිය. (රංජිත් රළපනාව, 1979)

## නිගමනය

ඉහත  සඳහන් කළ පරිදි රටක සංවර්ධන ක්‍රියාවලියට අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු අංගයක් ලෙස කෘෂි අංශය හැඳින්විය හැකිය. කෘෂි ආර්ථික සංවර්ධනය ක්‍රියාවලියට දායක වන්නේ ඉහත සඳහන් ආකාරයන් මගින් පමණක් නොවේ . ඒ අනුව රාජ්‍ය  ආදායම් වර්ධනය කර ගැනීමේ මගක් ලෙස ද කෘෂිකාර්මික අංශය වැදගත් වේ. එපමණක් නොව විදේශ විනිමය ඉපයීමට මගක් ලෙස  කෘෂි අංශය වැදගත් වේ.  තවද අයවැය ප්‍රශ්නය විසඳා ගැනීමේදී ද කෘෂිකාර්මික අංශය වර්ධනය කරගත යුතුය. එබැවින් අවසාන වශයෙන් නිගමනය කළහැකි වන්නේ අනිවාර්යෙන්ම රටක් සංවර්ධනය කිරීමේදී කෘෂිකාර්මික අංශයේ වර්ධනය කරගැනීම වැදගත් වන බවයි. රටක් කාර්මික හා සේවා යන අංශ දෙකේම සංවර්ධනයක් ඇතිකර ගත්තද ආහාර අවශ්‍යතා සපුරාලීමට මෙම අංශ දෙකට නොහැකිය. කාර්මික හා සේවා අංශයන්ට ද අවශ්‍ය වන ආහාර අවශ්‍යතාවය සපුරාලීමට හැකි වන්නේ කෘෂිකාර්මික අංශයට පමණි. එබැවින් ඕනෑම රටක් සංවර්ධන ඉලක්ක කරා පියමනින විට කෘෂිකාර්මික අංශය වර්ධනය කරගත යුතු බව පිළිගත යුතුය. මේ ආකාරයට ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ කෘෂිකාර්මික අංශය ඇති වැදගත්කම පැහැදිලිව අවබෝධ කරගත හැකි ය.

## මූලාශ්‍ර


1. Athukorala, P. & Jayasuriya, S. (1994) Macro EconomicPolicies, Crises and Growth in Sri Lanka 1969-90, The world Bank
2. පොඩි මැණිකේ, ප්‍රේමා , (2004) ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසයය කැල්ණිය ප්‍රින්ට්, මාකොල, කිරිබත්ගොඩ
3. උදයකාන්ත,සමන්( (2007.) සංවර්ධන අභියස කෘෂිකර්මාන්තය, එස් . ගොඩගේ සහ සහෝදරයෝ, (675,) කුලරත්න මාවත, කොළඹ 10.
4. කෘෂිකාර්මික ප්‍රතිපත්ති පුළුල් කිරීම් ශ්‍රී ලංකාව ( පිටපත්) කෘෂිකාර්මික අමාත්‍යාංශය ,ග්‍රාමීය, ආර්ථික කටයුතු වාරිමාර්ග හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
5. රළපනාව.ආර්, (1979,) ප්‍රායෝගික ආර්ථික විද්‍යාව ප්‍රවේශය, ඇස්,ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන පාර,කොළඹ10
6. ශ්‍රී ලංකා මහා බැකු වාර්ෂික වාර්තාව

# An Introduction to the Ecosystem Services in Wetland

Senior lecturer Mangala Jayarathne
Department of Geography
University of Kelaniya
mangala7@kln.ac.lk

## 01.Introduction

One of the most significant ecosystems on earth is the wetlands. They sustain human societies by performing biological, ecological, hydrological, and geological functions. There are many different species and ecosystems in the world that are held and supported by wetlands (Mwakaje, 2009). By definition, wetlands are places with water and vegetation that are either natural or artificial and include swamps, marshes, peatlands, fens, and others (Ramsar, 1971). A wetland's aquatic system can be dry, flowing, brackish, salty, or stagnant, and it occasionally includes marine areas with a depth of no more than 6 meters at low tide (Finlayson et al., 2005). The sustainability of wetlands depends on numerous factors, including the supply and loss of water (MA, 2005). The latest studies show 12.1 million km$^2$ of wetland ecosystems worldwide, including inland waters, coastal and near-shore marine wetlands, and artificial wetlands (Davidson et al., 2018).

Ecosystem services are the benefits people obtain from ecosystems and are co-produced by the interactions between ecosystems and societies. Recently it has included ecosystem services and natural capital in stated policy priorities since the Millennium Ecosystem Assessment (MA 2005). Also, to "enhance the benefits to everybody from biodiversity and ecosystem services," the Parties to the Convention on Biological Diversity (CBD; www.CBD.int) have committed on a global scale. The CBD Aichi Target 14 is of relevance to ecosystem services: 'By 2020, ecosystems that provide essential services, including services related to water, and contribute to health,

livelihoods and wellbeing, are restored and safeguarded, taking into account the needs of women, indigenous and local communities, and the poor and vulnerable societies.

The concept of wellbeing, as a measure of a person's change in status, has emerged largely in both developed and developing countries because of its association with national development. Therefore, understanding human wellbeing is a core task for researchers and policymakers (Clark and Mcgillivray, 2007). Also, the idea that human society benefits from the environment or nature in various ways, both directly and indirectly, is certainly not new and can be traced back several millennia (www.conservationandsociety.org). The concept of 'ecosystem services emerged during the 1970s and gained increasing recognition in the following decades (www.Britannica.com). The report' natural capital and sustainable development by Costanza and Daly and others focused on calculating the economic value of ecosystem services in 1992.

The concept of ecosystem services is defined in many ways according to the researchers' level of study and vision. The Common International Classification of Ecosystem Services (CICES), 2018; defined; "Ecosystems services are defined as the contributions that ecosystems make to human wellbeing and distinct from the goods and benefits that people subsequently derive from them. Services are grouped into three sections: Provisioning; regulation; and maintenance; and Cultural."

Also, Millennium Ecosystem Assessment (MEA) 2005 defines ecosystem services as follows, "Benefits people obtain from ecosystems. These include provisioning services such as food and water; regulating services such as regulation of floods, droughts, land degradation and diseases; supporting services such as soil formation and nutrient cycling; and cultural services such as recreational, spiritual, and religious and other nonmaterial benefits".

keywords related to the concept of ecosystem services in the last decades are shown in Figure 01. It focuses on human wellbeing, land management and change, water-related services, and connecting natural and social systems. Moreover refers to the hot words related to ecosystem services such as resilience and sustainable development.

The Rapid Assessment of Wetland Ecosystem Services (RAWES) approach is technically developed to understand the services provided by wetlands in another way. It was developed through an iterative process of field trials at numerous wetland sites in the United Kingdom, India, Chad and Ireland, in consideration of approaches to urban drainage (Everard et al., 2016) and through dialogue with stakeholders and potential end-users such as site managers, academics, non-governmental organizations and intergovernmental bodies, such as the Ramsar Convention. by links the service to beneficiaries. For each ecosystem service, an assessment is made as to the scale at which the benefits accrue.

Figure 01: keywords related to the concept of ecosystem services




Source: Ecosystem service cascade: Concept, review, application and prospect - 2022

An initial three-point scale is provided, but this can be modified to the specific assessment context, for instance, if the assessment considers a finite entity such as a county or metropolitan region in Sri Lanka. The assessors are trained to apply their local knowledge within the consistent framework provided by the RAWES approach and to make the best professional judgements on the scale of the benefits being provided by the wetland. The three scales of benefit considered are described below. However, this scale can be refined and modified for the local context.

- Local benefits:

  *Those experienced by individuals, households or communities living and working near the wetland*
- Regional benefits:

  *Those delivered to individuals, households or communities living and working in the broader catchment of the wetland*
- Global benefits:

  *Those that extend beyond national boundaries*

With the publication of the MEA came an alternative categorization for ecosystem services, whereby the services are described as being provisioning, regulating, cultural, and supporting. Figure 02; shows the type of services provided by the ecosystem.

Figure 02: Main types of ecosystem services




Source: Millennium Ecosystem Assessment - 2005

## 02. Provisioning Services

Water, food, wood, raw materials, medical resources and other goods are some of the material benefits we obtain from the ecosystems called "provisioning services". Many provision services such as food, water, wood, and biochemical and genetic resources are essential to people in different ways. They are supported by the physical wellbeing of people and various economic activities in markets. Moreover, on the other hand, many people living in rural regions in the world highly depend on providing services for their livelihood. Perhaps the most significant of these are fish, the primary source of protein for one billion people worldwide, and providing employment and income for at least 150 million people through a fishing industry (www.ramsar.org). Water: The role of the ecosystem is crucial in the global hydrological cycle as it regulates the flow and purification of the water. The water coverage of the earth is two third. In short, all living creatures on the earth need water in order to survive. Agriculture is

heavily dependent on freshwater, and 60 percent of all the world's freshwater withdrawals go towards irrigation uses.

The water supports sustainable fisheries and aquaculture development. Scientists have discovered over 220,000 species of marine life in the oceans. Livestock is another important use of freshwater resources. It is estimated that livestock use 15 percent of global agriculture water (www.fao.org). Food: The main source of food production comes from managed agro-ecosystem, and freshwater, marine, brackish and forests are supported to increase the food production for human consumption. The world currently produces food for over 7 billion people. Today, the world produces 17 per cent more food than 30 years ago, and the production rate has increased faster than the population over the last two decades (www.fao.org 10/06/22). Figure 03: are shows the provisioning services of wetland and examples for each.

Figure 03: Provisioning services of wetland.

| **Services** | | **Examples** |
|---|---|---|
| 01 | Provision of fresh water | *Water used for domestic drinking supply, irrigation, and livestock etc.* |
| 02 | Provision of food | *Crops, fruit, fish, etc* |
| 03 | Provision of fibre | *Timber for building, wool for clothing, etc* |
| 04 | Provision of fuel | *Fuelwood, peat, etc* |
| 05 | Provision of genetic resources | *Rare breeds used for crop/stock breeding, etc* |
| 06 | Natural medicines and pharmaceuticals | *Plants used as traditional medicines, etc.* |

| | | |
|---|---|---|
| 07 | Provision of ornamental resources | *Collection of shells, flowers, etc* |
| 08 | Clay, mineral, aggregate harvesting | *Sand and gravel are extracted for building use, clay extracted for brick-making, etc.* |
| 09 | Waste disposal | *Dumping of solid waste, discharge of wastewater, etc* |
| 10 | Energy harvesting from natural air and water flow | *Water wheels driven by flowing water, windmills driven by the wind, etc* |

Source: Rapid Assessment of Wetland Ecosystem Services (RAWES), 2017.

## 03. Regulating services

Regulating service is one of the four broad categories of ecosystem services that consist of ecosystem processes that maintain environmental conditions favourable to life. They also include water purification, soil formation and climate regulation; regulating services are often silent and invisible processes. Furthermore, there are no markets for most regulating services such as air quality, climate regulation, water regulation, erosion control, water purification and waste treatment, regulation of human diseases, biological control, pollination and storm protection.

An example of regulating service is crop pollination. The bees act as pollinators for our crops and benefit from food products. Moreover, diverse food chains, as well as aquatic habitats, are other examples of regulating services. These are very important because we are all a part of nature. Figure 04: shows the regulating services of wetland.

Figure 04: Regulating services of wetland.

| Services | | Examples |
|---|---|---|
| 01 | Air quality regulation | *Removal of airborne particles from the exhaust of cars, chimneys of industry, dust from agricultural land, etc* |
| 02 | Local climate regulation | *Regulation of the local microclimate, through shading, reducing air temperature, etc.* |
| 03 | Global climate regulation | *Regulation of the global climate through control in greenhouse gas emissions, carbon sequestration, etc.* |
| 04 | Water regulation | *Regulation of flows of surface water during high and low flows, regulation of recharge of groundwater, etc.* |
| 05 | Flood hazard regulation | *Regulation and storage of flood water, regulation of intense rainfall events, etc.* |
| 06 | Storm hazard regulation | *Regulation of tidal or storm surges, regulation of extreme winds, etc.* |
| 07 | Pest regulation | *Control of pest species such as mosquitoes, rats, flies, etc.* |
| 08 | Regulation of human diseases | *Presence of species that control the species (vectors) that transmit human diseases such as malaria, West Nile fever, dengue fever, Zika virus, leptospirosis, schistosomiasis, etc.* |
| 09 | Regulation of diseases affecting livestock | *Presence of species that control the species (vectors) that transmit diseases to livestock such as leptospirosis, schistosomiasis, duck virus enteritis, highly pathogenic avian influenza, tick-borne diseases, etc* |

| | | |
|---|---|---|
| 10 | Erosion regulation | *Regulation of energy environment to reduce risk of erosion, presence of dense vegetation protecting soils, etc.* |
| 11 | Water purification | *Cleaning of water, improvement of water quality, deposition of silts, trapping of contaminants and pollutants, etc.* |
| 12 | Pollination | *Pollination of plants and crops by pollinators such as bees, butterflies, wasps, etc.* |
| 13 | Salinity regulation | *Freshwater in the Wetland provides a barrier to saline waters.* |
| 14 | Fire regulation | *Providing physical barriers to the spread of fire, maintaining wet conditions to prevent fires spreading, etc.* |
| 15 | Noise and visual buffering | *Wetland trees or tall reeds absorbing and buffering the impact of noise.* |

Source: Rapid Assessment of Wetland Ecosystem Services (RAWES), 2017.

**04. Cultural services**

The nonmaterial benefits people obtain from ecosystems are called "Cultural Services". They include aesthetic inspiration, cultural identity, sense of home and spiritual experience related to the natural environment. According to the definition of MEA cultural services in terms of the 'nonmaterial benefits, people obtain from ecosystems. The importance of cultural services has consistently been recognized, but it is difficult to quantify in biophysical or monetary terms. Of course, to qualify as a service, ecosystem structures and functions must contribute to meeting human needs and wants. Figure 05: shows the cultural services of the wetland ecosystem.

Figure 05: Cultural Services of Wetland Ecosystem

| Services | | Examples |
|---|---|---|
| 01 | Cultural heritage | *Importance of the Wetland for historical or archaeological value, as an example of traditional uses or management practices, as a cultural landscape, etc.* |
| 02 | Recreation and tourism | *Importance of the Wetland for providing a location for recreation such as fishing, watersports, or swimming, or as a tourism destination, etc.* |
| 03 | Aesthetic value | *The wetland is overlooked by properties, is part of an of known area of natural beauty, is used as a subject for painters and artists, etc.* |
| 04 | Spiritual and religious value | *The wetland holds plays a role in local religious festivals, the wetland is considered as a sacred site, the wetland forms part of a traditional belief system, etc.* |
| 05 | Inspirational value | *Presence of local myths or stories relating to the wetland, traditional oral or written histories about the wetland or wetland animals, creation of different art forms associated with the wetland, development of distinct architecture based on the wetland, etc.* |
| 06 | Social relations | *Presence of fishing, grazing or cropping communities which have developed within and around the Wetland* |

| | | |
|---|---|---|
| 07 | Educational and research | *Use of the Wetland by local school children for education, site of long-term research and monitoring, site visited by organized educational study tours, etc* |

Source: Rapid Assessment of Wetland Ecosystem Services (RAWES), 2017.

## 05. Supporting services

Supporting service is useful and almost required because these services help create and sustain all other ecosystem services. Furthermore, supporting services are fundamentally different from the other three service categories in that they exist without relation to humans. Their function is strictly ecological. Through the other ecosystem service categories (provisioning, regulating and cultural services), there is a direct correlation to increased human welfare, and environmental quality, the supporting services themselves are strictly grounded in the earth.

Supporting services were not traditionally unvalued, and the government has acknowledged their importance mainly in soil and biodiversity conservation. These supporting services are a long-term process that includes nutrient cycling, water recycling, formation of soil and production of Oxygen. Agriculture, forestry and other public landscapes depend on supporting ecosystem services such as nutrient cycle and soil formation. The supporting services of the ecosystem are the water cycle, habitat provision and primary production. In contrast to the habitat definitions for plants and animals, it is difficult to describe the human habitat. Organisms utilized some parameters like temperature and food sources. Organisms modify the environment to survive and protect themselves where humans cannot. For example, a forest ecosystem modifies the soil, temperature, moisture, chemistry, humidity and the amount of sunlight that reaches the ground. The wetland ecosystem supporting services helps habitat and human health, countless numbers of animals and plant

species, the man who relatively depends on the food. Figure 06: shows the supporting services provided by the wetlands.

Figure 06: Supporting services of wetland ecosystem.

| **Services** | | **Examples** |
|---|---|---|
| 01 | Soil formation | *Deposition of sediment, accumulation of organic matter, etc.* |
| 02 | Primary production | *Presence of primary producers such as plants, algae, etc.* |
| 03 | Nutrient cycling | *Source of nutrients present from inputs from agricultural land, internal cycling of plant material, inputs of nutrients from floodwaters, presence of fauna to recycling nutrients, etc.* |
| 04 | Water recycling | *The presence of wetland vegetation and open water result in evapotranspiration and local recycling of water, relatively closed canopies and low exposure to winds retain water in local cycles, sandy or coarse substrates allow exchange with groundwaters, etc.* |
| 05 | Provision of habitat | *Presence of locally important habitats and species, presence of species and habitats of conservation concern, etc* |

Source: Rapid Assessment of Wetland Ecosystem Services (RAWES), 2017.

## Conclusion

Ecosystems are the foundations of the biosphere and determine the health of the entire earth system. The organisms in an ecosystem are usually well balanced with each other and the environment. Unfortunately, over half of the world's wetlands disappeared in the last century due to unplanned development. However, the wetland ecosystem is unique among the various ecosystems as it provides many services. Therefore, wetlands are considered as "Biological Supper markets". The above evidence proves the services provided by wetlands in many ways, and it emphasizes the neediness to conserve wetlands over the world in another aspect.

## References

1. Balvanera, Patricia, Sandra Quijas, Daniel S. Karp, Neville Ash, Elena M. Bennett, Roel Boumans, Claire Brown, Kai M. A. Chan, Rebecca Chaplin-kramer, Benjamin S. Halpern, Jordi Honey-ros, Harold Mooney, Tuyeni Mwampamba, Jeanne Nel, Stephen Polasky, Belinda Reyers, Joe Roman, Woody Turner, Robert J. Scholes, Heather Tallis, Kirsten Thonicke, Ferdinando Villa, and Matt Walpole. 2017. *The GEO Handbook on Biodiversity Observation Networks*.
2. Bennett, Elena M., Julia Baird, Helen Baulch, Rebecca Chaplin-Kramer, Evan Fraser, Phil Loring, Peter Morrison, Lael Parrott, Kate Sherren, Klara J. Winkler, Jérôme Cimon-Morin, Marie Josée Fortin, Barret L. Kurylyk, Jeremy Lundholm, Monique Poulin, Jesse T. Rieb, Andrew Gonzalez, Gordon M. Hickey, Murray Humphries, Krishna Bahadur KC, and David Lapen. 2021. "Ecosystem Services and the Resilience of Agricultural Landscapes." *Advances in Ecological Research* 64:1–43.
3. Carucci, Tomaso, Katherine Whitehouse-Tedd, Richard W. Yarnell, Alan Collins, Fran Fitzpatrick, Andre Botha, and Andrea Santangeli. 2022. "Ecosystem Services and Disservices Associated with Vultures: A Systematic Review and Evidence Assessment." *Ecosystem Services* 56(July 2021):101447.
4. Clark, D., Mcgillivray, M., 2007. Measuring Human Well-Being : Key Findings and Policy Lessons, vol. 3.
5. Colding, Johan, and Stephan Barthel. 2017. "The Role of University Campuses in Reconnecting Humans to the Biosphere." 1–13.
6. Davidson, N.C., 2014. How much wetland has the world lost? Long-term and

recent trends in global wetland area. Mar. Freshwater Res. 65 (10), 934–941
7. Duku, Eric, Precious Agbeko Dzorgbe Mattah, and Donatus Bapentire Angnuureng. 2022. "Assessment of Wetland Ecosystem Services and Human Wellbeing Nexus in Sub-Saharan Africa: Empirical Evidence from a Socio-Ecological Landscape of Ghana." *Environmental and Sustainability Indicators* 15(April):100186.
8. de Groot, Dolf, Luke Brander, and C. Max Finlayson. 2018. "Wetland Ecosystem Services." *The Wetland Book: I: Structure and Function, Management, and Methods* (February):323–33.
9. Everard, M., 2018. National wetland policy: Ghana. In the wetland book: I: structure and function. Management, and Methods 785–788. https://doi.org/10.1007/978-90- 481-9659-3_158.
10. Finlayson, C.M., Gordon, C., Ntiamoa-Baidu, Y., Tumbulto, J., Storrs, M., 2000. Hydrobiology of the Songor and Keta Lagoons: Implications for Wetland Management in Ghana.
11. Landreth, Nicholas, and Osamu Saito. 2014. "An Ecosystem Services Approach to Sustainable Livelihoods in the Homegardens of Kandy, Sri Lanka." *Australian Geographer* 45(3):355–73.
12. McInnes, R. J., and M. Everard. 2017. "Rapid Assessment of Wetland Ecosystem Services (RAWES): An Example from Colombo, Sri Lanka." *Ecosystem Services* 25:89–105.
13. Mitsch, William J., Blanca Bernal, and Maria E. Hernandez. 2015. "Ecosystem Services of Wetlands." *International Journal of Biodiversity Science, Ecosystem Services and Management* 11(1):1–4.
14. Mwakaje, A.G., 2009. Wetlands , livelihoods and sustainability in Tanzania. Afr. J. Ecol. 47, 179–184.
15. Schuyt, Kristen; 2004. "The Economic Values of the World's Wetlands." *Environmental Studies* (January 2004).
16. Tiemann, André, and Irene Ring. 2022. "Towards Ecosystem Service Assessment: Developing Biophysical Indicators for Forest Ecosystem Services." *Ecological Indicators* 137(February).
17. Xu, Xibao, Minkun Chen, Guishan Yang, Bo Jiang, and Ji Zhang. 2020. "Wetland Ecosystem Services Research: A Critical Review." *Global Ecology and Conservation* 22:e01027.
18. Zhang, Cheng, Jing Li, and Zixiang Zhou. 2022. "Ecosystem Service Cascade: Concept, Review, Application and Prospect." *Ecological Indicators* 137(November 2021):108766.
19. Wetlands and Ecosystem Service, (2015), World Wetland day, Wetland for our Future, CBD

# ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය සහ ආර්ථික සංවර්ධනය අතර පවතින සම්බන්ධතාවය

එස්. පූර්ණිමා ශ්‍රීමාලි විජේවංශ
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
poornima.wijewansha@gmail.com

## සංක්ෂේපය

රටක මානව සම්පත එරට ආර්ථික ක්‍රියාවලියේ උච්චාවචනයන් සමඟ සක්‍රීය ලෙස සම්බන්ධ වේ. නිදහසෙන් පසු ශ්‍රී ලංකාව තුළ ද ජන සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වී ඇත. ජන සංඛ්‍යාවේ විශාලත්වය, සංයුතිය, වයස් කාණ්ඩය හා අවකාශීය ව්‍යාප්තිය ආදිය ආර්ථික සංවර්ධනය කෙරෙහි අඩුවැඩි වශයෙන් බලපායි. වර්තමානයේ දී ශ්‍රී ලංකාව තුළ වයස්ගත ජන සංඛ්‍යාව ඉහළ යෑම ආර්ථික ක්‍රියාවලියේ සෑම අංශයක් කෙරෙහි ම ඍජුව ම සම්බන්ධ වේ. රටට හිතකර මානව ප්‍රාග්ධනයක් තුළින් ආර්ථිකය ශක්තිමත් කර ගත හැකි සේ ම වැඩි වන ජන සංඛ්‍යාව රටට අහිතකර ලෙස බලපෑම් කරන සෑම අවස්ථාවක දී ම ජනගහන පාලන ප්‍රතිපත්ති අනුගමනය කළ හැකිය.

මුඛ්‍ය පදඃ ජනසංඛ්‍යාව, ආර්ථිකය

## හැඳින්වීම

ජන සංඛ්‍යාවේ වර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එය ආර්ථික ක්‍රියාදාමයන් සමඟ විවිධාකාරයෙන් සම්බන්ධතා පවත්වන බවට හඳුනා ගත හැකිය. වැඩිවන ජන සංඛ්‍යාවට අවශ්‍ය පරිදි මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නම් සංවර්ධනය තුළ අපේක්ෂා කළ යුත්තේ මිනිසුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම පිළිබඳවයි. ආර්ථිකය හා මානවයා යන සංකල්පයන් ද්විත්වය ම පොදු සංකල්පයන් ලෙසට සංවර්ධනය මූලික කර ගනිමින් සාකච්ඡා කළ ද තවමත් ජන සංඛ්‍යාවේ වර්ධනයන්ට සමගාමී ව ආර්ථික සංවර්ධනයක් අත්පත් කර ගැනීම අසීරු කටයුත්තක් බවට පත් වී ඇත.

20 වන සියවස මැදභාගය වන විට රටක ආර්ථිකමය දියුණුව සංවර්ධනය ලෙසට අර්ථකථනය කෙරිණි. 20 වන සියවස අගභාගය වන විට සංවර්ධනය, භෞතික හෝ ආර්ථිකමය වශයෙන් නොව මානවයා කේන්ද්‍ර කොට ගත් ක්ෂේත්‍රයන් කෙරෙහි ද අවධානය

යොමු කෙරිණි. රටක ආර්ථික සංවර්ධනය සමඟ සමාජයීය සංවර්ධනයක් ද ඇති විය යුතුය. සමාජයීය සංවර්ධනය සිදු විය යුත්තේ ආහාර හා පෝෂණය, සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස, සමාජ සුරක්ෂිතතාව, ඇඳුම්පැළඳුම්, විවේකය හා මානුෂීය නිදහස යන ක්ෂේත්‍රවලය (යුනෙස්කෝ ප්‍රකාශය, 1978). සංවර්ධනය යනු ජන සංඛ්‍යාව සමාජයීය, සංස්කෘතික හා සදාචාරාත්මක යන සාධක ඇතුළත් වෙනස්වීම් හා වර්ධනය පිළිබඳ ක්‍රියාදාමයයි (එක්සත් ජාතීන්ගේ සංවිධානය, 1981/90). The meaning of Development කෘතියෙහි සංවර්ධනය අර්ථ නිරූපණය කිරීමේ දී මූලික ප්‍රශ්න තුනක් මතු කර පෙන්වා දී ඇත. එනම් ආර්ථික සංවර්ධනය සමඟ දුප්පත්කමට කුමක් සිදුවේද? විරැකියාවට කුමක් සිදුවේද? ආදායම් විෂමතාවයට කුමක් සිදුවේද? යනුවෙනි (Seers, 1969).

කිසියම් රටක ජන සංඛ්‍යාව එම රටෙහි සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා ඍජු සහ වක්‍ර අයුරින් බලපෑම් කරයි. තවමත් සංවර්ධනය නොවූ විශාල සම්පතක් ලොව පවතින්නේ නම් එය මානව සම්පත ලෙසට ද ඇතැම් පුද්ගලයෝ මත පළ කරති (ඩයස්, 2019). 16, 17 සියවස් තුළ දී ගවේෂණය, ජනාවාසකරණය හා වෙළෙඳාම ප්‍රසාරණය වීම තුළ ජන සංඛ්‍යාව වර්ධනය වීමට අවශ්‍ය පසුබිම සැකසුණු අතර 18 වන සියවස තුළ ඇති වූ කාර්මික විප්ලවය තුළින් සිදු වූ වෛද්‍ය, ප්‍රවාහනය හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයන්හි දියුණුවත් සමඟ ජන සංඛ්‍යාවේ වර්ධනයේ ගතික බව වේගවත් කිරීමට හේතු විය (මධුභාෂිණී, 2016). ශ්‍රී ලංකාව තුළ සිදු වන ජන සංඛ්‍යාවේ වෙනස්කම් පිළිබඳ ව අවධානයෙන් සිටීම වැදගත් වන්නේ තවමත් සංවර්ධනය වෙමින් පවතින රටක් බැවිනි. සංවර්ධිත රාජ්‍යයක් බවට පත් වීමට නම් ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව කළමනාකරණය කර ගත යුතුය. රට තුළ ආර්ථික සංවර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා ජන සංඛ්‍යා වර්ධනය තීරණාත්මක සාධකයක් වන බැවින් එම ද්විත්වය අතර පවතින සම්බන්ධතාවය අධ්‍යයනය කිරීම කාලෝචිත වේ.

**ජන සංඛ්‍යාව හා බැඳුණු න්‍යායාත්මක පසුබිම**

ජන විකාශනය හා එහි ආර්ථිකමය වශයෙන් පවතින බලපෑම සම්බන්ධයෙන් විවිධ මත සහ තර්ක ඉදිරිපත් වී ඇත. 18 වන සියවසේ දී ජන සංඛ්‍යාව පිළිබඳ මුල් ම න්‍යාය, තෝමස් රොබට් මෝල්තස් විසින් ඉදිරිපත් කළ බව පැවසේ. ඒ අනුව තෝමස් තම න්‍යාය මඟින් කරුණු ඉදිරිපත් කිරීමට පෙර පැවැති න්‍යායන් හා ජනගහනය පිළිබඳ මතවාදයන් 'පූර්ව මැල්තුසියානු න්‍යායන්' ලෙසත්, ඔහු තම න්‍යාය ඉදිරිපත් කිරීමෙන් පසු ජනගහනය පිළිබඳ

ව නව අදහස් ඉදිරිපත් කළ න්‍යායන් 'පශ්චාත් මැල්තුසියානු න්‍යායන්' ලෙසටත්, ඔහු විසින් ඉදිරිපත් කළ න්‍යායන් 'මැල්තුසියානු න්‍යාය' ලෙසටත් හැඳින්විය (ප්‍රනාන්දු, 2008).

පූර්ව මැල්තුසියානු න්‍යායන් 18 වන සියවස මුල්භාගයේ සහ 18 වන සියවස අගභාගය දක්වා බිහි වූ බවට සැලකේ. ජනගහන වර්ධනය රටක සංවර්ධනයට සුබවාදී වේ යන්නත්, ජනගහන වර්ධනය රටක සංවර්ධනයට බාධාකාරී වේ යන මත දෙක වටා ගොඩනැගුණු අදහස් දැරූවන් සර්ව සුබවාදීන් සහ සර්ව අසුබවාදීන් ලෙසත් හඳුන්වනු ලැබේ. මොවුන් ජනගහනය හා ආර්ථික සංවර්ධන පිළිබඳ ව විවිධ තර්ක ගොඩනගා ඇත. නමුත් තෝමස් රොබට් මෝල්තස් තම න්‍යාය තුළින් ප්‍රජනන හැකියාව, භූමි ප්‍රමාණය, යැපුම් මාධ්‍ය යන සංකල්ප මත තර්කණයේ යෙදෙමින් ජනගහන වර්ධනය හා ආර්ථික සංවර්ධනය පිළිබඳ සුබවාදී තර්කණය ප්‍රතික්ෂේප කරන ලදී (ප්‍රනාන්දු, 2008).

මැල්තුසියානු න්‍යාය විවේචනය කෙරෙමින් හා එම න්‍යාය පිළිගනිමින් ගොඩනැගුණු අදහස් පශ්චාත් මැල්තුසියානු වාදයන් ලෙසට හඳුන්වා ගත හැකිය. ජනගහන වර්ධනය නිෂ්පාදනය පහත හෙළීමට හේතු සාධකයක් ලෙස අදහස් ඉදිරිපත් කළ නව සම්භාව්‍යවාදී න්‍යායන් මෙන් ම ජන සංඛ්‍යාව හා සම්පත් අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ ව අදහස් ඉදිරිපත් වූ ප්‍රශස්ත ජනගහන න්‍යාය වැනි න්‍යායන් පශ්චාත් මැල්තුසියානු යුගයට අයත් වේ (ප්‍රනාන්දු, 2008).

රටක ජනගහන ව්‍යාප්තිය කාලානුරූප ව වෙනස් වන ආකාරය අනුව ජනගහන විද්‍යාඥයින් අවධි 4ක් 'ප්‍රජා විද්‍යාත්මක සංක්‍රාන්ති අවධි' ලෙසට හඳුන්වා දී ඇත.

01 පළමු අවධිය - උපත් හා මරණ අනුපාතිකයන් ඉහළ යයි. 1946 පෙර කාලයේ දී ශ්‍රී ලංකාව මෙම අවධියට අත් වූ බව හඳුනා ගැනේ.

02 දෙවන අවධිය - උපත් අනුපාතිකය ඉහළ යන අතර මරණ අනුපාතිකය ක්‍රමයෙන් අඩු වීමට පටන් ගනී. මේ අවධියේ දී සීඝ්‍ර ජනගහන වර්ධනයක් පෙන්නුම් කරයි. මරණ අනුපාතිකය අඩු වීම කෙරෙහි සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු වීමත් හේතු විය. 1947 සිය 1990 දක්වා කාලයේ දී ශ්‍රී ලංකාව මෙම අවධිය පසු කරන ලදී.

03 තුන්වන අවධිය - මරණ අනුපාතය මෙන් ම උපත් අනුපාතය ද මෙම අවධිය තුළ දී අඩු වීමට පටන් ගැනෙයි. මේ හේතුවෙන් වයස්ගත වූවන්ගේ ප්‍රමාණය වැඩිවීමක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාව වර්තමානයේ දී මෙම අවධිය පසුකරමින් ඇත.

04 හතරවන අවධිය - උපත් හා මරණ අනුපාතිකයන් පහත් මට්ටමකට පත් ව ස්ථාවර වීමක් මෙම අවධියේ දී හඳුනා ගත හැකිය. ශ්‍රී ලංකාව මෙම අවධිය වෙත ළඟාවෙමින් පවතී (චතුරංග, 2011).

**ජන සංඛ්‍යාව තීරණය කෙරෙන සාධක**

රටක ජන සංඛ්‍යාවේ  වර්ධනය, ව්‍යාප්තිය හා සංයුතිය තීරණය කෙරෙන සාධක තුනක් පහතින් දැක්වේ.

01 සාඵල්‍යතාව

02 මර්ත්‍යතාව

03 සංක්‍රමණ

01 සාඵල්‍යතාව

කාන්තාවකට තම ජීවිත කාලය තුළ ලබා දිය හැකි දරු උපත් සංඛ්‍යාව ජනගහනයේ සාඵල්‍යතා අනුපාතය ලෙසින් හැඳින්වේ. සාඵල්‍යතා අනුපාතය පහළ වැටීම නිසා ළමා ජනගහනය අඩු වන අතර වියපත් ජනගහනයේ ප්‍රතිශතය ඉහළ යයි. එයට ප්‍රතිපක්ෂ ව ක්‍රමානුකූල ව තරුණ හා ළමා ජනගහනය අඩු වේ. ශ්‍රී ලංකාවේ සාඵල්‍යතා අනුපාතය වර්තමානයේ දී සැලකිය යුතු ලෙස පහත වැටී ඇති අතර වියපත් ජනගහනය වැඩි වී ඇත. එයට හේතු වී ඇත්තේ කාන්තා අධ්‍යාපනය ඉහළ යාම, සෞඛ්‍ය සේවා වැඩි දියුණු වීම හා ව්‍යාප්තිය, සේවා නියුක්තිය ඉහළ යාම හා ආර්ථික ක්‍රියාකාරකම්වල ව්‍යුහමය වෙනස්කම් ඇති වීම මෙන් ම කෘෂි හා නිෂ්පාදන අංශයෙන් සේවා අංශයට විතැන් වීම ලෙසට හැඳින්විය හැකිය (ප්‍රියදර්ශන, 2012). සාඵල්‍යතා අනුපාතය වැඩිවීම ආර්ථික සංවර්ධනය කෙරෙහි ඍණාත්මක ආකාරයෙන් බලපායි. වැඩි වන ජන සංඛ්‍යාවේ ඉල්ලුම හා සැපයුමට අදාළ ව ආර්ථික කටයුතු ද හැසිරවිය යුතුය. නැතිනම් ආර්ථික සංවර්ධනය අත්පත් කර ගැනීම අසීරු කටයුත්තක් බවට පත් වේ.

02 මර්ත්‍යතාව

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව මරණය යනු සජීවී උපතකින් පසු ඕනෑම අවස්ථාවක දී තම ප්‍රාණය ස්ථිර වශයෙන් නිරුද්ධ වීමයි. වෛද්‍ය විද්‍යාවට අනුව මරණය යනුවෙන් හඳුන්වන්නේ ශ්වසන පද්ධතිය සහ රුධිර සංසරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වය අඩාල වීමයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මර්ත්‍යතාවය කෙරෙහි බලපානු ලබන සාධක දෙකක් හඳුන්වා දී ඇති අතර ඒවා නම් ජීව විද්‍යාත්මක සාධක සහ ප්‍රජා විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක සාධක වේ (මධුභාෂිණී, 2016).

යම් කාලයක් තුළ දී සලකා බලනු ලබන ප්‍රදේශයක කිසියම් කාලයක් තුළ සිදු වන මරණ සංඛ්‍යාව මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් බෙදීමෙන් ලැබෙන අනුපාතය තුළින් මර්ත්‍යතාවය ප්‍රකාශ කරයි. 1950 සිට ශ්‍රී ලංකාවේ මර්ත්‍යතාවය ද සැලකිය යුතු ලෙස අඩුවෙමින් පවතී. 1950-1955 දී 19.8 ක් වූ මර්ත්‍යතාව 2005-2010 වන විට 6.5 ක් බවට පත් විය. ඒ සඳහා බලපා ඇති හේතු රැසකි. සෞඛ්‍ය අංශයේ සංවර්ධනය හා පෞද්ගලික අංශය ප්‍රසාරණය වීම, ව්‍යාප්ත වන රෝග සඳහා අත්‍යවශ්‍ය පියවර රැසක් ගෙන තිබීම, උදාහරණ වශයෙන් 1870 කොලරා රෝගය සහ 1940 මැලේරියාව රෝග පාලනයටත් කටයුතු කිරීම, සෞඛ්‍ය අංශය තුළ දියුණු තාක්ෂණික ක්‍රම භාවිතය සහ පවුල් සෞඛ්‍ය සේවිකාවන් විධිමත් ආකාරයෙන් පුහුණු කිරීම ආදීයයි (ප්‍රියදර්ශන, 2012). මර්ත්‍යතාවය අඩුවීම තුළින් විශේෂයෙන් ම වයස්ගත ජන සංඛ්‍යා වර්ධනයක් සිදු විය හැකි බැවින් සුබසාධන කටයුතු හා සෞඛ්‍ය පහසුකම් වෙනුවෙන් රටක ආර්ථිකය තුළින් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කිරීමට සිදු වේ.

03 සංක්‍රමණ

එක්සත් ජාතීන්ගේ සංවිධානය පවසන ආකරයට සංක්‍රමණය යනු එක් භූගෝලීය ප්‍රදේශයක සිට තවත් භූගෝලීය ප්‍රදේශයක් දක්වා ස්ථිර පදිංචිය වෙනස් කරමින් සිදු කරනු ලබන සංක්‍රමණයයි. පුද්ගලයෙකුගේ ජීවිත කාලය තුළ සිදු වන සංක්‍රමණ ප්‍රමාණාත්මක ව ගණනය කිරීම අපහසු වුව ද සංක්‍රමණය වන කණ්ඩායමේ ස්ත්‍රීපුරුෂ බව, වයස, රැකියාව, සංස්කෘතික විවිධත්වය ආදිය රටක ආර්ථිකය කෙරෙහි බලපෑම් කරනු ලබයි (මධුභාෂිණී, 2016).

ශ්‍රී ලංකාවේ ජනගහනයේ සංක්‍රමණ 1871-1963

වගුව 01

| වර්ෂය | ස්වාභාවික වෘද්ධිය | සංක්‍රමණ වෘද්ධිය |
|---|---|---|
| 1871 - 1881 | 33.3 | 66.7 |
| 1881 - 1891 | 58.2 | 41.8 |
| 1891 - 1901 | 40.4 | 59.6 |
| 1901 - 1911 | 65.9 | 34.1 |
| 1911 - 1921 | 81.4 | 18.6 |
| 1921 - 1931 | 81.3 | 18.7 |
| 1931 - 1946 | 94.8 | 5.2 |
| 1946 - 1953 | 94.6 | 5.4 |
| 1953 - 1963 | 100.9 | -0.9 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2010

1871 - 1901 දක්වා කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ ජනගහනය වර්ධනය වීම කෙරෙහි වැඩි දායකත්වයක් දක්වනු ලැබුයේ ස්වාභාවික වෘද්ධියට වඩා සංක්‍රමණ වෘද්ධියයි. 1871 - 1881 යනු ලංකාවේ කෝපි වගාවේ සමෘද්ධිමත් යුගය වූ නිසා ඉන්දියානු දමිළ ජාතිකයින් විශාල සංඛ්‍යාවක් ශ්‍රමිකයන් ලෙස ශ්‍රී ලංකාවට සංක්‍රමණය විය. නමුත් 1939 දී ඉන්දියානුවන් මෙරටට ආගමනය තහනම් කළ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා රජය අනුගමනය කිරීම නිසාත්, 1948 අංක 20 දරණ ආගමන සහ විගමන පනත හේතුවෙන් 1871 - 1946 කාලය තුළ ආගමන මඟින් ජන සංඛ්‍යාවට එකතු වූ ප්‍රතිශතය සීඝ්‍ර ලෙස අඩු විය (ජයකොඩි, 2008).

1971 - 1981 කාල සීමාව තුළ දී සංක්‍රමණ -26.5% ලෙස සටහන් විය. ශ්‍රී ලංකාවෙන් සංවර්ධිත රටවලට වූ බුද්ධිගලනය මේ සඳහා ප්‍රධාන හේතුවක් විය. පසුකාලීන ව විදේශ සේවා නියුක්තිය සඳහා පිටත් ව යාමත් මේ සඳහා බලපෑමක් විය. 2015 වර්ෂයේ දී ශුද්ධ සංක්‍රමණ අනුපාතය 0.7 කි. 2012 වර්ෂයේ දී දිස්ත්‍රික්ක 25 ඇතුළට සංක්‍රමණ සැලකීමේ දී අඩුම අගය වූ 18.9 යාපනයෙන් ද වැඩිම අගය වූ 602.8 කොළඹ දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය (මධුභාෂිණී, 2016). සංක්‍රමණ තුළින් ජන සංඛ්‍යාවේ වර්ධනයන් සිදු විය හැකි අතර සංක්‍රමණිකයන්ගේ සුබසාධන කටයුතු සඳහා ද ඇතැම් රටවලට අනපේක්ෂිත ආකාරයෙන් මුදල් වෙන් කිරීමට ද සිදු වේ.

## ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය

ජන සංඛ්‍යාව වර්ධනය වීම යනුවෙන් හඳුන්වන්නේ නිශ්චිත භූමි ප්‍රමාණයක ජීවත් වන පුද්ගලයින් සංඛ්‍යාව වැඩිවීමයි. 1871 දී ශ්‍රී ලංකාව තුළ පවත්වන ලද ප්‍රථම සංගණනයේ දී මිලියන 2.4 ක් වූ ජන සංඛ්‍යාව 2012 වන විට මිලියන 20.2 ක් බවට පත් විය. ක්‍රි.ව. 1871 සිට 1946 දක්වා කාලය තුළ ජන සංඛ්‍යාව ඉතා සෙමින් වර්ධනය වී ඇති අතර 1946 න් පසු ජන සංඛ්‍යා වර්ධනය වඩා වේගවත් වී ඇත. ඉහළ ම වාර්ෂික වර්ධන අනුපාතිකයක් වූ 2.8%, 1946-1953 කාලසීමාව තුළ වාර්තා වූ අතර එය ක්‍රමයෙන් අඩු වී 2012 දී වාර්ෂික වර්ධන අනුපාතිකය 0.7ක් බවට පත් විය (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්ථමේන්තුව, 2012).

1953 සිට අද දක්වා රටෙහි ජනගහන වර්ධන අනුපාතිකය පහත වැටීමට හේතු වී ඇත්තේ රටෙහි උපත් අනුපාතිකය පහත වැටීමය. මේ තත්ත්වයන්ට හේතු සාධක වී ඇත්තේ පසුගිය සියවස මැදභාගයේ සිට සාක්ෂරතාවයෙහි වර්ධනය, ස්ත්‍රීන් විවාහ වන වයස් සීමාව ඉහළ යාම, රජය මැදිහත් වීමෙන් විවිධ පවුල් සැලසුම් ක්‍රම හඳුන්වා දීම, දශක තුනක පමණ කාලයක් පැවැති උතුරු-නැගෙනහිර යුද්ධය හේතුවෙන් රටෙන් පිටතට ජනතාව සංක්‍රමණය වීම, දරුවන් ලබන වයසෙහි කාන්තාවන් වැඩි වශයෙන් මැදපෙරදිග රැකියා සඳහා පිටත් ව ගොස් තිබීම ආදිය වේ (පෙරේරා, 2015).

ජන සංඛ්‍යාවේ විශාලත්වය හා වර්ධනය 1871 - 2012
ප්‍රස්ථාරය 01




මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්ථමේන්තුව, 2012

ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය කෙරෙහි බලපාන ලද ප්‍රාදේශීය වෙනස්කම් රාශියක් පවතී. වියළි කලාපය තුළ තෙත් කලාපයේ දිස්ත්‍රික්කවලට වඩා වැඩි වාර්ෂික ජන සංඛ්‍යා වර්ධනයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වාර්ෂික ජන සංඛ්‍යා වර්ධන අනුපාතිකය 0.7% ක් පමණ වුව ද එය අනුරාධපුර දිස්ත්‍රික්කයේ 1.33% ක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ 1.17% ක් මොනරාගල දිස්ත්‍රික්කයේ 1.15% ක් ලෙස ඉහළ අගයක් ගනී. තෙත් කලාපයේ කොළඹ 0.35%, නුවරඑළිය 0.05%, බදුල්ල 0.39% ලෙස අඩු ජන සංඛ්‍යා අනුපාතිකයක් පෙන්නුම් කරයි. එසේ වුව ද තෙත් කලාපයට අයත් බස්නාහිර පළාතේ කළුතර 1.23% සහ ගම්පහ 1.02% ලෙසට වැඩි ජන සංඛ්‍යා වර්ධන වේගයක් පවතින දිස්ත්‍රික්ක ලෙසට හඳුනා ගත හැකිය. මෙම දිස්ත්‍රික්ක දෙකෙහි ජන සංඛ්‍යා වර්ධන වේගය ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත්තේ කොළඹට ආසන්න දිස්ත්‍රික්ක වීම සහ ජන සංක්‍රමණ හේතුවෙනි (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012).

**ජන සංඛ්‍යා වර්ධනය හා ශ්‍රම බලකාය**

ශ්‍රම බලකාය යනු කිසියම් රටක, රැකියාවක් කිරීමට හැකියාවක් ඇති, රැකියාවක් කිරීමට හැකි, දැනටමත් රැකියාවක් කරමින් සිටින හා රැකියාවක් අපේක්ෂාවෙන් සිටින පුද්ගලයන් වේ (ශ්‍රම බල සමීක්ෂණ වාර්තාව, 2014). ජන සංඛ්‍යාව වැඩි වන විට ශ්‍රම බලකායට එකතු වන පිරිස ද වැඩි වන අතර එය රටෙහි ආර්ථික ක්‍රියාවලියට ද බලපෑමක් ඇති වේ. 1960 ගණන්වල දී ශ්‍රී ලංකාවේ වැඩි වුන ජන සංඛ්‍යාවට සාපේක්ෂ ව ශ්‍රම බලකාය ද වැඩි වුන අතර එයට සාපේක්ෂ ව රැකියාවන් වර්ධනය නොවීම හේතුවෙන් රට තුළ වර්තමානයේ දී සේවා වියුක්තියක් ඇති විය. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 53.8% වන අතර 4.2%ක පමණ සේවා වියුක්ති තත්ත්වයක් පවතින ශ්‍රී ලංකාව තුළ අද වනවිට පවතින ශ්‍රම බලකායෙන් රටෙහි සංවර්ධනය සඳහා දායකත්වයක් ලබා ගන්නා බව නොපෙනේ (මධුභාෂිණී, 2016).

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය 2015 -2019

වගුව 02

| අයිතමය | 2015 - % | 2016 - % | 2017 - % | 2018 - % | 2019 - % |
|---|---|---|---|---|---|
| වයස් කාණ්ඩය | | | | | |
| 15 - 19 | 15.0 | 13.8 | 13.3 | 11.7 | 12.0 |
| 20 -24 | 55.5 | 55.6 | 57.4 | 53.2 | 54.9 |
| 25 -29 | 65.4 | 65.8 | 67.6 | 66.3 | 68.1 |
| 30 -39 | 67.4 | 67.6 | 68.1 | 66.0 | 67.6 |
| 40ට වැඩි | 54.0 | 54.4 | 54.6 | 52.8 | 52.6 |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020

මේ අනුව ශ්‍රම බලකාය ආර්ථික වශයෙන් පරිපූර්ණ පිරිසක් නොවීම හේතුවෙන් ආර්ථික ප්‍රශ්න වැඩි වීම, නීතිවිරෝධී ක්‍රියාවන් වෙත යොමු වීම, මානසික පීඩාවන්වලින් යුතු වීම, කැරලි කෝලාහල ඇති වීම ආදීය අහිතකර තත්ත්වයන් ලෙසට හඳුනා ගත හැකිය. වැඩි වන ජන සංඛ්‍යාවට සාපේක්ෂ ව විධිමත් ආකාරයෙන් ශ්‍රම බලකාය සක්‍රීය ලෙස ආර්ථික ක්‍රියාවලියට දායක කර ගැනීමට නම් රැකියා වෙළෙඳපොළ ප්‍රසාරණය කළ යුතුය. අධ්‍යාපන මට්ටමට සරිලන නව රැකියාවන් නිර්මාණය කළ යුතුය. පෞද්ගලික අංශය තුළින් ආකර්ශනීය රැකියා අවස්ථාවන් හඳුන්වා දිය යුතුය. 2012 ජන සංගණනයට අනුව ආර්ථික කටයුතුවල නියුතු ජන සංඛ්‍යාවෙන් වැඩි පිරිසක් පුරුෂයින් වන අතර පුරුෂ මූලික රැකියා අවස්ථා ද බහුල වේ. එහෙයින් කාන්තාවන් ද ආර්ථික ක්‍රියාවලියේ දී සක්‍රීය ලෙස දායක කර ගත යුතු අතර ඔවුන්ට සරිලන රැකියා අවස්ථාවන් නිර්මාණය කළ යුතුය. ආයෝජන කලාප සහ කර්මාන්ත ක්ෂේත්‍රයන් ප්‍රවර්ධනය කිරීම තුළ ආර්ථික කටයුතුවල නියැලීමට ශ්‍රම බලකායට වැඩි අවස්ථාවක් උදා වේ.

**ජන සංඛ්‍යා වර්ධනය හා ඒක පුද්ගල ආදායම**

රටක ජන සංඛ්‍යාව යනු එම රට සතු වටිනාම මානව සම්පත වේ. රටක ආර්ථික ක්‍රියාවලියේ දී ප්‍රමුඛ කාර්යයන් සිදුවන්නේ මානවයාගේ ප්‍රමුඛත්වයෙනි. එහෙයින් කුසලතාවලින් පරිපූර්ණ මානව සම්පතක් තුළින් රටක ආර්ථික වර්ධනයක් අත්පත් කර ගත හැකි අතර මෙම ද්විත්වය අතර මනා සම්බන්ධතාවයක් ද පවතින බව පැහැදිලිය. ශ්‍රී ලංකාව තුළ ජන සංඛ්‍යාව ක්‍රමික ව වර්ධනය වීමත් සමඟ ඒක පුද්ගල ආදායමට ඇති කෙරෙන බලපෑම පහත සේ හඳුනා ගත හැකිය (මධුභාෂිණී, 2016).

ඒක පුද්ගල ආදායම 1980 - 2015

වගුව 03

| වර්ෂය | ජනගහනය | ඒක පුද්ගල ආදායම (ඇ.එ.ඩො) |
|---|---|---|
| 1980 | 14747000 | 273 |
| 1990 | 17015000 | 472 |
| 2000 | 19102000 | 869 |
| 2010 | 20675000 | 2744 |
| 2015 | 20966000 | 3924 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, 2015

නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ සාඵල්‍යතා අනුපාතය ඉහළ මට්ටමක පැවති බැවින් ජන සංඛ්‍යාව ද ක්‍රමයෙන් වැඩි විය. කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන කටයුතුවල විකාශනයත් සමඟ ජනතාවගේ ඒක පුද්ගල ආදායම ද ක්‍රමයෙන් වැඩිවිය. ඒ අනුව ඉහළ පරිභෝජන අවස්ථාවන් වෙත යොමු වීම, ජීවන මට්ටම උසස් තත්ත්වයකට පත් වීම, ඉතිරි කිරීම් සඳහා යොමු වීම, ජනතාව තුළ සුබවාදී ආකල්ප ඇති වීම සහ රැකියා අවස්ථා වැඩි වශයෙන් නිර්මාණය වීමත් සිදුවේ.

2015 න් පසුව ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම සැලකීමේ දී 2018 වර්ෂයේ ඩොලර් 4079 ක් සහ 2019 දී ඒක පුද්ගල ආදායම ඩොලර් 3852 දක්වා අඩු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ලංකාව ඉහළ මැදි ආදායම් මට්ටමේ සිට පහළ මැදි ආදායම් මට්ටම දක්වා පහතට වැටිණි. මෙහි ප්‍රතිඵලය වන්නේ දේශීය නිෂ්පාදිතය පහත වැටීමයි. ජන සංඛ්‍යාව වසරක් පාසා වැඩි වුව ද ඔවුන් ආර්ථික කටයුතුවල දායක නොවුනහොත් ඒක පුද්ගල ආදායම, ඔවුන්ට ජීවිකාව ගත කිරීමට තරම් ප්‍රමාණවත් නොවේ (රාජරත්න, 2020).

**ජන සංඛ්‍යා වර්ධනය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ**

කුටුම්භ, සමාගම් සහ රජය යන සියලු අංශවලට ප්‍රාග්ධනය අවශ්‍ය වේ. ජන සංඛ්‍යාවේ වර්ධනය ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ඉල්ලුම සහ සැපයුම කෙරෙහි බලපායි. වර්තමානය තුළ ශ්‍රී ලංකාවේ රැකියා අවස්ථාවන් අඩුවීම, නිවාස හා යටිතල පහසුකම් කෙරෙහි පවතින ඉල්ලුම ද අඩු වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව තුළ මේ වන විට වයස්ගත පුද්ගලයින් ඉහළ අගයක් ගැනීම හේතුවෙන් ද ප්‍රාග්ධනය සඳහා පවතින ඉල්ලුම ද පහළ බසී. ශ්‍රම

බලකාය ආර්ථිකමය වශයෙන් පහත වැටීමත්, වයස්ගත ජන සංඛ්‍යාව වර්ධනය වීමත් තුළ මෙරට ඉතුරුම් අනුපාතය ද පහළ අගයක් ගනී.

ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ඉල්ලුම හා සැපයුම ශක්තිමත් කිරීමට නම් ආයෝජන දිරිමත් කළ යුතුය. ඒ ආශ්‍රිත වන රැකියා නිර්මාණය කළ යුතුය. විදෙස් ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම සඳහා උචිත වැඩපිළිවෙළක් සකස් කර ගත යුතුය. වැඩිහිටි ජන සංඛයාව තුළින් ලබා ගත හැකි 'උපදේශන සේවාවන්' වැනි සමාජයට හිතකර කාර්යයන් වෙත අවධානය යොමු කළ යුතුය.

**ජන සංඛ්‍යා වර්ධනය හා නිෂ්පාදන කටයුතු**

රටක් ආර්ථික වශයෙන් දියුණු තත්ත්වයකට පත් වීමට නම් නිෂ්පාදන කටයුතු ඉතාමත් ප්‍රශස්ත මට්ටමක පැවතිය යුතුය. ආනයනයට වඩා අපනයන කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. වර්තමානය වනවිට ග්‍රාමීය ප්‍රදේශවලින් ජනතාව කොළඹ ආශ්‍රිත තදාසන්න ප්‍රදේශවල සේවා අංශයේ රැකියා කටයුතුවලට සංක්‍රමණය වීමත් සමඟ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා සඳහා අවම සහභාගීත්වයක් පවතී. මේ හේතුවෙන් රටට අවශ්‍ය සහල් පවා පිටරටවලින් ආනයනය කිරීමට සිදු ව ඇත. ශ්‍රී ලංකාවේ වැඩි වන ජන සංඛ්‍යාව තුළ වයස්ගත පුද්ගලයන් වැඩිවන බැවින් නිෂ්පාදන කටයුතු කෙරෙහි යොමු වන ශ්‍රම බලකායේ අඩුවක් දැකිය හැකිය. කර්මාන්ත කටයුතු සඳහා අවශ්‍ය වන්නේ ශක්තිමත් නිරෝගී තරුණ පිරිසක් වන බැවින් නිෂ්පාදන කාර්යයන් සාර්ථක කර ගැනීමේ දී වයස්ගත ජන සංඛ්‍යාව වැඩිවීම ගැටලුවක් බවට පත් වේ. නිෂ්පාදනයන් තුළින් වැඩි වාසි අත්පත් කර ගැනීම සඳහා විවිධ නිර්මාණශීලී උපදෙස් ලබා ගැනීමට මෙන් ම නිෂ්පාදනයන්හි ගුණාත්මකබව පරීක්ෂා කිරීම සඳහා මානව සම්පත පුහුණු කිරීමේ හැකියාවක් ද පවතී. එතුළින් නව රැකියා උත්පාදය කර ගැනීමටත් අපනයන ක්ෂේත්‍රය දියුණු කර ගනිමින් ආර්ථික වාසි අත්පත් කර ගැනීමට ද හැකියාව ලැබේ.

**ජන සංඛ්‍යා වර්ධනය හා සෞඛ්‍ය ක්ෂේත්‍රය**

රටක ජන සංඛ්‍යාව වැඩිවීමත් සමඟ ආර්ථික සංවර්ධනය තුළ වැඩි මුදල් ප්‍රමාණයක් සුබසාධන කටයුතු සඳහා වැය කිරීමට සිදුවන්නේ සෞඛ්‍ය කටයුතු දියුණු කිරීම සඳහාය. ජන සංඛ්‍යාව වැඩිවීමේ දී බෝ වන සහ බෝ නොවන රෝග සඳහා ජනතාව ගොදුරු වීමේ දී රෝහල් පහසුකම් දියුණු කළ යුතුය. වෛද්‍යවරුන් ඇතුළු රෝහල් කාර්යය මණ්ඩල සඳහා බඳවා ගැනීම්, පුහුණු කිරීම් වැඩි කළ යුතුය. ඖෂධ පිටරටවලින් ආනයනය කළ යුතුය. මේ

වෙනුවෙන් වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කළ යුතුය. ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ දී වැඩිහිටි ජන සංඛ්‍යාව වැඩිවීමත් සමග ඔවුන්ගේ රෝගී තත්ත්වයන් සහ ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රතිකාරවල ස්වභාවයන් ද බොහෝ සේ වෙනස් වේ. විශේෂිත හා වෘද්ධ චිකිත්සාව සහිත සෞඛ්‍ය පහසුකම් මෙන් ම වියපත් බව වැඩිවීමත් සමග Chronic වැනි රෝගී තත්ත්වයන් සඳහා ද විශාල පිරිවැයක් දැරීමට සිදු වේ (සටහන, 2012).

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක, වයස් ව්‍යුහයේ සහ ජීවිත අපේක්ෂාවේ වෙනස්කම් මත සෞඛ්‍ය අංශය දියුණු කිරීම සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කිරීම අපහසුය. භාණ්ඩ, සේවා හා ප්‍රාග්ධනය සඳහා වූ සමස්ත සෞඛ්‍ය වියදම 1990 දී රුපියල් බිලියන 12 සිට 2008 වන විට රුපියල් බිලියන 154 දක්වා වැඩි වී ඇත (National Health Expenditure, 2008). එය දළ ජාතික නිෂ්පාදිතයෙන් 3.% පමණ වේ. එමෙන් ම සෞඛ්‍ය සේවාවන් වෙනුවෙන් ශ්‍රී ලංකා රජය දරනු ලැබූ මුළු පිරිවැය 1990 දී පැවැති රුපියල් බිලියන 5 ක මුදල, 2010 වන විට රුපියල් බිලියන 74 ක් දක්වා වැඩි වී ඇත (ශ්‍රී ලංකා මහ බැංකු වාර්තා, 2010).

ඒ අනුව රටක වැඩි වන ජන සංඛ්‍යාවේ සෞඛ්‍ය සම්පන්නභාවයත් එරට ආර්ථික සංවර්ධනයත් අතර ඍජු සම්බන්ධතාවයක් පවතී. සෞඛ්‍ය කටයුතු වෙනුවෙන් වැඩි මුදල් ප්‍රමාණයක් යෙදවීමට නොහැකි වුවහොත් මානව ප්‍රාග්ධනය රෝගී බවට පත්වෙමින් එරට ආයු අපේක්ෂාව ද ක්‍රමයෙන් අඩු වීමට පටන් ගනී. එසේම සියලු කර්තව්‍යයන්හි සාර්ථකත්වයට මෙන් ම ආර්ථික සංවර්ධනය සඳහා ද නිරෝගීමත් මානව ප්‍රජාවක් අත්‍යවශ්‍ය වේ.

**සමාලෝචනය**

රටක ජන සංඛ්‍යාව වර්ධනය වීම ක්‍රමානුකූල ව සිදු වන අපේක්ෂිත ප්‍රතිඵලයක් මෙන් ම එම ද්විත්වය අතර අඩුවැඩි ලෙස සෑම ආකාරයකින් ම සම්බන්ධතා පවතී. ජන සංඛ්‍යාවේ විශාලත්වය, සංයුතිය, වයස් කාණ්ඩය, අවකාශීය විශාලත්වය යන කරුණු සැලකිල්ලට ගෙන ඉල්ලුම හා සැපයුම තීරණය කිරීම අවශ්‍ය වේ. එමෙන් ම වැඩි වන ජනසංඛ්‍යාව පාලනය කිරීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කළ යුතුය. රටක ජනසංඛ්‍යාව හිතකර ආකාරයෙන් පාලනයකින් යුතු ව වර්ධනය වන විට ආර්ථික ක්‍රියාවලිය හසුරුවා ගැනීම ද ඉතාමත් පහසු වේ. උසස් තත්ත්වයකින් යුතු මානව ප්‍රාග්ධනයක් රටකට බරක් නොවන අතර ඒ හා සාපේක්ෂ ව ආර්ථික සංවර්ධනයක් අත්පත් කර ගැනීම උදෙසා නිවැරදි ආකාරයෙන්

ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුය. එවිට ජනසංඛ්‍යාවේ වර්ධනය තුළින් ආර්ථිකයට සිදු විය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කර ගත හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. අබේකෝන්, ඒ. ටී. පී. එල්, (1999), ශ්‍රී ලංකාවේ ජනගහනය වයස්ගත වීම, ආර්ථික විමසුම
2. කල්බදු සරණය, (2012), සටහන, ශ්‍රී ලංකා මහ බැංකුව, සන්නිවේදන දෙපාර්තමේන්තුව
3. චතුරංග, සී. ඩී, (2011), ශ්‍රී ලංකාවේ ජනගහන උපනතීන් හා අනාගත අභියෝග, සන්තති ශාස්ත්‍රීය සංග්‍රහය, සිව්වන වෙළුම, කැලණිය විශ්වවිද්‍යාලය
4. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, (2012), ජන හා නිවාස සංගණනය, කොළඹ
5. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, (2015), සංඛ්‍යාන නිබන්ධනය, කොළඹ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය
6. දිසානායක, ලක්ෂ්මන්, (2019), වියපත් ජනගහනය රටේ සංවර්ධනයට, dinamina.lk
7. පෙරේරා, පී. ජී. ටී. එන්, නුගලියැද්ද ඩී. ආර්. කේ, සේනාරත්න ඒ. ඩී. වයි, (2015), ශ්‍රී ලංකාවේ ජන සංයුතියේ ව්‍යුහාත්මක වෙනස්කම්, Jornal of Social Statistics
8. මධුභාෂිණී, ඒ. ඒ. පී. එම්, (2016) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි ජනගහන වර්ධනය ඇති කෙරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්, Jornal of Social Statistics
9. රාජරත්න, මිල්ටන්, (2020), ඉහළ-මැදි ආදයමේ සිට පහළ-මැදි ආදායමට හෙලා යහපාලනය රට දුප්පත් කළා, Colombo Telegraph
10. ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන, (2020), ශ්‍රී ලංකා මහ බැංකුව
11. සමාජ හා සංඛ්‍යාන අධ්‍යයන අංශය, (2019), සමාජ හා සංඛ්‍යාන ශාස්ත්‍රීය සංග්‍රහය, හයවන වෙළුම, පළමු වන කලාපය, කැලණිය විශ්වවිද්‍යාලය
12. Central Bank of Sri Lanka, (2016), Economics and Social Statistics of Sri Lanka, Colombo, Central Bank of Sri Lanka

# ශ්‍රී ලංකාවේ ශ්‍රම අනාගතයේ තාක්ෂණික පරිවර්තනය මෙරට සංවර්ධනය කෙරෙහි ඇති කරන අභියෝග

කේ.ඒ. ඊෂානි උපේක්ෂා කොඩිතුවක්කු
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
ieshanikodi1996@gmail.com

## සංක්ෂේපය

දියුණු වෙමින් පවත්නා වත්මන් ගෝලීය ක්‍රියාවලිය තුළ තාක්ෂණික අංශයන්ගේ පරිවර්තනය සෑම අංශයකින්ම සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. එය ශ්‍රී ලංකාව තුළ කම්කරු, නිශ්පාදන, සේවා, සංචාරක, වෙළඳපොළ, අධ්‍යාපන, කෘෂිකර්මාන්තය කෙරෙහි විවිධ අයුරින් බලපෑම් ඇති කරයි. මෙලෙස ඇතිවන බලපෑම ප්‍රබල ලෙස බලපානු ලබන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රම අනාගතය කෙරෙහිය. ඒ අනුව ද්විතික දත්ත මත පදනම් වෙමින් දත්ත විශ්ලේෂණය සිදු කරමින් පවත්නා තත්ත්වයන් හදුනා ගැනීම සිදු වුණි. එමෙන්ම තාක්ෂණික පරිවර්තනය තුළින් ඇතිවන  අභියෝගයන්ට විසඳුම් ලබා දිය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සිදු වූ අතර සුභවාදී තාක්ෂණික ප්‍රවේශයන් හරහා අභියෝග ජය ගත හැකි වීම මෙම අධ්‍යයනයේ ප්‍රධානතම වැදගත්කමයි.

මුඛ්‍ය පද - ශ්‍රම අනාගතය, තාක්ෂණය, පරිවර්තනය, සංවර්ධනය, අභියෝග

## හැදින්වීම

වර්තමානයේ රැකියා ලොකයේ සිදුවන තාක්ෂණික පරිවර්තනය මෙරට ශ්‍රම අනාගතයේ දැවැන්ත පරිවර්තනයකට ලක් වෙමින් පවතී. එය සෘජුව මෙරට සංවර්ධනය කෙරෙහි අභියෝග ඇති කිරීමට සමත් වන්නකි. මෙරට රැකියා ලෝකය දැවැන්ත පරිවර්තනයකට මේ හරහා ලක් වීමට ඇති  හැකියාව ඉහළය. මෙම තාක්ෂණික පරිවර්තනය ඇතිවීමට බලපෑ ප්‍රධාන හේතු සාධක කිහිපයක් වර්තමානයේ දී හඳුනා ගත හැකිය.

1. තාක්ෂණික දියුණුව
2. ජන සංයුතියේ වෙනස්කම්

3. වෙනස්වන දේශපාලන සංස්කෘති

4. සේවා නියුක්ති සහ නිෂ්පාදන වෙනස් වීම්

මෙවැනි කරුණු රැසක බලපෑම් හේතුවෙන් මිනිසා ජීවත්වන ස්වභාවය සහ ඔවුන්ගේ හැකියාව සහ ස්වභාවය පෙර අපේක්ෂා නොකළ පරිදි වෙනස්කම් වෙත අවතීර්ණ වෙමින් පවතී. කෘතිම බුද්ධිය ,ස්වයංක්‍රීයකරණය සහ රොබෝ තාක්ෂණය ආදී ඩිජිටල් තාක්ෂණික ක්‍රමවේද තුළ අනාගත ශ්‍රම බලකාය දෝලනය වන අතර එම ක්‍රමවේද හතරවන කාර්මික විප්ලවය ලෙස ද ඇතැම්හු හඳුන්වති. මෙය සුබවාදී හා අසුභවාදී පැතිකඩ මත දෝලනය වන අතර සංවර්ධනය වෙමින් පවත්නා රටක් ලෙස ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සන්දර්භයක් තුළ මෙය විමසා බැලිය යුතුය. මේ අනුව ද්විතික දත්ත මත පදනම් වෙමින් ලබාගන්නා තොරතුරු විශ්ලේෂණය කිරීම සිදු වුණි. දියුණු වන තාක්ෂණය රැකියා ලෝකයේ කෙරෙහි සිදුකරන බලපෑම බොහෝ විට හැඩ ගැසෙනුයේ සමාජ ආර්ථික ක්‍රියාකාරිත්වයට අනුකූලවය. නමුත් සංවර්ධනය වෙමින් පවත්නා රටවල්හි අනාගත රැකියා පරිසරයට මෙලෙස නැගී එන තාක්ෂණය තුළින් ඇති කරන අභියෝග පිළිබඳ එතරම් කතිකාවක් නොමැති අතර මේ තුළින් එම හිඩැස පිරවීමට ද අපේක්ෂා කෙරිණි.

සංවර්ධනය වෙමින් පවත්නා රටවල් බොහෝමයක තවමත් මූලික කාර්මික අවශ්‍යතා පුළුල් වෙමින් පවතී. දේශපාලන, ආර්ථික, සමාජ ක්‍රියාකාරීත්වය හා රැකියා ලෝකයේ තුළ සිදුකරන බලපෑම් අනුව ඒවා හැඩ ගැසෙමින් වර්ධනය වෙමින් පවතී. රටක සංවර්ධන කටයුතු ඉහළ යාමට මෙම තාක්ෂණික පරිවර්තනය මනා සේ ඉවහල් වන අතර එකී තාක්ෂණික පරිවර්තනය තව දුරටත් වර්ධනය කරගෙන යනු ලබන්නේ ශ්‍රම බලකාය විසිනි. ඕනෑම රටක ජනගහනය ආර්ථික වශයෙන් ක්‍රියාශීලී හා ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය ලෙස කොටස් දෙකකට වෙන් කළ හැක. මෙහි ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය රටක ශ්‍රම බලකාය ලෙස හඳුන්වනු ලබයි (ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව,1997). ආර්ථික වශයෙන් ක්‍රියාශීලී නොවූ හෙවත් රටක ශ්‍රම බලකායට අයත් නොවන පුද්ගලයින් වනුයේ වයස අවු:10 ට අඩු ළමයින්, පූර්ණ කාලීන ශිෂ්‍යයින්, නිවෙස්වල ගෘහ කටයුතුවල යෙදී සිටින අය වැනි ස්ව කැමැත්තෙන් රැකියා වියුක්තව සිටින පුද්ගලයින් විශ්‍රාමකයින්, ආබාධිතයින් හා ක්‍රියාකාරී රැකියාවක් අපේක්ෂා නොකරන හා සූදානම් නොවන පුද්ගලයින් ය (පාරිභෝගික මුදල් හා සමාජ සමීක්ෂණ වාර්තාව,1981/82).

යම් කිසි කාල පරිච්ජේදයකදී භාණ්ඩ හා සේවාවන් නිශ්පාදනය කිරීම සඳහා තම ශ්‍රමයෙන් දායක වී ඇති සහ දායක වීමට කැමති පුද්ගලයන්ගෙන් ශ්‍රම බලකාය සමන්විත වී ඇත. ශ්‍රම

බලකාය නිර්වචනය කර ඇත්තේ සියලුම සේවා නියුක්තිකයන් (වැටුපකට ස්වයං රැකියාවක හෝ පවුලේ සුභ සිද්ධිය සඳහා යම්කිසි ආර්ථික කටයුත්තක නියැලෙන සියලුම පුද්ගලයන්) සහ සේවා වියුක්තිකයන්ගේ එකතුව ලෙසය (නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය,1998). මේ අනුව ආර්ථික වශයෙන් ක්‍රියාශීලී ජනගහනය හෙවත් ශ්‍රම බලකාය රැකියා නියුක්ත හා රැකියා වියුක්ත පුද්ගලයින්ගෙන් සමන්විත වන අතර ආර්ථිකමය වශයෙන් ක්‍රියාශීලී නොවන ජනගහනය, ශ්‍රම බලකායට අයත් නොවූ පුද්ගලයින්ගෙන් සමන්විත වේ. මේ අනුව පැහැදිලි වනුයේ රටක අනාගත සංවර්ධනය තීරණය වනුයේ එරට වැඩකරන ජනතාවගේ ඵලදායිතාව මතය. එකී ශ්‍රම බලකා ඵලදායිතාව මත ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකා අනාගතය තීරණය වන බවයි.

මෙම තාක්ෂණික පරිවර්තනය ප්‍රබල ලෙස විහිදී යන අංශ පහත පරිදිය.

- කම්කරු ක්ෂේත්‍රය
- නිෂ්පාදන අංශය
- වෙළඳ පොල අවස්ථා
- අන්තර්ජාලය පාදක කොටගත් රැකියා
- අධ්‍යාපනය
- කෘෂිකර්මාන්තය හා පරිසරය

ඒ අනුව මෙම එක් එක් අංශ තුළ මෙම තාක්ෂණික පරිවර්තනයන් සිදු වන ආකාරය පහත පරිදි හඳුනා ගත හැකිය.

### කම්කරු ක්ෂේත්‍රය

තාක්ෂණික දියුණුවීම්වල දී කම්කරු ක්ෂේත්‍රය තුළ කම්කරුවාට ඇතිවන බලපෑම් ද වැඩි අගයක් ගනී. අනාගතයේ තාක්ෂණික ක්‍රමවේද යොදා ගැනීම හරහා ඉහළ වාණිජ අගයක් කෘෂිකාර්මික අංශයට එකතු වීම සිදු වීම මෙයට ප්‍රබල හේතු සාධකයකි. එමෙන්ම තාක්ෂණික අංශයන්ගේ නැඹුරුව යාවත්කාලීන නොවීම හේතුවෙන් අනාගතයේදී මෙරට තාක්ෂණික හැකියාව තුළින් සන්නද්ධ පුද්ගලින් අඩු වූ විට සංක්‍රමණික කම්කරුවන්ගෙන් එම අවශ්‍යතා සපුරාලීමට සිදු වනු ඇත. වර්තමානය තුළ උසස් ඉදිකිරීම් සීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගෙන ඇතත් ඉහළ පිරිවැය සහ තාක්ෂණික ක්‍රමවේද යොදා ගැනීම නිසා මෙම ක්ෂේත්‍රය මන්දගාමී වීමට හේතු වී ඇත. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ පවතින නො දැනුවත්කම නිසා මන්දගාමී වීම ඉදිකිරීම් ක්ෂේත්‍රය වර්තමානයේ දී ද මුහුණ දෙන ප්‍රධාන අභියෝගයයි.

**නිෂ්පාදන අංශය**

නිශ්පාදන අංශය සඳහා විවිධ තාක්ෂණික ක්‍රමවේද යොදා ගැනීම් නිසා නිෂ්පාදන අංශයේ රැකියාවල අඩුවීමක් හට ගැනීමට හේතු විය හැකිය. මෙය වඩාත් ඇත්තේ මැදි කුසලතා රැකියාවලයි. විශේෂයෙන්ම මෙම නැගී එන තාක්ෂණික ක්‍රමවේද ලංකාව තුළ පවතින්නේ ආරම්භක මට්ටමේ ය. මේ හේතුව මත දෑත්, ඇස් උපයෝගි කර ගනිමින් ඉක්මනින් පුහුණු කළ හැකි දැතින් සිදු කළ හැකි රැකියා තුළින් ආර්ථික ප්‍රතිලාභ ලැබෙන ප්‍රමාණය අඩු මට්ටමක් ගනු ලබයි. එම හේතු කරණ කොට පුහුණුවක් අවශ්‍ය නොවන රැකියා තාක්ෂණයට භාරදීමට අනාගතයේ දී සිදුවන අතර ඒ හරහා වැඩිවන ජනගහනයේ රැකියා අර්බුදයන් නිර්මාණය වීමට බලපානු ඇත. කෙසේ වුවත් පුහුණු වූ පමණින් ළඟා කරගත හැකි, විචාරශීලි චින්තනය අවශ්‍ය නොවන එනම් මැදි මට්ටමේ කුසලතා අවශ්‍යවන දෛනික රැකියා ඉදිරි කාලය තුළ තාක්ෂණයේ සිදුවන පරිවර්තනයන් ඉහළ යාමත් සමග වැඩි වීමේ අවදානම වැඩිය. එමෙන්ම ආහාර පිරිසැකසුම්කරණය ආදී තාක්ෂණය මුල්කර කරගත් කර්මාන්ත ඉහළම මට්ටමේ ස්වයංක්‍රීයකරණයකට ලක් වීමට ඇති හැකියාව වැඩිය.

**වෙළඳපොල අවස්ථා**

විද්‍යුත් වාණිජ තත්වයන් වෙළෙඳපොළ ක්ෂේත්‍රය වෙත පැමිණීම සිදු වීම එම ක්ෂේත්‍රය තුළ තාක්ෂණික පරිවර්තනයන් ඇති වීමට හේතුවක් වේ. නමුත් අඩු පුහුණුව ලගා ගත් තරුණ ප්‍රජාවගේ සමාජ චලනතාව සඳහා සම්ප්‍රදායික රැකියා අවස්ථා තවදුරටත් බිහි නොවීමට එය හේතුවක් වේ.. එමෙන්ම සිල්ලර වෙළදාම සඳහා යොමු වූ තරුණ ප්‍රජාවගේ විශාල පිරිසකට රැකියා අහිමි වීමේ අවදානමක් මේ හරහා ඇතිවිය හැකිය. විශේෂයෙන්ම කුඩා වැව්ලි ආශ්‍රිතව රැකියා වලින් බැහැරට ගොස් විධිමත් රැකියාවන්ට පිවිසීමට පවත්නා පහසු මග ලෙස බොහෝ තරුණ ප්‍රජාව තෝරාගන්නා සිල්ලර රැකියා ක්ෂේත්‍රයට මෙය තදින්ම බලපානු ඇත. මෙය එවන් අවස්ථාවක රැකියා අර්බුදයක් නිර්මාණය වීම කෙරෙහි තදින්ම බලපානු ඇත.

එමෙන්ම මෙම අංශ තුළ සිදුවන තාක්ෂණික පරිවර්තනය අනාගත ශ්‍රම බළකාය තුළ අවම නිපුනණතාවයක් අවශ්‍ය රැකියා විශේෂයෙන්ම සම්මත නොවන රැකියා අවස්ථා වැඩි දියුණු වීමට හේතු වේ. පූර්ණ කාලීන හා ස්ථිර රැකියා වෙනුවට අර්ධකාලීන සහ කොන්ත්‍රාත් රැකියා හඳුන්වා දීම වර්තමානය වන විට වර්ධනය වී තිබෙන අතර අක්‍රමවත් රැකියාවල නියැලීමත් වැඩිවෙමින් පවතී. සෞඛ්‍ය සහ වැඩිහිටි සේවා ආර්ථිකය මගින් සුනිසි රැකියා අවස්ථා බිහි කර ගත හැකි අතර ඒවා තාක්ෂණික මට්ටම් කරා යෑමේ අඩු අවධානමක් පවතී.

විශේෂයෙන් වෛද්‍ය, මහලු, ළමා සහ සුවතා අංශ ආදී ක්‍රියාකාරී කම්කරුවන් අවශ්‍ය කරන සේවා රැකියා මුළුමනින්ම තාක්ෂණය වීම සිදුවන්නේද නැත. මෙහි බලපෑම් බොහෝ විට අවම නිපුනණතාවයකින් රැකියාවල නිරතවන්නන් හට දැඩිව දැනෙනු ඇත.

### අන්තර්ජාලය පාදක කොටගත් රැකියා

මෙම තාක්ෂණික පරිවර්තනය අන්තර්ජාලය පාදක කොටගත් රැකියා වැඩිදියුණු වීමට ප්‍රධාන වශයෙන් හේතු වේ. අන්තර්ජාලය පාදක කොටගත් රැකියා විසින් නව අවදානම් සහිත රැකියා ක්‍රම නිර්මාණය කරනු ඇති බවටත් එමගින් සේවකයන්ගේ ජීවනෝපාය සහ හිමිකම් කැපී පෙනෙන අන්දමින් සෝදාපාළුවට ලක්ව ඇති බවටත් මතයක් පවතී. එමෙන්ම අන්තර්ජාලය හරහා බිහිවන රැකියා මගින් සාමූහික කේවල් කිරීම හා සාම්ප්‍රදායික වෘත්තීය සමිති ස්වභාවය වෙනස් වීම සිදු වීමට ඇති ඉඩකඩ වැඩිය.

මානව සම්පත් කළමණාකරණය හරහා තාක්ෂණය යොදා ගැනීම මඟින් රැකියා සංස්කෘතිය සීඝ්‍ර වෙනසකට ලක් වීමේ වැඩි ඉඩක් පවතී. සමාජ මාධ්‍ය, ස්මාර්ට් රැකියා අවකාශ, තාක්ෂණික ආවේක්ෂණය, ආදි තාක්ෂණික විසඳුම් ක්‍රියාවට නැංවීම මඟින් විවිධ ආකාරයෙන් ශ්‍රම බලකායට හා මානව සම්පත් කළමනාකරණයට එය බලපායි.

### අධ්‍යාපනය

ශ්‍රී ලංකාව අනාගත රැකියා ලොවට සූදානම් වන විට අධ්‍යාපනය හා කුසලතා පරතරය එරට ප්‍රධානතම අභියෝගය වේ. ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාව අතරින් බොහෝ ප්‍රමාණයකට උසස් අධ්‍යාපනය සම්බන්ධ ගැටලු පැන නගින අතර  ඔවුන් බොහෝ දෙනෙකුට මෘදු කුසලතා, ඉංග්‍රීසි සාක්ෂරතා ආදී කුසලතා පුහුණු  ද නොමැත. ඊට ප්‍රධානම හේතුව වනුයේ ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනය තුළ එම කුසලතා ලගා කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපනික වටපිටාව බිහි කර නොමැති වීමයි. මෙය ඔවුන්ගේ අභිලාශවලට ඔබින උසස් කුසලතා රැකියා ලබා ගැනීමට ඔවුන්ට බාධා පමුණුවයි. එමෙන්ම උගත් සහ අධ්‍යාපනය නොලත් යන තරුණ දෙකොට්ඨාසයම සීඝ්‍රයෙන් වෙනස් වන රැකියා පරිසරයන්ට ප්‍රිය කරයි. එමෙන්ම ඔවුන් අඩු කුසලතා සහ දැතින් සිදු කරන රැකියා සඳහා යොමු වීමට මැලිකමක් දැක්වීමත් වර්තමාන සමාජය  අධ්‍යයනයේ දී දැකගත හැකිය.

**කෘෂිකර්මාන්තය හා පරිසරය**

ශ්‍රී ලංකාව තුළ පරිසරය කෙරෙහි ද තාක්ෂණික බලපෑම් ප්‍රබලය. කාර්මීකරණය හා නාගරීකරණය සමග වර්ධනය වන තාක්ෂණය කෘෂිකර්මාන්තය කෙරෙහි ද පසුකාලීනව බලපෑම් ඇති කිරීමට හේතු විය. අනාගතයේදී තාක්ෂණික පරිවර්තනය ඇතිවීමත් සමඟ වර්ධනය වන කෘෂි භූමිය තුළ බර යන්ත්‍ර යොදා සිදුකර කරන සීසෑම හරහා එම භූමිය හායනය වීම සිදුවීමත් එය කෘෂි භූමියට අහිතකර ලෙස බලපෑමට ද හැකියාව ඇත. කෘෂි පසට අවශ්‍ය සතුන් මියයාම තාක්ෂණික උපකරණ මඟින් සිදුවේ. එකල අසීමිත මානව සම්පත් හරහා කෘෂිකර්මාන්තයට අවශ්‍ය ශ්‍රමය ලබා ගත්තද අද එම ශ්‍රමය තාක්ෂණික මෙවලම්වලට සීමා වීම සිදු වී ඇත.

**සංචාරක කර්මාන්තය**

තාක්ෂණය සමග සංචාරක කර්මාන්තය තුළ රැකියා අවස්ථා වැඩි වනු ඇති අතර, එය තනි පුද්ගල සේවා සම්පාදකයන් සහ අන්තර්ජාලය මගින් ඉදිරියට ගෙනයනු ඇත. සංචාරක කර්මාන්තය මූලික කරගත් නිවාස , ප්‍රවාහන , ආපනශාලා ආදී ඊට සම්බන්ධ ක්ෂේත්‍රවල සෘජු හා වක්‍රාකාරව රැකියා අවස්ථා බිහිකිරීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ඇත. එමෙන්ම අන්තර්ජාලය තුලින් හෝටල් කළමනාකරණය එපිට ඇති කුඩා පරිමාණ සහ අවිධිමත් ආයතන බලාත්මක කරමින් සංචාරක කර්මාන්තයට පිවිසීමට ඇති හැකියාව විමධ්‍යගත කිරීම සඳහා කටයුතු කරයි. ශ්‍රී ලංකාවේ මේ වන විට නව නිපැයුම් ක්ෂේත්‍රය අනාගත ශ්‍රම බලකාය තාක්ෂණයට දක්වන ඇල්ම පිළිබඳ යම් ඉඟියක් ලබා දේ. පහත දැක්වෙන්නේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් ලබාගත් නව නිපැයුම් අයදුම් කළ පුද්ගලයින් සහ පේටන්ට් බලපතය්‍ර ලබා ගත් වර්ෂ පිළිබඳ තොරතුරු ය.

වගු අංක 01

**නව නිපැයුම් අයදුම් කළ පුද්ගලයින් සහ පේටන්ට් බලපත්‍රය ලබා ගත් වර්ෂ 1995-2019**

| අයදුම් කිරීම | | | | ලියාපදිංචි කිරීම | | |
|---|---|---|---|---|---|---|
| වර්ෂය | පදිංචිය (දේශීය) | පදිංචිය (අන්තර්ජාතික) | එකතුව | පදිංචි | පදිංචි නොවන | එකතුව |
| 1995 | 75 | 114 | 189 | 64 | 95 | 159 |
| 2000 | 71 | 250 | 321 | 59 | 169 | 228 |
| 2005 | 149 | 211 | 360 | 64 | 116 | 180 |
| 2010 | 225 | 235 | 460 | 220 | 284 | 504 |
| 2015 | 218 | 263 | 481 | 38 | 224 | 262 |
| 2019 | 353 | 258 | 611 | 39 | 136 | 175 |

මූලාශ්‍රය- National intellectual Property Office,2019

1995 දී ජාතික මට්ටමින් අයදුම් කළ පුද්ගලයින් ප්‍රමාණය 75 වන අතර 2019 වන විට 353 දක්වා වර්ධනය වීම සිදු වී ඇත. පේටන්ට් බලපත්‍රය ලබා ගත් පුද්ගලයින් ප්‍රමානය ද පෙර වසරවලට සාපේක්ශව වර්ධනය වීම සිදුව ඇත. මෙමගින් පැහැදිලි වනුයේ ශ්‍රී ලංකාවේ තාක්ෂණික අංශය කෙරෙහි පුද්ගලයන් තුළ පවත්නා වත්මන් නැඹුරු බාවයයි.

**තාක්ෂණික පරිවර්තනය තුළින් ඇතිවන අභියෝගයන්ට ලබා දිය හැකි විසඳුම්**

මීළඟ දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ගමන් මග තුළ විවිධ මට්ටම්වලින් තාක්ෂණීකරණය වීම දැක්විය හැක. ගෝලීය වශයෙන් සිදුවෙමින් පවතින දැවැන්ත තාක්ෂණික වෙනස්කම් ශ්‍රී ලංකාවේ පවතින සුවිශේෂී සමාජ-ආර්ථික සංදර්භයට ඇතුළත් වීමේ වේගය සහ තිව්‍රතාව අනෙකුත් රටවලට වඩා වෙනස් වූවත් එය මෙරට ශ්‍රම බලකායට එකවිටම ඔරොත්තු නොදෙනු ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ තාක්ෂණික පරිවර්තනය මෙරට ශ්‍රම බලකායේ අනාගතය කෙරෙහි ඇති කරන අභියෝග සඳහා ඉදිරිපත් කළ හැකි , විසඳුම් ලබාදිය හැකි ක්ෂේත්‍ර කිහිපයක් පහත පරිදිය.

රූප සටහන 01

**විසඳුම් ලබා දිය හැකි ක්ෂේත්‍ර**




මූලාශ්‍රය- කර්තෘ විසින් සම්පාදිතය.

ඉහත රූප සටහන 01 හි දක්වා ඇත්තේ තාක්ෂණික සංක්‍රාමණය උදෙසා ලබා දිය හැකි තිරසාර විසඳුම් ය. ඒ අනුව රට තුළ රැකියා ලෝකය ඵලදායි ලෙස හැඩගැසීම සඳහා ශ්‍රී ලංකාවට ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය පෙළක අවශ්‍යතාවය මතුව ඇත.

රැකියා ලෝකයේ අවස්ථා තුළ අධ්‍යාපනය වෙනස්කම් ඇති කිරීමට නම් සාම්ප්‍රදායික අධ්‍යාපන හා පුහුණු පද්ධති තුළ ප්‍රධාන වෙනස්කම් රැසක් ඇතිවිය යුතුය. රැකියා පරිසරයට අනුගත වීමේදී තාක්ෂණික කුසලතා වලට එහා ගිය කුසලතා මැදිහත්වීමක් අවශ්‍ය වුවත් ඒවා අධ්‍යාපනයට ආදේශක ලෙස නොගත යුතුය.

තාක්ෂණික සංක්‍රාමණයේදී ඇතිවන ගැටළු වලට විසඳුම් ලබා දීමේදී මෘදු කුසලතා අතිශය වැදගත් වේ. කියවීම්, ලිවීම සහ අංක ගණිතය පිළිබඳ මූලික දැනුමක් නොමැතිව උසස්

මට්ටමේ විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු හා ගණිතය මත පදනම් වූ අධ්‍යාපනයක් තුළින් පමණක් යහපත් අනාගතයක් උදා කර ගත නොහැකිය.

ඉංග්‍රීසි භාෂාව ප්‍රවීණත්වය හා ඩිජිටල් සාක්ෂරතාව පිළිබඳ කැපීපෙනෙන පරතරයක් ග්‍රාමීය නාගරික ප්‍රදේශ ආශ්‍රිතව පවතී. මේ නිසා භාෂා ප්‍රවීණතාවය වැඩි දියුණු කිරීම හා ඩිජිටල් සාක්ෂරතාව පිළිබඳ දැනුවත් කිරීම් පාසල් මට්ටමින් මෙන්ම අධ්‍යාපනික ප්‍රතිපත්ති තුළට ඇතුළත් කළ යුතුය. ප්‍රාදේශීය මට්ටමින් පවත්නා අසමානතාවලට විසඳුම් ලබාදීමට එම පරතර පවතින ප්‍රදේශ තුළ ඉලක්කගත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග දියත් කළ යුතුය. මෙහිදී කාන්තාවන් සහ වෙනත් අඩු වරප්‍රසාදලාභී කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් වේ.

ලාංකීය ව්‍යවසාය මුහුණ දෙනු ලබන ගැටළු වලට විසඳුම් ලබාදීම සඳහා මහජන ප්‍රතිපත්ති භාවිතා කිරීමට මෙහෙයුම් පාදක කොට ගත් නවෝත්පාදනයට හැකියාව ඇත. වෙළඳපොළට ගැලපෙන විසඳුම් හා තාක්ෂණික සමාගම් සවිබල ගැන්වීමට මේ යටතේ හැකියාව ඇත.

උදා - හරිත තාක්ෂණ කර්මාන්ත සඳහා සහයෝගය ලබා දීමට රජයට හැකිය. එමෙන්ම සූර්ය කෝෂ ස්ථාපිත කිරීම සඳහා සහනදායි ණය සේවා ක්‍රම අභ්‍යන්තර ජල පිරිපහදු ක්‍රමවේද, අභ්‍යන්තර ජල පිරිපහදු ක්‍රමවේද, සඳහා සහනාධාර ලබාදීමට හැකි අතර නව ආර්ථික ක්‍රියාකාරකම් උදෙසා රැකියා අවශ්‍යතාවද මතුවේ.

අවිධිමත් අංශයට සහ යැපුම් ගොවිතැනේ නියැලෙන පිරිසට මුදල් හුවමාරු සහ රැකියා තහවුරු කිරීමේ වැඩසටහන් ලබාදීම මඟින් ඔවුන්ට මූලික ආදායම් සුරක්ෂිතතාවක් තහවුරු කිරීමට සමාජ ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම හරහා හැකිවේ. මේ සඳහා ශ්‍රී ලංකාවට ඉන්දියාවේ මහත්මා ගාන්ධි ජාතික ග්‍රාමීය රැකියා සහතිකකරණ වැඩසටහන ආදර්ශයට ගත හැකියි.

ශ්‍රී ලංකාව තුළ දත්ත පාලනය කිරීම සඳහා නීති නොමැති වුවත් 'දත්ත ආරක්ෂාව පිළිබඳ භාවිත සංග්‍රහයට' අනුව තොරතුරු සන්නිවේදන නියෝජිතායතනය දත්ත පාලනය කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කරමින් සිටින අතර එම ප්‍රතිපත්තිය 2003 තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ පනත යටතේ නියාමනයක් බවට පත්කිරීමටත් කටයුතු කරමින් සිටී.

## නිගමනය

i) economic exclusion to equitable access in economic/financial, social, human and natural resource assets
ii) exclusion from access to basic services
iii) Social exclusion restricting people from participating on fair terms in local and national social life (World Bank, 2006).

Clearly, the exclusion promotes causes unequal access to education and jobs for the urban poor. According to the most recent growth statistics, income inequalities have risen across countries; the GINI coefficients are sharply higher for urban incomes, with growth has not trickled down to the poor. Income inequalities matter for poverty reduction- the level of inequality indeed determines the share of the urban poor in the growth process.

Urban poverty is not just the income and growth but also it is the distribution of that income and growth in various income classes. As another way to demonstrate urban poverty has multi-dimensional nature and it is beyond income poverty. In recent years, urban poverty has become a subject of global attention due to its direct link to a lack of decent employment opportunities, especially for youth and women.

Between 2014 and 2018, the proportion of the urban population living in slums worldwide increased from 23 percent to 24 percent, translating to over 1 billion slum

dwellers. Slum dwellers are most prevalent in three regions: Eastern and South-Eastern Asia (370 million), sub-Saharan Africa (238 million) and Central and Southern Asia (226 million). The situation should be concerned with urban planning, financing, and policymaking (Figure 02)

Figure 02: Proportion of the urban population living in slums in selected regions, 2018 (percentage)




Source: UNSTATS, 2021

Normally the urban poor does not have legal ownership of the land they live in. Yet they have to live in temporary settlements, and with the current development process implemented by states, they have to move to new dwelling places. For instance, In 1997 the government of Sri Lanka launched a sustainable township program which is a new strategy to provide re-housing in the Colombo municipal council area through an entirely voluntary, self-financing, market-based, aprocess to ensure “Homes for the People and Space for the Urban Development” Under that program it is expected to rehouse 66000 households currently living in slums and shanties in the city of Colombo. Recently, the urban development Authority launched an urban regeneration

program that aims to provide new homes to the inhabitants in the underserved settlements in apartment buildings within the Colombo municipality are, a and people were settled under the housing projects. Although there is a great potential for such kinds of programs to change the existing bad conditions, such attempts have not been very successful. The existence of such situations directly hinders sustainable urbanization.

**Crime and Violence**

Crime and violence affect hundreds of millions of children in urban areas. “Crime and violence are cited to occur more frequently in settings where there is an unequal distribution of scare resources or power coupled with weak institutional controls – highly characteristic of cities” (UN-HABITAT, 2006). Latin America and the Caribbean provide the best example of existing crime and violence. Cities where inequalities and exclusion are strongly evident also appear to be vulnerable to insecurity. Such examples can be identified in slums in South Africa (2005), and gang warfare in Los Angeles, Nairobi, and Rio de Janeiro

According to the World Bank study of violence, they have explored how urban residents cope with violence, or the threat of it, in their everyday lives, to inform the design of policies and programs for violence prevention. Their study is known as the first global study on urban violence undertaken by the World Bank and covers three regions. There are several key findings of the study are as follows:

1. The current policy approach of treating different forms of violence separately clashes with the reality that the lines between different expressions of violence—from domestic to collective political violence—are very blurry
2. The coping mechanisms to deal with violence occur mostly on the individual level, and many undermine long-term violence prevention by generating perverse social capital

3. The built environment has an essential relationship with urban violence. The built environment causes violent behavior in four ways
    - Inadequate infrastructure means that there often is no safe space to hold community meanings or to gather in public places
    - Narrow alleyways or lack of street lighting create opportunities for violent assault.
    - Limited infrastructure and services add to daily frustrations that can escalate violence and exacerbate a sense of exclusion.
    - Inadequate infrastructure creates vulnerabilities as residents try to meet basic needs (fetching water, visiting public toilets).

4. There is a strong perception in all of the communities studied that unemployment, especially among youth is driving (The World Bank, 2010).

**Climate changes and Disasters**

Climate changes and Disasters unevenly affect to urban poor. Urban Poverty can be defined as a complex condition and its more intense exposure to hazards are cyclones, floods, landslides, and earthquakes. This can be a disaster when combined with severe accident vulnerability. “Disasters take a particular toll on underprivileged urban residents because of where they live, and also because they are inadequately served and ill-equipped to prepare for or recover from extreme events” (UNICEF, 2007). Urbanization displaces forests, farmland, wetlands, parks and open spaces and such displaces reduce the water supply excessive groundwater usage depletes water tables. This causes significantly reduces the ability of natural ecosystems to filter Water and Air. Climate change poses serious threats to urban infrastructure, quality of life, and entire urban systems. Not only poor countries, but also rich ones will increasingly be affected by anomalous climate events and trends (World Bank, 2010). In 2003, more

than 70,000 people died in Europe from a severe heat wave (World Bank 2009; Dhainut,2004). Furthermore, Annual average land continues to increase by more than the global land temperature during the 21st century. By the 2021-2050 period, temperature increases of between 1.0°C and 2.5°C are projected, and by 2071-2100 these increases to between 2.5°C and 4.0° (EEA,2021).

Traditionally, cities were located near rivers and oceans for transportation and connectivity purposes. This natural geographic advantage is now increasing the vulnerability of cities as sea levels rise and windstorms increase in severity and frequency. In Europe, 70 percent of the largest cities have areas that are particularly vulnerable to rising sea levels, and most of these cities are less than 10 meters above sea level. Port cities in developing countries — such as Kolkata, Shanghai, and Guangzhou — are as vulnerable as such cities in developed countries —Rotterdam, Tokyo, or New York City. China alone has more than 78 million people living in vulnerable low-elevation cities; this number is increasing annually by 3 percent (McGranahan,2007).

Approximately 360 million urban residents live in coastal areas less than 10 meters above sea level and are vulnerable to flooding and storm surges (Satterthwaite and Moser, 2008). Almost there are fifteen megacities at risk from rising sea levels and coastal surges. Figure 03 indicates that the Risk Population and Megacities Concentrated in Low-elevation Coastal Zones (LECZ) Threatened by Sea-level Rise and Storm Surges

Map 01: **At Risk: Population and Megacities Concentrated in Low-elevation Coastal Zones (LECZ) Threatened by Sea-level Rise and Storm Surges**




Source: World Bank, 2009

Following Figure 03 indicates the Share of the Global Population Outside and Inside the Low Elevation Coastal Zone, By Settlement Type Although just 2 percent of the world's total land is urban, almost 10 percent of coastal land lower than 10 meters above sea level is already urbanized or quasi-urbanized. To this end, 13 percent of the world's total urban land mass is in low-elevation coastal zones. In terms of the total number of people living in the low-elevation coastal urban centers, China has the most (129.5 million people), followed by India (55.2 million people), and Bangladesh (40.9 million people). Notably, some of the largest numbers of people are in countries with the least capacity to prepare for or recover from climate-related shocks (CIESIN,2019).

Figure 03: **Share of Global Population Outside and Inside The Low Elevation Coastal Zone, By Settlement Type,2015**




Source: CUNY Institute for Demographic Research, Institute for Development studies and the center for International Earth science Information Network, Columbia University,2019

**Environmental Protection and waste management**

With the rapid modernization of urban it should be more concerned with their impact on environmental security. Otherwise, it will be an immeasurable problem affecting sustainability. People who live in urban areas have different consumption patterns than those living in rural areas. The rising in their consumption levels is the root cause of environmental problems. An increase in Pollution and water contamination and depletion may be seen as necessary side effects of rapid modernization, with the assumption that, once cities become more developed, the rate of pollution and environmental destruction will decrease and eventually be reduced. The development process may be tempted to allow pollution for immediate economic growth.

Poorly managed waste has an enormous impact on health, the local and global environment, and the economy (World Bank, 2012). Solid waste is the most visible

and pernicious by-product of a resource-intensive, consumer-based economic lifestyle and its effects on the people and the development of urban areas cannot be excluded. There is a high negative impact caused by the removal of solid waste in urban areas. Table 05 shows estimates of waste generation for the year 2025 as expected according to current trends in population growth in each region.

Table 04: **Waste Generation Projections for 2025 by Region**

| Region | Current available data | | | Projections for 2025 | | |
|---|---|---|---|---|---|---|
| | Total Urban population (Millions) | Urban waste Generation | | Projected Urban Population (millions) | Projected urban waste | |
| | | Per capita (Kg/capita/day) | Total (tons/day) | | Per Capita (kg/capita/day) | Total (tons/day) |
| Africa | 260 | 0.65 | 169,119 | 518 | 0.85 | 441,840 |
| East Asia and pacific | 777 | 0.95 | 738,958 | 1229 | 1.5 | 1,865,379 |
| Eastern and central Asia | 227 | 1.1 | 254,389 | 239 | 1.5 | 354.810 |
| Latin America and Caribbean | 399 | 1.1 | 437,545 | 466 | 1.6 | 728,392 |
| Middle East and North Africa | 162 | 1.1 | 173,545 | 257 | 1.43 | 369,320 |
| OECD countries | 729 | 2.2 | 1,566,286 | 842 | 2.1 | 1,742,417 |
| South Asia | 426 | 0.45 | 192,410 | 734 | 0.77 | 567,545 |
| Total | 2980 | 1.2 | 3,532,252 | 4285 | 1.4 | 6,069,703 |

Source: World Bank. 2012. *WHAT A WASTE:* A Global Review of Solid Waste Management

As indicated in the above table it's obvious that there is a gradually increasing growth of the urban population as well as urban waste generation. Per capita waste generation in OECD countries are approximately 2.2 and is projected to lower value by 2025. But the same situation will not remain in the developing world. Due to the rapid

urbanization, waste generation will increase with the growth of the urban population in East Asia and the Pacific, Central Asia and Latin America and Caribbean regions. As a whole with the high generation of urban waste, particularly waste management should be focused on.

Waste Management defines environmental performance as protecting the environment and enhancing the communities where we work and live complying with all rules and regulations. Cities also present unique opportunities for developing innovative waste management such as waste-to-energy technologies (e.g., methane from landfills), reusing and recycling as an economic opportunity, and ecosystem-based sewage treatment. Solid waste management measures including composting and generating energy from methane combustion can also help reduce methane emissions in landfills, increase forest carbon sequestration and contribute to an overall reduction of greenhouse gases

## Conclusion

There are several demanding challenges that have emerged when achieving sustainable urban development. Accordingly, Preparation for optimal urbanization is the best possible way to achieve sustainable development. Microfinance should be demonstrated as a powerful instrument for poverty reduction that enables the poor to build assets, increase incomes, and reduce their vulnerability to economic stress. Due to the failure of governance informal settlements and slums are rising with the constitution of unhealthy living and working environments. High concentration should be given to the need for improving urban strategies, which promote efficiency in resource use. As well as urgent attention should be given to reducing the generation of solid waste at the sources through mandatory standards and regulation fees and tax incentives, and education and voluntary compliance. As it is indicated in sustainable development goals “make cities inclusive, safe, resilient and sustainable” immediate

actions should be get to bring it in line. These optimal urbanization strategies would pave the way towards sustainable development.

## References


1. Bannister. J (2016) **Urban Studies**, SAGE publications, London
2. Hussain. M (1994) **Human Geography**, smt¡prem Rawat"Rawal Publications"3-Na-20"Jawahar nagar, Jaipur, India
3. Morrish.M (1998) **Development in the third world**, oxford university press, Walton
4. Asian Development Bank (2013), **Gender and urban Poverty in South Asia**: Proceedings Report of the 2012 sub-regional workshop
5. UNDP (2016) **sustainable urbanization strategy**: UNDP's support to sustainable, inclusive and resilient cities in the Developing world [Online] Available at: http://www.undp.org/content/dam/undp/library/Sustainable%20Development/Urbanization/UNDP_Urban-Strategy.pdf?download
6. UN. (2018) World Urbanization Prospects. [Online] Available at: https://population.un.org/wup/Publications/Files/WUP2018-Report.pdf
7. UN-HABITAT. (2012) Addressing Urban Poverty, Inequality, and Vulnerability in a Warming World. [Online] Available at: http://www.fukuoka.unhabitat.org/programmes/ccci/pdf/1_Addressing_Urban_Poverty_Inequality_and_Vulnerability_in_a_Warming_World.pdf
8. ESDN. (2014) Mapping Urban Sustainable Development in Europe and Beyond. [Online] Available at: http://www.sdnetwork.eu/pdf/case%20studies/ESDN%20Case%20Study_No%2015_final.pdf
9. ADB. (2014) Urban Poverty in Asia [Online] Available at:https://www.adb.org/sites/default/files/publication/59778/urban-poverty-asia.pdf
10. WORLD BANK. (2012) *WHAT A WASTE:* A Global Review of Solid Waste Management[Online] Available at: https://siteresources.worldbank.org/INTURBANDEVELOPMENT/Resources/336387-1334852610766/What_a_Waste2012_Final.pdf

# ප්‍රාදේශීය සංවර්ධන විෂමතා හමුවේ ශ්‍රී ලංකාව

නිර්භීතා චාරුනි තිලකරත්න
භූගෝල විද්‍යා ශාස්ත්‍රවේදී ගෞරව තෙවන වසර
භූගෝල විද්‍යා අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
nirbeethathilakarathna123@gmail.com

## සංක්ෂේපය

සංවර්ධනය අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාව දැරූ විවිධ වූ උත්සහයන්ට දශක ගණනාවක් ගෙවී ගොස් ඇත. මෙම කාලය තුළ දී ලෝකයේ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ වූ ප්‍රවේශ අනුගමනය කෙරිණ. එම සෑම ප්‍රයත්නයක් ම ප්‍රධාන වශයෙන් චින්තන ධාරා දෙකකට අයත් වූයේ ය. බටහිර රටවල් අනුදත් නිදහස් ආර්ථික චින්තනය සහ සෝවියට් දේශය හා එම කඳවුරේ රටවල් නිර්දේශ කළ සමාජවාදී ආර්ථික චින්තනය එම මහා සුසමාදර්ශ ද්විත්වයයි. 20 වන සියවසේ අවසාන කාර්තුවේ සිට සමාජවාදී ආර්ථික චින්තනයේ ආකර්ෂණීය බව තුරන් වී ගොස් බටහිර රටවල් විසින් සාඩම්බරයෙන් ඉදිරිපත් කළ නව ලිබරල්වාදී ආර්ථික දර්ශනය අධිපති තත්ත්වයකට පත් වී තිබේ. මෙම ගෝලීය ප්‍රවාහයේ බලපෑම අනුව ශ්‍රී ලංකාව ද නිදහස් ආර්ථික චින්තනය ඔස්සේ සිය සංවර්ධන ක්‍රියාවලිය හැඩගස්වාගෙන ඇත. මෙහි ප්‍රබල නිෂේධාත්මක බලපෑමක් ලෙස විෂමතාවන්ගෙන් විච්චින්න වූ ප්‍රාදේශීය සංවර්ධනයක් ශ්‍රී ලංකාව තුළින් නිරීක්ෂණය කළ හැකි වේ. විෂමතාවන්ගෙන් තොර ප්‍රාදේශීය සංවර්ධනයක් අපේක්ෂාවෙන් නොයෙක් ගැහැට විඳින ශ්‍රී ලංකාවේ ජනතාවට සිදුව ඇත්තේ දේශපාලනය විසින් මෙහෙයවන ලද මෙම ආර්ථික සංවර්ධනය තුළ අපේක්ෂා භංගත්වයට පත්වීමට ය. එම ක්‍රියාවලියේ දී අතලොස්සක් ජනතාව සංවර්ධන විෂමතාවන්ගේ මලපුඩුවෙන් ගැලවුණ ද අතිවිශාල ජනසංඛ්‍යාවක් සංවර්ධන විෂමතාවන්ගේ ගැහැට විඳිමින් සිටී. මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීයව සංවර්ධනයේ අවකාශීය අසමානතාවන් ගොඩනැගුණි. මෙම අසමානතාවන් සඳහා විවිධ හේතු සාධක බලපා ඇත. එසේ ම මෙම තත්ත්වය නිසා ඇති වී තිබෙන අභියෝගයන් ද බලපෑම් සහගත ය. එම නිසා ශ්‍රී ලංකාව ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන්ගෙන් තොරව හැසිරවීම සඳහා දේශීය අනන්‍ය ප්‍රවේශයකින් යුතුව කටයුතු කිරීම කාලීන හා වැදගත් අවශ්‍යතාවක් වේ. මේ පිළිබඳ දැවැන්ත මහජන හා විදග්ධ කතිකාවක් ගොඩනැගීම හා එහි

විසරණ ක්‍රියාවලිය සිදු කිරීම ශ්‍රී ලාංකේය පරපුරෙන් පරපුරට චිරාත් කාලයක් පැවතිය යුතු ද වන්නේ ය.

මුඛ්‍ය පද - ප්‍රාදේශීය සංවර්ධනය, විෂමතා, හරය, පර්යන්තය

## හැඳින්වීම

සංවර්ධනය යනු ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමයි. වර්තමාන ලෝකය ලබා ඇති සමාජ-ආර්ථික දියුණුව හෙවත් සංවර්ධනය මෑතක දී සිදු වූවක් නොවන්නේ ය. එය මිනිස් ඉතිහාසය මුළුල්ලෙහි ම ඇති වූ දිගු කාලීන ක්‍රියාවලියකි. මෙම ඓතිහාසික ක්‍රියාවලිය බිම් ප්‍රදේශ සොයායාම, ජනාවාස ඇති කර ගැනීම, යටත් විජිත ඇති වීම, ජාත්‍යන්තර වෙළදාම, විවිධ රාජ්‍යයන්ගේ බිඳ වැටීම, පුළුල් වීම, දේශ සීමා වෙනස් වීම, කෘෂිකාර්මික හා කාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ නවීකරණයන්, සමාජීය වර්ධනය හා සංස්කෘතික දියුණුව යනාදී සිදුවීම් ඔස්සේ විකාශනය වූවකි. මෙයින් පැහැදිළිව ම ගම්‍යමාන වනුයේ සංවර්ධනය යනු ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා දේශපාලනමය යන සියළු අංශයන්ගේ සාර්ව වර්ධිත අවස්ථාවක් වන බවයි.

නමුත් මෙම සංවර්ධන සංකල්පය ප්‍රායෝගික තලයේ දී ලෝකයේ සියලු ප්‍රදේශවල සමානාකාරයෙන් දැකිය නොහැකි වේ. එය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල ද එසේ ම ය. සංවර්ධනය අවකාශීය වශයෙන් විවිධත්වයක් නිරූපනය කිරීම සංවර්ධනයේ ප්‍රායෝගික පසුබිමෙහි අනිවාර්ය ලක්ෂණයක් ද වේ. මේ අනුව සංවර්ධනය පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ අවකාශීයව ප්‍රාදේශීය විෂමතාවක් පවතී. මෙම අවකාශීය විෂමතාව සංවර්ධනයේ එක් එක් අංශයන් ඔස්සේ අධ්‍යයනය කිරීමෙන් එහි ස්වභාවය මනාව විද්‍යමානිත කරගත හැකි වේ. සියලු ශ්‍රී ලාංකිකයන්ට සෑම අංශයකින් ම යම් මට්ටමකින් හෝ සාමානාත්මතාව අවම කිරීමෙහිලා සංවර්ධනයේ අවකාශීය අසමානතාව ප්‍රබල බාධකයක් ලෙස පවතී. ඒ අනුව මෙය සංවර්ධන ක්‍රියාවලිය තුළ පැන නැගී පවතින අනිවාර්ය සහ ප්‍රබල නිශේධාත්මක තත්ත්වයක් වේ. මේ ඇසුරින් විවිධ අභියෝග අප හමුවේ ගොඩනැගී හා ගොඩනැගෙමින් පවතී. මෙලෙස ගොඩනැගී ඇති අභියෝගයන් ජය ගැනීම සඳහා ලෝකයේ විවිධ රටවල් විවිධාකාරයෙන් කටයුතු කරනු ලබයි. ඒ අතර විවිධ උපාය මාර්ග, ජනතාව තුළ ධනාත්මක ආකල්ප උද්දීපනය කිරීමට ක්‍රියාත්මක කරන ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්, ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති, විවිධාකාරයේ සංවර්ධන සැලසුම් හා ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් ප්‍රාදේශීය සංවර්ධන විෂමතා දුරුකිරීම උදෙසා ගෙඩනගනු ලබන සංවර්ධන ප්‍රතිපත්ති

යනාදිය වේ. මේ අනුව යමින් ශ්‍රී ලංකාව ද මෙම අභියෝගයන්ට විසඳුම් සොයමින් සිටී. නමුත් සංවර්ධන සංකල්පය ලංකාවේ ක්‍රියාත්මක වූ දා සිට වර්තමානය වන තුරු ද මේ සඳහා ස්ථිරසාර විසඳුම් සෙවීමට නොහැකි වීම කණගාටුවට කරුණකි. ඒ අනුව අප මෙම අභියෝගයන්ට දේශීය අනන්‍ය ප්‍රවේශයකින් යුතු විසඳුම් හා ප්‍රාදේශීයව ඒ ඒ ප්‍රදේශයන්ට උචිත අයුරින් ඒවා ක්‍රියාත්මක කිරීම කාලීනව වැදගත් අවශ්‍යතාවක් වේ. මේ සඳහා ශ්‍රී ලාංකේය ජනයාටත් රජයටත් වගකීම් හා යුතුකම් පවතින අතර සිය පාර්ශවයෙන් ඉටු විය යුතු කර්යයන් නොපමාව ඉටු කිරීම ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා දුරු කරලීමට ආශිර්වාදයක් වේ.

## ප්‍රාදේශීය සංවර්ධන සංකල්පය හා න්‍යාය ශ්‍රී ලංකාවට බලපාන ආකාරය

ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳව විවිධ නිර්ණායක ඔස්සේ විවිධ අර්ථකථන ඉදිරිපත් කොට ඇත. ප්‍රාදේශීය සංවර්ධන සංකල්පය පිළිබඳව විද්වතුන්ගේ අවධානය යොමු වූයේ දෙවන ලෝක යුද්ධයෙන් පසුව ය. එනම් 20 වන සියවස අග භාගය වන විට ලොව පුරා රටවල ප්‍රාදේශීය සංවර්ධනය පදනම් කරගෙන විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවන ලදි. ප්‍රාදේශීය සංවර්ධනය යන්න සරලව අර්ථකථනය කළහොත් රාජ්‍යයේ නිෂ්පාදනය, ආදායම හා රැකියා අවස්ථා වර්ධනය කිරීම තුළින් එම වර්ධනයේ ප්‍රතිලාභ සමාජය තුළ හා ප්‍රාදේශීය වශයෙන් හැකිතාක් දුරට සාධාරණ ලෙස ව්‍යාප්ත කිරීම තුළින් මිනිසුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි. මෙහි දී මේ තුළින් අපේක්ෂා කරනුයේ සංවර්ධනයේ ප්‍රතිලාභ සියලු දෙනාට ම සමානව හා සාධාරණව ලබා දීමයි. කෙසේ නමුත් මේ සම්බන්ධව ඉදිරිපත් කර ඇති විද්වතුන්ගේ අදහස් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.

"ප්‍රාදේශීයව ඵලදායිතාවයේ වෙනස් වීමක් අදහස් කෙරේ. එය ජන සංඛ්‍යාව, රැකියා, ආදායම හා නිෂ්පාදන කර්මාන්තවල එකතු වූ අගයෙහි වෙනස් වීමෙන් මැනිය හැක."

- (Arthur C. Nelson, 1993) -

"වෙනස් වන වාසිදායක තත්ත්වයන් අනුව ආර්ථික කටයුතු ස්ථානගත වීම තුළින් ප්‍රාදේශීය ආර්ථික වර්ධනය වන ආකාරය ප්‍රාදේශීය සංවර්ධනයයි."

- (John Friedmann, 1967) -

"යම්කිසි නිශ්චිත ප්‍රදේශයක සංවර්ධනය ප්‍රාදේශීය සංවර්ධනයයි. එය ප්‍රදේශ අතර අසමානතා නිසා මතු වන ගැටලුවලට ප්‍රතිචාරයකි."

- (John Galsson, 1974) -

"ප්‍රාදේශීය සංවර්ධනය යනු යම්කිසි අපේක්ෂිත ආකාරයකින් වත්කම්, ආර්ථික කටයුතු, සේවා, ජන සංඛ්‍යාව ආදී කරුණු ව්‍යාප්ත වන ආකාරය හැඩ ගැන්වීමයි."

- (Roy Bromely) -

උක්ත විද්වතුන් ඉදිරිපත් කොට ඇති නිර්වචනවල ශ්‍රී ලංකාවට ඇති දායකත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලංකාව ප්‍රදේශය යන්න හඳුනා ගන්නේ කෙසේද යන්න වැදගත් වේ. ඒ අනුව ශ්‍රී ලංකාව ප්‍රදේශය යන්න නිර්වචනය කර ඇත්තේ සැලසුම් කරන පරමාර්ථයෙන් නොව හුදෙක් පරිපාලනමය කාර්යයන් සඳහා පමණි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රදේශ ලෙස සැලකෙනුයේ පළාත් ය. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය කෙරෙහි වර්තමානයේ දැඩි ලෙස අවධානය යොමු වී ඇත.

සංවර්ධනයේ දී භූමි පරිභෝග රටාව හෙවත් අභ්‍යන්තර ව්‍යුහය පිළිබඳ අධ්‍යයනය ඉතා වැදගත් වේ. මෙලෙස භූමි පරිභෝග අධ්‍යයනය කිරීම සඳහා පරිසර විද්‍යාත්මක සංකල්ප සහාය දක්වා ඇත. මෙම පරිසරාත්මක සංකල්ප ආධාර කර ගෙන 20 වන සියවසේ දී පැවති නගරවල ජන සංඛ්‍යාව හා ප්‍රදේශයක ආර්ථික කටයුතුවල ක්ෂේත්‍රීය ව්‍යුහය තුළ පවතින විවිධතා හඳුනාගැනීමට උත්සුක විය. මේ සමඟ සංවර්ධන න්‍යාය පිළිබද ආදර්ශක රැසක් බිහි විය. මෙහිදී Robert Park, Ernesr W. Burgess, J. L. Berry, John Kasarda වැනි නාගරික භූගෝල විද්‍යාඥයන් වැදගත් වේ. ඔවුන් විසින් නගරයක විවිධ කාර්යයන්, ස්ථරායනයන් හා රටා ආදිය පිළිබඳව අවධානය යොමු කරමින් සිදු කළ අධ්‍යයන හේතුවෙන් භූමි පරිභෝග ආදර්ශක බිහි වීම ආරම්භ විය. එනම්,

- ඒක කේන්ද්‍රීය වෘත්ත ආදර්ශකය
- ඛණ්ඩ ආදර්ශකය
- බහු න්‍යෂ්ටි ආදර්ශකය යනාදියයි.

ශ්‍රී ලංකාවට නිදහස ලැබී වසර 70ක් ගෙවී ඇතත් තවමත් අවකාශීය වශයෙන් පැහැදිලි සංවර්ධන විෂමතාවයක් දැක ගත හැකි ය. වර්තමානයේ දී සමස්ත සංවර්ධන ක්‍රියාවලිය තුළ බස්නාහිර පළාත හර ප්‍රදේශය බවට පත්ව තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ නගරය ආර්ථික හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියා කරයි. නගරය පෝෂණය වන්නේ ගම තුළ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ මත ය. මේ නිසා ඒවා නාගරික වෙළඳපොළ වෙත පැමිණීමේ දී අතරමැදි වෙළෙන්දන්ට නතු වේ. මෙය පරාධීන න්‍යාය ආශ්‍රිත සංකල්පයෙන් පැහැදිලි කරන අතර නාගරික පරපුටුවන් බිහිවීම මෙහි ප්‍රතිඵලයකි. මේ නිසා තනි නගර අධික ලෙස වර්ධනය වන අතර අධික ජන සංකේන්ද්‍රණයක් ද දැකිය හැකි ය. අනෙක් නගර හා ග්‍රාමීය ප්‍රදේශ ජනගහනය අතින් ඊට වඩා සැහෙන තරම් පිටුපසින් සිටී. නිදසුනක් ලෙස කොළඹ ජන ඝනත්වය වර්ග කි. මී. එකකට 3608ක් ද, ගම්පහ 1796ක් ද වන අතර මුලතිව්, මන්නාරම, වව්නියාව, මොණරාගල, වැනි දිස්ත්‍රික්කවල එය 100ට අඩු සංඛ්‍යාවක් ද වේ. (ශ්‍රී ලංකා මහ බැංකුව., (2019), "ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2019") මෙම අඩු ජන ඝනත්වයක් සහිත දිස්ත්‍රික්කවල අඩු ජන ඝනත්වයක් පෙන්නුම් කිරීමට සංවර්ධනයේ ප්‍රතිලාභ මෙම දිස්ත්‍රික්කවල ජනයා වෙත ගලා යාමේ යම්කිසි අඩුවක් පැවතීමත් හේතු වී ඇත. එමෙන් ම මෙම දිස්ත්‍රික්ක වෙන වෙන ම අධ්‍යයනය කළ ද පෙනී යන්නේ එක් එක් දිස්ත්‍රික්කය තුළ ද ප්‍රාදේශීයව සංවර්ධනයේ විෂමතාවක් පවතින බවයි.

John Friedmann ප්‍රකාශ කර ඇති පරිදි හර පර්යන්ත වෙනස නිසා ග්‍රාමීය හා නාගරික වෙනසක් පවතී. බස්නාහිර පළාත තුළ පවතින ආකර්ෂණයට අනුව බොහොමයක් ආර්ථික කටයුතු ස්ථානගත වී ඇති අතර එබැවින් එම පළාත තුළ ආදායම් ඉපැයීම්, රැකියා අවස්ථා ජනනය හා සුභසාධනය වර්ධනය වී ඇත. කොළඹ නගරය තුළ වරාය හා මාර්ග සංකේන්ද්‍රණය වී ඇති අතර එය ප්‍රධාන පරිපාලන නගරය බවට ද පත් වී ඇත. මේ අනුව එම ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ සමාජ-ආර්ථික ජීවිතය දියුණු වීම හා ප්‍රසාරණය වීම සිදු වී ඇත. නාගරික ජනගහනය ද වර්ධනය වෙමින් පවතී. එමෙන් ම ෆ්‍රීඩ්මාන්ගේ නිර්වචනයෙන් පැහැදිලි වන පරිදි වර්තමානය වන විට වයඹ පළාත ගත් විට වාහන අමතර කොටස් හා වාහන ස්ථානගත වීම යන ආකර්ෂණීය සාධකය එම ප්‍රදේශය සංවර්ධනයට හේතු වී ඇත. එමෙන් ම මධ්‍යම පළාත ගත් විට එහි පවතින භූගෝලීය දේශගුණික තත්ත්වය මෙන් ම ඓතිහාසික වටිනාකම හේතුවෙන් එම ප්‍රදේශය සංවර්ධනය සිදු වී ඇත. නමුත් සමස්ත මධ්‍යම පළාතේ හෝ වයඹ පළාතේ සංවර්ධනය පිළිබඳ සලකා බලන විට අවකාශීයව ප්‍රාදේශීය විෂමතාවයක් පැහැදිළිව දැක ගත හැකි ය. ඒ අනුව අපට පැහැදිළි වන්නේ A.C.

Nelson ප්‍රකාශ කරන පරිදි ප්‍රාදේශීය ඵලදායිතාවය ද John Friedmann ප්‍රකාශ කරන පරිදි ප්‍රාදේශීය වාසිදායක තත්ත්වය නිසා ඇති වන ආර්ථික වර්ධනය ද එමෙන් ම අනෙකුත් විද්වතුන් ප්‍රකාශ කරන පරිදි සිදු විය යුතු ප්‍රාදේශීය සංවර්ධනය පළාත් යන ප්‍රාදේශිකය අභ්‍යන්තරයේ විවිධත්වයක් උසුලන බවයි. එක් සාධකයක් හෝ සාධක කිහිපයක් කේන්ද්‍ර කරගෙන එක් ස්ථානයක සමාජ, ආර්ථික සංවර්ධනය සමස්ත ප්‍රදේශයේ ම සංවර්ධනය ලෙස සැලකිය නොහැක. එනම් නගර ප්‍රදේශ වශයෙන් වර්ධනය වන ප්‍රදේශවල සිදු වන සංවර්ධනය පර්යන්ත ප්‍රදේශවලට යන විට අඩු වී ඇත.

ශ්‍රී ලංකාව තුළ උක්ත කරුණු පිළිබඳව අවධානය යොමු කරන විට ඒ තුළ ගැටලු පවතින බවත් පැහැදිලි ප්‍රාදේශීය සංවර්ධන සැලැස්මක් අවශ්‍ය බවත් පැහැදිළි වේ. ඒ අනුව ප්‍රදේශ අතර පවතින අසමානතාව අවම වන පරිදි පරිපාලනය විමධ්‍යගත කෙරෙන සියල්ලන්ට සහභාගි විය හැකි සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයන්ගෙන් මෙරට අවකාශීය වශයෙන් පවතින අසමානතාවය අවම කිරීමටත් එමඟින් ප්‍රාදේශීය සංවර්ධනය සැමට ප්‍රතිලාභ ගලා යන ලෙස හැඩගැස්වීමටත් හැකියාව ලැබේ.

## ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල සංවර්ධන ක්‍රියාවලිය හේතු කොට ගෙන ග්‍රාමීය අංශය හා නාගරික අංශය අතර වෙනසක් නිරීක්ෂණය කළ හැකි ය. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 75%ක් පමණ ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරයි. රටක ආර්ථික සංවර්ධනය උදෙසා ග්‍රාමීය අංශයට සාපේක්ෂව නාගරික අංශයේ දායකත්වය ඉහළ අගයක් ගත්ත ද ග්‍රාමීය අංශය ද වැදගත් වේ. මෙම අංශයේ පරිමාව විශාල කළ හැක්කේ මූල්‍ය සංවිධාන හැකියාව ඉහළ නැංවීමෙනි. මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශය වැදගත් වන බවත් ජනගහනයෙන් විශාල පිරිසක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වන බවත් ය.

රටක් සංවර්ධනය කරා යාමේ දී නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශය ද සංවර්ධනය විය යුතු වේ. වර්තමානයේ දී සමස්ත ආර්ථික වර්ධන ක්‍රියාවලිය තුළ බස්නාහිර පළාත ප්‍රමුඛ තත්ත්වයක් හිමි කරගෙන තිබේ. නමුත්, පසුගිය දශකය තුළ බස්නාහිර පළාතේ දායකත්වය ක්‍රමයෙන් අඩු වී ඇති අතර දකුණු, මධ්‍යම, උතුරු හා නැගෙනහිර පළාත් මඟින් සිදු කර ඇති දායකත්වයේ ඉහළ නැගීමක් පෙන්නුම් කරයි. භෞතික හා සමාජ යටිතල පහසුකම් පළාත් අතර අසමාන ලෙස ව්‍යාප්ත වී ඇති අතර වේගවත් වර්ධනයක් සහිත ආර්ථික කේන්ද්‍රස්ථාන බොහොමයක් බස්නාහිර පළාත තුළ පිහිටා ඇත. කර්මාන්ත, වෙළඳ

හා වාණිජ මෙන්ම සේවා සැපයුම් අංශය වැනි ආර්ථික කාර්යයන් ද ඉතා වැඩි වශයෙන් බස්නාහිර පළාත තුළ ස්ථානගතව ඇත. පළාත් මට්ටමේ ප්‍රධාන නගර අනෙකුත් පළාත්වල නගරවලට වඩා කොළඹ ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන සමග ඍජුව සම්බන්ධ වී ඇති අතර, නිෂ්පාදනයන් සඳහා අගය එකතු කිරීමේ ක්‍රියාවලිය පළාත් මට්ටමින් සිදු නොවීම සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතා ඇතිවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ හර හා පර්යන්ත ප්‍රදේශ අතර පවතින විෂමතාව විශාල ය. පහත සිතියම් අංක 01 මගින් ශ්‍රී ලංකාවේ හර හා පර්යන්ත ප්‍රදේශවල ව්‍යාප්තිය නිරූපණය වේ.

**සිතියම 01 - ශ්‍රී ලංකාවේ හර හා පර්යන්ත ප්‍රදේශ ව්‍යාප්තිය**




මූලාශ්‍රය - මික් මොර්, 1985

ඉහත සිතියමට අනුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක වශයෙන් ගත් කල ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර යන දිස්ත්‍රික්කයන් හර ප්‍රදේශයට ද කෑගල්ල, මහනුවර, නුවරඑළිය යන දිස්ත්‍රික්කයන් අභ්‍යන්තර පර්යන්ත ප්‍රදේශයට ද පුත්තලම, කුරුණෑගල, මාතලේ, බදුල්ල, මොනරාගල, රත්නපුර යන දිස්ත්‍රික්කයන් බාහිර පර්යන්ත ප්‍රදේශයට ද මන්නාරම, මුලතිව්, වව්නියාව, අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව, හම්බන්තොට යන දිස්ත්‍රික්කයන් අත්‍යන්ත පර්යන්ත ප්‍රදේශයට ද යාපනය, කිලිනොච්චිය යන දිස්ත්‍රික්කයන් යාපනය ප්‍රදේශයට ද අයත් වේ. එසේ ම මෙම සෑම තනි දිස්ත්‍රික්කයක් තුළ ම නැවත හර හා පර්යන්ත ප්‍රදේශ පිහිටා ඇත. ඒ ඒ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරය හර ප්‍රදේශය වශයෙන් ද ඒ වටා පිහිටි සෙසු ප්‍රදේශ පර්යන්ත ප්‍රදේශ වශයෙන් ද ක්‍රියාත්මක වන ආකාරයක් ප්‍රාදේශීයව නිරීක්ෂණය කළ හැකි ය.

පසුගිය දශකය තුළ ශ්‍රී ලංකාවේ සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය 6.3%ක් පමණ වූ අතර එළඹෙන වසර පහ තුළ එම වර්ධන වේගය 6.6%ක අගයක පවත්වා ගැනීමට රජය වසර 2015 දී සැලසුම් කරන ලදි. ඒ අනුව 2020 වසර වන විට ළඟාකර ගැනීමට මධ්‍ය කාලීන ඉලක්ක කිහිපයක් රජය විසින් හඳුන්වා දෙන ලදි. ඒවා නම්, වසර 2020 වන විට ප්‍රධාන වශයෙන් උතුරු, නැගෙනහිර හා ඌව යන පළාත්වල දිළිඳුකම ජාතික අගය දක්වා අඩු කිරීම, අධ්‍යාපනයේ ප්‍රාදේශීය විෂමතා අවම වන පරිදි සියලු ම පාසල් සංවර්ධනය කිරීම, වෘත්තීය පුහුණු හා තාක්ෂණ විද්‍යාල සඳහා ඇතුළත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව සියයට 50කින් වැඩි කිරීම, මධ්‍යම, උතුරු හා උතුරු මැද පළාත්වල මාතෘ මරණ අනුපාතිකය ජාතික අගය දක්වා අවම කිරීම, මධ්‍යම, උතුරු හා වයඹ පළාත්වල ළදරු මරණ අනුපාතිකය ජාතික අගය දක්වා අඩු කිරිම, නාගරික අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස 65,000ක් ඉදි කිරීම, වාර්ෂිකව ග්‍රාමීය නිවාස 50,000ක් වැඩි දියුණු කිරීම, වතු ජනගහනයෙන් 65%ක් සඳහා මූලික අංගයන් සහිත නිවාස ලබා දීම, නැවත පදිංචි කරවන ලද පවුල් ඒකක සඳහා අවශ්‍ය සියලු ම නිවාස ලබා දීම, ග්‍රාමීය මාර්ග කි.මී. 3,000ක් වැඩි දියුණු කිරීම යනාදියයි. මෙම සැලසුම් සියල්ල ම පසුගිය ආණ්ඩු සමයේ දී සැලසුම් කරන ලද ඒවා ය. නමුත් 2020 වන විට බලය පත් වූයේ වෙනත් ආණ්ඩුවකි. මේ අනුව ශ්‍රී ලංකාවේ සංවර්ධන සංකල්පය මුල් වරට ක්‍රියාත්මක වූ දා සිට දශක ගණනාවක් ගෙවී ගොස් අද පවතින තත්ත්වය දෙස බැලූව ද එදා අද අතර එතරම් වෙනසක් දක්නට නොලැබේ. අප එදත් සංවර්ධනය වෙමින් පවතින රාජ්‍යයකි. අදත් එසේ ම ය. එදත් කොළඹ ඇතුළු බස්නාහිර පළාත තුළ ශ්‍රී ලංකාවේ හර ප්‍රදේශය වශයෙන් ඉහළ සංවර්ධනයක් දක්නට ලැබුණි. ඊට සාපේක්ෂව ගත් කල ශ්‍රී ලංකාවේ පර්යන්ත ප්‍රදේශවල සංවර්ධනය අවම මට්ටමක පවතී. අදත් එවා එසේ ම පවතී. ඒ අනුව ශ්‍රී

ලංකාවේ බලයට පත් වන සියලු ම පාලකයින් එදා සිට අද වන තුරුත් රට ගැන සිතා රටේ ප්‍රාදේශීය සංවර්ධනය ගැන සිතා කටයුතු කරනවාට වඩා තම තමන් සිය පක්ෂ ප්‍රතිපත්ති මත පිහිටා තම තමන්ට කටයුතු කරගත්තාට වඩා වැඩි තත්ත්වයක් සංවර්ධනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන යථාර්ථය තුළ දක්නට නොලැබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා අධික ය. කුමන දේශපාලන දර්ශනයක් ඇතිව හෝ බලයට පත් වන ඕනෑ ම ආණ්ඩුවක් ජනතාව වෙනුවෙන් සිය වගකීම් නොපිරිහෙළා ඉටු කළ යුතු ය. ඔවුන් ක්‍රියාත්මක විය යුත්තේ අවුරුදු පහෙන් පහට මාරු වන පක්ෂ ප්‍රතිපත්තියක් අනුව නොව කවුරුන් බලයට පත් වුව ද වෙනස් නොවන ස්ථිරසාර ජාතික ප්‍රතිපත්තියක් මත පිහිටා ය.

සංවර්ධනයේ ප්‍රතිලාභ සමාජයේ සියලු ම ස්ථරයන් අතර බෙදී යෑම හා ඒ තුළින් සමාජ සමානාත්මතාව හා සාධාරණත්වය ඇති කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. එහෙත් සංවර්ධනයේ ප්‍රතිලාභ සියලු ම පළාත් අතර සියලු ම දිස්ත්‍රික්ක අතර සියලු ම ප්‍රදේශ අතර සමානාකාරයකින් බෙදී ගොස් නොමැත. රාජ්‍යයක් දියුණු වන විට එම රාජ්‍යයේ ප්‍රාදේශීය ප්‍රදේශ අතර පවතින සංවර්ධන විෂමතා අවම විය යුතු ය. එම නිසා හුදෙක් රාජ්‍යයක ජාතික නිෂ්පාදිතය හෝ එහි වර්ධනයෙන් පමණක් එම රාජ්‍යයේ සංවර්ධනය මැනිය නොහැකි වේ. වර්ධනය වන ජාතික නිෂ්පාදනයේ ඵලය ප්‍රාදේශීය ප්‍රදේශ අතර සමබර ලෙස බෙදී යෑම ද මෙහි දී වැදගත් ය. සැමට සමාන සමාජ-ආර්ථික සංවර්ධනයක් උරුම විය යුතු ය. සමබර හා තුළිත සමාජ-ආර්ථික සංවර්ධනයක් ගැන අවධානය යොමු කළ යුත්තේ එබැවිනි. ශ්‍රී ලංකාවේ සෑම පළාතක ම සිටින ජනතාවට සමානාකාරයෙන් සමාජ-ආර්ථික ප්‍රතිලාභ ගලා යන බවට සහතික විය හැක්කේ එවිට ය. මෙහි දී ශ්‍රී ලංකාවේ පළාත් අනුව සෞභාග්‍ය දර්ශකයේ අගය ප්‍රාදේශීයව කුමන ආකාරයකින් නිරූපණය වන්නේ ද යන්න පිළිබඳ වැදගත් වේ. පහත වගු අංක 01 මඟින් එය දැක්විය හැකි ය.

වගුව 01 - පළාත් අනුව සෞභාග්‍ය දර්ශකය 2009 - 2017

| පළාත | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 0.56 | 0.70 | 0.86 | 0.86 | 1.07 | 1.22 | 1.13 | 1.20 | 1.28 |
| මධ්‍යම | -0.51 | -0.21 | -0.09 | -0.02 | 0.23 | 0.30 | 0.26 | 0.35 | 0.35 |
| දකුණු | -0.35 | -0.24 | -0.01 | 0.03 | 0.17 | 0.23 | 0.31 | 0.41 | 0.49 |
| උතුරු | -1.09 | -0.64 | -0.40 | -0.27 | 0.09 | 0.25 | 0.15 | 0.27 | 0.19 |
| **නැගෙනහිර** | **-0.65** | **-0.42** | **-0.43** | **-0.27** | **-0.11** | **-0.09** | **-0.03** | **0.14** | **0.07** |
| වයඹ | -0.41 | -0.25 | -0.16 | -0.06 | 0.17 | 0.27 | 0.17 | 0.31 | 0.35 |
| උතුරු මැද | -0.49 | -0.23 | -0.13 | -0.03 | 0.12 | 0.15 | 0.24 | 0.28 | 0.20 |
| ඌව | -0.62 | -0.45 | -0.37 | -0.21 | -0.10 | -0.01 | 0.03 | 0.21 | 0.14 |
| සබරගමු | -0.69 | -0.38 | -0.35 | -0.16 | 0.01 | 0.07 | 0.11 | 0.13 | 0.15 |
| **ශ්‍රී ලංකාව** | **-0.89** | **-0.53** | **-0.28** | **-0.01** | **0.25** | **0.48** | **0.45** | **0.66** | **0.77** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව., (2019), "ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2019"

මෙම වගුව අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ මෑත කාලයේ දී ද ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ හැර අන් සියලු පළාත්වල සෞභාග්‍ය දර්ශකය ඍණ අගයන් ලෙස පැවති බවත් මෙය කාලයත් සමඟ ක්‍රමයෙන් අඩු වුව ද 2017 වර්ෂයේ දී බස්නාහිර පළාතේ හැර අන් සියලු පළාත්වල සෞභාග්‍ය දර්ශකය පහළ අගයන් නිරූපණය කරන බවත් ය. නැගෙනහිර පළාතේ සෞභාග්‍ය දර්ශකයේ අගය ඉතා ම පහළ මට්ටමක පවතී. ඊට අමතරව ඌව හා සබරගමු පළාත්වල සෞභාග්‍ය දර්ශකයේ අගයන් ද පහළ මට්ටමක පවතී. මෙම පළාත්වල අගයන් හා බස්නාහිර පළාතේ අගයන් අතර පවතින පරතරය පුළුල් ය. එසේ ම මෙම දර්ශකයේ ආර්ථික ව්‍යාපාරික පරිසර උප දර්ශකය, ජන ජීවිතයේ යහපැවැත්ම උප දර්ශකය, සමාජ ආර්ථික යටිතල පහසුකම් උප දර්ශකය යනාදියෙහි අගයන් ගත්ත ද මේ අයුරින් ප්‍රාදේශීයව පුළුල් විෂමතාවක් නිරීක්ෂණය කළ හැකි වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීයව සංවර්ධනයේ විෂමතා පුළුල්ව පවතින බව විශේෂයෙන් සඳහන් කළ යුතු නොවේ.

## ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා සඳහා බලපාන සාධක

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් හඳුනාගත හැකි ය. මෙම තත්ත්වය නිර්මාණය වීම දීර්ඝ කාලයකට පෙර සිදු වූ දෙයකි. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වශයෙන් එකිනෙකට වෙනස් වූ සංවර්ධන ප්‍රදේශ පිළිබඳ විවිධ පසුබිම් හේතු සාධක රැසක් බලපා ඇත. ඒ අතර භෞතික පරිසරය, ඓතිහාසික සාධක, සංස්කෘතිය, දේශපාලන ස්වාධීනත්වය, රාජ්‍ය ප්‍රතිපත්ති, ආර්ථිකය, මානව සම්පත, මානව ආකල්ප, විද්‍යාව හා තාක්ෂණය, සන්නිවේදනය, අධ්‍යාපනය, නාගරීකරණය හා නාගරික අභිනතිය, පරිපාලන බෙදීම් හා මායිම්, සංවර්ධන උපාය මාර්ගවල ප්‍රායෝගික භාවිතය, ත්‍රස්තවාදය යනාදිය වැදගත් ය.

භෞතික පරිසරය යනුවෙන් මෙහි දී අදහස් කරනුයේ භූ විෂමතාව හා දේශගුණික තත්ත්වයන් යනාදියයි. ඉහළ සංවර්ධන ඉලක්කයන් කරා ළඟා වීමට නම් මේවායෙහි සාධනීය බලපෑමක් පැවතිය යුතු ය. සෑම මිනිස් ක්‍රියාකාරකමක් සඳහා ම භෞතික පරිසරය බලපානු ලබයි. භෞතික පරිසරය අභිබවා මිනිස් කටයුතු ප්‍රසාරණය වන විට ඉන් පරාජයට පත්වීමේ ඉහළ ම සම්භාවිතාව ඇත්තේ මිනිසාට ය. මේ නිසා සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් භෞතික ප්‍රතිරෝධකතා හේතුවෙන් භෞතික වශයෙන් දැඩි විෂමතාවකට ලක් වී තිබේ. භෞතික පරිසරයේ පවතින විවිධත්වය සංවර්ධනය ගලායාමට හානිකර වී තිබේ. ලංකාවේ භූ විෂමතාව දෙස බලන විට මධ්‍යම කඳුකරය කඳුකර කලාපවලින් යුක්ත වන අතර ලංකාවේ නිරිත දිග ප්‍රදේශයේ සමාන්තරව දිවෙන සබරගමු කඳු කලාපය ද වේ. මෙම ප්‍රදේශ වතු ජනාවාසවලින් යුතු දියුණු සංවර්ධන කලාපවලින් තොර ය. අධික වර්ෂාපතනය, බෑවුම් ප්‍රදේශ පිහිටීම නිසා සංවර්ධන කටයුතු සිදු කිරීම අසීරු ය. මේ නිසා ද්විතීයික හා තෘතීක ආර්ථික කටයුතු ප්‍රසාරණය නොවේ. භූ දර්ශනය නිසා සංවර්ධනය යම් යම් ප්‍රදේශවලට සීමා වී තිබේ. එමෙන් ම ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීමේ දී දේශගුණ විෂමතා විශේෂයෙන් ම බලපා ඇත. උදාහරණ ලෙස ශ්‍රී ලංකාවේ උතුරු කලාපයට අයත් වන වව්නියාව දිස්ත්‍රික්කය තුළ සංවර්ධන ව්‍යාපෘති දියත්වීමක් වර්තමානය තුළ දී ද ඉතා අවම මට්ටමක පවතී. උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය මඟින් ජල සැපයුම සංවර්ධනය කිරීමට වත්මන් රජය මඟින් යෝජනා කර ඇති අතර එහි සාර්ථකත්වයක් පිළිබඳව තවමත් නිශ්චිත නොමැත. එසේ ම සබරගමුව, ඌව, නැගෙනහිර වැනි ප්‍රදේශ ද ඉතා සෙමින් සංවර්ධනය වන ප්‍රදේශ ලෙස විද්වතුන් විසින් හඳුනාගෙන ඇත. මෙම ප්‍රදේශවල ජල සැපයුම ඉතාම දුර්වල වන අතර ආන්තික දේශගුණයක් සහිතවීම නිසා සංවර්ධන ව්‍යාපෘති පවා දියත් වන්නේ ඉතාම අවම ලෙසට ය. නමුත් වයඹ, බස්නාහිර, මධ්‍යම පළාත් සීඝ්‍රයෙන් වර්ධනය

වන අතර එහි ජල සැපයුමේ ඇති විභවතාවය මෙන් ම ජනාකීර්ණවීම ද බලපා ඇත. තෙත් කලාපීය ප්‍රදේශ වන මෙම කලාපය ශ්‍රී ලංකාවේ සංවර්ධනය අතින් ඉහළ ම වර්ධනයක් පෙන්නුම් කරයි. මේ අනුව ශ්‍රී ලංකාවේ පවතින භෞතික පරිසරය මත මෙහි සංවර්ධනයේ අවකාශීය විෂමතාවක් නිරූපනය වේ.

12 වන හා 13 වන සියවස්වල ශ්‍රී ලංකාවේ රාජධානි නිරිත දිගට සංක්‍රමණය වීම සිදු විය. මෙහි දී වියළි කලාපීය ප්‍රදේශවල එනම් අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණිය, යාපහුව ආදී ප්‍රදේශවල සිට කුරුණෑගල, ගම්පොළ, කොට්ටේ ආදී ප්‍රදේශවලට ජනයා සංක්‍රමණය විය. මේ හේතුවෙන් වියළි කලාපීය ප්‍රදේශ ජනශුන්‍ය විය. දිගින් දිගට ම හුදකලා වීම තුළ දී කාලීන සංවර්ධන පසුබිමක් නිර්මාණය නොවී ය. පැවති රාජධානි ක්‍රමය මෙම ප්‍රදේශ පසුගාමී සංවර්ධන ප්‍රදේශ බවට පත් කරවී ය. එය ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා නිර්මාණය වීමට හේතු විය.

සංස්කෘතිකමය හා ආකල්පමය සාධක හේතුවෙන් ඇතැම් ප්‍රදේශවලට සංවර්ධනය ගලායාමට බාධා පැමිණ ඇත. වතු ජනාවාස ආශ්‍රිතව ඔවුන්ට ආවේණික සංස්කෘතීන් හේතුවෙන් සමාජ සංවර්ධන වැඩසටහන් දියත් කිරීමේ දී විවිධ දුෂ්කරතා මතු වේ. එමෙන් ම පාරම්පරික වැදි ගම්මාන සංවර්ධනයේ දී ද නූතන සංවර්ධන ප්‍රතිලාභ ලබා දීම ගැටලුවක් වී ඇත. නුවර කලාවියේ ගොවිතැන් කේන්ද්‍ර කරගත් ගම්මානවලට නූතන තාක්ෂණය ලබාදීම ඉතාම අසීරු කාර්යයක් වී තිබේ. එම සමාජ තුළ මුල් බැසගත් සංකල්ප කඩා බිඳ දැමීම පහසු කටයුත්තක් නොවේ. මේ නිසා සංවර්ධනයේ ආංශික තත්ත්වයන් නිරූපනය කරයි. මුස්ලිම් ජනතාව වැඩිපුර ජීවත් වන සමන්තුරේ, අම්පාර, කල්මුනේ වැනි ප්‍රද්ශවල විරැකියාව ඉහළයාම හා සාක්ෂරතාව පහළයාම කෙරෙහි මුස්ලිම් කාන්තාවන්ට පවතින සාම්ප්‍රදායික, ආගමික හා සංස්කෘතික බලපෑම් හේතු වී තිබේ.

ශ්‍රී ලංකාවේ පවතින පරිපාලන බෙදීම් ද සංවර්ධන විෂමතා නිර්මාණය වීමට බලපා ඇත. යටත් විජිතයක්ව පැවති යුගවල සිට මෙරට ස්ථාපිත කළ අවිධිමත් පරිපාලන බෙදීම් මෙම තත්ත්වයට හේතු වී ඇත. සම්පත් ව්‍යාප්තිය, භූ විෂමතාව, පාරිසරික කලාප, දේශගුණය හා සංස්කෘතිය යන ලක්ෂණ වැනි නිර්ණායක කෙරෙහි අවධානය යොමු නොකර මෙම බෙදීම් සිදු කර ඇත. රටක් සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමේ දී සමස්ත ප්‍රදේශයන් පිළිබඳව ම අවධානය යොමු කළ යුතු ය. සංවර්ධනයේ ප්‍රතිලාභ සෙසු ප්‍රදේශවලට ගලා යාමට නම් පවත්නා පරිපාලන බෙදීම් වර්තමානයට ගැළපෙන පරිදි වෙනස් කළ යුතු ය. නිදසුනක් ලෙස කඩුගන්නාව හා හපුතලේ නගර ලෙස සැලකුව ද සෙසු නගර හා සසඳන

විට ඒවායෙහි නාගරික ලක්ෂණ නොමැත. මේ නිසා පරිපාලන බෙදීම්වල ඇති දුර්වලතාව නිසා ද සංවර්ධනයේ ප්‍රතිලාභ ගලා යාම විෂම වී ඇත.

සංවර්ධන උපාය මාර්ගවල ප්‍රායෝගික භාවිතය සංවර්ධනයේ අවකාශීය අසමානතාවන් සඳහා බලපාන ප්‍රබල සාධකයක් වේ. උසස් සංවර්ධන උපාය මාර්ග න්‍යායික වශයෙන් පැවතීම සංවර්ධන ක්‍රියාවලියක දී ප්‍රමාණවත් නොවේ. ඒවා ඒ ඒ ප්‍රදේශවල සෙසු සාධක ද සැලකිල්ලට ගෙන ඒ ඒ ප්‍රදේශවලට උචිත ලෙස ප්‍රායෝගිකව යොදා ගත යුතු ය. සංවර්ධන උපාය මාර්ග ප්‍රායෝගිකව භාවිතා කිරීමේ දී භෞතික පරිසරය පිළිබඳ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු ය. භෞතික පරිසරයේ සංවේදී තත්ත්වයන්ට හානියක් නොවන්නට කටයුතු කළ යුතු වේ. සංවර්ධන උපාය මාර්ග ප්‍රායෝගිකව භාවිතා කිරීමේ සාර්ථක අසාර්ථකභාවය අනුව සංවර්ධනයේ ස්වභාවය තීරණය වී ඇති ආකාරයක් අවකාශීයව නිරූපිත ය.

**නිදසුන -** ගංගා 103කින් සමන්විත ශ්‍රී ලංකාව තුළ සංවර්ධන ක්‍රියාමාර්ග ඉතා ම පහසු ලෙස කළ හැකි නමුත් රජය මඟින් ගෙන යන සංවර්ධන ව්‍යාපෘති මඟින් සිදුවන්නේ සංවර්ධනය තව තවත් අඩාල වන බවයි. එනම් උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් විශාල ඛේදවාචකයකට එම ප්‍රදේශයේ ජනතාව මුහුණ පා ඇත. මෙම තත්ත්වයන් මඟින් ප්‍රාදේශීය සංවර්ධන විෂමතා තව තවත් තීව්‍ර කර ඇත.

සංවර්ධන ක්‍රියාමාර්ග මඟින් භූමි පරිහරණ රටාවේ පැහැදිලි වෙනසක් ඇති කර තිබේ. වගුරු බිමක් වූ මුතුරාජවෙල භූමිය හරහා කටුනායක අධිවේගී මාර්ගය ඉදි කර ඇත. සංවර්ධන ක්‍රියාදාමයේ දී ජෛව පරිසර පද්ධතීන්ට සිදු වන හානිය අවතක්සේරු කිරීම මඟින් විවිධ ස්වභාවික ආපදාවන් සිදු වේ. කොළඹ, ගම්පහ වැනි නගර ඉදිකිරීමේ දී ද ගංවතුර තර්ජනයට ලක් වීම ගැටලුවක් වී ඇත. සංවර්ධනය මුවාවෙන් සිදු වන මෙම ස්වාභාවික විපත් මඟින් ජන ජීවිතවල ගුණාත්මක භාවයට දැඩි ලෙස හානි සිදු කරයි. මෙම තත්ත්වය නිසා ප්‍රාදේශීය සංවර්ධන විෂමතා උග්‍ර වෙමින් පවතී. එසේ ම අනුරාධපුර නගරය ද ගංවතුර තර්ජනයට ලක් වේ. මෙම නගරය ගොඩ නැගී ඇත්තේ පහත් බිම් ගොඩ කිරීම මඟින් ය. මේ නිසා නිසි කාණු පද්ධතියක් නොතිබීම හේතුවෙන් ද ගංවතුර තර්ජනයට ලක් වේ.

ප්‍රදේශයක් තුළ සාමකාමී වතාවරණයක් නොමැති වීම ද සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතාවන් ඇති වීමට බලපාන ලද හේතු සාධකයකි. ත්‍රස්තවාදය බොහෝමයක් දේශපාලනික සංවිධාන මඟින් ඔවුන්ගේ අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා විශාල වශයෙන් භාවිතා කර ඇත. ඒවා අතරට දක්ෂිණාංශික හා වාමාංශික දේශපාලන පක්ෂ, ජාතිවාදී හා

ආගමික කණ්ඩායම්, විප්ලවවාදීන් හා ආණ්ඩු අයත් වේ. නූතන ලෝක ක්‍රමය අනුව ත්‍රස්තවාදය ද කාලය සමඟ පරිණාමය වෙමින් එහි නිම් වළලු පුළුල් කරමින් ගෝලීය ත්‍රස්තවාදයක් (Global Terrorism) වෙත පිය නඟා ඇත. මේ අනුව සංවර්ධනයේ විෂමතා වර්ධනය වන්නට විය. 2019 වර්ශයේ අප්‍රේල් 21 වන දින එල්ල වූ ඉස්ලාමීය ත්‍රස්තවාදී පාස්කු ප්‍රහාරය ද ජාත්‍යන්තර හා දේශීය ත්‍රස්තවාදයේ කුරිරු අවස්ථාවකි. මෙමඟින් ද මෙහි බලපෑමට ලක් වූ ලංකාවේ ඒ ඒ ප්‍රදේශවල සංවර්ධන ක්‍රියාවලිය පසුබෑමකට ලක් විය. එසේ ම තිස් අවුරුදු ඊලාම් යුද්ධය ද සංවර්ධනයේ විෂමතා ඇති කිරීමට හේතු විය. උතුර සහ නැගෙනහිර ප්‍රදේශවල සංවර්ධන ව්‍යාපෘති මෙම කාලය තුළ සිඳු නොවුන තරම් ය. මේ නිසා අවකාශීය සංවර්ධන දෘෂ්ටි කෝණයකින් ශ්‍රී ලංකාව දෙස බලන කල මෙම ප්‍රදේශය තුළ ලංකාවේ සෙසු ප්‍රදේශවලට වඩා වර්තමානයේ දී ද ඉතා අඩු මට්ටමක සංවර්ධනයක් නිරීක්ෂණය කළ හැකි ය.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා කෙරෙහි දේශපාලන ස්වාධීනත්වය, රාජ්‍ය ප්‍රතිපත්ති, ආර්ථිකය, මානව සම්පත, මානව ආකල්ප, විද්‍යාව හා තාක්ෂණය, සන්නිවේදනය, අධ්‍යාපනය, නාගරීකරණය හා නාගරික අභිනතිය යනාදී සාධක ද හේතු වී ඇත. මේ අනුව සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතාවන් සඳහා විවිධ සාධක විවිධාකාරයෙන් බලපා ඇති ආකාරය විවරණය වේ.

## ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා නිසා ඇති වී තිබෙන අභියෝග

භූමි ප්‍රමාණයෙන් කුඩා රාජ්‍යයක් වුව ද පාරිසරික, ආර්ථික හා සමාජ ලක්ෂණ අනුව ශ්‍රී ලංකාව සැලකිය යුතු විවිධත්වයක් විද්‍යමාන වන රටකි. ගත වූ සියවස් දෙකක කාලය තුළ සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා විවිධ නිර්ණායක ඇසුරින් ගම්‍ය වන ස්වභාවය අනුව ශ්‍රී ලංකාවේ පවතින ප්‍රාදේශීය සංවර්ධන විෂමතාව හඳුනාගත හැකි ය. සෙසු බොහෝ දියුණු හා නොදියුණු රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ රජය ද මුහුණදෙන ප්‍රධාන අභියෝගය වනුයේ රටෙහි නිශ්පාදනය, ආදායම හා රැකියා අවස්ථා ජාතික වශයෙන් වර්ධනය කිරීම මෙන් ම එම වර්ධනයෙහි ප්‍රතිලාභ සමාජය තුළ සහ ප්‍රාදේශීය වශයෙන් හැකිතාක් දුරට සාධාරණ ලෙස ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම ය. නමුත් ශ්‍රී ලංකාව ප්‍රාදේශීය සංවර්ධන විෂමතා නිසා අභියෝග රැසකට මුහුණ පාමින් සිටී. මෙම අභියෝග අංශ කිහිපයක් ඔස්සේ දැක ගත හැකි ය.

**ආර්ථික අභියෝග**

- විරැකියාව සහ ඌන සේවා නියුක්තිය පිළිබඳ ප්‍රාදේශීය විෂමතාවයන් පළාත් අතර සැලකිය යුතු මට්ටමකින් පැවතීම.
- දරිද්‍රතාවය සහ අවදානම් බව සම්බන්ධ ගැටලු ප්‍රාදේශීයව නිරීක්ෂණය කළ හැකි වීම හා දිළිඳු පොකුරු (poverty pockets) ශ්‍රී ලංකාවේ පළාත්වල විවිධ ප්‍රදේශයන්හි පැවතීම.
- ප්‍රාදේශීයව ආදායම් විෂමතා පැවතීම.
- මූල්‍ය සාක්ෂරතාවයේ ප්‍රාදේශීය විෂමතාවක් පැවතීම.
- පසුගාමී පළාත් විසින් දළ දේශීය නිෂ්පාදිතයට කරන දායකත්වය ප්‍රමාණවත් නොවීම.
- ආයෝජන සංවර්ධනයේ හර ප්‍රදේශ වෙත ඇදී යාම.
- සංවර්ධනයේ හර ප්‍රදේශවලට සමාජ-ආර්ථික ප්‍රතිලාභ සංකේන්ද්‍රගත වීම.
- සංවර්ධනයේ හර ප්‍රදේශවල ඉඩම් ඒකකයක මිල ඉහළ යාම පාලනය කළ නොහැකිවීම.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා නිසා මතු වන ආර්ථික අභියෝගවලට අප රටක් වශයෙන් සේ ම ඒ ඒ ප්‍රදේශවල ජනයා ද දැඩි ලෙස මුහුණ පාමින් සිටී. මෙහි දී විරැකියාව සහ ඌන සේවා නියුක්තිය පිළිබඳ ප්‍රාදේශීය විෂමතාවයන් පළාත් අතර සැලකිය යුතු මට්ටමකින් පැවතීම ප්‍රධාන අභියෝගයකි. පහත රූප සටහන් අංක 01ට අනුව ස්ත්‍රී පුරුෂ දෙපාර්ෂවයේ ම අවම සේවා නියුක්තියක් දක්වන දිස්ත්‍රික්ක පිළිවෙළින් යාපනය, කිලිනොච්චි, වව්නියා, මන්නාරම, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, මහනුවර යන දිස්ත්‍රික්ක ය. ඒ අනුව ඉහළ ම සේවා වියුක්තියක් දක්වන දිස්ත්‍රික්ක ද පිළිවෙළින් මෙම දිස්ත්‍රික්ක වේ. සංවර්ධනයේ ප්‍රතිලාබ පර්යන්ත ප්‍රදේශවලට ගලා යාමේ පවතින දුර්වලතා නිසා මෙලෙස ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල විරුකියාව ඉහළ මට්ටමකින් දැකිය හැකි ය. එසේ ම ඌන සේවා නියුක්තියෙන් ද සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල ජනයා විවිධ ආර්ථික හා සමාජමය අපහසුතාවන්ට පත්ව සිටී. මෙම ප්‍රදේශවල තරුණ විරුකියාව ඉහළ මට්ටමක පැවතීම ද විශාල ගැටලුවකි. සිය අධ්‍යාපන මට්ටමට, සිය වෘත්තීය පුහුණු මට්ටමට හා දක්ෂතාවන්ට ගැළපෙන අයුරින් සේවා සැපයීමට ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී පළාත් අසමත් වී ඇත. මෙවන් තත්ත්වයන් රටක් වශයෙන් පසුගාමී වීමටත් ප්‍රාදේශීයව පර්යන්ත ප්‍රදේශවල ජනයාගේ ජීවන තත්ත්වය පහළ දැමීමටත් ප්‍රබල හේතු කාරක වේ.

**ප්‍රස්තාරය 01 - දිස්ත්‍රික්ක අනුව වසර 15ට වැඩි ජන සංඛ්‍යාවේ සේවා නියුක්ත අනුපාතය 2012**




මූලාශ්‍රය - ජනලේඛන හා සංඛාලේඛන දෙපාර්තමේන්තුව, 2012

දරිද්‍රතාවය සහ අවදානම් බව සම්බන්ධ ගැටලු ප්‍රාදේශීයව නිරීක්ෂණය කළ හැකි වීමත් දිළිඳු පොකුරු (poverty pockets) පළාත්වල විවිධ ප්‍රදේශයන්හි පැවතීමත් මෙහි දී මුහුණ පාන ප්‍රධාන අභියෝගයකි. කෘෂිකාර්මික නොවන කම්කරුවන් සහ සමාන සේවකයන් සහ කෘෂිකර්ම, වන ආශ්‍රිත හා ධීවර ක්ෂේත්‍රයේ කම්කරුවන්ගේ කුටුම්බයන් ශ්‍රී ලංකාවේ දුප්පත් ම කුටුම්බ බව විශ්ලේෂණවලින් පෙනී යයි. වඩාත් අවදානමක් ඇති වෙනත් කණ්ඩායම් වන්නේ රැකියාවක් විරහිත පුද්ගලයින්, පුහුණු කෘෂිකාර්මික, වන ආශ්‍රිත හා ධීවර කම්කරුවන් සහ වැඩ කළ නොහැකි තරම් වයස්ගත පුද්ගලයන්ගේ කුටුම්බයන් ය. දිස්ත්‍රික්ක අනුව දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වන සේවා නියුක්ත පුද්ගල සමානුපාතය පහත රූප සටහන් අංක 02 මඟින් නිරූපිත ය. මෙහි වැඩි ම අගයක් ගන්නේ පිළිවෙළින් මුලතිව්, මොණරාගල, මඩකලපුව, මන්නාරම, බදුල්ල යන දිස්ත්‍රික්කයන් ය. රැකියාවක නිරත වූව ද

දරිද්‍රතාවයේ ගැහැට විඳින පුද්ගල සංඛ්‍යාව සංවර්ධනයේ පසුගාමී පර්යන්ත ප්‍රදේශවල ඉහළ අගයක් ගන්නා බව මින් පැහැදිළි වේ.

**ප්‍රස්තාරය 02 - දිස්ත්‍රික්ක අනුව දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වන සේවා නියුක්ත පුද්ගල සමානුපාතය 2012**




මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012

එමෙන් ම දරිද්‍රතාවයෙන් ඉහළට ඔසවා තැබූ අය නැවත දරිද්‍රතාවයට පත්වීම වැළැක්වීම තහවුරු කිරීම ද වැදගත් ය. රජය දරිද්‍රතාවය සැලකිය යුතු ප්‍රමාණයකට අඩු කිරීමට ඉවහල් වූ ආර්ථික වර්ධනය උත්තේජනය කරන උපාය මාර්ග සකස් කොට ක්‍රියාත්මක කළ ද ආදායම් අසමානතාවය තවමත් ඉහළ මට්ටමක පවතී. ප්‍රදේශවල ඇති සංවර්ධනයේ අසමානතා සහ විවිධ සමාජ ආර්ථික කණ්ඩායම් නිසා මෙය ඇති විය හැකි ය. තවත් බරපතල අභියෝගයක් වනුයේ මූල්‍ය සාක්ෂරතාවයේ ප්‍රාදේශීය විෂමතාවක් පැවතීමයි. සංවර්ධනය මූල්‍යකරණය සමඟ නොමඳ සම්බන්ධතාවක් දක්නට ලැබෙන අතර, මූල්‍යකරණයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට මූල්‍ය සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතිය යුතු ය. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතිය ද ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීයව විශේෂයෙන් ම සංවර්ධනයේ පර්යන්ත ප්‍රදේශවල මූල්‍ය සාක්ෂරතාව පහළ මට්ටමක පවතින බව අනාවරණය වී ඇත.

මෙහි දී තවදුරටත් කිව හැකි කරුණ වන්නේ නාගරික අංශයට සාපෙක්ෂව ග්‍රාමීය අංශයේ මූල්‍ය සාක්ෂරතාව පහළ මට්ටමක පවතින බවයි. එසේ ම සංවර්ධනයේ පසුගාමී පළාත් විසින් දළ දේශීය නිෂ්පාදිතයට කරන දායකත්වය ප්‍රමාණවත් නොවීමත් සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතාවන් නිසා පැනනැගී පවතින අයහපත් තත්ත්වයකි. වගු අංක 02 මගින් ශ්‍රී ලංකාවේ පවත්නා වෙළඳපොළ මිල අනුව පළාත් දළ දේශීය නිශ්පාදිතය දැක්විය හැකි ය.

**වගුව 02 - පවත්නා වෙළඳපොළ මිල අනුව පළාත් දළ දේශීය නිශ්පාදිතය 2019**

| පළාත | ද. දේ. නි. දායකත්වය (%) | | | | | ද. දේ. නි. (රු. මිලියන) | | ඒකපුද්ගල ද. දේ. නි. (රු.) | | වර්ධනය (%) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016/ 2017 |
| බස්නාහිර | 42.2 | 41.5 | 39.9 | 37.9 | 37.7 | 4,540,772 | 5,054,669 | 753,280 | 831,223 | 10.3 |
| මධ්‍යම | 10.5 | 10.5 | 10.6 | 10.7 | 10.7 | 1,277,670 | 1,436,787 | 474,970 | 527,843 | 11.1 |
| දකුණු | 10.1 | 10 | 10.1 | 9.9 | 9.8 | 1,188,146 | 1,313,121 | 459,809 | 502,919 | 9.4 |
| උතුරු | 3.4 | 3.9 | 4.1 | 4.5 | 4.5 | 541,431 | 605,331 | 489,097 | 540,957 | 10.6 |
| නැගෙනහිර | 5.7 | 5.5 | 5.7 | 5.3 | 5.6 | 632,592 | 746,471 | 384,555 | 445,123 | 15.8 |
| වයඹ | 10.9 | 10.7 | 10.6 | 10.7 | 10.7 | 1,280,125 | 11,440,015 | 516,805 | 574,169 | 11.1 |
| උතුරු මැද | 5.1 | 5.4 | 5.9 | 5.9 | 5.6 | 706,286 | 751,131 | 531,042 | 556,806 | 4.9 |
| ඌව | 5.2 | 5.4 | 5.6 | 7.1 | 7.6 | 855,710 | 1,020,692 | 641,943 | 756,629 | 17.9 |
| සබරගමුව | 7 | 7.1 | 7.5 | 8.1 | 7.8 | 973,351 | 1,050,070 | 484,495 | 5,177,866 | 6.9 |
| ශ්‍රී ලංකාව | 100 | 100 | 100 | 100 | 100 | 11,996,083 | 13,418,287 | 565,773 | 625,736 | 10.6 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව, 2019

2017 වසරේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට වැඩි ම දායකත්වයක් දක්වා ඇත්තේ බස්නාහිර පළාතයි. එහි අගය 37.7%කි. ඊට සාපේක්ෂව සංවර්ධනයේ පසුගාමී පළාත් විසින් මේ සඳහා සිදු කර ඇති දායකත්වය සැලකිය යුතු මට්ටමකින් පහළ ප්‍රතිශතාත්මක අගයන් ගනී. එනම් උතුරු පළාත විසින් 4.5%ක් ද නැගෙනහිර හා උතුරු මැද පළාත් විසින් 5.6% බැගින් ද ඌව පළාත විසින් 7.6%ක් ද සබරගමු පළාත විසින් 7.8%ක් ද දකුණු පළාත විසින් 9.8%ක් ද මධ්‍යම පළාත හා වයඹ පළාත විසින් 10.7% බැගින් ද වශයෙන් වේ. මේ අනුව

සංවර්ධනයේ හර ප්‍රදේශයේ හා පර්යන්ත ප්‍රදේශවල මෙම ප්‍රතිශතාත්මක අගයන්ගේ පරතරය පුළුල් ලෙස නිරූපණය වේ. ඉහතින් දක්වන ලද ශ්‍රී ලංකාවේ හර හා පර්යන්ත ප්‍රදේශ ව්‍යාප්තිය සහ ශ්‍රී ලංකාවේ පවත්නා වෙළඳපොළ මිල අනුව පළාත් දළ දේශීය නිශ්පාදිතය අතර පැහැදිලි සම්බන්ධයක් දැකිය හැකි ය. මේ නිසා දේශීය හා විදේශීය ආයෝජන ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ හර ප්‍රදේශවලට ඇදී යාමේ ප්‍රවණතාවක් පවතී. මෙවන් තත්ත්වයන් නිසා සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශ සංවර්ධනයට පවතින අවස්ථා තව තවත් හැකිලීමේ අවදානමක් පවතින බව ද අප සිහි තබා ගත යුතු ය. එසේ ම ශ්‍රී ලංකාවේ හර ප්‍රදේශවල සංවර්ධන ක්‍රියාවලිය සැලකිය යුතු මට්ටමකින් වර්ධනය වී ඇති නිසාත් සියලු සමාජ ආර්ථික පහසුකම් එම ප්‍රදේශවලට සංකේන්ද්‍රණය වී ඇති නිසාත් එම ප්‍රදේශවල වැඩි ජන ඝනත්වයක් පවතී. ඒ අනුව ජනයා වැඩි වශයෙන් මෙම ප්‍රදේශවලට ඒකරාශී වීම පදනම් කරගෙන මෙම ප්‍රදේශවල ඉඩම් සඳහා පවතින ඉල්ලුම කාලයත් සමග වැඩි වෙමින් පවතී. මේ ආකාරයට හර ප්‍රදේශවල ඉඩම් මිල ඉහළ යාම අද වන විට පාලනය කළ නොහැකි තත්වයකට පත්ව ඇත.

**සෞඛ්‍ය අභියෝග**

- ඇතැම් පළාත්වලට විශේෂිත වූ බෝ නොවන රෝග ආශ්‍රිත ගැටළු පැවතීම. (උදා: උතුරු මැද, නැගෙනහිර, දකුණු හා ඌව යන දිස්ත්‍රික්කයන්හි හඳුනානොගත් නිදන්ගත වකුගඩු රෝගය වැඩි වශයෙන් ව්‍යාප්ත වී පැවතීම)
- සංවර්ධනයේ පර්යන්ත ප්‍රදේශවල ඉහළ ළදරු මරණ අනුපාතිකයක් පැවතීම.
- සංවර්ධනයේ පර්යන්ත ප්‍රදේශවල මාතෘ සෞඛ්‍ය පිළිබඳ ගැටලු පැවතීම.
- ප්‍රෝටීන ඌනතාව හා මන්දපෝෂණ සම්බන්ධයෙන් ප්‍රාදේශීයව ගොඩනැගුන ගැටලු පැවතීම.
- කුසගින්න තුරන් කිරීම සම්බන්ධ ගැටලු පැවතීම.
- ප්‍රාදේශීයව ඇතැම් ප්‍රදේශවල වසංගත රෝග ව්‍යප්තිය පාලනයේ ගැටලු පැවතීම.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා නිසා ප්‍රාදේශීයව මතු වී තිබෙන සෞඛ්‍ය ගැටලු ආශ්‍රිත අභියෝගයන්ට ශ්‍රී ලාංකිකයන් දැඩි ලෙස මුහුණපාමින් සිටී. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල ජන සංඛ්‍යාව බෝ නොවන රෝගී තත්ත්වයන්ට හා වසංගත රෝගවලට ගොදුරු වීමේ ඉහළ ශක්‍යතාවක් පවතී. බෝ නොවන රෝගී තත්ත්වයන්ට හේතු සාධක වන්නේ හර ප්‍රදේශවල නාගරිකකරණය වැඩිවීම, මත්පැන් සහ

දුම් පානය සහ ශරීරයට සුවදායක නොවන ආහාර පාන යනාදී පර්යන්ත ප්‍රදේශවල පවතින දිළිඳුකම හා පුද්ගල සෞඛ්‍යයේ දැනුවත්භාවයේ මදකම නිසාත් ය. එසේ ම වසංගත රෝගී තත්ත්වයන්ට ගොදුරු වීමේ වැඩි ම අවධානමකට ලක් වී ඇති ජන කොට්ඨාසය වනුයේ හර හෝ පර්යන්ත ප්‍රදේශවල සිටින දිළින්දන් ය. එසේ ම මෙම ප්‍රදේශවල සිටින අඩු ආදායම්ලාභීන් හට ද එහි දී ඉහළ අවදානමක් පවතී. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා නිසා ජනයා විශාල අභියෝග රැසකට මුහුණපාමින් සිටී. එසේ ම සංවර්ධනයේ පර්යන්ත ප්‍රදේශවල ඉහළ ළදරු මරණ අනුපාතිකයක් පැවතීම, මාතෘ සෞඛ්‍ය පිළිබඳ ගැටලු පැවතීම, ප්‍රෝටීන ඌනතාව හා මන්දපෝෂණය සම්බන්ධව ගොඩනැගුන ගැටලු පැවතීම, කුසගින්න තුරන් කිරීම සම්බන්ධ ගැටලු පැවතීම යනාදිය ද මෙම විෂමතාව නිසා ඇති වී තිබෙන අභියෝගයන් ය. පවුල් සෞඛ්‍ය කාර්යාංශය අනුව ළදරු මරණවලින් 70%ක් ම සිදු වන්නේ ඉපදීමෙන් දින 28ක් ඇතුළත ය. ඊට හේතුන් වන්නේ සහජ විකෘත (48%) සහ නොමේරු (28%) උපත් ය. ළදරු මරණ සංඛ්‍යාව අඩුවීම රඳා පවත්නේ නවජ සූති මරණ සංඛ්‍යාව අඩු කිරීම මත ය. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී පර්යන්ත ප්‍රදේශවල ප්‍රශස්ත මාතෘ සෞඛ්‍යයක් නොපැවතීම, මාතෘ හා ළදරු ප්‍රතිශක්තිකරණ හැකියාව දුර්වල වීම, මෙම ප්‍රදේශවල කාන්තාවන්ගේ දැනුවත්භාවය මේ සම්බන්ධයන් අවම මට්ටමක පැවතීම, දරිද්‍රතාව හා ආදායම් විෂමතාව, කුසගින්න, ප්‍රොටීන ඌනතාව, මන්දපෝෂණය යනාදී හේතු මේ සඳහා සාධක වී ඇත. 2012 වසරේ ශ්‍රී ලංකාවේ අංශ හා දිස්ත්‍රික්ක අනුව (උතුරු පළාතේ දිස්ත්‍රික්ක හැර) වයස අවුරුදු 05ට අඩු බරින් අඩු ළමයින්ගේ ප්‍රතිශතය ප්‍රස්තාර අංක 01 මඟින් නිරූපිත ය.

**ප්‍රස්තාරය 03 - ශ්‍රී ලංකාවේ අංශ හා දිස්ත්‍රික්ක අනුව (උතුරු පළාතේ දිස්ත්‍රික්ක හැර) වයස අවුරුදු 05ට අඩු බරින් අඩු ළමයින්ගේ ප්‍රතිශතය 2012**




මූලාශ්‍රය - ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012

මේ අනුව මෙම ගැටලු සම්බන්ධයෙන් ප්‍රදේශ වශයෙන් ඉහළ මට්ටමක පවතින විචල්‍යතා අවම කිරීම අභියෝගයක් වී ඇත.

**සමාජීය අභියෝග**

- සංවර්ධනයේ හර ප්‍රදේශ වෙත තව තවත් සංවර්ධනය සංකේන්ද්‍රගතවීම හා සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශ තව තවත් හුදකලාවීම.
- අධ්‍යාපනයේ ගුණාත්මක භාවයේ ප්‍රාදේශීය විෂමතා පැවතීම.
- ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමේ පොදු සේවාවන් කාර්යක්ෂමව ලබා දීම සඳහා ඇතැම් පළාත් පාලන ආයතනයන්ට ප්‍රමාණවත් ධාරිතාවයක් නොතිබීම.
- ප්‍රාදේශීයව ඇතැම් පළාත්වල ප්‍රතිරූපය පහළ මට්ටමක පැවතීම.

- ගම හා නගරය අතර පරතරය වැඩි වීම.
- සංවර්ධනයේ හර ප්‍රදේශවල ඉසුලුම් ධාරිතාව ඉක්මවා ජනගහනය වර්ධනය වීම නිසා නාගරීකරණය ආශ්‍රිත ගැටලු මතු වීම.
- සංවර්ධනයේ හර ප්‍රදේශවල මාර්ග තදබදය ඉහළ යාම හා එය පාලනය කිරීමට අසීරුවීම.
- ප්‍රාදේශීයව තිරසර සංවර්ධනයට ප්‍රවේශවීම හා අඛණ්ඩව පවත්වාගෙන යාමේ ගැටලු පැවතීම.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා නිසා ප්‍රාදේශීයව මතු වී තිබෙන සමාජමය ගැටලු ආශ්‍රිත අභියෝගයන්ට අප දැඩි ලෙස මුහුණ පාමින් සිටී. මෙහි දී සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතාව නිසා හර ප්‍රදේශ වෙත තව තවත් සංවර්ධනය සංකේන්ද්‍රගතවීම හා ඒ මඟින් සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශ දිගින් දිගට ම හුදකලාවීම සිදු වේ. මේ අනුව මෙම ප්‍රදේශවල විවිධ ගැටලු රාශියක් මතු වේ. අධ්‍යාපනයේ ගුණාත්මකභාවයේ සන්නිවේදනයේ හා තාක්ෂණයේ ප්‍රාදේශීය විෂමතා වේ. මේ අනුව මෙම ප්‍රදේශවල ජීවත් වන ජනයා විවිධ අභියෝගවලට මුහුණදෙමින් ගම තුළ හුදකලා ජීවිතයක් ගත කරයි. මේ නිසාය ශ්‍රී ලංකාවේ පරිගණක සාක්ෂරතාවය, සරසවි ප්‍රවේශය යනාදී කරුණු සලකා බලන විට විශාල ප්‍රාදේශීය විෂමතාවක් පවතිනුයේ. සියල්ල හර ප්‍රදේශය තුළට ඒකරාශී වීමේ ප්‍රවණතාව නිසා ප්‍රාදේශීයව ඇතැම් පළාත්වල ප්‍රතිරූපය පහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ උතුරු, උතුරු මැද, නැගෙනහිර යනාදී පළාත්වල ප්‍රතිරූපය මෙලෙස සාපේක්ෂව පහළ මට්ටක පවතී. ඒ අනුව මෙම ප්‍රදේශවල සමාජ-ආර්ථික ක්‍රියාකාරකම් සංවර්ධනය සමඟ මුසු වන්නේ අවම වශයෙනි. සංවර්ධනයේ ප්‍රතිලාභ මෙම ප්‍රදේශ සිසාරා ගලා යාමක් දක්නට නොලැබේ. මේ අනුව ගම සහ නගරය අතර පරතරය ද තව තවත් තීව්‍ර වේ. සංවර්ධනයේ හර ප්‍රදේශවල ඉසුලුම් ධාරිතාව ඉක්මවා ජනගහනය වර්ධනය වීම නිසා නාගරීකරණය ආශ්‍රිත ගැටලු මතු වීම ද ආරම්භ වී ඇත. මේ අනුව මිනිස් භූමි අනුපාතය හර ප්‍රදේශවල කාලිකව අවම වීමක් නිරීක්ෂණය කළ හැකි ය. සංවර්ධනයේ හර ප්‍රදේශවල මාර්ග තදබදය ඉහළ යාම හා එය පාලනය කිරීමට අසීරුවීම වැනි අයහපත් තත්ත්වයන් ඇති වේ. නාගරික දිළිඳු ජන කොට්ඨාසයක් බිහි වේ. නාගරික පරිසරය දූෂණය වේ. මේ අනුව ප්‍රාදේශීයව තිරසර සංවර්ධනයට ප්‍රවේශවීම හා අඛණ්ඩව පවත්වාගෙන යාමේ ගැටලුකාරී තත්ත්වයන් මතු වේ.

**පාරිසරික අභියෝග**

- සංවර්ධනයේ හර ප්‍රදේශවල පාරිසරික චිරස්ථායීභාවය තහවුරු කිරීමේ ගැටලු පැවතීම.
- සංවර්ධනයේ හර ප්‍රදේශවල පරිසර දූෂණය උග්‍රවීම.
- ප්‍රාදේශීයව පිරිසිදු පානීය ජල ගැටලු පැවතීම.
- සංවර්ධනයේ හර ප්‍රදේශවල කැලිකසල සම්බන්ධ ගැටලු මතුවීම.
- සංවර්ධනයේ හර ප්‍රදේශවල කාන්තාරකරණය ඇති වීම.
- ස්වභාවික සම්පත් පරිහානියක් සිදු වීම හා ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ ගැටලු මතුවීම.
- සංවර්ධනයේ හර ප්‍රදේශවල සංවර්ධනයේ හරිත සංකල්පය පවත්වාගෙන යාමේ ගැටලු පැවතීම.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා නිසා මතු වන පාරිසරික අභියෝගයන්ට ද රටක් වශයෙන් සේ ම ඒ ඒ ප්‍රදේශවල ජනයා ද දැඩි ලෙස මුහුණ පාමින් සිටී. මෙය ගෝලීය පරිසරයට ද බලපානු ලබයි. මේ අනුව සංවර්ධනයේ හර ප්‍රදේශවල පාරිසරික චිරස්ථායීභාවය තහවුරු කිරීමේ ගැටලු පැවතීම මහත් අභියෝගයක් වී ඇත. එමෙන් ම සංවර්ධනයේ විෂමතා දුරු කිරීමට රජය විසින් ගන්නා ලද ඇතැම් ක්‍රියාමාර්ග නිසා ද පාරිසරික තුල්‍යතාව බිඳ වැටී ගිය අවස්ථා පවතී. උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය මේ සඳහා සාක්ෂි සපයයි. පෙර සඳහන් කළ පරිදි සංවර්ධනයේ හර ප්‍රදේශවල පරිසර දූෂණය උග්‍රවීම දැඩි පාරිසරික ගැටලුවක් වී ඇත. ශ්‍රී ලංකාවේ මාර්ග තදබදය අධික ලෙස පවතින නුවර දිස්ත්‍රික්කය වායු දූෂණය අධික ම දිස්ත්‍රික්කය බව පත් වී ඇත. ප්‍රාදේශීයව පිරිසිදු පානීය ජලය නොමැති වීමෙන් පීඩා විඳින ජනයා වියළි කලාපීය ප්‍රදේශවල සිටී. කැලිකසල සම්බන්ධ ගැටලුවලට ද අප මුහුණපාමින් සිටී. මේ සඳහා හොඳ ම නිදසුන වනුයේ මීතොටමුල්ල කසල කන්ද නාය යාම ය. මෙමගින් පාංශු දූෂණය ද සිදු වේ. මෙවන් තත්ත්වයන් නිසා ඇති වන රෝගී තත්ත්වයන් තව තවත් අභියෝග රැසකට මඟ විවර කරයි. එමෙන් ම සංවර්ධනයේ හර ප්‍රදේශවල වන ආවරණය පිළිබඳ තක්සේරුවක් නොකොට දිගින් දිගට ම සිදු කරන විචක්ෂණශීලී නොවන සංවර්ධන ක්‍රියාවලි නිසා කාන්තාරකරණය ඇති වීම ද ප්‍රබල අභියෝගයකි. එසේ ම ස්වභාවික සම්පත් පරිහානියක් සිදු වීම හා ස්වභාවික සම්පත් සංරක්ෂණය පිළිබඳ ගැටලු මතුවීම ද මෙම තත්ත්වයන් යටතේ සිදු වේ. සමස්තයක් වශයෙන් ගත් කල පාරිසරිකව සංවර්ධනයේ හර ප්‍රදේශවල සංවර්ධනයේ හරිත සංකල්පය

පවත්වාගෙන යාමේ ගැටලු මතු වීම ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ විෂමතා නිසා අප අභියස පවතින ප්‍රබලත ම අභියෝගයකි.

## ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවන්හි අභියෝගයන්ට විසඳුම්

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා නිසා ඇති වී තිබෙන අභියෝග බොහෝ ය. ඒ අනුව මෙම විෂමතා දුරු කිරීමට අතීතයේ සිට විවිධ ක්‍රියා මාර්ග මේ දක්වා ඒ ඒ කාලයේ බලයට පත් වූ රජයන් විසින් අනුගමනය කර ඇත. ඒ අතර 1935 දී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ වියළි කලාපයේ සැලසුම්ගත ජනාවාස ඇති කරවීම, 1948 දී ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම, 1900 දී වාරි මාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම, 1949 දී ගල්ඔය බහු කාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය ඇරඹීම, 70 දශකයේ දී ප්‍රාදේශීය සංවර්ධන මණ්ඩල ඇති කිරිම, 1970 දී මහවැලි යොජනා ක්‍රමය, 1973 දී විමධ්‍යගත අයවැය ක්‍රමය හඳුන්වාදීම, 1980 දී දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය පිහිටුවීම, 1992 දී ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය දිස්ත්‍රික් 17 ව්‍යාප්ත කිරීම, 80 දශකයේ දී පළාත් සභා ක්‍රමය ඇති කිරීම, 1980 දී ගම් උදාව ව්‍යාපෘතිය ඇරඹීම, දිළිඳුකම පිටුදැකීමට ජන සවිය හා සමෘද්ධිය ඇරඹීම, 1959 දී කාර්මික ජනපද පිහිටුවීම, 1997 දී ආයෝජන ප්‍රවර්ධන කලාප ඇති කිරිම, 1994 දී ඇඟළුම් කර්මාන්ත 200 වැඩසටහන ඇති කිරීම, ගම නැගුම යටතේ නොදියුණු ගම්මාන 400ක් සංවර්ධනය කිරීම ද මීට අමතරව නූතනයේ දී ළඟ ම පාසල හොඳ ම පාසල වැඩසටහන, ජාතික පාසල් 1000ක් වැඩසටහන, ගම්පෙරළිය, දැයට කිරුළ යනාදී වශයෙන් විවිධ මුහුණුවරයන්ගෙන් යුතු ක්‍රියා මාර්ග වේ. නමුත් අඛණ්ඩ ස්ථිර ප්‍රයත්නයකින් තොරව බලයට පත් වන දේශපාලන පක්ෂ විසින් දියත් කරන මෙවැනි විවිධ පියවරයන් හේතුවෙන් ශ්‍රී ලංකාව ප්‍රාදේශීය සංවර්ධන විෂමතාව අවම කිරීම පිළිබඳ අභියෝගයට තව තවත් මුහුණදෙමින් සිටී. මෙහි දී ප්‍රධාන වශයෙන් ම ලංකාවේ ප්‍රදේශීය සංවර්ධන විෂමතා ඇති වීමට බලපාන හේතු විමර්ශනය කොට ඊට උචිත ක්‍රියා මාර්ග හඳුනාගැනීම සිදු විය යුතු අතර ඒවා දිගු කාලීනව අඛණ්ඩව ස්ථිරසාරව ක්‍රියාත්මක වීම ද සිදු විය යුතු ම ය.

මේ අයුරින් ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා නිසා ඇති වී තිබෙන අභියෝගවලින් ශ්‍රී ලාංකේය ජනයා ප්‍රාදේශීය විෂමතාවයකින් යුතුව අඩු වැඩි වශයෙන් බොහෝ අපහසුතාවලට ලක්ව සිටී. මෙම සෑම අභියෝගයක් ම ඔවුනට සිය ජීවන පැවැත්මේ ගුණාත්මකභාවය තහවුරු කර ගැනීමට ඇති විශාල බාධකයන් ය. ඒ අනුව මෙම ප්‍රාදේශීය විෂමතා අවම කිරීමට අප රටක් වශයෙන් ක්‍රියා කළ යුතු ය. මේ සඳහා රජයට පවතින

වගකීම ඉතා පුළුල් ය. ඒ අනුව මෙම අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට විසඳුම් අනුගමනය කිරීමේ දී පහත දැක්වෙන ක්ෂේත්‍රයන් පිළිබඳ අවදානය යොමු කරමින් වඩා ප්‍රශස්ත විසඳුම් සෙවීම වැදගත් වේ.

- සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල දරිද්‍රතාව අවම කරීමට, දරිතාවයේ අවදානම් බව අවම කිරීමට හා ආදායම් විෂමතාව අවම කිරීමට මෙම ප්‍රදේශවල සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල ප්‍රතිරූපය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
- ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව වැඩි කරගැනීමට කටයුතු කිරීම.
- දළ දේශීය නිශ්පාදිතය සඳහා අවම දායකත්වයක් දක්වන පළාත්වල දළ දේශීය නිශ්පාදිතය වැඩි කර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.
- සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල සෞඛ්‍ය සේවාව ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- සංවර්ධනය් දී පාරිසරික චිරස්ථායීභාවය තහවුරු කිරීම.
- ශ්‍රී ලංකාව සඳහා යෝජිත 'සංවර්ධන ප්‍රදේශ' අනුව සංවර්ධන ක්‍රියාවලිය සිදු කිරීම.

ප්‍රතිරූපය යන්න රටකට, ජාතියකට, දේශපාලන පක්ෂයකට, රජයට, සංවිධානවලට හෝ ආයතනවලට පමණක් සීමා නොවෙයි. සංවර්ධන විෂමතා මත ගොඩනැගෙන අභියෝගයන්ට විසඳුම් සෙවීමේ දී ප්‍රදේශයකට ද මෙය ඉතා වැදගත් ය. විශේෂයෙන් ම ගෝලීයකරණය වූ වත්මන් වෙළෙඳපොළ රටාව තුළ සෑම ප්‍රදේශයක් ම ලොව පාරිභෝගිකයන්, සංචාරකයන්, අපනයනකරුවන්, ආයෝජකයන් දිනාගැනීමේ අනවරත තරඟයක යෙදී සිටී. මේ තරඟයෙන් ජයග්‍රහණය කිරීමට ජාතික ප්‍රතිරූපය ඉහළ නැංවීම, ජාතිකත්වය ගොඩනැගීම ඉතා වැදගත් ය. එම නිසා ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල ප්‍රාදේශීය ප්‍රතිරූපය ඉහළ නැංවීම වඩාත් වැදගත් වී ඇත. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලට, පළාත්වලට එකිනෙකට වෙන් වූ ප්‍රතිරූප තිබේ. ඒවායේ පදනම ඇතැම් විට ස්වභාව ධර්මයේ නිර්මාණ ය. තවත් විටෙක මිනිසුන්ගේ ක්‍රියාකාරකම් ය. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල ප්‍රතිරූපය ලංකාවේ සෙසු ප්‍රදේශ හා සසඳන කල දිගු කාලීනව අවම තත්ත්වයට පත්ව ඇත. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත්වල පවතින ප්‍රතිරූපය ඉතා ම පහළ මට්ටමක පවතී. මෙවන් තත්ත්වයක් යටතේ මෙම ප්‍රදේශවල සංවර්ධන ක්‍රියාවලිය තව තවත් පසුබෑමකට ලක් වේ. මෙම ප්‍රදේශවල සමාජ-ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රසාරණය නොවේ. ආයෝජනය සඳහා හිතකර නොවන ස්ථානයක්

ලෙස රට තුළ ලේබලකරණයකට ලක් වේ. යම් ප්‍රදේශයක් පිළිබඳව ගොඩනැගෙන ඍණාත්මක ප්‍රතිරූපයෙහි පදනම බොහෝ අවස්ථාවල මෙම සංවර්ධනයේ විෂමතාවයි. ප්‍රතිරූපය පිළිබඳ එවැනි ඍණාත්මක දෘෂ්ටියක් පවතින අවස්ථාවක ජාතික ආර්ථිකයෙන් එයට ලබා ගත හැකි ප්‍රතිලාභ ගිලිහී යනු ඇත. එවැනි විටෙක සැබෑ තත්ත්වය ඉස්මතු කර පෙන්වීමට, තම ප්‍රතිරූපය ධනාත්මක, ශක්තිමත් එකක් බවට ගොඩනැංවිය යුතු ය. එහෙත් මෙම ගොඩනැංවීම වචනවලට සීමා නොවිය යුතු ය. ප්‍රදේශයක් ගැන අන් අය නිගමනවලට එළැඹෙන්නේ කියන දෙයින් නොව කරන දෙයින් බව ඇන්හෝල්ට් පවසයි. ඒ අනුව ප්‍රදේශයක ප්‍රතිරූපය යථාර්ථවාදීව තහවුරු කළ යුතු වේ. ඉහළ ප්‍රතිරූපයක් පවතින විට එම ප්‍රදේශ ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද සන්නාමකරණයට ලක් වේ. යම් ප්‍රදේශයක් කෙරෙහි ආයෝජකයෝ විශ්වාසය තබන්නේ එහි ප්‍රතිරූපය පිළිබඳ විශ්වාසයක් ඇති විටයි. ආයෝජනය සඳහා සුදුසු යටිතල පහසුකම් සහිත පරිසරයක් තිබීම සහ ආර්ථික හා දේශපාලන ස්ථායීතාව සහ මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාව ද එයට හේතු වේ. යම් ප්‍රදේශයකට සංචාරකයන්ගේ පැමිණීම ද එහි ප්‍රතිරූපය අනුව තීරණය වේ. ඔවුන් අපේක්ෂා කරන්නේ ආරක්ෂාකාරී මෙන් ම සුවපහසු සංචාරයකි. සංචාරය සඳහා සුදුසු බොහෝ ප්‍රදේශ ලංකාව තුළ ඇති හෙයින් ඒවා අතර තේරීමක් කිරීමේ දී ඔවුන්ගේ ආකර්ෂණය දිනාගැනීමට නම් තරඟකාරී අනෙක් ප්‍රදේශ අතරින් ඒවාට වඩා කැපී පෙනෙන ආකාරයේ ප්‍රතිරූපයක් තිබීම වැදගත් වෙයි. සංවර්ධනයේ ප්‍රතිලාභ නිසි ආකාරව ලැබීමට නම් ප්‍රදේශයක් සිය නිෂ්පාදන සම්බන්ධව ද මනා ප්‍රතිරූපයක් ජාතික ප්‍රජාව අතර ස්ථාපිත කළ යුතු ය. ප්‍රතිරූප ෂඩාස්‍රයට අනුව මෙලෙස යම් ප්‍රදේශයක ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා සංචාරක, අපනයන, පාලනය, ආයෝජන සහ සංක්‍රමණ, සංස්කෘතිය සහ උරුමය, ජනතාව යන අංශ හයෙහි (06) ප්‍රතිරූපය වර්ධනය කළ යුතු ය. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශ මෙම අංශ 06 ඔස්සේ සිය ප්‍රතිරූපය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු ය. මේ සඳහා රාජ්‍ය මැදිහත්වීම අතිශය වැදගත් වේ.

මූල්‍ය සාක්ෂරතාව, මූල්‍ය පද්ධතියක් පවත්වාගෙන යාමට මෙන් ම ශීඝ්‍ර ආර්ථික වර්ධනයකට ද වැදගත් වේ. මූල්‍ය සාක්ෂරතාව සමාජයක ආර්ථික ක්‍රමය තුළ විවිධ ගැටලු නිරාකරණය කිරීමට උපකාරී වන අතර පහළ මූල්‍ය සාක්ෂරතාවක් පැවතීම විවිධ සමාජ-ආර්ථික ගැටලු ඇතිවීමට හේතු වේ. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල මූල්‍ය සාක්ෂරතාව පහළ අගයක් ගන්නා අතර හර ප්‍රදේශවල මෙය ඉහළ අගයක් ගනී. මේ අනුව මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමෙහි ඇති වැදගත්කම් කිහිපයක් මෙසේ පැහැදිලි කළ හැකි ය. මිනිසාගේ ආර්ථිකමය තීන්දු තීරණ ගැනීම සඳහා මෙන් ම

යහපැවැත්ම සඳහා ද ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් පැවතීම ඍජු දායකත්වයක් සපයයි. යම් ප්‍රදේශයක මූල්‍ය පද්ධතියක මනා ක්‍රියාකාරීත්වය සඳහා මූල්‍ය පද්ධතිය තුළ සිටින සාමාජිකයන් සතු මූල්‍ය සාක්ෂරතාව වැදගත් වේ. ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් සහිත පාරිභෝග ශීඝ්‍රයෙන් වර්ධනය වන තාක්ෂණය තුළින් බිහිවන නවීන මූල්‍ය උපක්‍රම සහ උපකරණ පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමටත් ඒවායින් උපරිම ඵල නෙළාගැනීමටත් මූල්‍ය සාක්ෂරතාව වැදගත් වේ. ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ පසුගාමී ප්‍රදේශවල මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම බොහෝ සෙයින් වැදගත් වන අතර නූතනයේ ආර්ථික විද්‍යාඥයන් විසින් බහුලව සංවාදයට ලක් කරනු ලබන සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක් හා සංවර්ධන ක්‍රියාවලියක් (Inclusive Economic Growth) සඳහා සමාජයක සියලු කණ්ඩායම් සහභාගි කරවා ගැනීමට ප්‍රජාව සතු ඉහළ මූල්‍ය සාක්ෂරතාව නිරන්තරයෙන් ම ඉවහල් වේ. මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම සඳහා විශේෂයෙන් ම පර්යන්ත ප්‍රදේශ විවිධ පියවර අනුගමනය කළ යුතු වේ. ඒ සඳහා ආයතන පිහිටුවීම, සමීක්ෂණ පැවැත්වීම, ජාතික උපාය මාර්ග සංවර්ධනය, වැඩසටහන් සංවිධානය සහ දැනුම්වත් කිරීමේ වෙබ් අඩවි ආරම්භ කිරීම මේ අතරින් කිහිපයකි. මූල්‍ය සාක්ෂරතාව ලබාගත හැකි ඉගෙනුම් ආකෘති, ස්වයං තක්සේරු මෙම වෙබ් අඩවි තුළ අන්තර්ගත වේ. මේවායෙහි බදු කටයුතු, බැංකු ගිණුම්, ණය සහ ණය කාඩ්පත්, ණය පාලනය, රක්ෂණ කටයුතු, පාරිභෝගික ආරක්ෂාව, මූල්‍ය සැලසුම්කරණය පිළිබඳ උපදෙස්, ඉතුරුම්, ආයෝජන, පවුල තුළ මුදල් කළමනාකරණය සහ විශ්‍රාම සැලසුම්කරණය යන ක්ෂේත්‍රය ආශ්‍රිත දැනුම අන්තර්ගත වේ. ග්‍රාමීය ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට විවිධාකාරයේ පියවරයන් අනුගමනය කළ හැකි ය. ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් ලබා ගැනීමට ජත්‍යන්තර අත්දැකීම් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයන් පහත ක්‍රියා මාර්ගවලට යොමු වීමේ අවශතාවක් පවතී.

- මූල්‍ය සාක්ෂරතාව සමීක්ෂණ හා පරීක්ෂණ සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, විවිධ ප්‍රජා කණ්ඩායම්වල විෂමතා මෙමඟින් හඳුනාගත හැකි ය.
- මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමට අවශ්‍ය විශේෂඥ දැනුම භාවිත කරමින් අවශ්‍ය විනිමය රාමුව සකසා එයට අවශ්‍ය ආයතනික රාමුව ස්ථාපිත කිරීම, එම ආයතනික පද්ධතිය හරහා පාසල් විෂය ධාරාවට මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ ඇතුළත් විෂය නිර්දේශයන් හා පාඨමාලා සකස් කර අනිවාර්ය කිරීමට පියවර ගත හැකි ය.
- පහළ මූල්‍ය සාක්ෂරතාවක් සහිත ප්‍රජාව ඉලක්ක කර ගෙන රටේ සමස්ත මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනයට කටයුතු කිරීම.

- සියලු ම රැකියාවන්හි ඉලක්ක උසස්වීම් සඳහා කිසියම් ශ්‍රේණියක් ලබා දී මූල්‍ය සාක්ෂරතාව පරීක්ෂා කිරීමේ විභාග පැවැත්වීම.
- මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ නව පාඨමාලා විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීම.
- රටේ සමස්ත ප්‍රජාව ආවරණය වන පරිදි ඒ ඒ මට්ටම්වලට අදාළව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය සාක්ෂරතාව වර්ධනයට විශේෂ ව්‍යාපෘති හඳුන්වාදීම.

උක්ත ක්‍රියා මාර්ග අනුගමනය කිරීම තුළින් පර්යන්ත ප්‍රදේශවල මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට හැකි වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීව පවතින කුසගින්න, මන්දපෝෂණය, දරිද්‍රතාව වැනි මානුෂ සංවර්ධනයට අයහපත් බාධක අවම කර අධ්‍යාපනය හා සෞඛ්‍ය වැනි සාධක ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා කටයුතු කිරීමට විශේෂයෙන් ම රාජ්‍ය අවධානය යොමු විය යුතු ය. මන්දපෝෂණය, කුසගින්න උග්‍ර දරිද්‍රතාව හා ගැබ් වූ කරුණකි. පෝෂණ ඌනතා විශේෂයෙන් ම ක්ෂුද්‍ර පෝෂණ ඌනතා දරිද්‍රතාවෙන් මිදීමට පුද්ගලයන්ට ඇති හැකියාවට බලපෑම් කරන හෙයින් එය ද දරිද්‍රතාවට ප්‍රධාන හේතුවකි. ළමුන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය අඩු වීම, පාසල් පැමිණීම හා කාර්යසාධනය නතර වීමට ප්‍රබලව බලපාන අතර, එම නිසා අධ්‍යාපනය සඳහා වූ ආයෝජනයන්ගේ ඵලදායීතාව හීන වීම සහ ඉන් අනතුරුව ඔවුන් ශ්‍රම බලකායට ඇතුළත් වීමේ දී නිෂ්පාදන ධාරිතාවට අහිතකරව බලපායි. එවැනි පුද්ගලයන් පසුව කුසගින්න, අඩු ඵලදායීතාව සහ දැඩි දරිද්‍රතා උගුලට හසු වේ. නීරක්තිය, අඩු බර උපත්, වර්ධනය නතර වීම, අඩු බර හා උසට සරිලන බර නොමැති වීම යනාදී විවිධ දර්ශක සැලකු කල ශ්‍රී ලංකාවේ කාර්යසාධනය ඉහළ සෞඛ්‍ය ජයග්‍රහණ ලබා ගත් රටවලට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පවතී. ප්‍රාදේශීයව ගත් විට මෙහි ළමා පෝෂණ ඌනතා ගැටලුව, වියළි කලාපීය ප්‍රදේශවල විශේෂයෙන් ම උතුරු මැද පළාත, කිලිනොච්චිය හා මොණරාගල සහ මධ්‍යම කඳුකරයේ හා වතු ආශ්‍රිත දුප්පත් පවුල් ඒකකයන් තුළ ඒකරාශී වී ඇත. ධනවත් පවුල්වලට වඩා දුප්පත් පවුල් තුළ සහ රටේ අනෙක් ප්‍රදේශයන්ට සාපේකෂව වතු අංශයේ අඩු බර උපත් සහ ළමා පෝෂණ ඌනතාව පැතිරීම තුන් ගුණයකින් ඉහළ වේ. ශ්‍රී ලංකාව පෝෂණ දර්ශකයන්ගෙන් අඩු ප්‍රගතියක් පෙන්වීමට ප්‍රධානත ම හේතුන් වනුයේ දරිද්‍රතාව, ආහාර අනාරක්ෂිතතාව සහ එහි ප්‍රතිඵලයක් ලෙස මව්වරුන්ගේ සෞඛ්‍ය තත්ත්වය වේ. මේ අතරින් ශ්‍රී ලංකාව තුළ මේ සඳහා හේතු වන ප්‍රධානත ම සාධකය වන්නේ අඩු බර උපත්, ළමා වැඩීම නතර වීම හා අඩු බර සඳහා තුනෙන් දෙකකට වඩා දායක වන ආහාර

අනාරක්ෂිතතාවයි. ආහාර අනාරක්ෂිතතාව, ආහාර පරිභෝජනයේ මදකම පමණක් නොව සෞඛ්‍ය සම්පන්න සමබර ආහාර වේලක් ලබා ගැනීමට ඇති නොහැකියාව ද පිළිබිඹු කරයි.

රට තුළ පෝෂණ ඌනතාව හා පාදක ප්‍රශ්නවල සමාජ-ආර්ථික අවදානම හේතුවෙන් රජය මගින් දැනට ගෙන ඇති ප්‍රයත්නයන්ට අමතරව දරිද්‍රතාවෙන් යුතුවූවන් අතර පෝෂණ තත්ත්වයන් වැඩිදියුණු කිරීමට බහුවිධ ප්‍රවේශයෙන් යුතු ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍ය වේ. ඵලදායී ජාතික උපාය මාර්ගයක් මගින් අවදානමට ලක් වූ පවුල්වලට ඵලදායී හා ප්‍රමාණවත් ආහාර සැපයුම හා දේශීය නිෂ්පාදන ඉහළ දැමීමට හා විවිධාංගීකරණයට අවශ්‍ය කෘෂිකාර්මික උපායන්, සහ එවැනි මූලික මැදිහත්වීම් සඳහා සහාය දීම, දැනුම් දීම සහ සැපයුම වැනි ක්ෂුද්‍ර මැදිහත්වීම් අන්තර්ගත විය යුතු ය. මෙම ගැටලුව නිරාකරණය කිරීමට පෝෂණ ක්ෂේත්‍රයේ සෞඛ්‍ය සේවකයන්ගේ ශක්‍යතාව ගොඩ නැංවීම සඳහා ප්‍රමාණවත් මූල්‍යයනයන් සැලසීම වැනි සෞඛ්‍ය නොවන මැදිහත්වීම් ද අත්‍යවශ්‍ය වේ. එසේ ම පෝෂණ මට්ටම්වල විෂමතා පුළුල් වීම පිළිබිඹු කරන ළමුන් අතර අධිපෝෂණය ඉහළ යෑමේ කරුණු සලකා බලා අනාගත පරපුර අතර දියවැඩියාව හා හෘද රෝග වැනි තත්ත්වයන්ගේ වර්ධනය වැළැක්වීමට කඩිනම් අවධානය යොමු කළ යුතු වේ.

මෙම සියලු උපාය මාර්ග තුළින් ශ්‍රී ලංකාව මධ්‍ය කාලීනව ඉහළ ආර්ථික වර්ධනයක් ස්ථාවරව පවත්වාගෙන යෑමට අපේක්ෂා කරන අතර එය ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට අවස්ථාවන් ලබා දෙනු ඇත. මෙය සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතාවන් නිසා ගොඩනැගී ඇති අභියෝගයන් ජය ගැනීමට හේතු වේ. කෙසේ වෙතත් ආර්ථිකයේ ව්‍යුහාත්මක වෙනස්කම් හේතුවෙන් පීඩාවට පත්විය හැකි ජනගහනය දරිද්‍රතාවෙන් නගා සිටුවීම සඳහා ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභයන් පහළට කාන්දු වීම් (Trickling Down) මත ප්‍රතිපත්ති සම්පාදකයන්ට සම්පූර්ණයෙන් විශ්වාසය තැබීමට නොහැකි වී ඇත. එබැවින් සර්ව සහභාගීත්ව වර්ධනය තුළින් සෞභාග්‍ය බෙදා ගැනීම සඳහා රජය විසින් සමස්ත මහජනතාව ම සංවර්ධන ක්‍රියාදාම සඳහා දායක වීම පමණක් නොව එහි ප්‍රතිලාභ භුක්ති විඳීමට ද හැකි වන සංවර්ධන ක්‍රියාදාමයක් නිර්මාණය කර එය ශක්තිමත්ව හා අඛණ්ඩව පවත්වා ගෙනයෑම අත්‍යවශ්‍යයෙන් ම සිදු කළ යුතු ය. මෙහි දී විශේෂයෙන් ම සැලකිය යුතු කරුණක් වන්නේ නාගරික දිළින්දන් හා අඩු ආදායම්ලාභීන් ය. මොවුන් විවිධ දුෂ්කරතාවලින් පීඩා විඳිති. මෙහි දී හර ප්‍රදේශවල වුව ද මානුෂ සංවර්ධනය සම්බන්ධ ගැටලුකාරී අවස්ථා පවතී. වත්මන් ගෝලීය COVID 19 වසංගතය හමුවේ ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ වැල්ලම්පිටිය, වැල්ලවත්ත, මට්ටක්කුලිය යන ප්‍රදේශ ඇසුරින් මෙම තත්ත්වය පැහැදිළි වේ. මෙවන් වසංගත තත්ත්වයන් හමුවේ දී වුව ද තව තවත් ගැටලුවලට ඇද වැටෙන්නේ දිළින්දන් ම ය. මෙම

ප්‍රදේශයන් සංවර්ධයේ දී අඩු ම දියුණුවක් සාක්ෂාත් කර ගෙන ඇති ප්‍රදේශයන් ය. ඒ අනුව සංවර්ධනයේ ප්‍රාදේශීය අසමානතාවන් අධ්‍යයනයේ දී කැපී පෙනෙන මෙවන් කරුණු වෙත ජාතික අවධානය යොමු විය යුතු වේ. ඒවාට අවශ්‍ය උපාය මාර්ග හඳුනාගැනීමටත් සුදුසු ක්‍රියාමාර්ග දියත් කිරීමටත් මෙමඟින් හැකියාව ලැබේ.

එසේ ම අවදානම් සහිත කණ්ඩායම්වලට සහන සැලසීම කෙරෙහි විශේෂ අවධානය යොමු වූ සියලු ප්‍රදේශ ආවරණය වන ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය පිළිබඳව ප්‍රතිපත්ති අවධානය යොමු වීම අවශ්‍ය ය. වර්තමාන ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සහ ප්‍රදේශ අතර සංචලනය පහසු කරන ප්‍රවාහන යටිතල පහසුකම්වල කෙරෙන සුවිශාල ආයෝජන දැනට පවතින ආදායම් අසමානතා අවම කිරීමට ඉවහල් විය හැකි ය.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන විෂමතා සමඟ ඇති වී තිබෙන ප්‍රධාන අභියෝගයක් වන පරිසර හායනයට ඉදිරිපත්ව ඇති පිවිසුමක් වන්නේ පරිසරයට හා වනාන්තරවලට අවම හානියක් වන වඩාත් පරිසර හිතකාමී ආකාරයකින් යටිතල පහසුකම් හා සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීමයි. ශ්‍රී ලංකාවේ පාරිසරික ප්‍රතිපත්ති රාමුවට මඟපෙන්වීම් ලැබෙන්නේ හරිත ලංකා උපාය මාර්ගය, වඩාත් සුරක්ෂිත ශ්‍රී ලංකාවක් කරා මාර්ග සිතියමක්, ජාතික දේශගුණික වෙනස්වීම්වලට අනුගතවීමේ උපාය මාර්ග සහ වඩාත් පිරිසිදු ජාතික නිෂ්පාදන උපාය මාර්ගය වැනි උපාය මාර්ග හරහා ය. ඒවා සමූහිකව හරිත, සුරක්ෂිත සහ පිරිසිදු පරිසරයකට මඟ පෙන්වා ඇත. පාරිසරික දත්ත රැස් කිරීම හා කළමනාකරණය සඳහා ආයෝජනය කිරීමෙන් ප්‍රතිපත්ති සම්පාදකයන්ට සහ සැලසුම්කරුවන්ට පාරිසරික සම්පත් කළමනාකරණයට සහ චිරස්ථායී භාවය සැලසුම් කිරීමට ඉවහල් විය හැකි ය. මෙහි දී හරිතාගාර වායු විමෝචනය අධීක්ෂණයට ප්‍රමුඛතාවයක් දිය යුතු ය.

එසේ ම වඩාත් විශාල සංවර්ධන ප්‍රදේශ පිළිබඳ ක්‍රමයක් අනුගමනය කිරීමේ දී විමධ්‍යගත කළ පාලන තන්ත්‍ර ක්‍රමය අතර ගැටුමක් පැහැදිලිව ම දක්නට ඇත්තේ නැත. වඩාත් විශාල සංවර්ධන ප්‍රදේශයක් මඟින් ප්‍රාදේශීය වර්ධනය හා තරඟකාරීත්වය වැඩි දියුණු කිරීම පිණිස රටේ ප්‍රාදේශීය භූමි ප්‍රදේශ වඩාත් සහේතුක හා ඵලදායී භූමි ප්‍රදේශයක් බවට පත් කරයි. මෙමඟින් වඩාත් විශාල සංවර්ධන ප්‍රදේශවල සැලසුම්කරණයේ හා ක්‍රියාත්මක කිරීමේ අංග වශයෙන් තිබෙන්නා වූ ප්‍රාදේශීය සංවර්ධන ක්‍රමෝපායක අවශ්‍යතාව පෙන්වා දෙනු ලබයි. දැනට පවත්නා විමධ්‍යගත කළ බලතල පිළිබඳ ක්‍රමය තිබෙන්නේ සංවර්ධනය පිළිබඳ සාධක දැක්වීමට නොහැකි වන තරමට ඛණ්ඩනය වී ගිය තත්ත්වයක ය. සාම්ප්‍රදායික පරිපාලන ව්‍යූහයක් හා සීමාවන් හරහා සිදු වන සංවර්ධන ක්‍රියාවලීන් හා ආර්ථික කටයුතුවලින් පැන නඟින සංවර්ධනයේ ප්‍රාදේශීය විෂමතාවන්ට අදාළ අභියෝග පිළිබඳ

කටයුතු කිරීමෙහිලා මෙම 'සංවර්ධන ප්‍රදේශ' මඟින් වඩාත් සඵලදායී රාමුවක් ඇති කරයි. සිතියම් අංක 02 මඟින් නිරූපණය වන්නේ ශ්‍රී ලංකාව සඳහා යෝජිත සංවර්ධන ප්‍රදේශයන් ය.

**සිතියම 02 - ශ්‍රී ලංකාව සඳහා යෝජිත සංවර්ධන ප්‍රදේශ**




මූලාශ්‍රය - ආර්ථික විමසුම, 2013 පෙබරවාරි - මාර්තු

මෙලෙස යෝජිත සංවර්ධන ප්‍රදේශ ඔස්සේ සංවර්ධන ක්‍රියාවලීන් සිදු කිරීමේ අවශ්‍යතාව මෙමඟින් විද්‍යමානිත ය.

## සමාලෝචනය

ශ්‍රී ලංකාවේ සංවර්ධනය ආරම්භ වන්නේ යටත් විජිත සමය වන පෘතුගීසි හා ලන්දේසි පාලන කාලවල කොළඹ, යාපනය, මන්නාරම, මඩකලපුව හා ගාල්ල නාගරික මධ්‍යස්ථාන ලෙස භාවිතා කිරීම සමඟ ය. මේ වන විට කොළඹ නගරය ප්‍රධාන වාණිජ නගරය බවට පත් වී ඇති නමුත් අවිධිමත් නාගරීකරණය ආශ්‍රිත බොහෝ ගැටලු රාශියක් උද්ගත වී ඇත. මේ නිසා වර්තමානයේ කොළඹ නගරය ප්‍රධාන කරගනිමින් බස්නාහිර පළාත ම මෙගා පොලිස් සංවර්ධන සැලැස්ම යටතේ සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත. නමුත් සෙසු නගර කෙරෙහි යොදවන අවධානය සාපේක්ෂව අවම මට්ටමක පවතී. එය විශාල පරතරයකින් යුතු සංවර්ධන විෂමතාවක් නිර්මාණය කිරීමට සමත් වී ඇත. සංවර්ධන ව්‍යාපෘති වුව ද දිගින් දිගට ම ක්‍රියාත්මක වුව ද ඒවා ක්‍රියාත්මක වන්නේ ද තොරාගන්නා ලද සුවිශේෂී කලාපවල පමණි. එසේ ම එම සංවර්ධන ව්‍යාපෘතිවල සාධ්‍යතාව පිළිබඳ ගැටලු රැසක් ද හඳුනාගත හැකි වේ. මේ අනුව සංවර්ධනය ශ්‍රී ලංකාව තුළ නිරන්තරයෙන් ම අසමාන අවකාශීය ව්‍යාප්තියක් පෙන්නුම් කරයි. මෙහි දී ජනයා මුහුණ දෙනු ලබන අභියෝග බොහෝ ය. ප්‍රාදේශීයව අඩු වැඩි වශයෙන් සංවර්ධන විෂමතාවන් හමුවේ පීඩනයට ලක්ව ඇති ජනයා වෙනුවෙන් රජය ඉටු කළ යුතු වගකීම් නොපිරිහෙළා ඉටු කිරීමට හා මේ සඳහා වඩාත් විචක්ෂණශීලී මානයකින් විමර්ශනයන් සිදු කොට වඩා යෝග්‍ය, සාර්ථක, ස්ථිරසාර විසඳුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රබල අවශ්‍යතාවක් පවතින අතර එය කාලීන මෙන් ම වැදගත් කර්තව්‍යයක් ඉටු කිරීමක් ද වේ. එසේ ම මෙහි දී දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති මත නොපිහිටා කටයුතු කිරීමට තරම් පාලකයින් සිය රාජ්‍ය වගකීම් පටු කළ යුතු ද නොවේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. ඕවිටිගල, අංජන, ඕ. කේ. එස්., (2009), "ශ්‍රී ලංකාවේ ප්‍රාදේශිය සංවර්ධන විෂමතා සහ ඒ කෙරෙහි බලපානු ලබන සාධක", භෞම සමීක්ෂා දෙවන කලාපය, භූගෝල විද්‍යා ශාස්ත්‍රපති හා සමාජීය විද්‍යාපති සංගමය, කැළණිය විශවවිද්‍යාලය
2. ජේමන්, එස්. කේ., "දේශපාලන දෘෂ්ටිය හා සංවර්ධනය", මාර්ග ප්‍රකාශන
3. දන්ගල්ල, එන්. කේ., (2015), "සංවර්ධනය : න්‍යාය සහ යථාර්ථය", කර්තෘ ප්‍රකාශන

4. දික්වැල්ල, ආර්., (2003), "ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන පරිපාලනය", ආරිය ප්‍රකාශන
5. ධනපාල, ඒ. එච්., (2015), "අසිරිමත් මිහිතලය : තිරසර සංවර්ධනය සඳහා මඟපෙන්වීමක්", සරසවි ප්‍රකාශන, නුගේගොඩ
6. ධනපාල, ඒ. එච්., (1990), "සමාජ අධ්‍යයනය : ලෝක සංවර්ධන ගැටලු", ඇස් ගෝඩලේ සහ සහෝදරයෝ, කොළඹ 10
7. ශ්‍රී ලංකා මහ බැංකුව., (2019), "ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2019", ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01
8. ශ්‍රී ලංකා මහ බැංකුව., (2019), "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන.", ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01
9. සංඛ්‍යාන දෙපාර්ථමේන්තුව., (2016), "සංවර්ධන විෂයෙහිලා මූල්‍ය සාක්ෂරතාවේ වැදගත්කම", සටහන 2014 සැප්තැම්බර්- ඔක්තෝබර්, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01
10. සංඛ්‍යාන දෙපාර්ථමේන්තුව., (2016), "ආර්ථික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිරූපය", සටහන 2014 ජූලි - අගෝස්තු, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01
11ග ජයරත්න, වීරක්කොඩි., (2016), "ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ජනාවාසකරණය සහ සංවර්ධනය", ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10
12. චන්ද්‍රසේන, යූ. ඒ., (2005), "ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනය, රාජ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන්", භෞම විද්‍යා හත්වන කලාපය, භූගෝල විද්‍යා ශිෂ්‍ය සංගමය, කැළණිය විශවවිද්‍යාලය
13. ගුණරත්න, විල්බට්., (2013), "ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන : පරමාදර්ශයක් කරා මාරුවීමට ඇති අවශ්‍යතාව" , ආර්ථික විමසුම 2013 පෙබවාරි - මාර්තු , කොළඹ 01
14. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දේපාර්තමේන්තුව., (2012), "ජන හා නිවාස සංගණනය 2012"

# සාම්ප්‍රදායික සන්නිවේදනය සමාජ සංවර්ධනයට සිදුකරන බලපෑම : ශ්‍රී ලංකාවේ පහතරට නර්තන සම්ප්‍රදාය ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්

එච්. යළිඳු කුංචන ජයවීර
සංවර්ධන අධ්‍යනය ශාස්ත්‍රවේදී ගෞරව දෙවන වසර
භූගෝල විද්‍යා අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
yalindu98@gmail.com

## සංක්ෂේපය

සංවර්ධනය යනු බහුමානිය සංකල්පයක් වේ. ඉතා විශාල පරාසයක පැතිර පවතින සංවර්ධන ක්ෂේත්‍රයේ සියලු විෂය පද්ධති තුළින් සංවර්ධනය තුළ ප්‍රධාන භූමිකාවක් ඉටුකරනු ලබයි. සෑම ක්ෂේත්‍රයක් තුළම සංවර්ධනය මුල් බැස ගැනීම එයට හේතුවයි. සංවර්ධනයේ පැතිකඩක් ලෙස සන්නිවේදනය ඉතා ප්‍රබල භූමිකාවක් ඉටුකරනු ලබන්නේ සංවර්ධනය පිළිබඳ සියලු මතවාද සම්ප්‍රේෂණය වන මාධ්‍ය සන්නිවේදනය වන බැවිනි . සන්නිවේදනයේ එක් කොටසක් වන සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ ඈත අතීතයේ සිදු වූ සන්නිවේදන ක්‍රම ශිල්ප පිළිබඳව හඳුන්වා දෙයි. සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ දේශීය නර්තන කලාවෙන් ලැබෙන පිටුවහල මානව සංවර්ධනයේ පෝෂණය උදෙසා ඉතා ප්‍රබලව බලපෑම් කරයි. දේශීය නර්තන කලාව සන්නිවේදනය අතින් ඉතා පොහොසත් වේ. ඒ තුළින් අතීත ජන සමාජයේ පුද්ගලානුබද්ධව සංවර්ධනය කිරීම සඳහා මනා අනුබලයක් ලැබී ඇත. අතීත ලංකාවේ භෞතික හා මානසික සෞඛ්‍යය උදෙසා මෙන්ම පුද්ගල සංවර්ධනය උදෙසා ද ශාන්තිකර්ම, නර්තනාංග, ගැමි නාටක හා නාට්‍යමය අවස්ථා යොදාගෙන ඇත. දේශීය නර්තන කලාවේ පහතරට නර්තන සම්ප්‍රදාය තුළ පවතින සන්නි සන්නියකුම ශාන්තිකර්මයේ උපත් කතාව හා ගිරිදේවි නර්තනය උපත් කථාව තුළින් මානව සංවර්ධනය උදෙසා කෙබඳු ආකාරයේ සන්නිවේදනයක් සිදුවේද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

**මුඛ්‍ය පද :- සංවර්ධනය, සාම්ප්‍රදායික සන්නිවේදනය, නර්තන කලාව**

## හැඳින්වීම

සාම්ප්‍රදායික සන්නිවේදනය සංවර්ධන සන්නිවේදන ක්‍රියාවලිය තුළ අඩංගු එක් පැතිකඩක් ලෙස හැඳින්විය හැක්කේ සාම්ප්‍රදායික හෙවත් අතීත ජනසන්නිවේදන ක්‍රමෝපායන් තුළින් සංවර්ධනය ක්ෂේත්‍රීය ව සිදු වූ බැවිනි. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රමෝපායයන් ලෙස ජන සංගීතය, දේශීය නර්තන කලාව, දේශීය නාට්‍ය කලාව, ගැමි නාටක, ජන ගායනා

ආදිය හැඳින්විය හැකිය. දේශීය නර්තන කලාවේ පහතරට නර්තන සම්ප්‍රදාය එයට අනන්‍ය වූ නර්තනාංග නර්තන ගායනා, ශාන්තිකර්ම හා නාට්‍යමය අවස්ථා වලින් සමන්විත වේ. මෙම අධ්‍යයනය සඳහා පහතරට නර්තන සම්ප්‍රදායේ සන්නියකුම ශාන්තිකර්මය හා ගිරිදේවි නර්තනාංගය තුළින් තොරතුරු විමර්ශනය කිරීමට හැකියාව ලැබේ.

සංවර්ධනය බහුමානීය සංකල්පයක් වන්නේ එය ලෝකයේ සෑම විෂය පද්ධතියක් තුළ ම ප්‍රධාන භූමිකාවක් ඉටු කරන බැවිනි. දේශපාලනය, කලාව, ආර්ථිකය, නීතිය, සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව මේ සියලු ක්ෂේත්‍රයන් වල ප්‍රධාන අවස්ථාවක් ලෙස සංවර්ධනය සැඟවී පවතී. පවතින තත්ත්වයට වඩා යහපත් තත්ත්වයක්, වඩා වර්ධනීය තත්ත්වයක් සංවර්ධනය තුළ අපේක්ෂා කරයි. සංවර්ධනය පිළිබඳ අතීත විග්‍රහය වන්නේ සමෘද්ධිමත් වීම යන්නයි. පසු කාලීනව සංවර්ධනය ආර්ථික ක්ෂේත්‍රීය මුහුණුවරක් ගනු ලැබිණි.

ඩබ්ලිව්.ඩබ්ලිව් රොස්ටෝව් ට අනුව "ආර්ථික වර්ධනය ඇති කිරීම සංවර්ධනය" ලෙස අර්ථ දක්වා ඇත. එමෙන්ම ඩඩ්ලි සියර්ස් සංවර්ධනය අර්ථානුරූප කරන්නේ, "සංවර්ධනය යනු රටක දුප්පත්කම අසමානතාවය හා විරැකියාව අඩු කිරීම හෝ අහෝසි කිරීම" ලෙසයි. නමුත් 1982 වසරේ මෙක්සිකෝ නගරයේ පැවති සමුළුවකදී යුනෙස්කෝ සංවිධානය මෙලෙස ප්‍රකාශ කර ඇත.

"...සංවර්ධනය යනු ආර්ථික වර්ධනය ඉක්මවා පැතිරෙන සංකීර්ණ පුළුල් හා බහුමානීය ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලිය ජන ජීවිතයට අදාළ සියලු අංග ද ඔවුන්ගේ ශක්තිය ද ඇතුළත්ව සමස්ත ජනතාවට එම ක්‍රියාවලියට දායක වී ඒ තුළින් ලැබෙන වාසි සියල්ල භුක්ති විඳියි..." ලෙසයි.

ඒ තුළ සංවර්ධනය ආර්ථික තත්ත්වය ඉක්මවා තවත් යම් සාධක අත්කර ගත යුත්තක් බව පවසයි.

මෙම සංවර්ධනය තුළ මානව සංවර්ධනය ඉතා ප්‍රබල වන්නේ මානවයා සංවර්ධනය නොකිරීමෙන් සංවර්ධනය යන සාධකය ක්ෂේත්‍රීය වශයෙන් ජයග්‍රහණය කිරීම ඉතා අපහසු කාරණයක් වන හෙයිනි. මෙම සංවර්ධනය තුළ සන්නිවේදනය ගැබ් ව ඇත්තේ එලෙසිනි. ඉයනතුල්ලා නම් පර්යේෂකයා දක්වන්නේ, "සංවර්ධනය වූ කලී මානව සාරධර්ම රකිමින් අභිමත පරිදි වඩාත් සුදුසු සාමාජික වෙනසක් ඇති කිරීම විය යුතුය" යන්නයි.

## සන්නිවේදනය හා සංවර්ධනය

මනා ලෙස හුවමාරුව මනා ලෙස තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සන්නිවේදනය යනුවෙන් හඳුන්වනු ලබයි. සංවර්ධනය සඳහා සන්නිවේදනය භාවිතා කළ යුතු වන්නේ ඇයිද යන සාධකය මනාව වැටහෙන්නේ යහපත් වූ තොරතුරු නිවැරදි ප්‍රතිපෝෂණයක් තුල ගලනය තුළින් සංවර්ධනයට එය දායක කර ගත හැකි වීම නිසයි.

අප පොදුවේ හඳුන්වන සහභාගිත්ව සංවර්ධනය, ඉහළ සිට පහළට සංවර්ධනය, ග්‍රාමීය සංවර්ධනය ආදී සංවර්ධන ක්‍රමෝපායන් තුළ භාවිතා වන්නේ ද සංවර්ධනය සඳහා සන්නිවේදනය යන සංකල්පයයි.

සිල්වියෝ වයිස්බෝඩ්ට අනුව සංවර්ධනය සඳහා සන්නිවේදනයේ ප්‍රායෝගිකභාවය සම්බන්ධයෙන් ප්‍රධාන අදහස් 5ක් හඳුනාගෙන ඇත. [1]

ඒ අනුව,

- ❖ කේන්ද්‍රගත බලය ශක්තිමත් කිරීම. (පුද්ගලයන් හා ප්‍රජාව දැනුම අත්පත් කර කර ගැනීම.)
- ❖ ඉහළ සිට පහළ ප්‍රවේශ ඒකාබද්ධ කිරීම.
- ❖ සන්නිවේදන මෙවලම් භාවිතය .
- ❖ පුද්ගලාන්තර සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර සමබරතාවය නිර්මාණය කිරීම .
- ❖ පුද්ගල හා සමාජ හැසිරීම් වෙනස් කිරීමේ වැඩසටහන් වලට ප්‍රමුඛතාවය ලබාදීම.

සාම්ප්‍රදායික සන්නිවේදනය ඉහත කී නිර්වචනය හා සපුරාම බැඳෙන කාරණයක් වේ. කාලාන්තරයක් තිස්සේ ගැමි ප්‍රජාව අතර තොරතුරු දැනුම විවේකය විනෝදය සඳහා භාවිතා වන අවට පරිසරය උපයෝගී කරගනිමින් සිදුකරන සන්නිවේදනය සාම්ප්‍රදායික සන්නිවේදනය වේ. සාම්ප්‍රදායික මාධ්‍ය විධි ක්‍රම තුළින් සිදු කරන්නේ ද ඉහළ හා පහළ ප්‍රවේශ ඒකාබද්ධ කරමින් සන්නිවේදන මෙවලම් භාවිතා කරමින් සන්නිවේදනය කිරීමයි. පුද්ගලාන්තර සන්නිවේදනය තුළින් දැනුම ප්‍රජාව අතර බෙදා දීමට ද පුද්ගලයා හා සමාජය

[1] සංවර්ධන සන්නිවේදනය, Retrived from https://bhagimaco.blogspot.com/2020/11/blog-

වෙනස් කිරීමේ හැකියාව ද මෙම සාම්ප්‍රදායික මාධ්‍ය ඔස්සේ සන්නිවේදනය සිදු කිරීම තුළින් හැකියාව ලැබේ.

## දේශීය නර්තන කලාව හා සබැඳීම

සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ දේශීය නර්තන කලාව වැදගත් වන්නේ අතීත දේශීය සංස්කෘතිකාංගයක් ලෙස නර්තන කලාව සමාජයට සම්ප්‍රේෂණය කළ දෑ ඉතා විශාල වන නිසාවෙනි. නර්තන කලාව තුළ පවතින ශාන්තිකර්ම, යාතුකර්ම, නාට්‍යමය අවස්ථා ගැමි නාටක, ජන ගායනා ආදී සියල්ල සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ නිමග්නගත ආංශික සාධකයෝ ය. ශ්‍රී ලාංකේය දේශීය නර්තන කලාව උප නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයකින් යුක්ත වේ.[2]

- උඩරට නර්තන සම්ප්‍රදාය
- පහතරට නර්තන සම්ප්‍රදාය
- සබරගමු නර්තන සම්ප්‍රදාය

එකිනෙකට වෙනස් ලක්ෂණ උරුම කර ගනිමින් නිර්මාණය වී ඇති මෙම සම්ප්‍රදායන් එයටම අනන්‍ය වූ අංගහාර (නර්තන ලක්ෂණ) පවත්වාගෙන එයි. දිවයිනේ විවිධ ප්‍රදේශ මූලික කරගනිමින් නිර්මාණය වී ඇති අතර වර්තමානයේ අධ්‍යයනයේ පහසුව තකා දිවයින පුරා පැතිර පවතී.

නර්තන සම්ප්‍රදාය තුළ පවතින නර්තන අංග, ශාන්තිකර්ම, නාට්‍යමය අවස්ථා ඉතා ඉහළ රස නිෂ්පත්ති සන්නිවේදනයක් ලබා දෙන අංගයෝ වෙති. පහතරට නර්තන සම්ප්‍රදායේ රට යකුම් යාගය දරුවන් නොමැති ස්ත්‍රීන් උදෙසා කරනු ලබන යාගයක් වන අතර ඉතා ගැඹුරු සන්නිවේදනයක් ඒ තුළින් සමාජය වෙත සම්ප්‍රේශණය කරයි .

## අධ්‍යයනයේ පසුබිම

පහතරට නර්තන සම්ප්‍රදායේ එන සන්නි යකුම ශාන්තිකර්මය රෝග දහ අටක් උදෙසා සිදුකරන ශාන්තිකර්මයක් ලෙස වැදගත් වේ. ගිරිදේවි නර්තනාංගය ශාන්තිකර්ම ස්ථානයෙන් බැහැර වූ නර්තනාංගයකි. නමුත් ඉතා අතීත පැවත ඒමක් මෙම නර්තනාංගය සතුය.

[2] දිසානායක. මුදියන්සේ (1993), සිංහල නර්තන කලාව, ගොඩගේ ප්‍රකාශකයෝ

## සන්නි යකුම ශාන්තිකර්මයේ උපත් කතාව[3]

සන්නි යකුම ශාන්තිකර්මය කතා පුවත සංඛපාල කතා පුවත ලෙස හැඳින්වේ.

දඹදිව ලිච්ඡවී වංශයේ සංඛපාල නම් රජුට අසුපාල නම් බිසවකි. ඉතා රූමත් වූ බිසව රජු යුද්ධයක් සඳහා ගිය අවස්ථාවකදී ගැබ් ගැනීමට ලක්විය මේ අතර බිසවට අඹ කෑමේ දොළදුකක් උපන් අතර එම කාලය රටේ අඹ අවාරය විය. මහ ඇමති අසල්වැසි රාජ්‍යයන් ට පවා දූතයන් යවා මී අඹ ගෙඩියක් සොයා අසුපාල බිසවට දුන්නේය. බිසව ආශාවෙන් අඹය කෑමට සැරසෙන විට බිසව මෙන්ම රජවාසල ගැබිණි දුගී දාසියක් ඇය ඉදිරියේ සිට තමන්ටද අඹ ගෙඩියෙන් කොටසක් දෙන ලෙස පැවසූ නමුත් බිසව ඇයට අඹයෙන් කොටසක්වත් නොදුන්නාය. රජවාසලින් ඇති තරම් රාජ භෝජන අනුභව කරන ලෙස බිසව දාසියට පවසා අඹය කෑවා ය. එම සිද්ධියෙන් කෝපයට පත් දාසිය රජු යුද්ධයට ගොස් එන අතරමග ට ගොස් රජු රජ මාලිගයේ නොසිටි සිටි අවස්ථාවේ බිසව මහ ඇමැති හා අනාචාරයේ යෙදී දරු ගැබක් පිලිසිඳ ගත් බව රජුට පැවසූවාය. කෝපයට පත් රජු මාළිගාවට ගොස් බිසව දකිත්ම දාසිය කියූ දෑ සත්‍ය ලෙස විශ්වාස කළේය.

වහාම රජවාසල වධකයන් ගෙන්වා අසුපාල බිසව දෙපළු කොට මරා දමන්නට නියෝග කළේය. අසුපාල බිසව කොතෙක් තමා නිර්දෝෂී බව කියා පෑමට උත්සාහ කළ ද වධකයො රාජ නියමය පරිදි අසුපාල බිසව කැබැල්ල ගසක එල්ලා දෙපළු කොටලු කොට මරා දැම්මෝය. නමුත් කුස උපන් කුමරුගේ පින් බලයෙන් දෙකට කැපූ සිරුර හා වී බිලිදා වැඩෙන්නට විය. පසුව කුමරු බිහි වී බිසවගේ ඇඟ මස් කා වැඩෙන්නට විය. නිර්දෝෂී වූ තම මව් මැරූ පියා ඇතුළු පිරිසගෙන් පළි ගැනීම උදෙසා වනයේ තිබූ විෂ ගෙඩි හා කොල වලින් පිරිවර සන්නි නමින් හැඳින්වූ යක්ෂයන් දහඅට දෙනකු මවාගෙන නුවරම යක්ෂ බිය, රෝග බිය, දුර්භික්ෂ බිය යන තුන්බිය ඇති කරන්නට විය. පසුව බුදුරජාණන් වහන්සේ අනුදැනුමෙන් රතන සූත්‍රය දේශනා කොට නුවරට සෙත් සැලසූ ලෙස බව දැක්වේ.

## ගිරිදේවි නර්තනාංගයේ කතා පුවත[4]

දඹදිව එක්තරා නුවරක රජ කෙනකුට සහ බිසවකට දල නම් කුමරෙක් උපන්නේය. කුමරු ඉතා නිරෝගීව හා කෙළිදෙලෙන් වැඩී යන වයසේ මව්බිසව නැවත ගැබ් ගත්තාය. දෙවන

[3] පීරිස්.ඥානසිරි (2012), නර්තනය 13 වන ශ්‍රේණිය, වාසනා ප්‍රකාශකයෝ
[4] පීරිස්.ඥානසිරි (2012), නර්තනය 13 වන ශ්‍රේණිය, වාසනා ප්‍රකාශකයෝ

වර දියණියක උපත ලැබූ අතර නිමිති බැලූ ශාස්ත්‍රකරුවෝ ප්‍රකාශ කළේ දියණිය කෙදිනක හෝ තම සොයුරා අතින් අතවරයට ලක්වන බවත් ඇයට මාලිගාවේ විසීම ඉතා අයහපත් බවත් ය. මේ නිසා කිරි මවුන් හා අවශේෂ පිරිවර සමග දියණිය ව රාජ්‍ය අසල පැවති වන ලැහැබක ගල් ගුහාවක නැවැත්වීය. එතැන් පටන් ගිරි කුලක ජීවත් වූ බැවින් මෙම කුමරිය ගිරි කුමරිය බවට නම් දැරුවාය. කල්ගත වෙත්ම දල කුමරු ඉතා ශෝභමාන වැඩෙන්නට විය. ගල් ගුහාවේ සිටි ගිරි කුමරිය ද ඉතා රූමත් ව වැඩෙන්නට විය. මේ අතරතුර ගිරි කුමරිය වැඩිවියට පත් වී හිස දිය නෑවූ දින දල කුමරු එම වනයේම දඩ කෙළියේ ගොස් සිටියේය. රජවාසල සේවිකාවන් හොර රහසේ මෙන් නාන මංකඩ වෙත පිවිසෙනු දුටු කුමරු ඇගෙන් කරුණු විමසා සිටියේය. ඇය ඉමහත් බියට පත්වී කරුණු දල කුමරුට කීවාය. තමා නොදැන ඉතා රූමත් නැගණියක් කැලේක වෙසෙනා බැව් දැනගත් දල කුමරු ඉතා කෝපයට පත් විය. වහාම ගිරිකුල ට ගොස් ගල්දොර දෙපළු කර නැගණිය දකින්නට විය. මිහිපිට දෙවඟනක් බඳු වූ ගිරි කුමරිය දැක දල කුමරුට රාග ආශාව වැඩි වී පාලනයෙන් තොර විය. කුමරු අතින් අවසන ගිරි කුමරිය අතවරයට ලක් විය. ගිරි කුමරිය ගිරි දේවිය බවට පත් වූවාය. ඇතිවූ සිදුවීමෙන් කම්පනයට පත් වූ ගිරි දේවිය ගොරකා ගස එල්ලී දිවි තොර කර ගත්තාය. දල කුමරු සිහි අවසඟව සියලු තැන්හි ඇවිදින්නට වූ අතර දල කුමරු ගිරි යක්ෂයා බවට නම් ලැබුවේය.

## උපත් කථා තුළින් සිදුවන සන්නිවේදනය

සන්නි යකුම ශාන්ති කර්මය හා ගිරිදේවි නර්තනාංගය තුල අන්තර්ගත වන කරුණු නර්තනය තුලින්, ගායනා තුළින් හා දෙබස් තුළින් සමාජය වෙත සම්ප්‍රේෂණය කරනු ලබයි. අතීත ජන සමාජය තුළ ජීවත් වන ජනයා ඉතා පහසුවෙන් සමාජ ප්‍රවාහයන්ට ලක් වීමේ අවදානමක පසුවුණු අතර ඒවා ධනාත්මක හෝ ඍණාත්මක ඒවා විය හැකි විය.ලෝකය ඉතා පටු පරාසයකට කොටුවීම, ධරණීය අනාගතයකට හිමිකම් නොකීම, සාර්ථක විධිමත් අධ්‍යාපනයක් හා ඒ ඔස්සේ බැඳුණු සමාජ වපසරියක් නොවීම යන සාධක මත සමාජ අවගමනය විය හැකි කාරණා ඉස්මතු විය. එහිදී සාම්ප්‍රදායික සන්නිවේදනය සමාජය හික්මවීමේ කාර්යය ඉතා සාර්ථක ව සිදු කරනු ලැබිණි. සාම්ප්‍රදායික සන්නිවේදනයේ නර්තනාංග අතර දේව අනුහස්,යක්ෂ බැල්ම, උපත් කතා තුලින් කියවෙන අහිතකර ප්‍රතිඵල ඇති කරවීමට සමත් අවැඩ සිදුවන ක්‍රියා ආදිය නිසා සමාජමය බියක් ලැජ්ජාවක් (හිරි ඔතප්) පුද්ගල මනස තුළ ඇති කරනු ලබයි නිදසුන් ලෙස සන්නියකුම ශාන්තිකර්මයේ සන්නියකුන් දහඅට දෙනා පිළිබඳ කථා පුවත ගත හැකිය. මේ නිසා සමාජයට වැරදි ක්‍රියා සම්ප්‍රේෂණය

නොකිරීමට පුද්ගලයා වග බලා ගනියි. ආධ්‍යාත්මික ගුණ වර්ධනය කෙරෙන අතර එකිනෙකා පිළිබඳ සහකම්පනය හා විනය ගරුක වීම, ප්‍රතිපත්තිගරුක වීම සමාජයේ සංවර්ධනයට බල පාන කරුණක් බව ගිරිදේවි නර්තනය තුළින් ගම්‍ය කරනු ලබයි. ආධ්‍යාත්මික ගුණ වර්ධනය කිරීම පුද්ගල මනසට නොදැනෙන ලෙස මෙම සාම්ප්‍රදායික සන්නිවේදනය ඔස්සේ සිදු කිරීම ඉතා ප්‍රබලව දැක්විය හැකි කාරණයක් වේ.

අතීත පැරැන්නෝ විසින් විද්‍යාත්මක පිළිබිඹු කිරීම් වලට වඩා අද්භූත මායාමය හා ආගමික සිතුවිලි ප්‍රබලව සලකමින් එම කරුණු සමාජය තුළ ඉතා වැදගත් යැයි ප්‍රකාශ කරමින් ඒ ඔස්සේ සමාජය නිර්මාණය කරන්නට පෙළඹිණි . දහඅට සන්නියේ සන්නි යකුන් දහඅට දෙනාම ලෙඩ රෝග දහඅටක් නිරූපනය කරයි. එම ලෙඩ රෝග දහඅට නම්,

| | | | |
|---|---|---|---|
| භූත සන්නිය | අභූත සන්නිය | අමුක්කු සන්නිය | ව්‍යාධි සන්නිය |
| වාත සන්නිය | බිහිරි සන්නිය | කණ සන්නිය | පිත්සන්නිය |
| කෝල සන්නිය | මූර්තු සන්නිය | දෙමළ සන්නිය | නාග සන්නිය |
| කොර සන්නිය | ගිනජල් සන්නිය | ගුල්ම සන්නිය | ජල සන්නිය |
| සීතල සන්නිය | දේව සන්නිය | | |

මෙම ලෙඩ රෝග තුළින් සමාජය දුර්වල වන බව හා ඒ තුළින් සමාජය තුළ විවිධ සංකූලතා හට ගන්නා බව පැරැන්නන් විශ්වාස කළේය. මේ නිසා මෙම ලෙඩ රෝගවලින් වැළකී සිටීමට ඔවුන් සන්නියකුමේ උපත් කථාව තුළින් නිදසුන් නිරන්තරව සමාජයට ගෙන හැර දක්වන්නට විය.

පරිසරය ආශ්‍රයෙන් ඉතා සමබර සන්නිවේදනයක් ලබා දේ. දේශීය වෛද්‍ය ක්‍රමය සපුරාම බැඳී ඇත්තේ පාරම්පරික ගස්, වැල්, පොතු, මුල්, ගෙඩි ආදී ද්‍රව්‍ය මතයි. ශාන්තිකර්මයෙන් පසුව ද දේශීය වෛද්‍ය ක්‍රමය හා යමින් දේශීය ශාකසාර ඖෂධ ලබා දීම සිදු කරනු ලබන කටයුත්තකි. නමුත් සන්නි යකුම සන්නියකුන් දහඅට දෙනාම කැලේ ගෙඩි, මුල් ආදිය ආශ්‍රයෙන් නිර්මාණය කරගත් ආකාරය කතාව තුළ දැක්වීමෙන් පෙන්නුම් කරනු ලබන්නේ ලෝකයේ යහපතට මෙන්ම අයහපතට ද පරිසරය ඉතා වැදගත් වන බවත් සන්නිවේදනය ඉතා ප්‍රබල ලෙස පරිසරය තුළින් ද සිදුවන බවත්ය.

වෛර කිරීම හා පලිගැනීම වනාහී පුද්ගල සංවර්ධනය තුළින් සිදුවන සමාජ සංවර්ධනයට ඉතා අයහපත් සාධකයක් වේ. මෙම අයහපත් සාධකය තුළින් ඇතිවිය හැකි ප්‍රතිඵල කෙරෙහි

සන්නිවේදනය ඉතා ප්‍රබලව බලපෑම් කරන බව ඔවුන් ඒ තුළින් ප්‍රකට කරනු ලබයි. උපත් කථාව තුළින් ඉතා ප්‍රහලව මෙය පුද්ගල මනසට කාවද්දවනු ලබයි.

සිතුවිලි පාලනය කිරීම හා මනා සිහිබුද්ධියෙන් කටයුතු කිරීම සමාජය තුළ ජීවත් වීමේදී ඉතා වැදගත් බව සන්නි යකුම ශාන්තිකර්මයේ උපත් කතාව හා ගිරිදේවි කතාව තුළින් ඉතා රසවත්ව පුද්ගල මනස තුළ තැන්පත් කරනු ලබයි. අතීත ගැමි සමාජය තුළ උගත් බුද්ධිමත් ජනතාවට වඩා නූගත් ගැමි සමාජය නිරන්තරයෙන් හැඟීම් සහ සිතට මූලිකත්වය දෙමින් කටයුතු කරයි. මෙම ආවෘත ජනකායකට සමාජ සංවර්ධන ක්‍රමෝපායන් යෙදීමේ දී ඉතා සරලව හා පවතින සමාජයට ගැළපෙන ආකාරයට ලබා දිය යුතුය. මෙම ක්‍රියාපටිපාටිය නර්තන සම්ප්‍රදායන් තුළින් ඉතා සාධනීය ආකාරයෙන් සිදු කර ඇත.

වර්තමානයේ පර්යේෂණාභිමුඛ තොරතුරු අනුව පුද්ගල මනස තුළ හැඟීම් වලට අනුකූලව තැන්පත් වඩා සාධක යනු ඔවුන් තුළින් නොගිලිහෙන ඒවා වන අතර ඒවා ඉතා ඉක්මනින් තව පාර්ශවයක් උදෙසා සන්නිවේදනය ද කරනු ලබයි. මෙය මනෝ මූලික ලක්ෂණයක් වන අතර ඉතා ඉක්මනින් ග්‍රහණයට ලක් කරනු ලබයි.

මව්පිය දූ දරු සබඳතාවයන් හි ප්‍රබලත්වය සහ සහෝදර සන්නිවේදනය හා සබඳතාවන්හි දුර්වලත්වය ගිරිදේවි උපත් කතාව තුළින් ඉතා මැනවින් පහදා දෙනු ලබයි. ඉතා ප්‍රාථමික ක්‍රියා පිළිවෙතක් වන  කටකථා ඔස්සේ විශ්වාස කරමින් පවුල් සංස්ථා බිඳ වැටීම් තුළින් එකිනෙකා කෙරෙහි නිවැරදි සන්නිවේදනයක් සිදු නොවීම, සහකම්පනය දුර්වල වීම, කුටුම්භ ඒකකයන් තුළින් සමාජගත වන ගැටලු ලෝකයට විසරණය වීම තුළින් වියවුල්කාරී තත්ත්වයන් වලට මුහුණ දීම ආදී සාධකයන් ගිරිදේවි කතාව තුළින් සාධනීය ලෙස පෙන්වා දෙයි.

සන්නි යකුම උපත් කතාවේ කුමරුගේ පින් බල මහිමයෙන් කුමරු උපන් බවට දක්වන නමුත් අවසානයේ රෞද්‍ර යක්ෂයකු බවට පත්වී ඇති අන්දම දක්වනු ලබයි. උපත ලැබීමට පැවති පින් මෙලොව ජීවිතය සාර්ථක කරගැනීමට නොතිබුණේ ද යන කාරණය හා සමඟ පවුල් සංස්ථාව හා වැඩිහිටි අවවාද විචාරශීලී බුද්ධිය සැඟවී යාම යන කරුණු ද ඒ සමඟම දැක්විය හැකි කාරණා වේ.

උපත් කතා ද්විත්වය තුලින් ම ඉතා සාධනීය ලෙස සමාජ සංවර්ධනයට අවශ්‍ය මඟපෙන්වීම් කරනු ලබයි. එය සංවර්ධනය කරා දායක කර ගැනීමද සාධනීය ආකාරයෙන් සාකච්ඡා කළ හැක.

## සංවර්ධනය හා සන්නිවේදනය තුළ බලපෑම

සංවර්ධන සන්නිවේදනය තුළ සදාචාරාත්මක සංවර්ධනය යනුවෙන් සංකල්පයකි. සංවර්ධනයේදී අභිමතාර්ථ හා පුද්ගල සදාචාරය තුළ සිදුකරන සවිඥානික ක්‍රියා හා හෘද සාක්ෂියට අනුකූලව සිදු කෙරෙන සන්නිවේදන ක්‍රමෝපායන් බව දැක්වේ.

සදාචාරාත්මක සංවර්ධනය තුළ මෙන් ම සාම්ප්‍රදායික සන්නිවේදනය තුලින් සිදුවන බලපෑම් මෙම දේශීය සංස්කෘතිකාංගයන් විමර්ශනය කළ හැකි ය. එහිදී සිල්වියෝ වයිස්බෝඩ් ගේ නිර්වචනයේ සඳහන් අංගයන් පහම උක්ත වේ. කේන්ද්‍රගත බලය ශක්තිමත් කිරීම, ඉහළ හා පහළ ප්‍රවේශ ඒකාබද්ධ කිරීම, මෙවලම් භාවිතා කිරීම, පුද්ගලාන්තර සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර සමබරතාවය නිර්මාණය කිරීම හා පුද්ගල හා සමාජ හැසිරීම් වෙනස් කිරීමේ වැඩසටහන් වලට ප්‍රමුඛතාවය ලබාදීම යන කරුණු ද දේශීය නර්තන කලාව සමඟ සැසඳීමේ දී  සාධනීය ලෙස පැහැදිලි වේ.

සංවර්ධන ක්‍රියාවලිය තුළ පවතින සහභාගිත්ව සංවර්ධන ක්‍රමෝපායන් අතීතයේදී සාම්ප්‍රදායික සන්නිවේදනය තුළින් දියුණු වී ඇත. නර්තන කලාවන් තුළින් හා උක්ත උපත් කතා අනුසාරයෙන් සිදුවන සමාජ ශෝධන ක්‍රියාවලිය ග්‍රාමීය සමාජය  තුළ සිදුවන සහභාගිත්වය සන්නිවේදනය තුළින් සංවර්ධනය වී ඇත. මේ තුළින් සිදුවන්නේ සමාජ සංවර්ධනයයි ඉහළ සිට පහළට සංවර්ධන ප්‍රවේශ කත්වය ද මේ සමඟම කතා කළ හැකි සංකල්පයක් වන්නේ සමාජමය සැකැස්මේ පහළ අදියරේ සිට ඉහළ අදියර දක්වා සදාචාර සංවර්ධනය උදෙසා සාම්ප්‍රදායික සන්නිවේදනය ඉවහල් වන නිසාවෙනි භෞතික පුද්ගල සංවර්ධනය මෙන්ම මානසික හා සදාචාර පුද්ගල සංවර්ධනය සිදුවීම පුද්ගල කාර්ය තුළ වැඩි උපයෝජනයක් ලබා ගැනීමට ඉවහල් වන සාධකයක් වේ .

සංවර්ධනය සඳහා සන්නිවේදනය භාවිතා කිරීම පිළිබඳ ප්‍රධාන න්‍යායන් හතරක් වේ.[5]

1. සන්නිවේදනය හා නවීකරණ න්‍යාය
2. නවෝත්පාදන තීරණ න්‍යාය
3. සාමාජීය අලෙවිකරණ ප්‍රවේශ න්‍යාය
4. විනෝදය අධ්‍යාපනයට අදාළ ක්‍රමවේද න්‍යාය

[5] ජිනදාස. එම්. පී (2014), සංවර්ධන සන්නිවේදනය, Cultural Communication Research Centre, පිටු 230-236

මෙයින් "විනෝදය හා අධ්‍යාපනයට අදාළ ක්‍රමවේද න්‍යායන් සපුරාම සන්නිවේදනය තුලින් සංවර්ධනය ඇතිකරවන හා උත්තේජන සපයන මාධ්‍යයක්" බව, මෙල්වින් ඩිස්ලුවර් සහ ලොවරි 1995 පර්යේෂණ තුළින් සොයාගෙන ඇත. විවිධ තොරතුරු විනෝදාස්වාදය සහනය ආදිය ලබා ගැනීම සඳහා ජනමාධ්‍ය භාවිතා කරන බව මෙහි දැක්වේ. එයින් පිළිබිඹු වන වැදගත් කාරණයක් වන්නේ සාම්ප්‍රදායික සන්නිවේදන අංග තුළ ඇතුළත් දේශීය නර්තන කලාවන් ගැමි නාටක ආදිය ද මේ ගණයෙහි ලා ගත හැකි වන නිසාවෙනි. එනයින් බලන කල නර්තන කලාවේ පවතින උපත් කතා නර්තන අංග හා ශාන්තිකර්ම සංවර්ධනය උදෙසා උත්තේජන සපයනු ලබයි.

මැක්ලූහන්ට අනුව, "ජනමාධ්‍ය සඳහා මාධ්‍ය සම්බන්ධ කරන්නේ මාධ්‍ය සංදේශයයි..." [6]

එවිට සන්නිවේදනය තුළ මාධ්‍ය සංදේශය බවට උක්ත අංගයෝ පත්වෙමින් සමාජ සංවර්ධනය යන ක්‍රියාවලිය උදෙසා දායක වනු ලබයි. මිනිසා හා සංවර්ධනය යන අන්ත දෙක තුළ සාම්ප්‍රදායික සන්නිවේදනයේ අන්තර්ගත නර්තන කලාව දෝලනය වෙමින් පුද්ගල සංවර්ධනය සිදුකරනු ලබයි.

සංවර්ධනය තුළ අප හඳුනාගන්නා සියලු කරුණු එක් පොදු මතයකට ගෙන විමසීමේ දී සංවර්ධනය ඒ ඒ ක්ෂේත්‍රයන් තුළ විවිධ ස්වරූප දරන බැවින් සංවර්ධනය සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ පුද්ගල සදාචාර සංවර්ධනය හා සමාජ ධනාත්මකත්වයට රුකුල් සපයන මාධ්‍යයක් ලෙස දැක්වීම වඩා යහපත් ය. එහිදී ආවෘත සමාජ පද්ධතීන්හි පැවති සංවර්ධන සන්නිවේදන ක්‍රම ඉතා ප්‍රබලව නූතනයේ සංවර්ධනයට ද දායක කරගත හැකිය.

සන්නිවේදනය හා ආචාරධර්ම විද්‍යාව තුළ ද දේශීය අභිචාර ක්‍රම හා දේශීය සෞන්දර්යාත්මක ලක්ෂණ අඩංගු උප සංස්කෘතීන් ඉතා වැදගත් ලෙස සලකනු ලබන්නේ සංවර්ධන ක්‍රියාදාමය තුළ මෙම සියළු පාර්ශව ප්‍රබල දායකත්වයක් දක්වන නිසාවෙනි.

[6] ජිනදාස. එම්. පී (2014), නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යයනය, Cultural Communication Research Centre, පිටු 74-75

## නිගමනය

සංවර්ධනය ඉතා පුළුල් ක්ෂේත්‍රයක පැතිර පවතින සංකල්පයකි. මෙම සංකල්පය තුළ සන්නිවේදනය ප්‍රධාන කොටසක් වේ. එහිදී සන්නිවේදනය තුළ කතා කරනු ලබන සාම්ප්‍රදායික සන්නිවේදනය, දේශීය නර්තන කලාව, දේශීය අභිචාර විධි, දේශීය නාට්‍ය කලාව, දේශීය සංගීත කලාව ආදී විශාල ක්ෂේත්‍රයක වපසරියක් දරනු ලබයි. මෙම සම්ප්‍රදායික සන්නිවේදනය තුළ පවතින දේශීය නර්තන කලාවේ එක් අංගයක් ලෙස විනිර්මුක්ත පහතරට නර්තන කලාවේ උපයුක්ත ශාන්තිකර්මයක් හා නර්තනාංගයක් වන සන්නියකුම ශාන්තිකර්මය ගිරිදේවි නර්තනය උපත් කතාවන්හි සමාජ සංවර්ධනය උදෙසා ප්‍රබල සාධක නිරූපණය කරන්නක් වේ.

මානව සංවර්ධනය තුළ ඉහළ කාර්ය සාපල්‍යතාවක් ලබා ගැනීම උදෙසා සිදුකරන ක්‍රියාවලීන් අතර සදාචාර හා මානසික සංවර්ධනය ද එක් පැතිකඩකි. එමෙන්ම සමාජය පුරා විසිරී යන ආකල්පමය සාධනීය ලක්ෂණ සංවර්ධනය උදෙසා සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ පවතින දේශීය නර්තන කලාවේ උක්ත උපත් කතා තුළින් මනා පිටුවහලක් ලැබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. දන්ගල්ල. එන්. කේ (2015) , සංවර්ධනය : න්‍යාය හා යථාර්තය, කර්තෘ ප්‍රකාශන
2. ජිනදාස. එම්. පී (2014), සංවර්ධන සන්නිවේදනය, Cultural Communication Research Centre
3. ජිනදාස. එම්. පී (2014), නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යයනය, Cultural Communication Research Centre
4. පීරිස්.ඥානසිරි (2012), නර්තනය 13 වන ශ්‍රේණිය, වාසනා ප්‍රකාශකයෝ
5. පියදාස. ආර්. එල් (2008), සන්නිවේදන විමර්ශන, මාධ්‍ය හා සංවර්ධනය පිළිබඳ කේන්ද්‍රය
6. දිසානායක. මුදියන්සේ (1993), සිංහල නර්තන කලාව, ගොඩගේ ප්‍රකාශකයෝ
7. දිසානායක. විමල් , මානව සන්නිවේදනය, ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට්
8. මධ්‍යම සංස්කෘතික අරමුදල, සන්නි යකුම ශාන්තිකර්මය,
9. Retrived from https://www.ccf.gov.lk/tour-item/sanniyakuma-shantikarma

10. සංවර්ධන සන්නිවේදනය, Retrived from https://bhagimaco.blogspot.com/2020/11/blog-

# සංවර්ධන සන්නිවේදනය

සහකාර කථිකාචාර්ය හර්ෂනී මහේෂා හරිස්චන්ද්‍ර
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
harshaniemh@gmail.com

## සංක්ෂේපය

ගෝලීයකරණයත් සමඟ නූතන ලෝකය තුළ "සංවර්ධන" සංකල්පය මුල් බැස ගෙන ඇත. සංවර්ධනය යන්න මතවාදයක් ලෙස ප්‍රවේශ වන්නට ඇත්තේ මානවයා ශිෂ්ඨාචාරගත වූ මුල් යුගයේ ය. කෙසේ වෙතත් සංවර්ධනය කාලානුරූපීව වෙනස් වන බහුමානීය සංකල්පයක් ලෙස හඳුනාගත හැකිය. මන්ද යත් ඒ තුළින් සමාජය තුළ පවතින ආර්ථික, සමාජීය, සංස්කෘතික, පාරිසරික හා දේශපාලනික ආදී අංගයන්හි කාලානුරූපී වෙනස්වීම සාකච්ඡා වන නිසාය. ඒ අනුව සංවර්ධනය වෙමින් පවත්නා ලෝකයේ විද්‍යාව හා තාක්ෂණික ඥානය පුළුල්වීම තුළ නූතනයේදී මානවයාට තොරතුරු හුවමාරු කර ගැනීමේ අවශ්‍යතාව මතු වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස අද වන විට සංවර්ධනය හා සන්නිවේදනය අතර පුළුල් සබඳතාවක් ගොඩනැගී ඇත. ඒ අනුව මෙම ලිපිය තුළින් සංවර්ධන සන්නිවේදනය පිළිබඳ සාකච්ඡා කර ඇත.

මුඛ්‍ය පද : සංවර්ධනය, සන්නිවේදනය

## සංවර්ධන සංකල්පය

සංවර්ධන ක්‍රියාවලියෙහි ආරම්භය හා විකාශනය දැනට වසර මිලියන ගණනකට පමණ පෙර එනම් මිනිස් වර්ගයා මෙම පොළෝතලය වාසභූමිය කරගත් කාලය දක්වා විහිදී යයි. එහෙත් සංවර්ධනය පිළිබඳ නූතන ක්‍රියාවලිය ආරම්භ වූයේ 1940 දශකයේදී ය. එනම් 1949 දී ඇමරිකානු ජනාධිපති හැරී ට්‍රෑමන් විසින් කොන්ග්‍රස් සභාව අමතා කළ Point Four දේශනයේදී ය. එම දේශනයේදී ප්‍රථම වරට ඌන සංවර්ධිත යන යෙදුම භාවිත විය.

සංවර්ධනය යන්න නිශ්චිතව නිර්වචනය කළ නොහැක. මන්ද යත් එය කාලානුරූපීව වෙනස් වන බහුමානීය සංකල්පයක් වන බැවිනි. එනමුදු විවිධ විද්වතුන් විසින් සංවර්ධන සංකල්පය විවිධාකාරයෙන් නිර්වචනය කර ඇත. සංවර්ධනය යන යෙදුම මනංකල්පිත ජාලයක් බවත්

එහෙයින් නිසි ලෙස අර්ථගැන්වීම අපහසු බවත් ඩඩ්ලි සියර්ස් නම් විද්වතා විසින් පෙන්වා දී ඇත. තවද ඔහු පවසන්නේ සංවර්ධනය යන්න "වැඩි දියුණුව" යන්නට පර්යාය පදයක් ලෙස දැක්විය හැකි බවය. සංවර්ධනය යන්න හුදු සංඛ්‍යාලේඛන වලින් මිනිය හැක්කක් නොවන බවත් ඒක පුද්ගල ආදායමේ හෝ ජාතික ආදායමේ හෝ වර්ධන ප්‍රවේගය අනුව එය මිනිය නොහැකි බවත් සියර්ස් වැඩිදුරටත් පෙන්වා දුන්නේ ය.

ආර්ථික විද්‍යාඥයන් සංවර්ධනය ලෙස හඳුන්වා දී ඇත්තේ පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම යන්නයි. ඒ අනුව ආර්ථික විද්‍යාඥ ගුනාර් මිර්ඩාල් සංවර්ධනය යනු සමස්ත සමාජ ක්‍රමයේම ඉදිරි ගමන හෝ විප්ලවීය වෙනස්වීම බව පවසා ඇත.

එමෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංවර්ධන සංකල්පය විවිධ සංවර්ධන දශක තුළ මේ අයුරින් නිර්වචනය කර ඇත.

සංවර්ධනය යනු ලෝක ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීමයි

***(1960-1970 ප්‍රථම සංවර්ධන දශකය එක්සත් ජාතීන්ගේ සංවිධානය)***

නිෂ්පාදන කාර්යක්ෂම කිරීම හා සමාජ සාධාරණත්වය සංවර්ධනයෙන් ඉටුවිය යුතු අතර ඒ සඳහා ධනය හා ආදායම සමානව බෙදා දිය යුතුයි

***(1971-1980 දෙවන සංවර්ධන දශකය එක්සත් ජාතීන්ගේ සංවිධානය)***

සංවර්ධනය යනු ජනගහනය සංස්කෘතිය හා සදාචාර යන සාදක ඇතුළත්ව වෙනස්වීම

***(1981-1990 තෙවන සංවර්ධන දශකය එක්සත් ජාතීන්ගේ සංවිධානය)***

මෙම නිර්වචන තුළින් පැහැදිලි වන්නේ සංවර්ධන සංකල්පය කාලීනව වෙනස් වන්නක් බවය. ඒ නිසාම පළමු සංවර්ධන දශකය තුලදී සංවර්ධනය ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම බවත් 1970 දශකය තුළ එය නිෂ්පාදන කාර්යක්ෂම කිරීම හා සමාජ සාධාරණත්වය බවත් දක්වා ඇත.

නමුත් ආර්ථික විද්‍යාඥයකු වන රෝස්ටෝව් පවසන්නේ සංවර්ධනය යනු දිගුකාලීන වර්ධන ක්‍රියාවලියකි. එය ආයෝජන මට්ටම හා ප්‍රතිලාභ මත රඳා පැවතිය යුතුය යන්නයි. නමුත් නූතන යුගය තුළ හඳුන්වා දී ඇති තිරසාර සංවර්ධන සංකල්පය තුළ සංවර්ධනය අර්ථ දැක්වෙනුයේ අනාගත පරම්පරාවේ අවශ්‍යතාවන්ට බාධාවක් නොවන අයුරින් වර්තමාන

පරපුරේ අවශ්‍යතාවන් සපුරා ගැනීම ලෙස ය. ***(බෲන්ට්ලන්ඩ් කමිෂන් වාර්තාව 1987 අපේ පොදු අනාගතය)***

අර්ථය වශයෙන් සමානත්වයක් දැක් වුව ද විවිධ පුද්ගලයන්, ජන කණ්ඩායම් සහ රටවල සංවර්ධනය පිළිබඳ දෘෂ්ටිය එකිනෙකාගෙන් වෙනස් වේ. ස්වෙඩින් ජාතික විද්වතෙකු වන හෙට්නර් කර ඇති ප්‍රකාශයක් මේ සම්බන්ධයෙන් වැදගත් වේ. ඔහු පවසන්නේ සංවර්ධනය පිළිබඳ නිශ්චිත වුත් අවසාන වුත් නිර්වචනයක් තිබිය නොහැකි බවත් ඇත්තේ සන්දර්භයට විශේෂිත වූ අරමුණු පමණක් බවත් ය.

වර්තමානයේ භාවිතව පවත්නා සෑම සංවර්ධන සංකල්පයක්ම මානව කේන්ද්‍රීය අරමුණු පිළිබිඹු කරයි. පෘථිවිය හා එහි සම්පත් පවතින්නේ පෘථිවිය මත ජීවත් වන අග්‍රේශ සත්වයා වන මිනිසාගේ අවශ්‍යතා හා ඕනෑ එපාකම් සපුරාලීම සඳහා බව මෙම සංවර්ධන සංකල්ප වලින් ගම්‍ය වේ.

සංවර්ධනය යනු සාම්ප්‍රදායික ජනසමාජයේ සිට නූතන ජනසමාජය දක්වා වන පරිවර්තනීය ක්‍රියාවලිය බව රෝස්ටෝව් විසින් පවසා ඇත. ඒ තුළින් සංවර්ධන සංකල්පය යුරෝපා කේන්ද්‍රීය වුවක් බව විදහා දක්වයි. තව ද 1970 දශක වන විට සංවර්ධන සංකල්පයේ පෝෂණයට බටහිර මතවාද එක් වන්නට විය. එහිදී සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමට නම් දිළිඳු රටවල ආර්ථිකයෙහි ව්‍යුහමය වෙනසක් ඇති කළ යුතු බව දක්වයි.

පසු කාලීනව සංවර්ධනය වඩාත් සංවිධානාත්මක ලෙස ඉදිරිපත් වන්නේ මානුෂ සංවර්ධන සංකල්පය තුළින් ය. මානුෂ සංවර්ධන සංකල්පය ශක්තිමත් කිරීමටත් සංවර්ධන සංකල්පය තුළ පුද්ගල භූමිකාව වඩාත් අවධාරණය කළ විද්වතෙක් ලෙස අමාත්‍යා සෙන් වැදගත් වේ. සංවර්ධනය යනු නිදහස බව ඔහු දක්වා ඇත. තව ද ඒ සඳහා පුද්ගලයාට ඇති තෝරාගැනීමේ වරණයන් පුළුල් කළ යුතු බවත් එයට පුද්ගල හැකියාවන් වර්ධනය කළ යුතු බවත් සෙන් තව දුරටත් පැහැදිලි කර ඇත.

ඒ අනුව සංවර්ධන සංකල්පය වඩාත් බහුමානීය මෙන් ම කාලීනව වෙනස් වන සංකල්පයක් බව මෙම විස්තරාත්මක පැහැදිලි කිරීම තුළ දක්වා ඇත. තව ද සංවර්ධන ක්‍රියාවලියට අදාළ සැලසුම්ගත වැඩ කොටස් සපුරා ගැනීම සඳහා විවිධාකාර අංශ යටතේ විවිධ ආයතන රැසක් සෑම සංවර්ධනය වන රටකම පාහේ පිහිටුවා ඇතත් තාමත් මෙම සන්නිවේදනමය කාර්යය උදෙසා අවශ්‍යය ආයතන පිහිටුවා ගත යුතුව ඇත.

# සන්නිවේදනය

සන්නිවේදනය යන්නට විවිධ ශාස්ත්‍රඥයන් විසින් විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. මිනිස් සමාජයේ ඔවුනොවුන් අතරේ අදහස්,තොරතුරු හුවමාරු කර ගැනීම සන්නිවේදනය ලෙස අර්ථ දැක්විය හැකිය. තවත් අතකින් සන්නිවේදනය මිනිස් ක්‍රියාකාරීත්ව උදෙසා වූ මූලික මානසික සම්බන්ධතාවකි. කිසියම් සමාජයක සාමාජිකයන් මානසික වශයෙන් ඔවුනොවුන් අතර පවත්වා ගෙන යනු ලබන සම්බන්ධතා ජාලය හා ඒ සඳහා අනුගත වන ක්‍රමවේදය සන්නිවේදනයයි.

සන්නිවේදනය මූලික මිනිස් අවශ්‍යතාවක් ද වෙයි. සාමූහික සමාජ ජීවිතයක් ගත කරන මිනිසාට නිරන්තරවම තම සමාජයේ අන් සාමාජිකයන් කරන කියන දේ පිළිබඳ දැන ගැනීමේ පිපාසයක් ඇති වේ. තොරතුරු ඇන ගැනීම, දැනුම ලැබීම මෙන් ම අන්‍යයන්ට ලබා දීම යනාදී අවශ්‍යතා ඉටු කරනු ලබන්නේ සන්නිවේදනය තුළිනි.

ෂැනන් වීවර් ආකෘතියට අනුව සන්නිවේදන ක්‍රියාවලිය පහත ආකාරයට දැක්විය හැකිය.

රූප සටහන 1




තොරතුරු, අදහස්, හැඟීම්, ආකල්ප, දැනුම, අත්දැකීම් යනාදී සියල්ලම සන්නිවේදනයේදී " පණිවුඩය" ලෙස හඳුන්වයි. සන්නිවේදන කාර්යය සපිරෙන්නට එම පණිවිඩය සංක්‍රමණය උදෙසා සන්නිවේදනය කරන්නෙක් සිටිය යුතු ය. ඔහු සන්නිවේදකයා ලෙස හඳුන්වයි. තව ද සන්නිවේදකයෙක් පණිවිඩය සන්දේශගත කරන කිසියම් ක්‍රමවේදයක් අවශ්‍යය වේ. එය සන්නිවේදන මාධ්‍යයයි. ශබ්ද, සංඥා, සංකේත යන සියල්ලම මාධ්‍යය යටතට අයත් වේ. සන්නිවේදන ක්‍රියාවලිය සඳහා අවශ්‍යය තවත් අංගයක් ලෙස පණිවුඩය ලබන්නා හෙවත් ග්‍රාහකයා දැක්විය හැකි ය.

කිසියම් සන්නිවෙදකයකු වෙතින් යම් පණිවිඩයක් යම් මාධ්‍යයක් මගින් ග්‍රාහකයකු වෙත සන්නිවේදනය කළ පමණින් එම සන්නිවේදන ක්‍රියාවලිය සම්පූර්ණ වන්නේ නැත. මන් ද යත් එය ග්‍රාහකයා වෙත නිසි පරිදි ග්‍රහණය වුවේ ද යන්න දැන ගත යුතු ය. සංවර්ධන සන්නිවේදනයේ වඩාත් වැදගත් ම අංගය වන්නේ ද එයයි. නිසි ලෙස ග්‍රහණය වූවේ ද යන්න හඳුනා ගත හැකි වන්නේ ග්‍රාහක ප්‍රතිචාර මඟින් පමණි. එම ප්‍රතිචාර මඟින් සන්නිවේදකයා නිරතුරුව ලබන අවබෝධය ප්‍රතිපෝෂණයයි.

## සංවර්ධන සන්නිවේදනය

සංවර්ධනාත්මක සන්නිවේදනය ඉතා පුළුල් විෂය පරාසයක් ලෙස හඳුනාගනු ලැබුවේ 1960 දශකයෙන් පසුවය. සංවර්ධන සන්නිවේදනය යනු හුදෙක් සංවර්ධන කාර්යය සඳහා සන්නිවේදන ක්‍රම ශිල්ප භාවිත කිරීමයි. ඒ අනුව 1960 පළමුවන සංවර්ධන දශකය ප්‍රකාශයට පත් කෙරෙද්දී තුන්වන ලෝකයේ අවශ්‍යතා අනුව ක්‍රියාත්මක වෙමින් පැවති සන්නිවේදන පර්යේෂණ ක්‍රම සංවර්ධනයෙහිලා වන ප්‍රමුඛත ම ක්‍රමවේදයක් බවට පත් විය.

සංවර්ධනාත්මක සන්නිවේදනය යන්නෙන් සරලව අදහස් කරනුයේ රටක සංවර්ධනාත්මක ප්‍රවේශයක් පිළිබඳව පවතින ජනමාධ්‍යයේ දායකත්වයයි. විල්බර් ශ්‍රාම් එය අර්ථ දක්වන්නේ මෙලෙසයි. "තොරතුරු සම්පාදනයේදී හා අධ්‍යාපනයේදී ජනමාධ්‍යයේ හා නව මාධ්‍යයන්ගේ කාර්යයභාර්යය වන්නේ සංවර්ධනය සඳහා වන සමාජ වෙනස්වීම වේගවත් කිරීමයි. එය පහසු කරවීමයි".(Schramm,1964:41,42)

මහාචාර්ය විමල් දිසානායකයන් දක්වන ආකාරයට "සංවර්ධන සන්නිවේදනය යනු කිසියම් ජනතාවක් දරිද්‍රතාවයෙහි සිට වඩාත් සමෘද්ධි සම්පන්න තත්ත්වයක් කරා පත් කිරීමටත්, ආර්ථික වෘද්ධියක් ඇති කිරීමටත්, සමාජ සමානාත්මතාවක් ඇති කිරීමටත්, මිනිසාගේ නෛසර්ගික ශක්‍යතා වලින් නිසි ප්‍රයෝජන ලබා ගැනීමටත් අනුබල දෙන සන්නිවේදනයයි". (දිසානායක, 2009:17)

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර විසින් රචිත සන්නනිවේදන ශබ්දාකරයේ සංවර්ධනාත්මක සන්නිවේදනය සංවර්ධන කටයුතු සඳහා සන්නිවේදනය භාවිතයට ගැනීම පසුබිම් කර ගෙන බිහි වු සංකල්පයක් ලෙසත් සාමාජික වශයෙන් වෙනස් කළ යුතු සාධක හඳුන්වාදීම මෙම සංකල්පයේ පදනම ලෙසත් දක්වයි. (මහේන්ද්‍ර, 1997:84)

සංවර්ධන සන්නිවේදනය පිළිබඳ විමසා බලන විට එය සංකල්පයක් ලෙස ලොව පුරා ප්‍රසිද්ධය. රටක ආර්ථික, සාමාජීය, සංස්කෘතික, දේශපාලනික, පාරිසරික, සෞඛ්‍ය ආදී සෑම ක්ෂේත්‍රයකම සංවර්ධනයක් ඇති කිරීම සඳහා සන්නිවේදනය භාවිත කළ හැකිය. සන්නිවේදනය බොහෝවිට සංවර්ධනය සඳහා පහසුකම් සලසන ප්‍රවේශ මාධ්‍යයක් ලෙසස සැලකිය හැකිය. එමෙන් ම නව තාක්ෂණය බිහිවීමත් සමග සංවර්ධන සන්නිවේදනය පුළුල් වී ඇත.

සංවර්ධන සන්නිවේදනයේ ප්‍රධානත ම භූමිකා ලෙස සැලකෙන්නේ තොරතුරු, අධ්‍යාපනය, සන්නිවේදනය, අභිප්‍රේරණය යන්නයි. මෙම ක්‍රියාවලීන් රාජ්‍ය මූලිකව පමණක් නොව පෞද්ගලික අංශයේ සහයෝගයෙන් යුක්තව කළ යුතු බව මහාචාර්ය උමා නරුලා දක්වයි.

සංවර්ධන සන්දේශයක් ඉදිරිපත් කිරීමේදී ඉලක්ක ප්‍රජාවකෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. එහිදී අව්‍යාජ බව, ආකර්ෂණීය බව පැවතිය යුතු ය.

මාචාර්ය විල්බර් ශ්‍රාම් දක්වන පරිදි සංවර්ධන සන්නිවේදනයේ ප්‍රධාන රේඛා සිව් වැදෑරුම් ය.

1. හුදෙකලා බවට වඩා සහභාගීත්ව සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යය වේ.

2. දැනමුත්තෙකු බවට පත්වීම මුග්ධභාවයේ ගිලී සිටීමට වඩා අවශ්‍යය වූවකි.

3. වඩාත් නීරෝගීව සිටීම රෝගී බවට වඩා අවශ්‍යය වේ.

4. සම්පත් සහිතව සිටීම සම්පත් රහිතව සිටීමට වඩා අවශ්‍යය වේ. (මහේන්ද්‍ර, 1997:84)

සංවර්ධන සන්නිවේදනය පිළිබඳ දැඩි විවාදාත්මක කරුණු සාකච්ඡා වන්නේ 1970 දශකයෙන් පසුවය. මේ පිළිබඳ බොහෝදෙනාගේ අදහස වන්නේ සංවර්ධනය පිළිබඳ කුමක් හෝ ලිපියක්, ඡායාරූපයක්, වැඩසටහනක් මාධ්‍යයේ පළ කිරීම සංවර්ධනාත්මක සන්නිවේදනයට අයත් වන බවයි. නමුත් රටක සංවර්ධනය පිළිබඳ විද්‍යානුකූලව මහජනයාට තොරතුරු සන්නිවේදනය කිරීම පහසු නැත. ඒ අනුව රටක සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විද්‍යාත්මක පදනමක පිහිටා කතා කළ යුතු ය. මෙහිදී විද්‍යාත්මක ඥානය සාමාන්‍ය ජනයාට වැටහෙන පරිදි සරලව ලබා දිය යුතු ය.

රටක සංවර්ධනය වෙත එළඹෙන්නට අවශ්‍යය සකළවිධ ක්‍රියාදාමය අපේක්ෂිත පරිදි ගෙන යන්නට මූලික වනුයේ සන්නිවේදනයයි. සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේදී පුද්ගල බාධක

වන පසුගාමී බව, මිථ්‍යා විශ්වාස ආදියෙහි ආකල්පමය වෙනසක් ඇති කළ යුතු ය. ඒ සඳහා අවශ්‍යය මූලික ක්‍රමෝපායක් වන්නේ සන්නිවේදනයයි. මන් ද යත් සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලිය තුළදී ද ප්‍රජාවගේ අවශ්‍යතාවන් දැන ගැනීමෙහිලා සන්නිවේදන ක්‍රම ශිල්ප අත්‍යවශ්‍යය වේ.

සංවර්ධන සන්නිවේදනය යන වචන යුගලය තුළ ප්‍රකට කරන අරුත් බොහෝ ය. සංවර්ධන සන්නිවේදනය, සංවර්ධන සහයෝගී සන්නිවේදනය, සංවර්ධනාභිමුඛ සන්නිවේදනය යන හඳුන්වාදීම් එහිලා භාවිත වෙයි. තව ද සංවර්ධනාත්මක සන්නිවේදනය වූ කලී පොදු ප්‍රජාව හා බැඳුණු හෘදයාංගම සන්නිවේදන ක්‍රියාවලියක් ලෙස ප්‍රමුඛව හඳුන්වාදිය හැකිය. ඒ අනුව සමාජයේ ඇතැම් වූ අවශ්‍යතාවන් හඳුන්වාදී ඊට අනුකූල සන්දේශ සකස් කොට ජනතාව ජනමාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ගය හැඳින්වෙන්නේ සංවර්ධනාත්මක සන්නිවේදනය යනුවෙනි.

සංවර්ධනාත්මක සන්නිවේදනයේ අන්තර් ක්‍රියාකාරීත්වය ප්‍රජාව හා බැඳී පවතී. එය පහත රූපසටහන අනුව පැහැදිලි කළ හැකිය.

රූප සටහන 2




සංවර්ධන ක්‍රියාදාමයේ ප්‍රධාන පාර්ශවකරුවන් වන්නේ රාජ්‍ය තන්ත්‍රය හා ප්‍රජාවයි. මෙම දෙපක්ෂය අතර ඵලදායී අන්තර් සබඳතාවක් ඇති කරනු ලබන්නේ සන්නිවේදනයයි. සංවර්ධිත මෙන් ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල සමාජ පරිවර්තනය සඳහා ප්‍රබලතම

සාධකය බවට ජනමාධ්‍යයේ ව්‍යාප්තිය පත්ව ඇත. එකී සමාජ පරිවර්තනය සඳහා ප්‍රජාව සූදානම් කෙරෙන කාර්යය වඩාත් පුළුල් හා සංකීර්ණ වේ. දුකෙහි ගැලී සිටින ජනතාව ඉන් මුදවා ගැනීම සඳහා ඔවුන්ගේ දැනුවත්භාවය බෙහෙවින් බලපානු ලබයි. එවිට මොනයම් ක්ෂේත්‍රයකින් හෝ ඔහු වටා බැඳී සිටින නොහැකියාව හා දුබලකම ශක්තිමත් හා වටිනා කාර්යයක් බවට පත් කිරීමේ භාරදූර වගකීම පැවරෙන්නේ සන්නිවේදන ක්‍රියාදාමයටය. ඒ අනුව අලුතින් නැගී සිටි බොහෝ රාජ්‍යයන්හි ජාතික සංවර්ධනය උදෙසා සන්නිවේදනයේ වැදගත්කම නූතනයේදී හඳුනාගෙන ඇත.

සංවර්ධන සන්නිවේදනය පුළුල් ලෙස හඳුනා ගැනීමේදී අධ්‍යයනය කළ යුතු ක්ෂේත්‍ර ගණනාවකි. භාෂාව, සන්නිවේදනය, සංස්කෘතිය, මෙන් ම සමාජවිද්‍යාව, පාරිසරික විද්‍යාව හැදෑරීම එහිදී වැදගත් වෙයි. එනම් මෙහිදී ප්‍රධාන වශයෙන් විස්තෘත ජන සමාජයක් සමඟ කෙරෙන අදහස් හා පණිවිඩ හුවමාරු කිරීම නිසා ය. එකී අදහස් සංවර්ධනාභිමුඛය.

## සමාලෝචනය

සංවර්ධන සන්නිවේදනය පිළිබඳ සාකච්ඡා කිරීමේදී නව මාධ්‍යය රාශියක් ඇත. ආරම්භක අවස්ථාවේ ගුවන් විදුලි මාධ්‍යය ප්‍රබල දායකත්වයක් දැක්වූ අතර වර්තමානයේදී රූපවාහිනිය, සිනමාව, පුවත්පත හා නව මාධ්‍යයන් විශාල කාර්යයභාර්යයක් ඉටු කරනු ලබයි. සංවර්ධන සන්නිවේදන සංකල්පය දෙස විවේචනාත්මකව බැලීමේදී ආරම්භයේ සිට අද දක්වා සංවර්ධන ක්‍රියාවලිය සඳහා අඩු වැඩි වශයෙන් දායක වී ඇත. සන්නිවේදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට සංවර්ධනය අවශ්‍යය වන අතර සංවර්ධනයට සන්නිවේදනය අවශ්‍යය වේ. ඒ අනුව සංවර්ධනය හා සන්නිවේදනය අතර පවතින්නනේ අවියෝජනීය සම්බන්ධයක් බව පැහැදිලිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. අත්තනායක, බන්දුල, (2010) සංවර්ධනාත්මක සන්නිවේදනය හා සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති සැලසුම්කරණය, එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්.
2. කරුණානායක, නන්දන, (2001). සන්නිවේදනය හා සංවර්ධනය, දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශන.

3. කරුණානායක, නන්දන, (1990).66 වසරක ගුවන් විදුලි ඉතිහාසය, කර්තෘ ප්‍රකාශනයකි.
4. ලියනගේ, චමිල, (2010). කෘෂිකාර්මික සංවර්ධනය හා ප්‍රාදේශීය ගුවන් විදුලිය, වැලිවේරිය, සඳකඩපහන ප්‍රකාශන.
5. දිසානායක, විමල්, (2009) සංවර්ධනය හා සන්නිවේදනය, කොළඹ 10,ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.
6. නානායක්කාර, සේන, (2008) සංවර්ධනාත්මක සන්නිවේදනය, කර්තෘ ප්‍රකාශන.
7. කරුණානායක, නන්දන, (2001) සන්නිවේදනය හා සංවර්ධනය, දිවුලපිටිය, සරස්වතී ප්‍රකාශන.

# තිරසාරත්වය, තිරසාර සංවර්ධනය සහ ශ්‍රී ලංකාවේ ගෝල්ෆේස් අරගලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නිශාන් සකලසූරිය
භූගෝල විද්‍යා අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
nishan@kln.ac.lk

## හැඳින්වීම

තිරසාර සංවර්ධන සංකල්පය (Sustainable Development) දශක දෙකකට වැඩි කාලයක් තිස්සේ විද්‍යාඥයින් සහ රාජ්‍ය නායකයින් අතර ගෝලීය පාරිසරික සංවාදයේ කොටසක් වී ඇත. 1992 එක්සත් ජාතීන්ගේ පරිසරය සහ සංවර්ධනය පිළිබඳ සමුළුවේ (UNCED, The Earth Summit) එක් ප්‍රතිඵලයක් වූයේ තිරසාර සංවර්ධන සංකල්පයෙහි ආචාර ධර්ම පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශය හෙවත් පෘථිවි ප්‍රඥප්තිය යි (The Earth Charter). "ස්වභාවධර්මයට ගරු කිරීම, විශ්වීය මානව හිමිකම්, ආර්ථික සාධාරණත්වය සහ සාමය මත ගොඩනැගුණු පොදු සංස්කෘතියක් මත පදනම් වූ තිරසාර ගෝලීය සමාජයක් බිහි කිරීමට ගෝලීය සමස්ත මානව වර්ගයා එකට එකතු විය යුතුයි" යන්න මෙම ප්‍රකාශනයේ මූලික අභිප්‍රායයි (Earth Charter International Secretariat, 2000). මෙම ප්‍රකාශය ලෝකයේ බොහෝ රටවල රාජ්‍ය, රාජ්‍ය නොවන, පුද්ගලික ආයතන වල ප්‍රතිපත්ති සම්පාදනයේදී පදනම වශයෙන් ගැනීමට සදාචාරාත්මක අවධානයක් යොමුවනු ඇතැයි එක්සත් ජාතීන් ගේ සංවිධානය අපේක්ෂා කරනු ලබයි. මෙම ලිපියෙහි අරමුණ වන්නේ මෙකී සංකල්පීය අපේක්ෂාවන් කොතරම් දුරට ප්‍රයෝගික යථාර්තයක් ව පවතින්නේද යන්න විමර්ශනය කිරීම යි.

## තිරසාරත්වය

"තිරසාරත්වය" (sustainability) යන සංකල්පය සහ යෙදුම නිර්වචනය කිරීම ඉතා අපහසුය. මෙම පදය සඳහා විශ්වීය වශයෙන් පිළිගත් නිර්වචනයක් නොමැත. මන්ද එය කාලය සහ අවකාශය හරහා වෙනස් වන බහුවිධ සංකල්පයකි. පොදුවේ ගත් කල, එහි සරල අර්ථය "විඳදරාගැනීමේ හැකියාව" (capacity to endure) වේ, නමුත් මෙහි අර්ථය විෂය, උප විෂය ක්ෂේත්‍රය සහ භාවිත ක්ෂේත්‍ර අනුව වෙනස් වේ. පසුගිය දශක කිහිපය තුළ, "තිරසාරභාවය" උප විෂය ක්ෂේත්‍රයක් ලෙස ඉස්මතු වී ඇත, විශේෂයෙන් භෞතික හා සමාජීය විද්‍යා

ක්ෂේත්‍රවල, එය ගැටළු විසඳීමේ සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි බහුලව භාවිතා වී ඇත (Sakalasooriya, N. 2021).

තිරසාර සංවර්ධනය යන සංකල්පයට තිරසාරත්වය යන්න යොදාගෙන ඇත්තේ ,පාරිසරික පද්ධතිවල ධාරිතාව පවත්වා ගැනීම, සමාජ පද්ධතිවල ගුණාත්මක භාවයට සහාය වීම සහ වැඩිදියුණු කිරීම, යන අර්ථයෙන් බව පෙනෙන්නට තිබේ. මෙම ස්වභාවික පරිසර පද්ධති වල ධාරිතාව පවත්වා ගැනීම සඳහා ඒ හා සම්බන්ධ ගැටළු සහ විසඳුම් ආශ්‍රිත ප්‍රතිපෝෂණ විශ්ලේෂණය මගින් ලැබෙන විද්‍යාත්මක අවබෝධය අත්‍යවශ්‍ය වේ. සාමාන්‍යයෙන්, තිරසාරත්වය වටහා ගැනීමට 'පාරිසරික පද්ධති' (Ecological systems) සහ 'සමාජ පද්ධති' (Social Systems) අතර අන්තර් සම්බන්ධතාවල ගතිකත්වය සහ ඒවායේ ක්‍රියාකාරී ස්වභාව වටහා ගැනීම අත්‍යවශ්‍ය වේ.

## තිරසාර සංවර්ධනය

'තිරසාර සංවර්ධනය' යන්නෙහි වඩාත් බහුලව භාවිතා වන නිර්වචනය පැමිණෙන්නේ 1987 ප්‍රසිද්ධ කරනු ලැබූ Our Common Future (අපේ පොදු අනාගතය) හෙවත් 1972 ස්වීඩනයේ ස්ටොක්හෝම් නගරයේදී පැවැත්වූ පෘථිවියේ ස්වභාවික පරිසරය පිළිබඳ ප්‍රථම ලෝක සමුළුව හෙවත් 'United Nations Conference on the Human Environment' දී පත්කළ පරිසරය සහ සංවර්ධනය පිළිබඳ ලෝක කොමිසමේ වාර්තාවෙනි[7] (WCED 1987). "අනාගත පරම්පරාවන්ට ඔවුන්ගේම අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාව අඩාල නොකර වර්තමාන මානව පරම්පරාවේ අවශ්‍යතා සපුරාලන සංවර්ධනය" තිරසාර සංවර්ධනය ලෙස එහි නිර්වචනය කොට ඇත. 1992 දී එක්සත් ජාතීන්ගේ පෘථිවි සමුළුවට රැස් වූ රාජ්‍ය නායකයින් 178 දෙනා පාරිසරික ගැටලුව සහ සමාජ ආර්ථික සංවර්ධන ගැටලුව යන දෙකටම විසඳුම් සෙවීමට උත්සාහ කල අතර එහිදී තිරසාර සංවර්ධන සංකල්පය යොදා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කරනු ලැබීය. පරිසරය සහ සංවර්ධනය යනු එකිනෙකට පසමිතුරු

[7] සමහර විටෙක මෙම වාර්තාව බ්‍රන්ඩ්ලන්ඩ් කොමිසන් වාර්තාව (Brundtland Commission report) ලෙසද හඳුන්වයි. එයට හේතුව මෙම කොමිසමේ සභාපතිවරිය වූයේ ග්‍රෝ හාලෙම් බ්‍රන්ඩ්ලන්ඩ් (Gro Harlem Brundtland) මැතිණිය වීමයි.

සංකල්ප හෝ ක්‍රියාවලි නොව එකිනෙක අතර සහයෝගීතාව වර්ධනය කිරීමෙන් වර්තමාන සහ අනාගත මානව සංහතීන් හි පොදු පැවැත්ම තිරසාර කිරීම සඳහා යොදා ගත හැකි ප්‍රයෝගික ක්‍රියාවලි ලෙස අවධාරණය කරනු ලැබීය. ඒ අනුව මෙම සංකල්ප තුලින් උපකල්පනය කරනුයේ  සමාජ ආර්ථික සංවර්ධනය සහ පාරිසරික ආරක්ෂාව සාධාරණ ආකාරයකින් සන්ධානගත කළහැකි බවය.

සංවර්ධනයේදී සාමාන්‍යයෙන් සිදුවන්නේ  සමාජ ආර්ථික ලාභය කෙරෙහි අවධානය යොමු කරනවිට ස්වභාවික පරිසරයේ ධාරිතා හැකියාව අභිභවා යමින් පාරිසරික තුල්‍යතාව බිඳ වැටීමයි. ඒ තුලින් සමස්ත පාරිසරික තුල්‍යතාවත්   මානව සෞභාග්‍යත් යන දෙකම අභියෝගයට ලක් වන්නේය. මේ නිසා මානව සෞභාග්‍යයේ තිරසාරත්වය පාරිසරික තුල්‍යතාව මත තීරණය වන බැවින් තිරසාර සංවර්ධන ක්‍රියාවලිය වෙත පිවිසීමේ අත්‍යවශ්‍යතාව විවිධ සමුළු සහ කතිකාවත් තුලින් සංවාදයට ලක්ව වර්තමානය වන විට තිරසාර සංවර්ධන සංකල්පය නූතන සංවර්ධන 'සුසමාදර්ශය' ක් (Paradigm) බවට පත්ව ඇත.

ඛනිජ තෙල් නිස්සාරණය හා පතල් කැණීම්  ආශ්‍රිත කර්මාන්ත සහ ධීවර කටයුතු වැනි සමහර ස්වභාවික සම්පත් ඍජුව නිස්සාරණය කරන කර්මාන්ත විසින් මානව සමාජ ආර්ථික සෞභාග්‍ය ප්‍රවර්ධනය කිරීමේ අභිලාෂයෙන් ලාභ උපරිම කිරීමේ අපේක්ෂාවෙන් සම්පත් වේගයෙන් ක්ෂය කරයි.  මෙම තිරසාර නොවන වර්ධන ක්‍රියාවලිය පරිසරයට හා සමාජයට යන දෙපාර්ශවයටම විනාශකාරී විය හැකිය. නිදසුනක් වශයෙන්, 1992 දී, අධික ලෙස මසුන් ඇල්ලීම හේතුවෙන් නිව්ෆවුන්ඩ්ලන්තයෙහි හි උතුරු දිග ප්‍රදේශයේ 'කෝඩ්' ධීවර කර්මාන්තය මුළුමනින්ම අස්ථාවර වී කඩාවැටුණි. කෝඩ් මසුන් ඇල්ලීම සීඝ්‍ර වීම නිසා එම සතුන්ගේ බෝවීම සීමාවී මත්ස්‍ය ගහනය ද සීඝ්‍රයෙන් පහත වැටිණ. මෙම ස්වභාවික සම්පතෙහි තිරසාර පැවැත්ම බිඳවැටීම නවතා යළි මත්ස්‍ය ගහනය යථා තත්ත්වයට පත් කිරීමට හැකි වන පරිදි කොඩ් මසුන් ඇල්ලීම සඳහා වසර දෙකක තහනමක් පැනවීමට එම රජයට සිදුවිය. මෙම තහනම ධීවර කර්මාන්තයෙහි නියැලී කම්කරුවන් සහ වෘතිකයින් දහස් ගණනක ජීවින පැවැත්මට නරක ලෙස බලපෑවේය (Heedrich and Hamilton 2000). මෙයින් පැහැදිලි වන්නේ ජීව විද්‍යාත්මක වශයෙන් පාරිසරික සංවේදීතාවන් සහ මානව සමාජ-ආර්ථික සංවේදීතාවන් අතර පැහැදිලි අන්‍යෝන්‍ය යැපීමක් සහ රැඳීයාවක් පවතින බවය. එනිසා මේ හා සමාන තත්වයන් තුල දී සමාජ අවශ්‍යතා සහ සහ පරිසර ධාරිතා හැකියාව අතර පවතින සමතුලිතතාව සොයා තේරුම් ගැනීම සහ ඒ අනුව කටයුතු කිරීමේ වැදගත්කම ඉස්මතු කරයි.

'අපේ පොදු අනාගතය' වාර්තාවේ (1987) සඳහන් තිරසාර සංවර්ධන නිර්වචනය ඒ පිළිබඳව ඇති පුළුල් ජාත්‍යන්තර පිළිගැනීම සහිත නිර්වචනය යි. මෙම නිර්වචනය මගින් අවධාරණය කරන ප්‍රධාන කරුණු දෙකකි. සංවර්ධනයේදී වර්තමාන මානව පරම්පරාවේ දක්නට ලැබෙන සියලු ආකාරයේ අවකාශීය සහ මානව ප්‍රජාවන් අතර පවතින විෂමතා පිටු දැකීම ඉන් පළමුවැන්න වන අතර වර්තමාන මානව පරම්පරාව සහ අනාගත මානව පරම්පරා අතර ඇති වියහැකි පරම්පරාන්තර සංවර්ධන විෂමතා අවම කිරීම දෙවැන්නය. මෙම සංවර්ධන නිර්වචනය මේ දක්වා පවතින සංවර්ධන නිර්වචන අතර වඩාත්ම ආකර්ෂණීය නිර්වචනය වුවත් ගත වූ දශක දෙකකට අධික කාලය තුල එහි නිර්වචනාත්මක අර්ථය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය පිළිබඳව පවතින්නේ ගැඹුරු සංවාදයකි.

ඉහත දක්වන ලද තිරසාර සංවර්ධනය පිලිබඳ ප්‍රථම පදනම් නිර්වචනය පසුව ඒ සඳහා නිර්වචන රාශියක් ඉදිරිපත්කොට ඇත. උදාහරණයක් ලෙස ඩේවිඩ් පියර්ස් සහ ඔහුගේ සහාය පර්යේෂකයින් මෙම 'Sustainable Development' පදය පිළිබඳ පිටු දහතුනක නිර්වචනාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරයි. මේ සඳහා ඔවුන් පදනම් කරගන්නේ තිරසාර සංවර්ධනය පිලිබඳ මුල් නිර්වචනය හා බැඳුනු එහි ප්‍රධාන ඉලක්ක තුන අසුරුකොටගෙනය. එනම් (අ) සමාජ ආර්ථික වර්ධනය; (ආ) පාරිසරික ආරක්ෂාව; සහ (ඇ) සමාජ සාධාරණත්වය මතය. මොවුන් මෙම කොටස් තුනේ විවිධ පැති උද්දීපනය කරමින් මින් අදහස් වන දේ විස්තර කරයි. මෙහිදී ජාතික සහ අන්තර්ජාතික කර්මාන්තකරුවන්ගේ ආර්ථික වර්ධන උවමනාවන්, පරිසරවේදීන්ගේ පාරිසරික තුල්‍යතා අවධානය මෙන්ම දරිද්‍රතාව සහ මානව සෞභාග්‍ය ලඟා කර ගැනීමේදී මතුවන අයුක්තිය හා අසාධාරණය පිටුදැකීමට කැමති ජාතික හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානවල සහ රාජ්‍ය පාලනය කරන විවිධ ආණ්ඩු වල සමාජ ආර්ථික අවධානයන්ද ඔවුන්ගේ නිර්වචනයට ඇතුළත් කර ඇත.

සොබාදහම සංරක්ෂණය සඳහා වූ ජාත්‍යන්තර සංගමය (IUCN)[8] විසින් ලෝක සංරක්ෂණ උපායමාර්ගයේ (1980) මෙම යෙදුම භාවිතා කරනුයේ වෙනස්ම අර්ථයකිනි. ලෝක සංරක්ෂණ උපායමාර්ගය අවධාරණය කරන්නේ පාරිසරික තිරසාරත්වය (Ecological Sustainability) මිස පාරිසරික, ආර්ථික සහ සමාජ තිරසාරත්වය ඒකාබද්ධ කිරීම නොවේ.

[8] The International Union for the Conservation of Nature

1970 සහ 1980 ගනන්වල සිට ක්‍රමයෙන් වර්ධනය වූ සංවර්ධනය සඳහා තාක්ෂණය යොදාගැනීම සහ එහිදී උචිත සහ අතරමැදි තාක්ෂණයන්, මෘදු බලශක්ති මාර්ග, සුනිත්‍ය බලශක්ති උත්පාදනය පිලිබඳ හදිසි සහ අත්‍යවශ්‍ය අවධානයක් මෙමගින් අවධාරණය කෙරුණි (Humphrey, Lewis, and Buttel 2002, Mitcham 1995).

ඩොනේල්ලා මිඩොව්ස් සහ වෙනත් අය (Donella Meadows at. al., 1972)) විසින් ප්‍රකාශයට කරන ලද 'වර්ධනයේ සීමා' යන අරුත් ඇති 'The Limits to Growth' (1972) අධ්‍යයන වාර්තාව තුළින් මානව සමාජවල වර්ධනයට හා සංවර්ධනයට දැඩි ජෛව භෞතික බාධාවන් බලපාන බවට සාක්ෂි ඉදිරිපත් කරයි (Humphrey and Buttel 1982, Mitcham 1995). ජනගහන වර්ධන වේගය, කර්මාන්ත සහ ස්වභාවික සම්පත් භාවිතයේ තීව්‍රතාව පරිසර දූෂණය, එවකට පැවති ආර්ථික වර්ධන ප්‍රවණතා දිගටම පැවතුනහොත්, ඉදිරි වසර සියය ඇතුළත පෘථිවිය මිනිසාට ජීවත් වීමට නොහැකි වන තත්වයකට පරිවර්තනය වනු ඇතැයි සම්ප්‍රදායික සංවර්ධනයේ සීමාවන් පුරෝකථනය කරනු ලැබීය. මෙම අධ්‍යයනය මගින් පෙන්වාදුන් කරුණු පිළිබඳ දැවැන්ත ජාත්‍යන්තර විවාදයක්, අවධානයක් සහ විවේචනයක් ඇති කළේය (Sandbach 1978). මෙහි දී නව සංවර්ධන සංකල්පය අනුව සංවර්ධනය වන රටවලට ස්වකීය සංවර්ධන කටයුතු වලට අනවශ්‍ය බාධා මතුවනු ඇතයි ද විවාදිතයක් පැන නැගිණි (Buttel 1998).

## සංවර්ධනයේ අසමානතාව

තිරසාර සංවර්ධන ක්‍රියාවලිය මගින් සම්ප්‍රදායික සංවර්ධනයට ඇති කරන සීමාවන් සංවර්ධනය වන රටවලට මහත් අභියෝගයක් යැයි එම රටවලින් දේශපාලන දෝෂාරෝපණයක් එල්ලවිය. ඔවුන් පෙන්වා දුන්නේ පාරිසරික ආරක්ෂණය සහ අඛණ්ඩ ආර්ථික වර්ධනය කිරීමේදී මේ දක්වා සංවර්ධනය වූ රටවලට නොමැති බාධාවන් ඇතිවීමෙන් සංවර්ධනය වන රටවල සංවර්ධනය තවදුරටත් අඩාල විය හැකි බවය (Baker, et al. 1997). එනමුත් අපේ පොදු අනාගතය වාර්තාව පැහැදිලිව සඳහන් කරන්නේ, තිරසාර සංවර්ධනය පිළිබඳ සංකල්පය සීමාවන් දක්වන නමුත් ඒවා නිරපේක්ෂ සීමාවන් නොව වර්තමාන තාක්ෂණය සහ සමාජ සංවිධානය පාරිසරික සම්පත් මත පනවා ඇති සීමාවන් සහ මානව ක්‍රියාකාරකම්වල බලපෑම් අවශෝෂණය කර ගැනීමට ජෛවගෝලයට ඇති හැකියාව ඒ තුලින් වර්ධනය වී සංවර්ධනය වන රටවලට ඉන් සහයෝගීතාවක් ඇති කරන බවය. ඒ මගින්

සංවර්ධනයේ නව යුගයකට මග සැලසීම සඳහා තාක්ෂණය සහ සමාජ සංවිධානය කළමනාකරණය සහ වැඩිදියුණු කළ හැකි බවද අවධාරණය කරයි (Ekins 1993).

තිරසාර සංවර්ධනය පිළිබඳ කතිකාව මානව සංවර්ධනය පිළිබඳ චින්තනයේ පැහැදිලි වෙනසක් ඉදිරිපත් කරනු ලැබුවත් ඊට සාපේක්ෂව සංවර්ධන ක්‍රියාදාමයෙහි වෙනසක් සිදු වූයේ දැයි පැහැදිලිව කිව නොහැකිය. තිරසාර සංවර්ධනය ඉදිරිපත් කරනු ලබන්නේ ආර්ථික සංවර්ධනය සහ පාරිසරික හායනය පිළිබඳ ගැටලු සඳහා විසඳුමක් ලෙස ය. ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) සහ ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර සංවර්ධන ආධාර ආයතන, ඔවුන්ගේ සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සඳහා තිරසාර සංවර්ධන රාමුව අනුගමනය අඛණ්ඩව අනුගමනය කරයි. පාරිසරික ප්‍රතිපත්ති සම්පාදකයින් ජෛව විවිධත්වය නැතිවීම, හරිතාගාර ආවරණය සහ ඕසෝන් ස්ථරය තුනී වීම වැනි පාරිසරික ගැටලු ගෝලීය ගැටලු ලෙස අර්ථ දැක්වීමට පටන් ගත් මුල් අවස්ථාවේදීම වගේ තිරසාර සංවර්ධන සංකල්පයේ මතුවීම සිදුවිය. පරිසරය සහ සංවර්ධනය ආශ්‍රිත ගැටළු විසඳාලීමේදී ගෝලීය වශයෙන් සිතීම සහ දේශීයව ක්‍රියා කිරීම (Think globally, act locally) වැදගත් බව පැහැදිලිව දක්වා ඇත.

තිරසාර සංවර්ධනය නිර්වචනය කරනු ලැබූ අයුරින් අපගේ අනාගත පරම්පරාවන්හි සෞභාග්‍යයේ තිරසාරත්වයට ඉඩ තබමින් වර්තමාන පරම්පරාවන්හි සෞභාග්‍ය උදාකරගත යුතුය. එහෙත් ලෝකයේ බොහොමයක් රටවල මෙන්ම දකුණේ රටක් හෙවත් ගෝලීය සංවර්ධනයේ පර්යන්ත රටක් වශයෙන් ශ්‍රී ලංකාව ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් ලෙස තිරසාර සංවර්ධන සංකල්පයට අදාලව සංවර්ධනය හසුරුවන රටකි. මෙම ලිපියේ කර්තෘ වශයෙන් මෙහිදී ප්‍රශ්න කරන්නේ සත්‍ය වශයෙන්ම එය එසේද? යන්නයි. 1992 න් පසු ගතවූ වසර 20 පමණ කාලයේදී ශ්‍රී ලංකාවේ සංවර්ධනය තිරසාර වශයෙන් සිදුවුයේ නැත. වැඩිහිටියන් වශයෙන් මේ රට පාලනය කල විවිධ ස්වරූපයේ පාලකයින් මෙරට වර්තමාන පරම්පරාව දියුණු කිරීමට උත්සහ ගෙන ඇත්තේ මෙරට සමස්ත අනාගත පරම්පරාවල අනාගත අපේක්ෂාවන් ගැන අල්ප මාත්‍රයකුදු තැකීමක් නොකර බව කතුවරයා පෙන්වා දෙයි.

එමෙන්ම ශ්‍රී ලංකාවට ණය සහ ආධාර ලබාදුන් ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එයට අනුබද්ධ ආයතන වැනි ගෝලීය සංවිධානත්

ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානත්, USAID[9], JAICA[10], SIDA[11], වැනි රාජ්‍ය අනුග්‍රහය ලබන සංවිධානත් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රජයන් ස්වකීය තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති අවංකවම සහ ප්‍රායෝගිකව පිලිපදිනු ලැබුයේ නම් ශ්‍රී ලංකාව වැනි රටවලට මේසා විශාල ආර්ථික, සමාජ, දේශපාලනික සහ පාරිසරික ඛේදවාචකයක් උරුම වුයේ කෙසේද ? යන්න ප්‍රශ්න කලයුතුය. ඒ අනුව පැහැදිලිව පෙනෙන්නේ පෙර දක්වනු ලැබූ සංවර්ධන පාර්ශවකරුවන් තිරසාර සංවර්ධනය උදෙසා වූ ස්වකීය වගකීම, වගවීම, සහ කැපවීම නිවැරිදිව හසුරුවා නැති බවය. දත්ත සහ තොරතුරු තුලින් යම් ආධාරයක් හෝ ණය ලබාගන්නා රටවල සංවර්ධන ක්‍රියාවලිය තිරසාරව සිදුවන්නේදැයි නිරීක්ෂණය කිරීමද ඔවුන්ගේ වගකීමකි. ශ්‍රී ලංකාව වැනි රටවල ආණ්ඩු මෙලෙස ලබාදෙන ණය සහ ආධාර අවභාවිතා කරන බව පැහැදිලිව දැන දැනත් නැවත නැවතත් ණය සහ ආධාර ලබා දෙන්නේ කුමන අරමුණකින්දැයි පැහැදිලි නැත. රටක් බංකොලොත් වුවාට පසුව ලබා දෙන උපදෙස් ඊට පෙර ලබා දී ඒවාට අනුගත නොවන්නේනම් ක්‍රියාමාර්ග ගත යුත්තේ ඊට පෙරය. කතුවරයා මෙම තර්කය මතුකරන්නේ ශ්‍රී ලංකාව වැනි රටවල බංකොලොත් භාවයට මේ සියලු දෙනා අඩු වැඩි වශයෙන් වගකිව යුතු බව පෙන්වා දීමටය.

ශ්‍රී ලංකාවේ වර්තමාන පරම්පරාවන් අනාගත පරම්පරාවට උරුමකරදී ඇත්තේ ලෝකයට ණය ගෙවාගත නොහැකි බංකොලොත් රටකි. ඒ රටේ ස්වකීය අනාගතය ඉල්ලා හඬ නගන මෙරටේ අනාගත පරම්පරාව, තරුණයින්, ඔවුන්ට අනාගතයක් ඉල්ලා කල සටන ලෝක වාසීන් හඳුන්වනු ලැබුයේ , " Galle Face Protesters" හෙවත් ගාලු මුවදොර අරගල කරුවන් වශයෙනි. ඔවුන් ඉල්ලා සිටියේ රටේ ආණ්ඩු බලය හෝ බල පෙරලියක් නොව, මෙරට ස්වකීය අනාගත තරුණ පරම්පරාවේ අනාගතය සුරක්ෂිත කරනු වස් මේ රට බංකොලොත් කරනු ලැබූ දූෂිත වයෝවෘද්ධ පාලක පවුල් විසින් රැගෙන ගිය ආර්ථික සහ දේශපාලනික "ක්‍රමය" (System Change) වෙනස් කරන ලෙසය. ඉතා සාමකාමීව ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේ නාගරික විවෘත සාගර තීරයක් වන "ගෝල් ෆේස්" භූමියට ආසන්න ව රජය මගින් ප්‍රකාශයට පත්කොට තිබූ නිදහස් අරගල භූමියට 2022 අප්‍රේල් 09 වන දින මෙම නේවාසික අරගලය ආරම්භවී ය. මෙරට මීළඟ අනාගත පරම්පරාව විසින් ස්වකීය අනාගතය ඉල්ලා මහලු දූෂිත දේශපාලන අයිතිකරුවන්ගෙන් සහ ඔවුන්ට සහාය දෙන අනෙකුත් පාර්ලිමේන්තු

---

[9] U.S. Agency for International Development
[10] Japan International Cooperation Agency
[11] Swedish International Development Cooperation Agency

නියෝජිතයින්ගෙන් තම ස්වකීය අනාගතය ඉල්ලන්නට විය. දින 123 කට පසුව ශ්‍රී ලංකා ඉතිහාසයේ තරුණ අරගලකරුවන් ශ්‍රී ලංකාවේ වැඩිහිටි පුරවැසියන්ගේද සහයෙන් මෙරට ජනාධිපතිවරයා රට අතහැර යන තෙක්ම සාමකාමී "ආදරයේ අරගලය" තීව්‍ර කළේය. ඉන් පසු ඒ තුලින් බලයට පත් වූ පාලක පන්තිය මෙම අරගලකරුවන් ත්‍රස්තවාදීන් හෝ නොමග ගියවුන් ලෙස හැඳින්වීමට පටන්ගත්තේය.

පාලක පන්තියේ අසාධාරණකම් වලට එරෙහිව අරගල කිරීමේ දිගු ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතුය. 1505 පෙර රාජධානි සමයේදී ත් ඉන් පසුව යුරෝපා යටත් විජිත සමයේදීත් 1948 දේශපාලන නිදහසින් පසුවත් අරගල රාශියක් සිදුවිය. රාජධානි සමයේදී ද මහජන අරගල අතර  තරුණ අරගල ද රාශියක් සිදුව ඇත. එළාර පාලනය නොඉවසූ ගැමුණු හෙවත් ගාමිණී තරුණ රාජකීය අරගලකරුවා ලාංකේය සමාජයට තිරසාර සෞභාග්‍ය උදාකර දුන්නේය. එතැන් සිට යටත් විජිත සමය දක්වා මෙවැනි තරුණ අරගල සිදුව තිබේ. එහිදී තිරසරත්වය පිලිබඳ සංකල්පය  රැඳුනේ "ගමයි පන්සලයි වැවයි දාගැබයි" යන්න මතය. ඒ තුලින් ලාංකේය සමාජය බතින් බුලතින් කිරෙන් පැණියෙන් සපිරුණු සමාජයක් නිර්මාණය කළ යුතු විය. රජුගේ කාර්යය ඉටු නොකළ හැම විටම තරුණයෝ අරගලයට ඉදිරිපත්විය.

1815 එංගලන්තයට යටත් වීමේ ගිවිසුමේ සිට වසර තුනක් තුලදී එංගලන්ත පාලකයින්ගේ නොපනත් කම් නොඉවසූ මෙරට තරුණ ජනයා 1818 දී එංගලන්ත පාලකයින්ට සහ ඔවුන්ට සහාය දුන් අයට එදිරිව අරගලයක් දියත් කළේය. අද වගේම එදාත්, එදා වගේම අදත් තරුණ අරගලකරුවෝ ත්‍රස්තවාදීන්, අන්තවාදීන්, රාජ්‍ය ද්‍රෝහීන් ලෙස සලකනු ලැබූහ. පසුව ඔවුන් ජාතික වීරයන් බවට පත්විය. වසර 30 පුර පවතී සිවිල් යුද්ධයේද සිදුවූයේ එයමය. එහිදී තරුණ අරගලකරුවෝ සිංහල සහ දෙමළ වශයෙන් බෙදා එකිනෙකා විනාශ කරගන්න තැනට රට ඇද දැමීමට එවක පාලනය සමත් විය. නමුත් ඔවුන් ඉල්ලා සිටියේ ජීවත්වන්නට හෙට දවසකි. 1971 සහ 1988/89 තරුණ අරගලකරුවෝ දකුණේ තරුණයින්ගේ අනාගතය ඉල්ලා අරගල කලෝය. ඒ හැමවිටම ඔවුන් ඉල්ලා සිටියේ තරුණ අනාගත පරම්පරාවේ අනාගතය තිරසාර කරන ලෙසය. රටේ ජනතාවට සෞභාග්‍යය උදා කරන ලෙසය. නමුත් සමාජය යම් පමණකට ඉදිරියට තල්ලු වූ නමුත් තරුණයින්ගේ අභිප්‍රායන් ඒ කිසිවිටෙක ඉටුවූයේ නැත. ඒ වෙනුවට වයෝවෘද්ධ සට කපට පාලකයින් නීතිය, ව්‍යවස්ථාව ඉදිරියට ගෙන තරුණයින්ගේ හඬ යටපත් කරුණු ලැබුවේය. එදා වගේම අදත් එය එසේමය.

## සමාලෝචනය

මේ අනුව බලන විට රටක සංවර්ධනයේ හෙවත් සෞභාග්‍යයේ තිරසාරත්වය බිඳවැටෙන විට එයට පාලකයින් ප්‍රතිචාර නොදක්වන විට ලෝකයේ බොහොමයක් බුද්ධිමත සංවේදී තරුණ ජනයා මහජනයා සමග එක්ව ඔවුන්ගේ අනාගතය ඉල්ලා අරගල කළහ. එය ශ්‍රී ලංකේය අනන්‍යතාවෙන් මෙරට ද සිදු උනේය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ඉතිහාසය පුරාම සිදුවූ අරගල වලින් උගත යුතු පාඩම වන්නේ තරුණයින්ගේ අනාගතය සුරක්ෂිත කරනුවස් ඊට සුදුසු ආණ්ඩු ක්‍රමයක් සකස් කිරීමත් තිරසාර සංවර්ධන අභිමතාර්ථ සත්‍ය වශයෙන්ම සාක්ෂාත් වන අයුරින් ශ්‍රී ලංකාව කටයුතු කිරීමත් ණය ආධාර ලබා දෙන ගෝලීය ආයතන, රජයන්, රාජ්‍ය නොවන සංවිධාන යනාදිය ද මනා නිරීක්ෂණයකින් කටයුතු කිරීමද අත්‍යවශය වේ. එමෙන්ම එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉදිරිපත් කොට ඇති තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17 ට "තරුණයින්ගේ අනාගතය සුරක්ෂිත කිරීම" (ensuring the future of youths) යනුවෙන් 18 වන අභිමතාර්ථයක් අනිවාර්යයෙන්ම ඉදිරිපත් විය යුතුය. එමෙන්ම රටක අනාගතය, එරටේ අනාගත පරම්පරාව, විනාශ කොට කිසිසේත් ගොඩනැගිය නොහැකි බවත් යමෙකුට එසේ සිතෙන්නේ නම් එවැනි ඉතිහාසයෙන් පාඩම් ඉගෙන නොගන්නා පාලකයින්ගේ අනාගතයද කිසිසේත් තිරසාර නොවන බව නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත මූලාශ්‍ර


1. Baker, Susan; Maria Kousis; Dick Richardson; and Steven Young. (1997). The Politics of Sustainable Development: Theory, Policy, and Practice Within the European Union. London: Routledge.
2. Barbier, Edward B. (1987). "The Concept of Sustainable Economic Development." Environmental Conservation 14(2):101–110.
3. Buttel, Frederick H. (1998). "Some Observations on States, World Orders, and the Politics of Sustainability." Organization & Environment 11: 261–286.
4. Earth Charter International Secretariat. (n.d.). The Earth Charter: Promoting Change for Sustainable Development. San Jose, Costa Rica: Author. A document produced by the 1992 Earth Summit in Rio de Janeiro.
5. Ekins, Paul. (1993). "Making Development Sustainable." In Global Ecology, ed. Wolfgang Sachs. London: Zed Books.
6. Guha, Ramachandra. (2000). The Unquiet Woods: Ecological Change and Peasant Resistance in the Himalaya. Berkeley: University of California Press.

7. Haedrich, Richard L., and Lawrence C. Hamilton. (2000). "The Fall and Future of Newfoundland's Cod Fishery." Society & Natural Resources 13: 359–372.
8. Humphrey, Craig R., and Frederick H. Buttel. (1982). Environment, Energy, and Society. Belmont, CA: Wadsworth Publishing.
9. Humphrey, Craig R.; Tammy L. Lewis; and Frederick H. Buttel. (2002). Environment, Energy, and Society: A New Synthesis. Belmont, CA: Wadsworth Publishing.
10. International Union for the Conservation of Nature. (1980). World Conservation Strategy. Gland, Switzerland: Author.
11. Lélé, Sharachandra M. (1991). "Sustainable Development: A Critical Review." World Development 19: 607–621.
12. Meadow, Donella N., Dennis L. Meadows; Jorgen Randers; and William W. Behrens III. (1972). The Limits to Growth. New York: Universe.
13. Mitcham, Carl. (1995). "The Concept of Sustainable Development: Its Origins and Ambivalence." Technology and Society 17: 311–326.
14. Mol, Arthur P. J., and Gert Spaargaren. (2002). "Ecological Modernization and the Environmental State." In The Environmental State Under Pressure, ed. Arthur P. J. Mol and Frederick H. Buttel.
15. Sakalasooriya, N. (2021) Conceptual Analysis of Sustainability and Sustainable Development. *Open Journal of Social Sciences*, **9**, 396-414. DOI: 10.4236/jss.2021.93026.

# චීනය සංවර්ධන ක්‍රියාවලියේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ පදනම් කරගැනීමේ යෝග්‍යතාවය පිළිබඳ අධ්‍යනයක්

ඩී. ආර්. අප්සරා කේ. දනසේකර
ආධුනික කථිකාචාර්ය
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
apsarad@kln.ac.lk

## සංක්ෂේපය

සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථයන්ගේ අඩුලුහුඩුකම් මගහරවාගනිමින් ලෝකයේ ප්‍රචලිත වූ තවත් සංවර්ධන සංකල්පයක් ලෙස තිරසර සංවර්ධන සංකල්පය හඳුනාගත හැකිය. ලෝකය නව්‍යමය මාවතක් වෙත ගමන් කරවීමට සමත් මෙම බහුමානීය සංකල්පය මගින් මානව කේන්ද්‍රගත, භාණ්ඩමය වූ භෞතික සංවර්ධන චින්තන ධාරාව හා ජෛව කේන්ද්‍රගත පරිසර සංරක්ෂණ චින්තන ධාරාව යන චින්නත ධාරාවන් ද්විත්වය එක් ස්ථානයක කේන්ද්‍රගත කිරීමට ගත් ප්‍රයත්නයකි. මෙලෙස ලෝකයේ රටවල් තුලනාත්මකව සංවර්ධනය කිරීමට නිර්මාණය වූ වැදගත් සංකල්පයක් වන තිරසර සංවර්ධනය කාර්මික දියුණුවක් වෙත ගමන් කරන චීනය තුළ ද ප්‍රතිස්ථාපනය කර ඇත. මෙලෙස චීනයේ සංවර්ධනය සඳහා උක්ත සංකල්පය භාවිතා කිරීම හා එමගින් චීනය අත්පත් කරගත් තිරසර දියුණුව පිළිබඳව මෙම ලිපිය මගින් තවදුරටත් සාකච්ඡා කරනු ලබයි.

*මුඛ්‍ය පද :චීනය, තිරසර සංවර්ධනය, යෝග්‍යතාවය*

## හැඳින්වීම.

නැගෙනහිර ආසියානු දේශයක් වන චීනය උතුරු අක්ෂාංශ 35.8617$^{0}$ හා නැගෙනහිර දේශාංශ 104.1954$^{0}$ අතර කලාපයක පිහිටා ඇති ඉහළ මධ්‍ය ආදායම් ලබන සංවර්ධනය වෙමින් පවතින නව කාර්මික රටකි. රුසියාව, දකුණු කොරියාව, උතුරු කොරියාව, ඉන්දියාව, නේපාලය, භූතානය, මියන්මාරය, වියට්නාමය, ලාඕසය, කිරිකිස්ථානය, තජිකිස්ථානය, පකිස්ථානය , ඇෆ්ගනිස්ථානය, මොන්ගෝලියාව ආදී රටවල් 14කින් වත්මන් දේශසීමා වලින් මායිම් වූ චීන භූමිය නිර්මාණය වී ඇත්තේ මහද්වීප භූ කාරක මූලාංග එක මත එක පිහිටීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. ලෝක ජනාවාසකරණයේ මුලාරම්භයන් ලෙස වසර දහස් ගණනක

අඛණ්ඩ ඉතිහාසයක් සහිත චීනය “ශිෂ්ටාචාරයේ තොටිල්ල” ලෙස විරුධාවලිය ලත් ලොව පැරණිතම දේශයකි. අවුරුදු මිලියන ගණනකට පෙර හෝමෝ ඉරෙක්ටස්ගෙන් පැවත එන චීන ශිෂ්ටාචාරය පරිණාමයට නතුවෙමින් විවිධ දෙස් විදෙස් ආක්‍රමණයන්ට ගොදුරු වෙමින් විවිධ සමාජ ආර්ථික දේශපාලන අර්බුදවලට මුහුණ දෙමින් අද වන වන විට ලොව විශිෂ්ටතම ජාතියක් බවටත්, ලොව බලගතුම රාජ්‍යක් ලෙසටත් නූතන සමාජවාදයේ කේන්ද්‍රය ලෙසත් සිය ආධිපත්‍යය සටහන් කොටගෙන අවසන්ය.

ලොව වැඩිම ජනගහනයක් (බිලියන 1.3 කටත් වඩා) වාසය කරන සංස්කෘතික උරුමක් සහිත රටක් වන චීනයේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 9,634,057 භූමියක් හා කිලෝ මීටර් 18,000 වෙරළ තීරයකින් සමන්විතය. අද්‍යතනයේ ලෝක බලවතා වීමේ සිහිනයෙන් ඇමරිකා එක්සත් ජනපදය අභිබවමින් තම දේශයේ ආධිපත්‍යය ලෝකය පුරා ප්‍රචලිත කිරීමට වෙර දරමින් සිටින චීනය තම රටේ සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ඔස්සේ යමින් පස් අවරුදු සැලසුම් ක්‍රියාත්මක කරමින්, රටේ සංවර්ධනය නංවාලීම සඳහා විවිධ පියවරයන් ගෙන ඇත. 2015-2030 කාල පරිච්ඡේදය තුළ තිරසර සංවර්ධන ජයගැනීමේ න්‍යාය පත්‍රය රට තුළ ක්‍රියාත්මක කිරීමට චීනය ගෙන ඇති ක්‍රියාමාර්ග අතිමහත්ය.

## තිරසර සංවර්ධන අභිමතාර්ථ

අනාගත පරම්පරාවට සිය අවශ්‍යතාවන් සපුරා ගැනීමේ හැකියාව අනතුරකට පත් නොකරමින් වර්තමාන පරම්පරාවේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම තිරසර සංවර්ධනය ලෙසින් ලොව පුරා ප්‍රචලිත වී ඇත. මෙලෙස තිරසර සංවර්ධනය පිළිබඳව අවධානය යොමු වන්නේ 1972 එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද සංකල්පයකට අනුවය. ස්විස්ටර්ලන්තයේ ස්ටොක්හෝම් නගරයේ පවත්වනු ලැබූ මානුෂ පරිසර සංවර්ධන පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයෙන් පසුවය. ඉන් පසුව 1987 දී පරිසරය හා සංවර්ධනය පිලිබඳ ලෝක කොමිසමේ දී මේ පිලිබඳව දළ ආකෘතියක් ඉදිරිපත් කර ඇත. 1992 එක්සත් ජාතීන්ගේ සංවිධානය බ්‍රසීලයේ රියෝ ද ජැනයිරෝ නගරයේදී පවත්වන ලද මිහිකත සමුළුවේදී තිරසර සංවර්ධනය පිළිබඳ අදහස් තව දුරටත් සාකච්ඡා කරන ලදී. එමෙන්ම 2002 දී දකුණු අප්‍රිකාවේ ජොහැනස්බර්ග් නගරයේදී පැවත් වූ චිරස්ථායි සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේදී ද මේ සම්බන්ධව අවධානය යොමු කරන ලදී. ඉන් අනතුරුව 2012 රියෝ සමුළුව 2013 ජනවාරි මස පිහිටුවන ලද අතර එහිදී තිරසර සංවර්ධන ඉලක්කයන් සඳහා එක්සත් ජාතීන්ගේ විවෘත ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කළ අතර එම කණ්ඩායමට රටවල් 70ක සාමාජිකයින් සම්බන්ධ

විය. ඔවුන් විසින් 2014 ජූලි මස තිරසර සංවර්ධනය සම්බන්ධව අවසාන කෙටුම්පත ප්‍රකාශයට පත් කරන ලදී. 2015 අගෝස්තු මස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් තිරසර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය නමින් තිරසර සංවර්ධන අභිමතාර්ථ 17කින් යුත් වැඩසටහනක් ඉදිරිපත් කරන ලදී. මෙම සියලු අභිමතාර්ථ 2000 වර්ෂයේදී හඳුන්වාදෙන ලද සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ වල ඉදිරි පියවරක් වන අතර පැරීසියේ පැවති සමුළුවකදී ලෝකයේ රටවල් 190 ක නියෝජිතයන් රැස් වී 2030 වන විට ලෝකය මිනිසාට වඩා යහපත් ස්ථානයක් කිරීමේ අරමුණින් මෙම ඉලක්ක සපුරා ගත යුතු බවට තවදුරටත් පෙන්වා දෙන ලදී.

ඒ අනුව තිරසර සංවර්ධනය ප්‍රධාන වශයෙන් ආර්ථික, පාරිසරික හා සමාජ සංවර්ධන යන අංශ 03 කින් සමබරතාවය ආරක්ෂා වන ආකාරයට සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි. එමෙන් ම මෙහිදී සෑම පරම්පරාවක් ම තමන් උරුම කරගෙන සිටින ප්‍රාග්ධන සම්භාරයවත් අඩු තරමින් අනාගත පරම්පරාව වෙත හිමිකර දිය යුතු වේ . මෙම සම්පත් වලින් නිෂ්පාදන හැකියා අඩු වීමට ඉඩ නොහැර අඛණ්ඩව පවත්වාගෙන යා යුතු බව අවධාරණය කරයි.

## තිරසර සංවර්ධනය අභිමතාර්ථ

1. කොතැනක හෝ පවතින ඕනෑම ආකාරයක දුගී බව අවසන් කිරීම.

2.කුසගින්න නැති කිරිම ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම හා සෞඛ්‍ය ප්‍රවර්ධනය තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.

3.සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් තහවුරු කිරිම හා සියල්ලන්ටම සෑම වයසකදීම සුභසාධනය ඇති කිරීම.

4.සියල්ලන්ම සඳහා සමානාත්මතාවයෙන් යුතු අධ්‍යාපනයක් ලබා දීම තහවුරු කිරීම සහ සෑම දෙනාම ජීවිතකාලය පුරාම ඉගෙනීම සඳහා දිරි ගැන්වීම.

5. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම තහවුරු කිරිම හා සියලුම ගැහැණු දරුවන් හා කාන්තාවන් සවිබල ගැන්වීම.

6.සෑම විටම ජලය හා සනීපාරක්ෂාව ලබා දීම තහවුරු කිරීම හා තිරසර කළමණාකාරිත්වය.

7.සැමටම ලබා ගත හැකි විශ්වාසනීය තිරසර හා නවීනකාලීන බලශක්තියට ප්‍රවේශය තහවුරු කිරිම.

8. තිරසර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම ආධාර තිරීම හා සැමට පූර්ණ කාලීන ඵලදායි රැකියා හා වැදගත් කර්මාන්ත ආරම්භ කිරීම.

9. ඔරොත්තු දෙන යටිතල පහසුකම් තිරසර කර්මාන්තකරණයක් හා නවයකරණයක් ඇති කිරීම.

10. රටවල් අතර ඇති අසමානතා අවම කිරීම.

11. ආරක්ෂාකාරී සුනම්‍ය හා තිරසර නගර හා මානව ජනාවාස ඇති කිරීම.

12. තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් ඇති කිරීම.

13.දේශගුණ විපර්යාස හා එහි බලපෑම අවම කිරීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම.

14. තිරසර සංවර්ධනයක් උදෙසා සාගර හා මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය හා තිරසර භාවිතය.

15. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම නැවත ඇති කිරීම හා තිරසාර භාවිතයට පෙළඹීම හා වනාන්තර තිරසර ලෙස කළමණාකරණය කිරීම, කාන්තාරීකරණය වැළැක්වීම, භූමි ඛාදනය වැළැක්වීම.

16. තිරසර සංවර්ධනයක් සඳහා වන සියලුම දෙනා අයත් වන සමකාමී සමාජයක් ඇති කිරීමට අනුබල දිය යුතු අතර සැමටම නීතියෙන් සාධාරණත්වය ලබා දීමට සහ සියලුම මට්ටම් වලින් ඵලදායි වගකීමක් සහිත ආයතන ඇති කිරීම.

17. තිරසර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාවය නැවත බල ගැන්වීම හා ක්‍රියාත්මක කිරීම.

## චීනයේ සංවර්ධනය

චීනයේ සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කිරීමේ දී චීන රජය විසින් පස් අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කර ඇත. 9 වන පස් අවුරුදු සැලැස්ම (1996-2000) කාලය තුල දී ඉදිරිපත් කළ ඇති අතර චීනය සඳහා වූ නව උපාය මාර්ගයක් ලෙස තිරසර සංවර්ධන සංකල්පය හඳුනාගත හැකිය. මීට පෙර පැවති සහශ්‍ර සංවර්ධන සංකල්පය 100%ක් සාර්ථක නොවීම හේතුවෙන් ද එම සංවර්ධන ක්‍රියාවලිය තුලදී සමාජ, ආර්ථික, පාරිසරික යන මානයන් සියල්ල පිළිබඳව සැළකිල්ලට නොගැනීම ද හේතුවෙන් විවිධ අයපත් ප්‍රතිඵල වලට මුහුණ දීමට හේතු වීමද තිරසර සංවර්ධන සංකල්පය පිළිබඳව සාකච්ඡා කිරීමට හේතු වී ඇත.

දසවන පස් අවුරුදු සැලැස්ම (2001-2005) තුළ දී තිරසර සංවර්ධනයේ විවිධ අංශවල එක් එක් අදියරයන් තුළදී සපුරාගත යුතු විශේෂිත ඉලක්ක ලැයිස්තුගත කර ඇති අතර ඇතැම් ප්‍රධාන ඉලක්කයන් පාරිසරික ඉදිකිරීම් සහ පාරිසරික ආරක්ෂණ ව්‍යාපෘති සැලසුම් කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. 1992 වර්ෂයේ සිටම චීන රජය 21 වන දින න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන පියවරයන් රැසක් ගෙන තිබේ. 1994 දී චීන රජය විසිඑක්වන සියවසේ

දී චීනයේ ජනගහනය, පරිසරය සංවර්ධනය පිළිබඳ යෝජනා ඇතුළත් 21 වන න්‍යාය පත්‍රය යාවත් කාලීන කර ප්‍රකාශයට පත් කර ඇත.

තිරසර සංවර්ධනය සඳහා 21 වන න්‍යාය පත්‍රය තුළ මූලික නීති පද්ධති රැසක් ඉදිරිපත් කර ඇත. එම නීති අතරින් ජනගහනය හා පවුල් සැලසුම් පිළිබඳ එක් නීතියක්, පාරිසරික ආරක්ෂණය පිළිබඳ නීති හයක්, ස්වාභාවික සම්පත් කළමණාකරණය සම්බන්ධ නීති දහතුනක් සහ ස්වාභාවික ආපදා වැලළැක්වීමේ හා අඩු කිරීමේ නීති තුනක්, නීතිය බලාත්මක කිරීම සඳහා ශක්‍යතා පද්ධතියක් සැපයීම, ජනගහනය, සම්පත්, පරිසරය හා ස්වාභාවික විපත් පිළිබඳ පරිපාලන නීති සියයකට අධික ගණනාවක් එහි අන්තරගත කර ඇත.

චීන රජය විසින් විවිධ පෞද්ගලික ආයතන සම්බන්ධ කර ගනිමින් අන්තර් දෙපාර්තමේන්තු පිහිටුවා සංවර්ධනය බලාත්මක කිරීමට උත්සහ ගෙන ඇත. 2000 වර්ෂයේදී තිරසර සංවර්ධන උපාය මාර්ගයක් සඳහා ජාතික මට්ටමේ පහසුකම් සපයා විවිධ තිරසර සංවර්ධනය සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අතරින්,

(1) ජාතික උසස් තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන

(2) ප්‍රධාන තාක්ෂණික පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන

(3) මූලික පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ ජාතික වැඩසටහන

(4) ස්වාභාවික විද්‍යා පදනම

හඳුනාගත හැකිය.

මෙහිදී ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික, කාර්මික හා බලශක්ති සංවර්ධනය සඳහා පරිසර හිතකාමී තාක්ෂණය සහ ආදර්ශන ව්‍යාපෘති කෙරෙහි ද විශේෂ අවධානය යොමු කර ඇත. පාරිසරික දූෂණය පාලනය හා සංරක්ෂණය හා ස්වාභාවික සම්පත් තිරසාර ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා ද ප්‍රමුඛත්වයක් ලබා දී ඇත. තිරසාර සංවර්ධන අභිමතාර්ථ තුලින් මානව සෞඛ්‍යය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සහ සමාජ ආරක්ෂාවන් පිළිබඳව විශේෂ ලෙස අවධානය යොමු කර ඇත.

චීන රජය විසින් රාජ්‍ය පවුල් සැලසුම් ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වා ගෙන ගිය එක් දරු පවුල් සැලසුම් ප්‍රතිපත්තිය සාර්ථක වී ඇත. 2000 සිට ක්‍රියාත්මක කරන ලද පස් අවරුදු සැලසුම් වලට අනුව තිරසර සංවර්ධනය හේතුවෙන් නාගරික හා ග්‍රාමීය ජනගහණ වල ආදායම ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට මෙන්ම අධ්‍යාපනය හා සෞඛ්‍ය මට්ටම

සැලකිය යුතු ලෙස වැඩි දියුණු කර ඇත. කාන්තාවන් සහ ළමයින් වඩා හොඳ රැකවරණය ඇති අතර වයස්ගත රක්ෂණ සහ වෛද්‍ය ආරක්ෂණ ක්‍රම ක්‍රමයෙන් වැඩිදියුණු වී ඇත.

මෙලෙස සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ වලට අනුව සංවර්ධනය වෙමින් පවතින රටක් බවට පත් වූ චීනයට පාරිසරික ගැටළු රැසකට ද මුහුණ දීමට සිදුව ඇත. මේ හේතුවෙන් චීනය විසින් 2015 දී තිරසර සංවර්ධන අභිමතාර්ථ වෙත අවධානය යොමු කර ඇති අතර වර්තමානය වන විටත් චීන රජය සංවර්ධන වැඩපිළිවල සකස් කර ඇත්තේ තිරසර සංවර්ධන අභිමාතාර්ථ වලට අනුකූලවය.

චීනයේ ප්‍රධාන සංවර්ධන ඉලක්ක 2ක් ඉදිරිපත් කර ඇත. 2015-2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක හා චීනය ගෝලීය සංවර්ධනය සඳහා නිරන්තරයෙන් සහයෝගිතාව ලබා දීම එම ඉලක්කයන් ය.

## කොතැනක හෝ පවතින ඕනෑම ආකාරයක දුගී බව අවසන් කිරීම.

තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේදී චීනය දරිද්‍රතාවය ජයගනිමින් මානව වංශ කතාවේ ඉතිහාසයේ මහා ජයස්ථම්භයක් කරා පැමිණ ඇත. චීනය විසින් දරිද්‍රතාවය අවම කිරීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තීන් හා වැඩසටහන් මෙම ජයග්‍රහණය සඳහා හේතු සාධක වී ඇත. 2015 නොබෙල් ත්‍යාග ලාභී සහ ප්‍රින්ස්ටන් විශ්ව විද්‍යාලයේ ආර්ථික හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ මහාචාර්ය ආර්ගස් ස්ටුවර්ට් ඩිටන් 2019.10.22 දින ජහයි නගරයේ පැවති "21 වැනි සියවස් සමුද්‍ර සේද මාවතේ චීනයේ ජාත්‍යන්තර සන්නිවේදනය පිළිබඳ තුන්වැනි සමුළුවේදී" චීනයේ දරිද්‍රතා අනුපාතය ඉහළ මට්ටමක පැවතීම කැපී පෙනෙන ලක්ෂණයක් බවට ප්‍රකාශයක් කර ඇත.

චීනයේ දරිද්‍රතාවය අවම කිරීමේ ජාත්‍යන්තර සංසදය බීජිංහි දී 2017.03.28 දින පැවැත්විණි. මෙම සංසදයේ තේමාව වූයේ "සහයෝගිතාව හා දරිද්‍රතාව අවම කිරීමට අත්වැල් බැඳ ගැනීම" යන්නයි. මෙම සංසදයේ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළේ චීනයේ අත්දැකීම් වලට අනුව දරිද්‍රතාවයෙන් තොර ලොවක් නිර්මාණය කිරීම පිළිබඳවය. එම වර්ෂයේ මැයි 23 සිට අගෝස්තු 23 දක්වා අයදුම්කරුවන්ට වචන 5000 කට වඩා අඩු අර්ථාන්විත, පැහැදිලි හා සංක්ෂිප්ත තොරතුරු ඉදිරිපත් කරමින් "දරිද්‍රතාවය තුරන් කිරීම පිළිබඳ ලියවිලි" ඉදිරිපත් කිරීමට අවස්තාවක් ලබා දී සමාලෝචන කමිටුවක් විසින් ජයග්‍රහකයින් තෝරා ගත් අතර, එම ලිපි පොදුවේ ප්‍රචලිත කර ඇත. මෙමඟින් තම රටේ පුරවැසියන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීමට රජය විසින් කටයුතු කර ඇත.

එලෙසම නිරිතදිග චීනයේ ගුයිෂෝ ප්‍රාන්තයේ අවසන් දුප්පත් කලාප නවය නිරපේක්ෂ දරිද්‍රතාවය තුරන් කර ඇති බව එම පළාත් රජය විසින් 2020.11.23 වන දින නිවේදනය කර ඇත. මෙයින් අදහස් කරන්නේ චීනයේ ලියාපදිංචි දරිද්‍රතා කලාප 832 ම දරිද්‍රතාවයෙන් මිදී ඇති බවයි. මෙම කලාප නවයේ දිළිඳු ජනතාවගේ සාමාන්‍ය වාර්ෂික ශුද්ධ ආදායම යුවාන් 11,487ක් දක්වා ඉහළ ගොස් ඇති අතර එය මෙම වසරේ නියම කර ඇති යුවාන් 4,000ක ජාතික දරිද්‍රතා රේඛාවට වඩා ඉහළ මට්ටමක පවතින බව චීනයේ දරිද්‍රතාවය තුරන් කිරීමේ හා සංවර්ධන කටයුතු පිළිබඳ පළාත් අධ්‍යක්ෂ ලී ජියාන් මහතා තවදුරත් ප්‍රකාශ කර ඇත. 2020 අවසන් වන විට නිරපේක්ෂ දරිද්‍රතාවය තුරන් කිරීමට චීනය ප්‍රතිඥා දී තිබුණ ද මෙම වර්ෂයේ ඇති වූ කොවිඩ්-19 වසංගත තත්වය එම ඉලක්කය සාර්ථක කර ගැනීමට යම් අභියෝගාත්මක සාධකයක් විය.

වර්තමානයේ චීනයේ දරිද්‍රතාවය ප්‍රධාන වශයෙන් ගම්බද දුගීන් වෙත යොමු වී ඇති අතර 2009 දී ලෝක බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද වාර්තාවකට අනුව, චීනයේ දුප්පත් පුද්ගලයින්ගෙන් 99%ක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන බව පෙන්වා දී ඇත. මෙලෙස අසමානතාවයට චීනයේ භෞතික පිහිටීම ද හේතු වී ඇත. වෙරබඩ ප්‍රදේශවල පවතින කර්මාන්තවල පිහිටීමත් සමඟ එම ප්‍රදේශ වඩාත් දියුණු වී ඇති අතර ගෝබි කාන්තාරය, හිමාල කඳු වැටිය, තක්ලමකාන් කාන්තාරය හේතුවෙන් එම ප්‍රදේශවල දරිද්‍රතාවය වඩාත් ඉහළ මට්ටමක පවතියි.

දශක ගණනාවක ආර්ථික වර්ධනය හේතුවෙන් චීනයේ නාගරික දරිද්‍රතාවය ක්‍රමිකව අවම වී ඇත. ලෝක බැංකුවේ දත්ත වලට අනුව චීනයේ දරිද්‍රතා අනුපාතය 1981 දී 88 % ක් ලෙස පැවතුන අතර 2013 දී 6.5% ක් ද 2016 වන විට එය 4.5% දක්වා පහත වැටී ඇති අතර මිලියන 500 කට වැඩි ජනගහනයක් අන්ත දිළිඳු භාවයෙන් ඉවත් කර ඇත. එය ඇමරිකානු ඩොලර් 1.90 ක් හෝ ඊට අඩු අගයක් ලෙස වාර්තා වේ. 1990-2005 සිට 15 වසර තුළ චීනයේ ඒකපුද්ගල වර්ධනයට 8.7% දක්වා වර්ධනය විය. මේ සඳහා "විවෘත දොර ප්‍රතිපත්ති" ලෙස කෙටියෙන් සඳහන් කරන සමස්ත ප්‍රතිසංස්කරණ වැඩසටහන බොහෝ විට හේතු වී ඇත.

ලෝකය පිළිබඳව පර්යේෂණ සිදු කරන ගැලප් විසින් ස්වාධීන අධ්‍යයනයකින් පෙන්වා දෙන්නේ දිනකට ඩොලර් 1.90 ක ආන්තික දරිද්‍රතා රේඛාව භාවිතා කරමින් 1990 සිට ගෝලීය දරිද්‍රතා අනුපාතය සැලකිය යුතු ලෙස පහත වැටී ඇති අතර එය ගෝලීය ජනගහනයෙන් සියයට 36.2 ක් (බිලියන 1.9 ක්) වූ අතර 2018 දී එය සියයට 8.7 ක් (දළ වශයෙන් මිලියන 668.7 ක්) බවයි. මෙම අඩුවීමෙන් සියයට 60 කට වඩා වැඩි ප්‍රමාණයකට චීනය ක්‍රියාකාරී

ලෙස දායක වී ඇත. චීනයේ දශක ගණනාවක වේගවත් ආර්ථික වර්ධනය මිලියන 748.5 ක ජනතාව අන්ත දරිද්‍රතාවයෙන් මුදවා ගැනීමට උපකාරී වූ අතර රටේ දරිද්‍රතා අනුපාතය සියයට 66.3 සිට සියයට 0.3 දක්වා පහත වැටුණි.

ලෝකයේ වඩාත්ම ජනාකීර්ණ රටවල් 15 අතරින් චීනය දරිද්‍රතා අනුපාතයේ විශාලතම ජයග්‍රහණය ලබාගෙන ඇත. කෙසේ වෙතත්, ගෝලීය දරිද්‍රතාවය පිටුදැකීම සඳහා චීනයේ දැවැන්ත දායකත්වය ලෝකයේ සෙසු රටවල් වලට නිදර්ශනයකි.




**ප්‍රස්ථාර අංක 01: චීනයේ දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින ග්‍රාමීය ජනතාව**

මූලාශ්‍රය: https://www.statista.com/statistics/866620

දරිද්‍රතාවය තුරන් කිරීමේ චීනයේ සාර්ථකත්වය බොහෝ දුරට දශක ගණනාවක වේගවත් ආර්ථික වර්ධනයේ ප්‍රතිඵලයකි. පසුගිය දශක දෙක තුළ පමණක් චීනයේ දළ ජාතික ආදායම (GNI) 2000 දී ඩොලර් 940 සිට 2019 දී ඩොලර් 10,410 දක්වා දස ගුණයකින් වැඩි විය. දරිද්‍රතාවය අවම කිරීමේ ඉලක්කය කරා ළඟා වන පළමු සංවර්ධනය වෙමින් පවතින රට චීනයයි.

එනිසා වාර්ගික සුළුතරයන්ගේ අසමාන ප්‍රතිඵල කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින්, දුප්පත් ප්‍රදේශ සහ දුප්පත් නිවෙස් සඳහා නාගරික සංක්‍රමණ, අධ්‍යාපන, සෞඛ්‍ය හා ප්‍රවාහන

පහසුකම් සැපයීම සඳහා චීන රජය විසින් සිය ප්‍රතිපත්ති මෑත වසරවලදී ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව, ආර්ථික විෂමතා අඩු කිරීම සඳහා දේශීය පරිභෝජනයට සහ රාජ්‍ය සේවා කෙරෙහි ආයෝජන හා අපනයනවලින් ආර්ථිකය ප්‍රතිස්ථාපනය කිරීමට උත්සාහ දරනු ලබයි. ග්‍රාමීය දරිද්‍රතාවය මැඩපැවැත්වීම සඳහා වන පරිපූර්ණ සැලසුමේ කොටසක් ලෙස වඩා සංවර්ධිත නාගරික ප්‍රදේශවලට දරිද්‍රතාවයෙන් පීඩා විඳින දුප්පත් ජනතාව නැවත ස්ථානගත කිරීම ද ක්‍රියාත්මක වේ.

චීනය විසින් ඉදිරිපත් කර ඇති 2015-2030 තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමේ වාර්තාවට අනුව දරිද්‍රතාවය අවම කිරීම සඳහා විවිධ සංවර්ධන වැඩසටහන් ඉදිරිපත් කර ඇත. චීනයේ දවසේ ආදායම ඩොලර් 1.25 කට වඩා අඩු ජනතාව දරිද්‍රතා රේඛාවෙන් පහල සිටින පිරිස ලෙස සලකනු ලැබේ. මෙලෙස දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වන පිරිසෙන් මිලියන 50 රේඛාවෙන් ඉහළට ඔසවා තැබීමට චීනය 2022 වන විට උත්සහ ගන්නා බව සඳහන් කරයි. එමෙන් ම දිළිඳුකමින් පෙනෙන කාන්තා, පිරිමි, කුමන වයසක හෝ දරුවන් 50% කින් අඩු කිරීම ද ඉලක්කයන් වේ. එමෙන්ම චීනය ජාතික වශයෙන් සුදුසු ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම හා දුප්පත්කම හා අවධානමට තිරසර ආවරණයක් ලබාදීමට ද ප්‍රතිපත්තීන් තුළ කටයුතු කර ඇත. එපමණක් නොව 2030 වන විට දිළිඳුභාවයේ අවදානමට මුහුණ දී ඇති සියළුම පිරිමි හා කාන්තාවන් වෙත ආර්ථික සම්පත් වලට අයිතිවාසිකම් ලබාදීමට ද චීන රජය කටයුතු සම්පාදනය කර ඇත. තවද දේශගුණික ආන්තික සිදුවීම් නිසා හා සමාජ, ආර්ථික සාධක ,පාරිසරික තත්ත්ව හා ව්‍යසන හේතුවෙන් අවදානමට ලක් වූ දුප්පත් පිරිස් වල පවතින දුර්වලතා හා තත්ත්වයන් අවම කිරීමටත් චීන රජය කටයුතු කරමින් පවතියි. ඒ අනුව මේ සියලු අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා රජය විසින් මේ වන විටත් ආර්ථික සංවර්ධනය, සමාජ අයිතිවාසිකම් වලට හා කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට නීති රීති රෙගුලාසි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම 2022 දී කාන්තාවන්ගේ ආර්ථික ඵලදායි ප්‍රවේශයක් සහතික කිරීම් සහ ග්‍රාමීය නිවාස ඉඩම් අයිතිය බෙදාහැරීමේ ක්‍රමවේද ද සැලසුම් කර ඇත. තවද ඵලදායි ණය ඉල්ලුම් සහිත සුදුසුකම් ලත් දිළිඳු පවුල් වලට ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාදීම හා ඛනිජ සම්පත් සංවර්ධනය කිරීමට කටයුතු ද සංවිධානය කර ඇත.

## කුසගින්න අවම කිරීම

චීනයේ මිලියන 150.8 ක් පමණ ජනයා මන්දපෝෂණයෙන් පෙළෙති. චීනයේ ජනගහනයේ විශාලත්වය අනුව, දරුවන්ගේ 9.4% ක් පෝෂණ ඌනතාවයෙන් ද , 19.4%ක් නිරක්තියෙන්ද

සහ 25% ක් අධි බර තත්වයෙන් ද පෙලෙයි. සමස්තයක් ලෙසින් ග්‍රාමීය කුඩා පරිමාණ ගොවීන් මිලියන 200 කට වඩා වැඩි ප්‍රමාණයක් පමණක් ජාතික වශයෙන් පරිභෝජනය සඳහා ආහාර නිෂ්පාදනය කරයි. මේ හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාව ආහාර හිඟකම හේතුවෙන් මන්දපෝෂණ තත්වයෙන් පෙලෙයි.

**ප්‍රස්ථාර අංක 02 : චීනයේ සාගින්න දර්ශකය 2019.**




*මූලාශ්‍රය : https://www.globalhungerindex.org*

චීනය ලෝකයේ වැඩිම ආපදා සහිත රටවල් අතරින් එකකි. නියඟය හා ගංවතුර බලපෑම් වලට වසරකට මිලියන 186 කට අධික ජනතාවකට නිරාවරණය වී ඇති අතර, වසරකට ටොන් මිලියන 20 ක් පමණ රටේ ධාන්‍ය ශක්‍යතාව වසරකට අඩු කිරීමට ඇස්තමේන්තු කර ඇත. මෙවැනි ආපදා තත්වයන් හේතුවෙන් කෘෂි බිම් විනාශ වීම, අස්වැන්න අඩු වීම ආදිය ද සිදු වේ. මේ තත්වය හේතුවෙන් චීනයේ කුසගින්න වැඩි වී ඇත.

චීනය කුසගින්න අවම කිරීම සඳහා උපායමාර්ගික සැලැස්මක් දියත් කර ඇති බව චීනයේ කෘෂිකර්ම අමාත්‍යාංශය හා එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන (WFP) නිවේදනය කර ඇත. 2016 සිට 2020 දක්වා පස් අවුරුදු සැලැස්ම තුල කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාවය, පෝෂණය ඉහළ නැංවීම සහ තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම යන ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට උත්සහ ගන්නා බව චීනය ප්‍රකාශ කරයි. මෙම ඉලක්ක සාක්ෂාත් කර ගන්නා ආකාරය පිළිබඳව 2015-2030 තිරසර සංවර්ධන ප්‍රතිපත්තිය තුල සඳහන් කර ඇත්තේ පහත ලෙසිනි.

2030 වන විට කුඩා දරුවන් ඇතුළු දිළිඳු පුද්ගලයින්ට පෝෂණය ආරක්ෂාව, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාදීම හා දිළිඳුකම පිටු පිටුදැකීම මෙහි ඉලක්ක වේ. තවද ඉඩම් හා අනිකුත් ඵලදායී සම්පත් හා අමුද්‍රව්‍ය දැනුම මූල්‍ය සේවාවන් වෙළෙඳපොළ වටිනාකම් එකතු කිරීම හා කෘෂිකාර්මික නොවන අංශවල සේවාවන් සඳහා ආරක්ෂිත හා සමාන ප්‍රවේශවීමේ හැකියාවන් ලබාදීම මෙන්ම සුළු පරිමාණ ආහාර නිපදවන්නන්ගේ ස්වදේශීය වගාකරුවන්ගේ ගැමියන්ගේ හා ධීවරයින්ගේ ආදායම හා කෘෂි ඵලදායිතාවය 2030 වන විට දෙගුණයකින් වැඩි කිරීම මෙහි ඉලක්ක වේ. ඒ අනුව චීනය 2030 වන විට කුසගින්න නිවා දැමීමටත් විශේෂයෙන්ම දුප්පත් ළදරුවන්ට හා අසරණ පුද්ගලයින්ට සුරක්ෂිත පෝෂදායි ප්‍රමාණවත් ආහාර ප්‍රවේශතාවය අරමුණු කර ඇත. 2020 වන විට 600 kg පමණ ජාතික ධාන්‍ය සුරක්ෂිත කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාවට නංවයි. අවුරුදු 5ට අඩු දරුවන්ගේ පෝෂණය වැඩි දියුණු කිරීමට පෝෂණ පිළිබඳ වැඩසටහන් හා පෝෂණය පිළිබඳ ප්‍රචාරණය කිරීම හා අධ්‍යාපනය ලබාදීම හා යොවුන්වියේ ගැහැනු දරුවන් හා වැඩිහිටි ගර්භනී කාන්තාවන්ට පෝෂ්‍යදායි මාර්ගෝපදේශ ලබාදීම ද ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම 2030 වනවිට තිරසර ආහාර නිෂ්පාදන පද්ධතියක් සහතික කිරීම හා දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම කාලගුණය නියඟ තත්වයන් ගංවතුර ආදී ව්‍යසන වලට අනුගත කිරීම සඳහා මෙන්ම නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට ප්‍රශස්ත කෘෂිකර්ම පිළිවෙත් අනුගමනය කිරීමට සැලසුම් ක්‍රියාවට නංවයි. එමෙන්ම අඩු බර සහිත දරු උපත් පහත දැමීම කෙරෙහිද චීනය තුළ ක්‍රියාත්මක කරන පෝෂණ වැඩසටහන් ඉතා යහපත් වේ. මන්දපෝෂණය පිටුදැකීම ද චීනයේ තිරසර සංවර්ධන අභිමතාර්ථ වල තවත් එක් උප අරමුණකි.

## පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

චීනයේ මැග්නීටා නගරයේ ඇති ප්‍රධාන ගංගා ජලයෙන් 85%ක් 2015 වන විට කිසිදු කාර්යයක් සඳහා නුසුදුසු බව සොයා ගෙන ඇත. බීජිං නගරයේ ජලයෙන් 39.9% ක්ම දූෂිත ජලය වන අතර උතුරු චීනයේ ප්‍රධාන වරාය නගරය සහ මිලියන 15ක් ජනයා ජීවත්වන ටියාජින් නගරයේ පානීය ජලයෙන් 4.9%ක්ම පානීය ජල මූලාශ ලෙස භාවිතා කිරීමට නොහැකි වී ඇත. මේ සඳහා එක් හේතුවක් වන්නේ දූෂණයට ලක්වන ජලයේ රොන්මඩ ඉවත් කිරීමට ප්‍රාදේශීය ආණ්ඩු බොහෝ විට අසමත් වී තිබීමය. යුනාන් පළාතේ ලූලියැන්ග් රසායනික කර්මාන්තය, පානීය ජල මූලාශ්‍රයක් ලෙස භාවිතා කරන ගංගාවක් අසල ටොන් 5,000ක අපද්‍රවය ප්‍රමාණයක් බැහැර කරන බවට 2011දී වාර්තා විය. දේශීය වැසියන් පවසන පරිදි අපද්‍රව්‍ය ටොන් 140,000 කට වැඩි ප්‍රමාණයක් දැනටමත් වසර 22කට වැඩි කාලයක්

තිස්සේ එහි එකතු වී ඇත. 2015 දී චීනය පුරා ඝන මීටර් 3.78 ක ජලය අපවිත්‍ර වූ අතර බීජිං හි පමණක් ඝන මීටර් 1.98 ක ප්‍රමාණයක් එහි අන්තර්ගත වේ. කෘෂිකාර්මික, කාර්මික සහ අලංකාර අරමුණු සඳහා ද ගංගා හා විල් භාවිතා කිරීම නුසුදුසු තත්වයක පවතියි.

පරිසර දූෂණයට එරෙහිව චීනයේ පරිසර අමාත්‍යාංශය සාර්ථක විසඳුම් ක්‍රියාත්මක කර නැති අතර පළාත් 31ක ජල තත්ත්වයන් සාම්පල 145ක් විශ්ලේෂණය කිරීමෙන් අනාවරණය කර ඇත්තේ 2011-2015 කාල පරිච්ඡේදය සඳහා රටෙන් අඩකට ආසන්න සංඛ්‍යාවක් අහිමි වී ඇති බවයි. පළාත් තුනක ෂැංසි, සිචුවාන් සහ ඇතුළත මොන්ගෝලියාවේ ජල මට්ටම වඩාත් නරක අතට පත් වී ඇත. "මිනිස් ස්පර්ශය සඳහා සුදුසු" ප්‍රමාණයේ මතුපිට ජලය එම පළාත් තුනේ 1.4%, 6.3% හා 13.6% කින් පහත වැටී ඇත.

**ප්‍රස්ථාර අංක 03 : චීනයේ ජල අවධානම 2011-2015.**




*මූලාශ්‍රය :* [https://www.chiiwaterrisk.org/resources](https://www.chiiwaterrisk.org/resources)

2017 ජල තත්ත්ව ශ්‍රේණිගත කිරීම් කර පිරිසිදු ජලය සහිත හා දූෂිත ජලය සහිත නගර 10 චීනයේ පරිසර අමාත්‍යාංශය නිවේදනය කළ යුතු අතර සියලුම නගරවල දත්ත ප්‍රසිද්ධ කළහ. එමෙන්ම පලාත් මට්ටමේ ආණ්ඩුවලට ඉතා ප්‍රශස්ත මට්ටමේ ඉලක්කයන් ළඟා කර ගැනීමට පහසුකම් ලබා දුන් අතර එම ආණ්ඩු වලින් 100%ක් තම ඉලක්ක සපුරා ගත යුතු අතර ඔවුන් එසේ නොකරන්නේ නම්, එය නිලධාරීන් සඳහා කළු සලකුණක් ප්‍රකාශ කර ඇත. වැඩි දියුණු කළ පරීක්ෂණ කාර්ය මණ්ඩලය හා දියුණු තාක්ෂණයන් ඇතුළු ජල දූෂණය

නිරීක්ෂණය කිරීම සඳහා ප්‍රාදේශීය සභාවලට වැඩි සම්පත් ප්‍රමාණයක් ලබා දීම ද රජය විසින් සිදු කර ඇත.

චීනයේ කාර්මික අපද්‍රව්‍ය වලින් හා ගෘහස්ථ අපද්‍රවය වලින් 90%කට වඩා වැඩි සංඛ්‍යාවක් කිසිදු ප්‍රමිතියකින් තොරව ගංගා හා විල් වලට මුදාහරියි. චීනයේ නගර වලින් සියයට 80ක් පමණ අපද්‍රවය බැහැර කිරීමේ පහසුකමක් නොමැත. චීනයේ ජනගහනයෙන් අඩකට පමණ පිරිසිදු පානීය ජල හිඟයක් ඇති බව ලෝක බැංකුව අනතුරු හඟවයි. යේල් විශ්ව විද්‍යාලයේ 2012 පාරිසරික කාර්ය සාධන දර්ශකයේ දී චීනය රටවල් 132ක් අතුරින් 116 වැනි ස්ථානයේ පසු වන්නේ ජල දූෂණය අතුරින් දරුණු ලෙස ක්‍රියාකාරී රටක් වන නිසාවෙනි. "රටේ ගංගා වලින් 40% ක් බරපතල ලෙස දූෂිත බවට 2012 දී චීන ජල සම්පත් පිළිබඳ ප්‍රධානීන් ප්‍රකාශ කර ඇත. 2012 ගිම්හානයේ සිට නිල වාර්තාවක් මගින් අනාවරණය කර ඇති පරිදි චීනයේ මිලියන 200ක ජනතාවකට පිරිසිදු පානීය ජලය සඳහා ප්‍රවේශයක් නැත. අද්‍යතන රජයේ අධ්‍යයනයකින් හෙළි වූයේ චීනයේ නගරවලින් 90% ක් භූගත ජලය අපවිත්‍ර වී ඇති බවයි. 2010 පෙබරවාරි මාසයේ දී චීනයේ පරිසර ආරක්ෂණ ආයතනය විසින් කරන ලද අධ්‍යනයනයකට අනුව සොයාගෙන ඇත්තේ කෘෂිකාර්මික අපද්‍රව්‍ය පිළිබඳ නොසලකා හැරීම හේතු කොට ගෙන ප්‍රධාන වශයෙන් ජලය දූෂණය වීමේ මට්ටම දෙගුණ වී ඇත. චීනයේ මිනිසුන් විසින් ආසනික්, ෆ්ලෝරීන් සහ සල්ෆේට් වැනි අන්තරායක ද්‍රවය ජලයට බැහැර කිරීම හේතුවෙන් අධික ලෙස අක්මාව ආශ්‍රිත රෝග, ආමාශ රෝග හා පිළිකා වැනි තත්වයන්ට ජනතාව මුහුණ දෙමින් සිටියි. මෙම ගැටළු හේතුවෙන් බහුල ලෙස පීඩාවට පත්ව සිටින්නේ දකුණු චීනයට වඩා උතුරු චීනය තුළ ජීවත්වන ජනතාවයි.

2014 වර්ෂයේ දී අගමැති ලී කැකියාන් ජල දූෂණය සඳහා ඩොලර් බිලියන 330ක් වෙන් කර ඇත. පානීය ජල ප්‍රමිතිය වර්ධනයට , ජල පවිත්‍රකරණය හා දූෂණය පාලනය කිරීම සඳහා ජලය 30% සිට 50% දක්වා අඩු කර ගැනීම සඳහා අවධානය යොමු කර ඇත. 2015-2020 සහ 2030 යන කාල වලදී උපරිම වශයෙන් ජල පරිහරණ, ජල පරිහරණ කාර්යක්ෂමතාව සහ දූෂණය පාලනය කිරීම සඳහා ඉලක්ක කර ඇත. 2015 අප්‍රේල් මාසයේ දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ජල දූෂණය වැළැක්වීමේ හා පාලන ක්‍රියාකාරී සැලැස්ම අනුගමනය කරන ලදී. මෙම සැලැස්ම බොහෝ අමාත්‍යංශ වලින් උපදෙස් ලබා ගෙන ඉදිරිපත් කර ඇති අතර "රතු රේඛා තුන" වැනි පූර්ව නිවේදනද එහි ඇතුළත් කර ඇත. දැඩි සැලසුම් ක්‍රියාත්මක කිරීම, ජල අධීක්ෂණ ප්‍රයත්න වැඩි කිරීම, පාරිසරික නීති ක්‍රියාත්මක කිරීම, දූෂකයන්ට දඬුවම් කිරීම හා දැඩි වශයෙන් දූෂණයට ලක්වන කර්මාන්ත ඉලක්ක කර ගැනීම සඳහා මෙම සැලැස්ම

අරමුණු කරයි. නිශ්චිත කාර්ය සාධන දර්ශක නිශ්චිත ඉලක්ක සහ කාලසීමාවන් සමඟ සකස් කර ඇත. උදාහරණයක් ලෙස, 2022 වන විට ප්‍රධාන ජලතල ජලයෙන් 70%ක් සහ ප්‍රධාන නගරවල පානීය ජල මූලාශ්‍ර වලින් 93%ක් පිරිසිදු ජලය බවට පත්වනු ඇත.

2016 දී දහතුන්වන පස් අවුරුදු සැලැස්ම තුල ජල පරිභෝජනය හා ජල තත්ත්වයන් සඳහා විශේෂිත ඉලක්කයන් සපයා ඇත. 2020 වන විට ජල පරිභෝජනය සඳහා 23%කින් පිරිසිදු ජලය සැපයීම, නාගරික අපද්‍රව්‍ය සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම සහ අපජලය පවිත්‍ර කිරීමේ අනුපාතය වැඩි කිරීම සඳහා මෙම සැලැස්ම අරමුණු කර ඇත. තවද රසායනික පොහොර හා කෘමිනාශක භාවිතය අඩු කිරීම මගින් කෘෂිකාර්මික දූෂක වලින් සිදුවන දූෂණය අවම කිරීම ද මෙහි අරමුණකි. මෙම ව්‍යාපෘති මගින් පෙන්නුම් කරන්නේ ජල දූෂණය වැළැක්වීම සම්බන්ධයෙන් චීන රජය බරපතල ලෙස පියවර වර්තමානය වන විට ක්‍රියාත්මක කරන බවයි. එමෙන්ම 2030 වන විට තිරසර ජලය ලබා ලබාගැනීම හා මිරිදිය ජල සැපයුම් හා සියලු අංශවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම තුළින් ජල හිගයට විසඳුම් සෙවීම සඳහා ද ජල හිගයෙන් පීඩා විඳින පිරිස් අවම කර කරගැනීමට ද අපේක්ෂා කරයි. 2030 වනවිට ජලය සමඟ බැඳී ඇති පරිසර පද්ධති වන ගංගා, වැව්, කඳු ,වනාන්තර, තෙත්බිම්, වගුරු ආරක්ෂා කිරීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම ද මෙහි ප්‍රධාන ඉලක්ක අතර පවතී තවද ප්‍රජාව අතර ජල කළමනාකරණය හා සනීපාරක්ෂාව පිළිබඳ දැනුම වැඩි කිරීම ද තිරසර සංවර්ධන අභිමතාර්ථ අරමුණු අතර වේ.

2017 වසරේ මුල් භාගයේදී චීනයේ ජල පිරිසිදු කිරීමේ ව්‍යාපෘති 8000 ක් දියත් කර ඇති අතර ඒ සඳහා ඩොලර් බිලියන 100ක ආයෝජනයක් අවශ්‍යවන බව පරිසර අමාත්‍යංශය සඳහන් කරයි.

ජල දූෂණය වැළැක්වීම සහ වළක්වා ගැනීම සඳහා 2015 ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් ලෙස මෙම ව්‍යාපෘතීන් සැලසුම් කර ඇති අතර පරිසර දූෂණයට ලක් වූ භූගත ජල භූමි භාග 325ක් ආවරණය වන පරිදි පරිසර ආරක්ෂණ අමාත්‍යංශය (MEP) විසින් සැලසුම් සකස් කර ඇත. මෙම ස්ථාන අතරින් 95%ක්ම අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව නැවත සකස් කිරීමට සැලසුම් කර අවසන්ය. කෙසේ වුවද 2017 වර්ෂයේ ජල දූෂන ඉලක්කයන් සපුරා ගැනීමට නොහැකි වූ සමහර ප්‍රදේශ තවමත් කාලසටහන් පසු කරමින් සිටින බව ද එය සඳහන් කරයි.




**රූප සටහන් අංක 3 : චීනයේ ගුඅන්ෂි පළාතේ රොක්ෂියැන් ගඟ**

*මූලාශ්‍රය :* [https://www.theguardian.com](https://www.theguardian.com)

එමෙන්ම අනෙක් තිරසර සංවර්ධන අභිමතාර්ථයන්ගේ අරමුණු ද චීනය තුල ක්‍රියාත්මක වේ. සමස්තයක් ලෙස අධ්‍යනය කළහොත් චීනයේ යටිතල පහසුකම් ප්‍රශස්ත තිරසර මට්ටමකට ගෙන එම සදහා නව වැඩපිළිවෙලක් ලෙස මුහුදු කලාප ආශ්‍රිත නව නගර ඉදි කිරීම හඳුනාගත හැකිය. චීනය විසින් ලෝකය පුරාම මෙලෙස වරාය නගර සඳහා මුදල් ආයෝජනය කරමින් ඔවුන්ගේ තිරසර සංවර්ධන අභිමතාර්ථයන් කරා ලඟා වීම හඳුනාගත හැකිය. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවේ කොලඹ වරාය නගරය හඳුනාගත හැකි අතර මෙමගින් චීනයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට ද දරිද්‍රතාවය අවම කිරීමට ද චීනය උත්සහ ගනියි.

එමෙන්ම චීනය විසින් තිරසර නගර සංකල්පය ද ලෝකයට හඳුනවා දී ඇති අතර උදාහරණ වශයෙන් bamboo town හඳුනාගත හැකිය. එයට අමතරව ශෝන්ග්ෂාන්, ශයෝසින් ආදී නගර තිරසර සංවර්ධනය කරා ගෙන ඒමට රාජ්‍ය විසින් කටයුතු කරයි.

එමෙන්ම දේශගුණික බලපෑම් වැඩි රටක් ලෙස චීනය හඳුනාගත හැකි අතර මේ හේතුවෙන් දරිද්‍රතාවය, කුසගින්න වැනි අනෙක් ගැටළු වලට ද එය හේතු වී ඇත. එම නිසා තිරසර සංවර්ධන සැලසුම් වලට අනුව වාර්ෂික අදායමෙන් ඩොලර් බිලියන 100ක් දේශගුණික විපර්යාස හේතුවෙන් අවතැන් වූ ජනතාවට වෙන් කිරීමට චීන රජය කටයුතු සම්පාදනය කර ඇත.

බලශක්තිය අතින් චීනය අනෙක් රටවල් වලට සාපේක්ෂව පියවරක් ඉදිරියට තබා ඇති බව ප්‍රකාශ කළ හැකිය. මන්ද යත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් චීනය බහුල ලෙස භාවිතයට ගන්නා බැවිනි. 2014 වන විට 19 GW ධාරිතාවයෙන් නිපද විය හැකි න්‍යෂ්ටික බලාගාර 23ක් පැවතියත් නව ප්‍රතිපත්ති හමුවේ 58 GW ධාරිතාවයෙන් යුත් බලාගාර 26ක් ඉදිවෙමින් පවතියි. සියංග්නින්ග්, වැංග්ජියංග් නිදසුන් වේ.

**සාරාංශය**

නව කාර්මික රටක් වශයෙන් චීනය තම සංවර්ධන කටයුතු සිදු කල ද පාරිසරික වශයෙන් චීනයට සිදු වන හානිය පිළිබඳව අවධානය යොමු නොකල බවට මෙම අධ්‍යනයන් තුලින් අපට පැහැදිලි ලෙසම අනාවරණය වේ. නමුත් චීනයේ සංවර්ධන මාවත තිරසර සංවර්ධන අභිමාතාර්ථ ඔස්සේ ගමන් කිරීමට ගත් පියවර ඉතා යෝග්‍ය මෙන්ම කාලෝචිත පියවරකි. දරිද්‍රතාවය අවම වීම් වැනි ඉතා සාර්ථක සංවර්ධන ඉලක්ක සපුරා ගත්ත ද වායු දූෂණය, ජල දූෂණය වැනි අයපත් ප්‍රතිපල රැසකට අද්‍යතනය වන විට චීනය මුහුණ පාමින සිටින්නේ සංවර්ධන මාවතේ පවතින දුරවලතා හේතුවෙනි.

2015-2030 කාලය තුල තිරසර සංවර්ධන අභිමාර්ථ අනුව යමින් චීනය මෙම සියළු පාරිසරික ගැටළු අවම කර ගනිමින් සමාජ, ආර්ථික සංවර්ධනය ලඟා කර ගැනීමට අපේක්ෂා කිරීම ඉතාමත් යෝග්‍ය බව අප හට ප්‍රත්‍යක්ෂය. එසේ නොමැති වුවහොත් චීනයේ ආර්ථික අංශය පමණක් සංවර්ධනය වන අතර පාරිසරික හා සමාජීය වශයෙන් චීනය තව තවත් පහළ තත්වයකට පත් වනු ඇත.

චීනය තවමත් සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස හඳුන්වන්නේ ජාතික වශයෙන් පවතින මෙවැනි තත්වයන් හේතුවෙනි. 2015-2030 කාලය තුල චීනය විසින් යෝජනා කර ඇති වැඩපිළිවෙලවල් 100%ක් සාර්ථක වුවහොත් චීනය සංවර්ධන ක්‍රියාවලියේදී තිරසර සංවර්ධන අභිමතාර්ථ පදනම් කර ගැනීම වඩාත්ම යෝග්‍යබව ප්‍රකාශ කල හැකිය. නමුත් වර්තමානය වන විට චීනයේ පවතින ගැටළු දෙස බැලීමේදී මෙම වැඩපිළිවල භාවිතය යෝග්‍ය වන අතර එහි සාර්ථක අසාර්ථක බව 2030 වන විට අපට තහවුරු කර ගත හැකිය.

## මූලාශ්‍ර


1. Aththa newapaper, (2020), Socialist china eliminates poverty. [online] Retrieved from:
2. www.aththa.lk [accesed on 06th Jan 2021]
3. Bradsher, K., (2009) China outpaces U.S. in cleaner coal-fired plants. [online] Retrieved from:
4. https://www.nytimes.com/2009/05/11/world/asia [accesed on 23rd May 2018]
5. China Power Team, (2020), Is China Eradicating Poverty. [online] Retrieved from:
6. https://chinapower.csis.org/poverty [accesed on 07th Jan 2021]
7. China Daily, (2020), China to Provide necessary support for economic recovery. Retrieved from: https://chinadailyasia.com [accesed on 07th Jan 2021]
8. Green Growth Knowledge Platform, (2012) China's National Plan on Implementation of the 2030 Agenda for Sustainable Development. [online] Retrieved from:
9. https://www.greengrowthknowledge.org/national-documents/china [accesed on 22th May 2018]
10. Ministry of Science and Technology of the People's Republic of China, (2010), S&T Programmes: National High- tech R&D Program. . [online] Retrieved from:
11. https://www.most.gov.cn/eng/programmes1 [accesed on 07th Jan 2021]
12. Ministry of Science and Technology of the People's Republic of China, (2010), S&T Programmes: National Basic Research Program of China. [online] Retrieved from:
13. https://www.most.gov.cn/eng/programmes1 [accesed on 07th Jan 2021]
14. National Research Council, (2010), Sustainable development and S&T projects and policy in China. [online] Retrieved from:
15. https://www.nap.edu/read/12920/chapter [accesed on 23rd May 2018]
16. The Guardian, (2017), In China, te water you drink is as dangerous as the air you breathe. . [online] Retrieved from:
17. https://www.theguarian.com [accesed on 07th Jan 2021]
18. United Nation, Department of Economic and Social Affairs, (2015), World Population Prospects: The 2015 Revision. [online] Retrieved from:
19. https://www.un.org/en/desa [accesed on 07th Jan 2021]

# අල්ලස, දූෂණය හා වංචාව නිසා ආසියාතික රටවලට ගෙවීමට සිදු වී ඇති සංවර්ධන පිරිවැය

වයි.එල්.එම්. ඉසුරු උදාකර යකන්දාවල
සංවර්ධන අධ්‍යයනය ශාස්ත්‍රවේදී ගෞරව ප්‍රථම වසර
භූගෝල විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
22isuru22@gmail.com

## සංක්ෂේපය

අද්‍යතන ශ්‍රී ලාංකික සමාජයේ හා දේශපාලන බල තරඟයේ වඩාත් නිරන්තරයෙන් භාවිත වන වචන වශයෙන් අල්ලස, දූෂණය හා වංචාව යන වචන දැක්විය හැකි ය. නමුත් එම වදන් අතර පාරිභාෂිතමය අනන්‍යතාවයන් වඩාත් න්‍යායාත්මක විග්‍රහ කර ගනිමින් සංවර්ධනයට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය මගින් සංවර්ධනය සඳහා ඒවා මගින් සිදු වන බලපෑම වඩාත් හොඳින් නිරීක්ෂණය කර ගැනීම පහසු කරයි. කලාපයක් වශයෙන් තවමත් සංවර්ධනය වෙමින් පවතින, පශ්චාත් යටත්විජිත ඉතිහාසයකට හිමිකම් කියන ආසියාව තුළ අල්ලස, දූෂණය හා වංචාව ප්‍රබල ව පැතිරී ගොස් ඇත. එය ආසියාවේ සංවර්ධනය ශීඝ්‍රතාවය හා විභවතාව සීමා කිරීමට හේතු වී ඇත. පුළුල් ව සාකච්ඡා කරන විට ආර්ථික, දේශපාලනික, සදාචාරාත්මක, මනෝවිද්‍යාත්මක, මානුෂීය, පාරිසරික, ආරක්ෂක යනාදී මාන රාශියක් ඔස්සේ ආසියානු සංවර්ධනයට මෙම පිරිවැය දැරීමට සිදු වී ඇත. කලාපයක් වශයෙන්, ඉදිරි දශක කිහිපය තුළ ආසියාවට නැඟී සිටීමට අවශ්‍ය නම් ඒ සඳහා දූෂණ, වංචා, අල්ලස් මැඩලීම අනිවාර්ය සංවර්ධන උපක්‍රමයක් ලෙස ආසියාව අභියස පවතී.

## හැඳින්වීම

ආසියාතික රටවල සංවර්ධනය පිළිබඳ සැළකිලිමත් වීමේ දී දූෂණය, වංචාව හා අල්ලස යන වචන පාරිභාෂික වචන වශයෙන් අවධාරණය කරමින් යම් න්‍යායාත්මක හා පරේෂණාත්මක දෘෂ්ටියක් හෙළීමට සිදු වී ඇත. පක් හුන්ග් මෝ (Pak Hung Mo) දක්වන පරිදි දූෂණය 1% කින් ඉහළ යන සෑම මොහොතක ම ආර්ථික වර්ධනය වේගය 72% කින් අඩු කිරීමට සමත් වන බව ප්‍රකාශ කරයි (Mo, 2001). මෙසේ මන්දගාමී ආසියාතික සංවර්ධනය හා දූෂණය අතර සම්බන්ධය ක්‍රමානුකූලව ගොඩනගා ගත හැකි ය. පසුගිය මාස දොළහක කාලයේ දී පමණක් ආසියාවේ පුද්ගලයන් පස් දෙනෙකුගෙන් එක් පුද්ගලයෙක් කිනම් හෝ ආකාරයේ

දූෂණයට හෝ අල්ලසකට පොදු සේවා භාවිතයේ දී සම්බන්ධ වීමෙන් ආසියාවට මෙම ගැටලුව කෙතරම් උග්‍ර වශයෙන් බලපානු ඇති ද යන්න තක්සේරු කිරීම පහසු වේ. (Global Corruption Berometer Report, 2020) වර්ධනය වෙමින් පවතින දූෂණ හා අල්ලස් සමඟ ආසියාවේ දූෂණ විරෝධී ව්‍යාපාර හා අල්ලස හා දූෂණයට එරෙහිව සටන් කිරීම සඳහා නොයෙක් රාජ්‍ය හෝ ඉන් පරිබාහිර ආයතන, සිවිල් සංවිධාන බිහි වී ඇත. වත්මන් වතාවරණය යටතේ දශකයකටත් වැඩි කාලයක් ඇතැම් සංවිධාන හා ආයතන ක්‍රියාත්මක වී ඇතත් ඒවා විසින් කලාපයේ අත් කොට ගෙන ඇති ප්‍රගතිය පිළිබඳ ව යළි හැරී බැලීමට සිදු වී ඇත. කලාපයක් වශයෙන් සංවර්ධන ක්‍රියාවලියේ දී ඉදිරියට යෑමට නම් මෙම තක්සේරුව ඉතා වැදගත් වනු ඇත. මේ ආකාරයේ විශ්ලේෂණයක් සඳහා ප්‍රමුඛ වශයෙන් වංචාව, දූෂණය හා අල්ලස යන සංකල්ප විවෘත ලෙස නිර්වචනය කර ගැනීමේ අවශ්‍යතාව පවතී. ඒ තුළින් සංවර්ධනයට කරන බලපෑම සංවර්ධනය හා දූෂණය, අල්ලස අතර පවතින අන්තර් සම්බන්ධතාව පුළුල් විග්‍රහයකට ලක් කිරීම මගින් පෙනී යන්නෙ මේ සාධකවල පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාවයයි.

යටත් විජිත ඉතිහාසයකට උරුමකම් කියන ආසියානු රටවල් තවමත් සංවර්ධන වෙමින් පවතින කලාපයක් වශයෙන් ප්‍රකට ව පවතී. සංවර්ධනය වෙමින් පවතින කලාපයක් ලෙස එහි පවතින සුවිශේෂී ආර්ථික, දේශපාලන හා සමාජ තත්ත්වය මෙන්ම තවදුරටත් ආසියාවේ සුවිශේෂී සංස්කෘතික සාධක මගින් දූෂණය යන සාධකය ක්‍රියාත්මක වන ආකාරය ද සුවිශේෂී චලිතයන්ගෙන් යුක්ත වේ. මේ සුවිශේෂී සන්දර්භය විමර්ශනය කරමින් තුන් වන ලෝකයේ පොදු ඌන සංවර්ධිත ආර්ථික කොන්දේසි යටතේ තවදුරටත් පල් කිරීම සඳහා හේතු වන වංචාව, දූෂණය හ අල්ලස පිළිබඳ විවේචනාත්මක අක්ෂයකින් සාකච්ඡා කළ යුතු ය. එමගින් කලාපය තුළ පවතින නිධන්ගත සංවර්ධන ගැටලු බවට පත් ව ඇති ආර්ථික අකාර්යක්ෂමතා, රාජ්‍ය අකාර්යක්ෂමතාව, ආර්ථික අසමානතාවය, දරිද්‍රතාවය වැනි දෑ සඳහා තිරසර දීර්ඝකාලීන විසඳුමක් සොයා ගැනීමට ඉඩකඩ විවර වනු ඇත.

## අල්ලස, දූෂණය, වංචාව හා සංවර්ධනය

අල්ලස, දූෂණය, වංචාව හා සංවර්ධනය යන බහුවිධ අදහස් ජනනය කරන මාතෘකාව පිළිබඳ ව විධිමත් හැදෑරීමකට පෙර එකිනෙක වචන අතර පවතින පරතර හා ඒ තුළින් ගම්‍යමාන වන නිර්වචනීය පරාසය ගවේෂණය කොට නිදොස් කර ගත යුතු ය. පොදු සමාජයේ ද අල්ලස, දූෂණය, වංචාව, සංවර්ධනය යන වචන පිළිබඳ ව නිවැරදි අර්ථකථනය

කර ගැනීමක් සිදු නො වීම ද අප සාකච්ඡා කරන අර්බුදය පුළුල් වීමට පැහැදිලිව බලපා ඇත.

සංවර්ධන සංකල්පය වඩාත් පුළුල් පරාසයක් තුළ පැතිර පවතින අදහසකි. සැකෙවින් සමාජ, ආර්ථික හා පාරිසරික යන සෑම අංශයක් තුළින් අත් කර ගනු ලබන චිරාත්කාලීන වර්ධනය හා සාමූහිකව අත්පත් කර ගනු ලබන ජීවන තත්වය සංවර්ධනය ලෙස සැළකිය හැකි ය. සංවර්ධනය පිළිබඳ ව මේරියන් - වෙබ්ස්ටර් (Merriam - Webster) ශබ්දකෝෂය පහත ලෙස වර නඟයි.

**"යමක් වර්ධනය වීමට හෝ විශාල වීමට හෝ වඩා දියුණු වීමට හේතු වන ක්‍රියාව හෝ ක්‍රියාවලිය"**

සංවර්ධනය පිළිබඳ සංකල්පය බොහෝ පැති ඇතුළත් වන අතර කාලයත් සමඟ වෙනස් වී ඇත. සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රයේ (A/RES/51/240) පළමු ඡේදයේ මෙසේ සඳහන් වේ. (UN research, 2022)

**"සංවර්ධනය එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ප්‍රමුඛතාවයන්ගෙන් එකකි. සංවර්ධනය යනු සියලු මිනිසුන් සඳහා උසස් ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීම සඳහා බහුමාන වගකීමකි. ආර්ථික සංවර්ධනය, සමාජ සංවර්ධනය සහ පරිසර ආරක්ෂණය තිරසාර සංවර්ධනයේ අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතින සහ අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් කරන සංරචක වේ."**

මේ ආකාරයට ධනාත්මක බහුමානී සමාජ, දේශපාලන, ආර්ථික චලිතයක් පිළිබඳ ව සංවර්ධනය යන සංකල්පයෙන් අදහස් වුව ද දූෂණය, අල්ලස, වංචාව යන වචන හරහා ඊට වියුක්ත අදහස් පද්ධතියක් ගම්‍ය කරයි.

දූෂණය යනු රාජ්‍යක, ආයතනයක හෝ යම් සංස්ථාවක නෛතික කාර්ය පටිපාටියට පරිබාහිරව නීත්‍යානුකූල නොවන මාර්ග හරහා වාසියක් ලබා ගැනීමට උත්සාහ කරන ඕනෑම නීති විරෝධී හෝ නුසුදුසු හැසිරීමක් වශයෙන් හඳුනා ගත හැකි ය (Britannica Encyclopedia, 2022). අල්ලස, බලය අනිසි ලෙස භාවිතා කිරීම, කප්පම් ගැනීම්, වංචාව, රැවටීම, කුමන්ත්‍රණ, ජාවාරම්, මංකොල්ල කෑම් සහ මුදල් විශුද්ධිකරණය ආදී මේ සියල්ල දූෂණයේ විවිධ ආකාර වශයෙන් හඳුනා ගත හැකි ය. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල්

(Transparency International) ආයතනය දක්වන පරිදි මෙය කෙනෙක්ට නෛතිකව භාර වූ බලය පුද්ගලික වාසි සඳහා අනිසි ලෙස භාවිත කිරීමකි.

අල්ලස් යනු කෙනෙකුගේ හැසිරීමට බලපෑම් කිරීම සඳහා නිශ්චිත කාර්ය පටිපාටියට අනුව උපයා නො ගත් ත්‍යාගයක් ලබා දීම හෝ ලබා ගැනීම අදහස් වේ. අල්ලස් දීමේ එක් පොදු ආකාරයක් වන්නේ පක්ෂපාතී සැලකීම ලබා ගැනීම වෙනුවෙන් උපයා නො ගත් නීත්‍යානුකූල ත්‍යාගයක් ලබා දීමයි. මෙහි දී දෙදනා ම අල්ලස සඳහා වැරදිකරුවන් වන අතර දෙදෙනා ම අල්ලස යටතේ දූෂිතයින් බවට පත් වේ. තවදුරටත් අල්ලස යන තාක්ෂණික යෙදුමේ අර්ථය සරල ව පැහැදිලි කර ගැනීමේ දි කේම්බ්‍රිජ් ශබ්දකෝෂයට (Cambridge Dictionary) අනුව, "ඔබ යමෙකුට දෙන මුදල් හෝ තෑග්ගක් මගින් ඔවුන් ඔබ වෙනුවෙන් යමක් සිදු කොට දීමයි. සාමාන්‍යයෙන් වංක යමක්." ලෙස පැහැදිලි කරයි.

මෙහි දී අල්ලස හා දූෂණය පිළිබඳ වෙනස මනා ලෙස අවබෝධ කර ගත යුතු අතර අල්ලස යනු තවත් එක් දූෂණ ක්‍රමවේදයක් වන අතර දූෂණය නමැති මහා සාධකය තුළ පවතින කුඩා සාධකයක් වශයෙන් අල්ලස යන්න හඳුනා ගත හැකි ය. සිංහල වහර තුළ නිරන්තරයෙන් අල්ලස හා දූෂණය එකට භාවිතා කිරීම තුළින් වචන දෙක පිළිබඳ සමානකමක් සමාජගත ව ඇතත් සංකල්පමය වශයෙන් වචන දෙක අතර යම් පරතරයක් පවතී. වංචාව යන වචනය පිළිබඳ අවබෝධය යොමු කිරීමේ දී සොරකම යන අර්ථය ගම්‍ය කොට ගත හැකි අතර සමස්තයක් ලෙස අල්ලස, දූෂණය, වංචා ව යන වචන ත්‍රිත්වය එකිනෙකට සම්බන්ධතාවක් පවතින වෙනස් අර්ථයන් සහිත වචන වේ.

## අල්ලස්, දූෂණ, වංචා නිසා ආසියාතික රටවල සංවර්ධනය දරන පිරිවැය

2020 වර්ෂයේ ආසියාව වෙනුවෙන් ම ආසියාවේ රටවල් 14ක් පාදක කර ගනිමින් ඉදිරිපත් කරන ලද ගෝලීය දූෂණ පීඩනමානය (Global Corruption Berometer - GCB) ආශ්‍රිත වාර්තාව තුළින් ද ආසියාතික උපනතීන් රාශියක් තුළින් කලාපීය සංවර්ධනය කෙරෙහි දූෂණය - අල්ලස සිදු කොට ඇති ඍණාත්මක බලපෑම මෙන් ම දූෂණය පිටු දැකීම තුළින් කලාපීය රාජ්‍යන් ලබා ගෙන ඇති සංවර්ධන ජයග්‍රහණයන් ද විශ්ලේෂණය කළ හැකි වේ. දූෂණයට එරෙහිව සටන් කිරීමෙහි ලා සිංගප්පූරුවේ සාර්ථකත්වය යනු දේශපාලන අධිෂ්ඨානය සහ නායකත්වය විසින් පදනම් වූ නීති, විනිශ්චය, බලාත්මක කිරීම සහ රාජ්‍ය පරිපාලනය යන ප්‍රධාන කුළුණු හතරක් සහිත ඵලදායී දූෂණ පාලන රාමුවක ප්‍රතිඵලයකි. මෙම පාලන රාමුමේ ආරම්භය දූෂණය මුලිනුපුටා දැමීමේ දේශපාලන අධිෂ්ඨානය 1959 දී

මහජන ක්‍රියාකාරී පක්ෂය (PAP) රජයට තේරී පත් වූ විට සිංගප්පූරුවේ ආරම්භක අගමැති ලී ක්වාන් යූ මහතා පත් වීමත් සමඟ සිදු විය. 2020 වර්ෂය වන විට මියන්මාරය දූෂණ සංජානන දර්ශකය (Corruption Perception Index - CPI) තුළ ලකුණු 28 ලබා ගෙන ඇත. 2012 සිට කැපී පෙනෙන ලෙස දර්ශකයේ ඒකක 13ක් වර්ධනය කර ගනිමින් ඉදිරියට පැමිණ ඇත. උස්බෙකිස්තානය 2012 සිට 2021 වර්ෂය දක්වා ලකුණු 17 කින් වර්ධනය කර ගෙන ඇත. CPI හි වඩාත්ම ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරන්නන්ගෙන් කෙනෙක් බවට උස්බෙකිස්ථානය මේ අනුව පත් වේ. 2016 සිට සම්මත කරන ලද ප්‍රතිසංස්කරණ අතර සිවිල් නිදහස, විශේෂයෙන්ම ප්‍රකාශනයේ නිදහස මෙම වර්ධනයට දායක විය. මීට අමතරව පසුගිය 2019 වසරේ සිට දර්ශකයේ ලකුණු 14 කින් ඉහළට පැමිණීමට මාලදිවයින CPI හි ධනාත්මක ප්‍රවණතාවයක් පෙන්නුම් කරමින් පවතී. ඊට සමගාමීව ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයේ සහ මර්දන නීති කිහිපයක් ඉවත් කිරීමේ අත්දැකීම ද මාලදිවයින වසර කිහිපයකට මෙපිට දී ලබා ගන්නා ලදී. ලකුණු 19 ක් සමඟින්, ඇෆ්ගනිස්ථානය CPI හි සැලකිය යුතු දියුණුවක් ඇති අතර, 2012 සිට 2020 වර්ෂය වන විට ලකුණු 11කින් වැඩි වී ඇත. රට සැලකිය යුතු නීතිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ ආරම්භ කර ඇති අතර නව දූෂණ විරෝධී කොමිසමක් පිහිටුවීමේ සැලසුම් 2021 වසරේ දී නිවේදනය කළේ ය. නමුත් අද වන විට ඇෆ්ගනිස්ථානය තලේබාන්වරුන් විසින් අත්පත් කොට ගෙන ඇති අතර 2021 වසරේ ලකුණු තුනකින් පසු බෑමට ලක් වී ඇත. මේ ආකාරයට ආසියානු කලාපය තුළ නව ප්‍රවණතා ගණනාවක් ම අල්ලස, දූෂණය, වංචාව හා සම්බන්ධ ව සිදු වී ඇත. ඒ තුළ ධනාත්මක මෙන් ම සෘණාත්මක සාධක පවතින බැවින් ආසියාව සමස්තයක් ලෙස අල්ලස, දූෂණ, වංචා වේගයෙන් පිටු දකින කලාපයක් වශයෙන් හඳුනා ගත නො හැකි ය.

අල්ලස්, දූෂණ, වංචා තුළින් ආසියානු කලාපය ඔවුන්ට ම ආවේණික ස්වභාවයක් ගනියි. විශේෂයෙන් රාජ්‍ය අංශයේ පවතින පුළුල් බව, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් පැවතීම, නැගී එන ආර්ථිකයන් කිහිපයක් පැවතීම, තුන්වන ලෝකයේ රටවල් ගණනාවක් පැවතීම මෙන් ම කලාපයට පොදු සංස්කෘතික කාරණා ද මේ අතර වේ. මේ නිසා කලාපයක් වශයෙන් ආසියාව විශේෂ වේ. තවද සංවර්ධනය හඹායන කලාපයක් වශයෙන් ද ආසියාව ප්‍රකට වේ. නමුත් ආසියාව තුළ ආවේණික හැඩයෙන් නිදන් ගත ව ඇති දූෂණ වංචා අල්ලස් සංස්කෘතිය එම සංවර්ධන ක්‍රියාවලිය විසින් ලබා ගත් ජයග්‍රහණ ආපසු හැර විය හැකි මට්ටමක පවතී. කලාපයේ වේගවත් සංවර්ධනයට ද බලපෑම් කරන අල්ලස්, දූෂණ හා වංචා

පිළිබඳ විශ්ලේෂණාත්මක ව බැලිය යුත්තේ එබැවිනි. ඒ සඳහා සංවර්ධනයට අල්ලස්, දූෂණ, වංචා විසින් සිදු කරන පරිහානිය මගින් අවබෝධ කර ගැනීමට උත්සහ කරමු.

## 1. ආර්ථික ගැටලු

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව 2016 වර්ෂයේ අල්ලස් මගින් වසරකට ට්‍රිලියන 1.5 - 2 ත් අතර ආර්ථික පරිහානියක් සිදු වේ. ට්‍රිලියනයක් යනු ප්‍රමාණාත්මකව විශාල මුදලක් වන අතර එමගින් ආර්ථිකයට වන හානිය හඳුනා ගත හැකි ය. සමස්තයක් ලෙස ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් 2%ක් මේ නිසා ගෝලීය ආර්ථිකයට අහිමි වන අතර ම ආසියාවට ද මේ හානිය ප්‍රබල වශයෙන් බලපායි. විශේෂයෙන් තුන් වන ලෝකයට අයත් කලාපයක් ලෙස තවමත් හඳුන්වන ආසියාව විදේශයන්ගෙන් ලබන සහනාධාර විශාල ප්‍රමාණයක් වංචාවට ලක් වන කලාපයකි. ඒ නිසා සිදු වන්නේ අනාගත ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය වන ආයෝජන සිදු නො වීම යි. විශාල මූල්‍ය ණය මගින් විශාල යටිතල පහසුකම් ආසියාවේ රටවල අද වන විට ප්‍රචලිත ව පවතින සංවර්ධන උපක්‍රමයකි. අනෙක් අතට, ආර්ථික වර්ධනය ඇති කිරීමට නම් රටක යටිතල පහසුකම් ක්ෂේත්‍රය වර්ධනය විය යුතු ය. නමුත් ඒ සඳහා ආධාර වශයෙන් හා රටේ අයවැයෙන් වෙන්කරන මුදල් වංචාවට ලක් වීම නිසා ආසියාව තවමත් මන්දගාමී සංවර්ධන ගමනක ගමන් කරයි. ආර්ථික කාර්යක්ෂමතාව ආසියාව තුළ එතරම් හොඳින් ක්‍රියාත්මක නො වේ. ඊට මූලික ම හේතුවක් වශයෙන් විශේෂඥයින් දක්වන්නෙ අල්ලස යි. සමීක්ෂණයක් තුළින් හෙළි වී ඇත්තෙ මාස දොළහක කාලයක් තුළ ආසියාවේ පොදු සේවාවන් ප්‍රවේශ වීම සඳහා පුද්ගලයන්ගෙන් හතර දෙනෙකුගෙන් එක් අයෙක් අල්ලස් ලබා දී ඇති බවයි. (UNDP, 2019) පොදු සේවාවන් මගින් සමස්ත ආර්ථිකය කාර්යක්ෂම වීම සිදු කිරීමේ විභවතාවක් පවතින අංශයක් වේ. නමුත් එම අංශය අල්ලසට ගොදුරු වීම නිසා සිදු වන්නේ ආර්ථික අකාර්යක්ෂමතාව ඇති කිරීම හා අත්‍යවශ්‍ය, ආර්ථික වශයෙන් සක්‍රීය පුද්ගලයන් අක්‍රීය කිරීමට හේතු වීමයි. මේ ආකාරයට ආර්ථික තරඟකාරිත්වයට විශාල හානියක් සිදු කිරීමට වංචා දූෂණවලට හැකියාවක් පවතී. තරඟකාරිත්වය අහිමි වීම තුළින් ආර්ථිකයක් අකාර්යක්ෂම තත්ත්වයට පත් වනවා මෙන් ම ආර්ථික වර්ධනයට ද එමගින් දරුණු හානි ඇති කළ හැකි ය.

2018 අගෝස්තු මාසයේ දී ජෙනෝවා හි පාලමක් කඩා වැටී අවම වශයෙන් පුද්ගලයින් 39 දෙනෙකු මිය යෑම පාදක කොට ගෙන සලකා බැලිය හැකි බොහෝ කරුණු තිබේ. මෙහි දී දූෂණය වඩාත්ම පැහැදිලි එකක් නොවූ නමුත්, මාෆියාව පාලනය කරන ඉදිකිරීම් සමාගමක් ගොඩනැගිලි ක්‍රියාවලියේ දී, දුර්වල සිමෙන්ති, භාවිතා කර ඇති බව පෙනී යන බව පසුව

කරන ලද පරීක්ෂණවලින් සොයා ගෙන ඇත. 2017 සැප්තැම්බර් මාසයේ මෙක්සිකෝ නගරයේ ඇති වූ භූමිකම්පාවේ දී ගොඩනැගිලි 40 කට අධික සංඛ්‍යාවක් කඩා වැටීමට දූෂණය පිටුබලය වූ අවස්ථාවක් වාර්තා වේ. මෙයින් පෙනී යන්නේ ඉඩම් පරිහරණය සහ බලපත්‍ර නීති මග හැර ඇති බව, අල්ලස්, ගජමිතුරුකම් නිසා නගර අවට මූලික වශයෙන් අනාරක්ෂිත ගොඩනැගිලි පැවතීමට තුඩු දෙන බවයි. ඉදිකිරීම් කර්මාන්තය යනු මාෆියාවේ වටිනා ලාභ ප්‍රභවයක් වන අතර මුදල් විශුද්ධිකරණය සඳහා වන නාලිකාවක් බව ප්‍රචලිත කරුණකි. සංවිධානාත්මක දූෂණයෙන් පීඩාවට පත් වූ කර්මාන්ත සහ සමාගම්වල අධීක්ෂණය සහ තරඟකාරිත්වය යන දෙක ම අඩාල වේ. නිශ්චිත ආසියාතික නිදසුනක් වශයෙන්, 1999 තුර්කියේ සිදු වූ ගොඩනැගිල්ලක් කඩා වැටීම දැක් විය හැකි ය. එහි දී භූමිකම්පාවක් සිදු වීම නිසා අනෙක් සියලු ගොඩනැගිලි ස්ථාවර ව තිබිය දී එක් ගොඩනැගිල්ලක් පමණක් සම්පූර්ණයෙන් කඩා වැටී ඇත. එය දූෂණ ඉතිහාසයේ විශේෂයෙන් සටහන් වන්නේ මේ නිසා ය. ආසියාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ මංමාවත් ඉදි කිරීමේ දී ද මෙවැනි දූෂණයන් සිදු වේ. එයින් සිදු වන්නේ තවමත් සංවර්ධනය කළ මාර්ග පද්ධතියක් වෙනුවට දෛනිකව ප්‍රතිසංස්කරණය කළ යුතු මාර්ග පද්ධතියක් ආසියාවට හිමි වීමයි. ආසියාවේ විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති ප්‍රමිතියට ඉදි නො කිරීමෙන් මෙන් ම සත්‍ය ව්‍යාපෘති පිරිවැයට වඩා අගයක් ලේඛන ගත කිරීමෙන් මහා පරිමාණයේ දූෂණ වංචා සිදු වේ. සමස්තයක් වශයෙන් ආසියාව තුළින් එසේ බිඳ වැටෙන්නේ සංවර්ධනයේ හා ආර්ථිකයේ පාදම වන ආර්ථික ආයෝජන ක්ෂේත්‍රයයි.

## 2. දරිද්‍රතාවය හා සමාජ විෂමතාවය

ආසියානු කලාපයේ සංවර්ධිත යුරෝප හා උතුරු ඇමරිකානු කලාපයට වඩා විශාල දරිද්‍රතා මට්ටමක් පවතින කලාපයකි. ලෝක බැංකුවට අනුව, ආසියාවේ මිලියන 320 කට වැඩි ජනතාවක් දරිද්‍රතාවයේ ජීවත් වෙති. එනම් ඩොලර් 1.90 ක අවම දෛනික ආදායමක් ලබා ගැනීමට නො හැකි තත්වයක පවති. එවැනි තත්වයක් පවතිද්දී වුව ද ආසියාව තුළ අල්ලස දූෂණය වර්ධනය වෙයි. තවදුරටත් දරිද්‍ර ජන කොටස් සඳහා ලබා දිය යුතු අරමුදල් දූෂණයට ලක් වෙයි. නිදසුනක් වශයෙන්, සමස්ත ආසියා පැසිෆික් කලාපයේ දූෂණ සංජානන දර්ශක අගය (Corruption Perception Index Value) 45ක් වන විට මිලියන 320ක දරිද්‍රතාවයක් පැවතීම විස්මයජනක නොවේ. දරිද්‍රතාවය සඳහා දූෂණ තුළ පොදු මහජනතාවගේ ධනය අයථා ලෙස මංකොල්ල කෑම මෙන් ම ඒ තුළින් දරුණු සමාජ විෂමතාවයක් ඇති වීම ද සිදු වේ. ප්‍රබල පුද්ගලයින් විසින් සිදු කරන ඉහළ මට්ටමේ දූෂණ වංචා තුළින් ධනය හිමි

පුද්ගලයන්ගේ ධනය තවදුරටත් ඉහළ යන අතර සාමාන්‍ය ජනතාව තමන්ගේ ධනය වංචාවට ලක් කර ගනිමින් තව දුරටත් දරිද්‍රභාවයට පත් වේ. ආසියාව දශක ගණනාවක සිට ආර්ථික වර්ධනයකට මුහුණ දුන්න ද තවමත් දරිද්‍රතාවය හා සමාජ විෂමතාව පවතින්නේ මේ හේතුවෙනි. සමස්තයක් වශයෙන් ආසියානු කලාපයේ ගිනි දර්ශකය 1965 දී 38.5% සිට 2006 වන 42.8% දක්වා ඉහළ නැග ඇත. (United Nations University, 2022) එනම්, විෂමතාවය වර්ධනය වී ඇත. එලෙසම ගිනි සංගුණකයේ සෑම ප්‍රතිශත ලක්ෂයක් සඳහා ම ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතයෙන් ඇමරිකානු ඩොලර් 209ක් පහත වැටී ඇත. මෙයින් පැහැදිලි වන්නේ දූෂණ වංචා අසමානතාව කෙරෙහිත්, අසමානතාවය දරිද්‍රතාවය කෙරෙහිත්, දරිද්‍රතාවය ආර්ථික පසුගාමිත්වය කෙරෙහිත් බලපාමින් සංවර්ධන ක්‍රියාවලිය අඩාල කරන බවයි.




**රූපය 01 : ආසියාතික කලාපය ගිලී ඇති දූෂණ විෂම චක්‍රය**

ඉහත රූපය තුළින් ආසියාතික කලාපය ගිලී ඇති විෂම චක්‍රයේ ස්වභාවය පෙන්නුම් කරයි. එනම් අල්ලස, වංචාව, දූෂණය මූලික සාධකයක් හා ප්‍රභවයක් වශයෙන් ආසියාතික රටවල සංවර්ධනයට අසමානතාවය හා දරිද්‍රතාවය ඇති කරමින් සිදු කරන බලපෑම පෙන්නුම් කරයි. අල්ලස, දූෂණය, වංචාව තුළින් සමාජ විෂමතාව ඇති කරයි. විෂමතාව තිව්‍ර වෙමින් වෙමින් ජනතාවගේ සැළකිය යුතු පිරිසක් දරිද්‍රතාවයට පත් වේ. දරිද්‍රතාවයේ ස්වභාවය අනුව දිළිඳුබවේ විෂම චක්‍රයට නැවත ගොදුරු වීම මගින් ආර්ථික සංවර්ධනය බිඳ වැටෙයි. සමාජයක් ආර්ථික වශයෙන් පසුගාමී වන විට තව තවත් දූෂණ හා වංචා සිදු කිරීමට ප්‍රභූන්

මෙන් ම ජනතාව ද පෙළඹේ. ආයතනික පද්ධතිය කඩා වැටීම මේ සමගාමීව සිදු වේ. මේ ආකාරයට නො නවතින චක්‍රයක් වශයෙන් ආසියාව තුළ දූෂණය, අල්ලස හා වංචාව සංවර්ධන ක්‍රියාවලියට බලපෑම් කරයි.

මීට අමතරව, දූෂණය මගින් දරිද්‍ර ජනතාවට ධනය ප්‍රතිව්‍යාප්ත (Wealth Redistribution) කරමින් විෂමතාවය පිටු දැකීමේ ක්‍රියාවලිය ද මොට කරනු ලබයි. බදු නො ගෙවීම, ආදායම් සැඟවීම, කුඨ ගනුදෙනු සිදු කිරීම, සහනාධාර අරමුදල් වංචා කිරීම තුළින් රටක විෂමතා අවම කිරීම සඳහා ධනය ප්‍රතිව්‍යාප්ත කිරීමට ඇති හැකියාව අවම කරයි. මෙමගින්, දරිද්‍රතාවය හා සමාජ විෂමතාව පහළ යවමින් සංවර්ධන ක්‍රියාවලියේ දී ආසියාව එක තැන පල් කර වීමට සමත් වෙයි.

### 3. රාජ්‍ය හා පුද්ගලික අංශය අක්‍රීය වීම

රාජ්‍ය අංශය ක්‍රියාත්මක වන්නේ ජනතා ධනයෙනි. එනම් ජනතාවගේ බදු මුදලිනි. රාජ්‍ය අංශය කටයුතු කරන්නේ පොදු යහපත උදෙසා මිස ලාභය පමණක් ප්‍රමුඛ කොට ගෙන නොවේ. එබැවින් රාජ්‍ය සතු ජනතාවගේ මුදල් යළිත් වරක් ජනතා සුබසාධනයට යෙදිය යුතු ය. නමුත් රාජ්‍ය අංශයේ පවතින වංචා දූෂණ තුළින් එම ක්‍රියාවලිය නිසි පරිදි සිදු නොවේ. රාජ්‍ය සේවය බිඳ වැටෙයි. ආසියාතික රටවල් ගණනාවක් ම රාජ්‍ය දූෂණය නිසා පීඩා විඳියි. රාජ්‍ය සේවාවක් ලබා ගැනීමේ දී අල්ලසක් ලබා දීමට සිදු වේ. තව තවත් සමාජ කාර්යක්ෂමතාවය අහිමි වෙමින් සංවර්ධනයේ පුරෝගාමියෙකු වන රාජ්‍ය, සංවර්ධනය දුර්වල කරන ආයතනයක් බවට පත් වේ.

ලොව පුරා පළාත් පාලන ක්‍රමයන් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව දූෂණය රාජ්‍ය අංශය තුළ පවතින්නේ සහ ඒ කෙරේ බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව ගණිතමය සමීකරණයක ආකාරයට ආචාර්ය රොබර්ට් ක්ලිට්ගාඩ් (Dr' Robert Klitgaard) විසින් ඉතාමත් සරල පැහැදිලි කිරීමක් කර ඇත. මේ මගින් ආසියාවේ වත්මන් තත්වය විග්‍රහ කර ගැනීම ද පහසු වනු ඇත.

$$C = M + D - A$$

දූෂණය = ඒකාධිකාරය + අභිමතානුසාරී බලය - වගවීම

Corruption = Monopoly + Discretion - Accountability

මෙම සමීකරණයෙන් අදහස් කෙරෙන්නේ ඒකාධිකාරී තත්වයක් පවතින විටෙක රජයේ නිලධාරියෙකුට සිය බලතල ක්‍රියාත්මක කිරීමට අභිමතානුසාරී බලයක් පවතින්නේ නම් සහ එම අවස්ථාවේ දී එම නිලධාරියා කිසිදු වගවීමකට ලක් නො වන්නේ නම් එවිට දූෂණය හට ගන්නා බවයි. කාර්යක්ෂම සහ ඵලදායී රාජ්‍ය අංශයක අභිමතානුසාරී බලය සහ වගවීම අතර ඉතා හොඳ සමබරතාවයක් අවශ්‍ය වේ. රාජ්‍ය සේවය තුළ විනිවිදභාවයකින් යුතු විෂය මූලික සහ වගවීම සංස්ථාපනය කරන රීති පද්ධතියක් හඳුන්වා දී ඒවා අර්ථ නිරූපණය කොට ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය පැහැදිලි ස්ථාවරයක් හා චිරස්ථායී ක්‍රමවේදයක් හඳුන්වා දීම මගින් රාජ්‍ය අංශය දූෂණයෙන් වළක්වා ගත හැකි ය. එවැනි කරුණු රාජ්‍ය නිලධාරීන් ගේ පාර්ශවයෙන් සිදු වන අයථා කටයුතු සඳහා ඇති අවස්ථාවන් අවම කර ඇත. දූෂණ ක්‍රියාවන්හි නියැලෙන ඕනෑම නිලධාරියෙකු නෛතිකව හෝ දේශපාලනිකව වගවීමේ සම්භාවිතාව මෙමගින් ඉහළ දමයි . ආසියාවේ බොහෝ අවස්ථාවන්හි දී නීති සහ රෙගුලාසි ඕනෑ තරම් තිබෙන බව දැකිය හැකි ය. වැදගත් වන්නේ දූෂණය දිගින් දිගට ම සිදු වීම වැළකෙන පරිදි රීති හා රෙගුලාසි අර්ථකථනය කිරීම සහ බලාත්මක කිරීමයි. නමුත් ආසියාව තුළ පත් වෙන බොහෝ පාලක පක්ෂයන් දූෂණය තුළින් ම පැමිණෙන නිසා දූෂණය මැඩලීම සඳහා අවශ්‍ය වන දිගු කාලීන විසඳුම් ගනු නො ලබයි. එබැවින් ආසියානු සන්දර්භය තුළ සිදු වන්නේ වගවීමකින් තොර ඒකාධිපති අභිමතානුසාරී බලය භාවිතා වීම තුළින් දූෂණය වර්ධනය වීමයි.

රාජ්‍යයේ ක්‍රියාවලියට වෙනස් ව පෞද්ගලික අංශය ක්‍රියාත්මක වන්නේ ලාභ අරමුණු කර ගනිමිනි. ඉල්ලුම සැපයුම අනුව මිල තීරණය කර ගනිමින් ක්‍රියාත්මක වෙයි. නමුත් පෞද්ගලික අංශය තමන්ට හිමි පොදු සේවාවන් ලබාගන්නෙ රජයෙනි. රාජ්‍ය අංශය දූෂිත නම් නිතැතින් ම එය පෞද්ගලික අංශයට බලපායි. පෞද්ගලික අංශය අක්‍රීය වීමට මේ නිසා විශාල ඉඩ කඩක් තිබේ. ශ්‍රී ලංකාව වැනි රටක පෞද්ගලික ව්‍යවසායකයෙකු වීම සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමට සිදු වන්නේ මේ නිසා ය. සමස්තයක් වශයෙන් රටේ පවතින ආර්ථික නිදහස මේ මගින් උල්ලංඝනය වේ. පෞද්ගලික අංශය රාජ්‍ය හරහා මෙන් ම පෞද්ගලික අංශය අභ්‍යන්තරයේ පවතින දූෂණ වංචා තුළින් ද අක්‍රියතාවයට පත් වේ. එම නිසා ඉල්ලුම සැපයුම වැනි බලවේග වලට මෙ පිටින් පෞද්ගලික අංශය තුළ මූල්‍ය බලය සඳහා ආධිපත්‍යක් නිර්මාණය වී තිබේ. විශේෂයෙන් ආසියානු කලාපයේ මුදල් මැවීම සිදු කරමින් මූල්‍ය වෙළඳපොළේ කටයුතු කරන ව්‍යාපාරිකයින් මෙවැනි ආධිපත්‍යක් දරමින් එම බලය අයථා ලෙස භාවිතා කරයි.

සමස්තයක් වශයෙන් මේ නිසා ආර්ථිකයේ ප්‍රබල ම අංශ දෙක බවට පත් වී ඇති පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය අඩපණ වීම ආසියාව තුළ දැක ගත හැකි ය. රාජ්‍ය අංශය තුළ රාජ්‍ය ආයතන විශාල වශයෙන් පාඩු ලබන තත්වයට පත් ව ඇත්තෙ මෙහි ප්‍රතිඵලයක් වශයෙනි. පෞද්ගලික අංශයේ නම් තරගාරිත්වය සීමා වෙමින් අයථා මුදල් ගණුදෙනු (කළු සල්ලි) වැනි නොයෙකුත් බරපතල මූල්‍ය අපරාධ දක්වා ගමන් කරන්නේ මෙම පසුබිම තුළ යි. ආසියාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ මෙම අක්‍රීයතාවයට පොදුවේ පාඩු විඳීමට සිදු වන්නේ කලාපයේ සංවර්ධන ක්‍රියාවලියට ය. විවෘත ආර්ථිකයක් පවතින අංශ හතරකින් යුතු ආර්ථිකයක මූලික අංශ දෙකක් වංචාව දූෂණය තුළින් අකර්මණ්‍ය වීම මගින් කලාපයේ සංවර්ධනය ඇනහිටීමට ලක් වීම පුදුම සහගත නො වේ.

### 4. ලිබරල් නොවන ජනප්‍රියවාද ඇති වීම

දූෂණය නිසා සිදු වන ආසියාව තුළ නිරන්තරයෙන් දැකිය හැකි තත්ත්වයක් ලෙස මෙය හඳුනා ගත හැකි ය. ආසියානු දේශපාලනය තුළ පුද්ගල ජනප්‍රියවාද පැවතීම සාමාන්‍ය තත්වයකි. නමුත් න්‍යායාත්මක ව මේ ගොඩනැගෙන ජනප්‍රියවාද තුළින් සිදු වන්නේ දූෂණය වසන් කිරීමේ ක්‍රියා මාර්ගයකි. මේ පිළිබඳ ව ට්‍රාන්පේරන්සි ඉන්ටනැෂනල් (Transparency International) ආයතනය විසින් 2017 වසරේ අදහස් දක්වා ඇත. එනම් පාලකයෙකු ජනප්‍රියවාදයට ගමන් කරන්නෙ බොහෝ විට දූෂණ වංචා වසා ගැනීමට යි. එහි බොහෝ විට සුළු ජාතියක්, ආගමක් හෝ බහිෂ්කරණය කරමින් තමන්ගේ ජනප්‍රියවාදය පවත්වා ගනිමින් දූෂණ වංචා වසා දමයි. මේ පිළිබඳ විශ්ලේෂණයක යෙදෙන ෆින් හෙන්රිච් (Fin Heinrich) විසින් දූෂණ සංජානන දර්ශක (Corruption Perception Index - CPI) අගය හා සමාජ අන්තර්ග්‍රහන දර්ශකය (Social Inclusion Index) අතර සම්බන්ධතාවයක් දක්වයි. ඔහුට අනුව දූෂණ හා වංචා වර්ධනය වීමත් සමඟ සමාජ සම්බන්ධතා ඇතුළත් කර ගැනීම (අන්තර්ග්‍රහනය) හෙවත් Social Inclusion පහළ වැටීමක් සිදු වන බවයි. ඊට හේතු වන්නේ දූෂණ වංචා වසා දැමීම සඳහා පාලකයාගේ සිට බාහිර සතුරෙක් මවමින් තමන් ජනප්‍රියවාදයට යමින් ඒකාධිපතියෙකු බවට පත් වීමයි. 2016 වසර දත්තවලට අනුව OECD රටවල් පාදක කර ගනිමින් මෙම න්‍යාය ෆින් හෙන්රිච් විසින් දක්වයි. එහි දී දූෂණ වංචා සහිත රටවල් මෙක්සිකෝව, තුර්කිය වැනි රටවල් සමාජ ඇතුලත් කර ගැනීමේ දර්ශනයේ

පහළ අගයක් ගන්නා අතර ඩෙන්මාර්කය, නවසීලන්තය වැනි දූෂණය අඩු රටවල් සමාජ ඇතුළත් කිරීමේ දර්ශකයේ ඉහළ අගයක් ලබා ගෙන ඇත. (රූපය 02)

**රූපය 02 : දූෂණ සංජානන දර්ශක අගය හා සමාජ අන්තර්ග්‍රහන දර්ශකය (Social Inclusion Index) අතර සම්බන්ධතාවය (Heinrich, 2017)**

ආසියාව දෙසට මෙම දෘෂ්ටිකෝණයෙන් බලන විට විශාල සම්බන්ධකමක් දැක ගත හැකි ය. ආසියානු කලාපය විශාල වශයෙන් ආගමික අන්තවාදයට, ජාතිවාදයට ගමන් කළ කලාපයකි. එම සමාජ පසමිතුරුතා සඳහා බොහෝ විට දූෂිත පාලකයන්ගේ අනුමැතිය ද ලැබී ඇත. ඊට මූලික හේතුව දූෂණය තුළින් තමන්ගේ බලය පවත්වා ගෙන යාමේ ක්‍රමවේදය එය වන බැවිනි. මේ නිසා දූෂණය විෂම චක්‍රයක් ලෙස පසුගාමී සමාජය ලිබරල් නොවන




ජනප්‍රියවාදයක් තුළට ගමන් කරවයි. එලෙස ම සමාජ දේහය නොයෙක් ආකාරයට බිඳ දමමින් සංවර්ධනය සඳහා අවශ්‍ය කරන මානව ප්‍රාග්ධනය භේද කරයි.

මේ අතර සාකච්ඡා කළ යුතු කාරණයක් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සිදු වන හානියයි. දූෂණය වංචාව ආසියාතික කලාපය තුළ පාලකයින් ප්‍රජාතන්ත්‍ර විරෝධී ආස්ථානයකට පත් කරනු ලබයි. ඊට හේතුව බවට පත් වන්නේ ඔවුන් ජනතා නියෝජිතයින් බවට පත් වන්නේ දූෂණය පවත්වා ගැනීම විනා ජනතා සේවයට නො වීමයි. ඒ අනුව දේශපාලනය යනු දූෂණයට හා වංචාවට ලබා දෙන බලපත්‍රයක් හා සමාන වීම ආසියාවේ දී සිදු වී ඇත. මේ නිසා ජනතාවගේ පරමාධිපත්‍ය බලය හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට දැඩි හානියක් සිදු වී ඇත. එලෙස ම ලිබරල් නිදහස තුළ සංවර්ධන අභිමතාර්ථ හඹා යාම තුළ දී ප්‍රජාතන්ත්‍රවාදී නො වන, ලිබරල් නො වන ඒකාධිපති පාලන තන්ත්‍ර වංචාව හේතුවෙන් ගොඩනැඟීම නිසා ආර්ථික සංවර්ධනයට සිදු වන්නේ විශාල හානියකි. සමාජ විද්‍යාත්මක ආකාරයකින් විශාල බලපෑමක් සමාජයකට කිරීමේ හැකියාවක් දූෂණ වංචාවාන්ට පවතින අතර ආසියාව එහි ප්‍රබල ගොදුරක් බවට පත් වී ඇති බවට ශ්‍රී ලංකාව ඇතුළු ආසියාතික රටවල් ගණනාවකින් ම දැක ගත හැකි ය. මේ නිසා ආසියාතික සංවර්ධනය සංකල්පය යට ගොස් අවශේෂ කරුණු ඉදිරියට පැමිණ සංවර්ධනය අඩාල කරන ලද කලාපයක් බවට පත් වෙයි.

### 5. නීතියේ ආධිපත්‍ය බිඳ වැටීම

ලෝක ආර්ථික නිදහස මනින දර්ශකයට අනුව ආර්ථික නිදහස පැවතීම රටක සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන බවයි. සැබෑ නිදහස යනු ආර්ථික නිදහස බව ඔවුන් තර්ක කරයි. කෙසේ වෙතත්, ඔවුන්ට අනුව ආර්ථික නිදහස මගින් ආර්ථික සංවර්ධනය සඳහා ගමන් කිරීම සඳහා ධනවාදි සමාජයක් තුළ අවකාශය හමු වේ. ලෝක ආර්ථික නිදහස මනින දර්ශකය ප්‍රකාශ කරන පරිදි ආර්ථික නිදහස ආරක්ෂා වීමට නම් නීතියේ ආධිපත්‍ය රටක් තුළ මනාවට ස්ථාපිත වී තිබීම අනිවාර්ය විය යුතු ය. නමුත් ආසියාවේ නීති ක්ෂේත්‍රය සඳහා දූෂණයෙන් හා අල්ලසින් සිදු වී ඇති බලපෑම අතිමහත් ය. ආසියාවේ මෙන් ම නොයෙක් රටවලින් ඒ සඳහා කුප්‍රසිද්ධ සිද්ධි ගණනාවක් වාර්තා වී ඇත. අනික් අතට කෙනෙක් යම් වංචාවකට හෝ දූෂණයකට සම්බන්ධ වන්නේ නෛතිකව එයින් ගැලවීම ද අදහස් කර ගෙන ය. බොහෝ විට මේ නිසා රටවල නීති පද්ධති අල්ලස තුළින් පිරී යයි. එක් දූෂණයක් වැසීම සඳහා නීති ක්ෂේත්‍රයට අල්ලස් ලබා දෙයි. අල්ලස විසින් ආසියාවේ දූෂිතයින් රකිනු ලබයි. මෙහි ගැඹුරු ම ගැටලුවට හිමිකම් කියන්නේ නීතිය පිළිබඳ ව රටේ ජනතාවගේ, ව්‍යාපාරික ප්‍රජාවගේ, සමාජයේ අනෙකුත් කොටස්වල විශ්වාසය කඩ වීමයි. ඒ තුළින් ඉහළ පංතියේ සිට පහළ ම පංතිය දක්වා වංචාව,දූෂණය හා අල්ලස පැතිරී යාම සිදු වේ. යමක් සිදු කර ගැනීමේ පහසු ම මාර්ගය බවට අල්ලස පත් වේ. සමස්ත රාජ්‍ය නීති පද්ධතිය ම අරාජික තත්වයට

පත් වීම හේතුවෙන් රට ද අරාජික තත්වයකට නැඹුරු වන අතර රටේ සංවර්ධනය සඳහා නිශේධනාත්මක ලෙස බලපායි. තවද ආසියාතික රටවල ඒකමිතිය බිඳ වැටීමේ අවධානමක් ද මේ මගින් පැන නැග ඇති අතර සංවර්ධනය අත්පත් කර ගැනීම තව තවත් අසීරු කිරීමට හේතු වේ.

**6. මානව හිමිකම් කඩ වීම**

දූෂිත පාලකයින් සිවිල් නිදහස, බලය තහවුරු කර ගැනීමට බාධාවක් ලෙස සැලකීමට නැඹුරු වන බව නිරීක්ෂණය කිරීම, Cato's Letters නමින් හැඳින්වෙන දූෂණය සහ කුරිරු පාලනය පිළිබඳ දහ අටවන සියවසේ රචනා එකතුව ඇතුළු බොහෝ ඓතිහාසික මූලාශ්‍රවලින් ද සොයා ගැනීමට හැකියාව පවතී. වඩාත් ම මෑතක දී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (Office of the United Nations High Commissioner for Human Rights - OHCHR) දූෂණය සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් අතර සැලකිය යුතු සම්බන්ධතා පවතින බව අනාවරණ කර ඇත. ආසියාව තුළ දූෂණ වාර්තා කරන සහ විරුද්ධ වන්නන් විවිධ ආකාරයේ ඝාතන සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හා අවසානයේ ඝාතනය කිරීමෙන් අවසන් වීම දක්වා ගමන් කරයි. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට විසඳුම් සෙවීමට සහ එම අයිතිවාසිකම් සහතික කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැකසීමට ආසියාතික රාජ්‍යයන්ට හැකියාව දූෂණය විසින් ම අඩු කරයි. සමාජ ආර්ථික අයිතීන් ඇතුළුව, බොහෝ විට රජයන් පැත්තෙන් සංකීර්ණ මුලපිරීම් අවශ්‍ය වුවත් ඒවා සිදු නො වේ. හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය දූෂණය, මානව හිමිකම් භුක්ති විඳීමට ව්‍යුහාත්මක බාධාවක්, ලෙස හඳුන්වන අතර මෙම ක්ෂේත්‍ර දෙක අතර බොහෝ මංසන්ධි විස්තර කර ඇත. ඒ හරහා මානව හිමිකම් පිළිබඳ දර්ශකවල ආසියාතික කලාපය වඩාත් පිරිහුණු තත්වයකට පත් වීමට මෙම දූෂණ වංචා ප්‍රබල හේතුවක් වී ඇති බව වැඩි දුරටත් හෙළිදරව් වේ.

**7. සන්නද්ධ ගැටුම් සහ ම්ලේච්ඡ අපරාධ**

දූෂණය විසින් පුළුල් කරන ලද රාජ්‍ය ධාරිතාව සහ සංවර්ධනය අඩු වීම, අනාරක්ෂිතභාවයට සහ සන්නද්ධ ගැටුම්වලට පවා තුඩු දිය හැකි ය (ලෝක බැංකුව, 2017). ඇත්ත වශයෙන් ම, දූෂණය රටවල් අස්ථාවර කරන සාධකයක් ලෙස හඳුනා ගෙන ඇත. දූෂණය සහ සාහසික අපරාධ (ජන සංහාරය, යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ඇතුළුව) අතර ඇති හේතු සම්බන්ධය ඔප්පු කිරීමට අපහසු විය හැකි වුව ද, සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන්

දූෂණය ගැටුමේ සහ ම්ලේච්ඡත්වයේ මූල හේතුව ලෙස හඳුනා ගෙන ඇත. මේ තත්වය ආසියාතිකයින්ට වටහා ගැනීම සඳහා මනා නිදසුනක් අප්‍රිකානු කලාපය දෙස විමර්ශනය කිරීමෙන් සොයා ගත හැකි ය. උදාහරණයක් ලෙස සියෙරා ලියොන් සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව සහ ලයිබීරියානු සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසමේ ඒකාබද්ධ අවසන් වාර්තාව හා පශ්චාත් අරාබි වසන්ත ටියුනීසියාවේ සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමටත් පෙර ගැටුමේ මූල හේතුව ලෙස දූෂණය හඳුනා ගන්නා ලදී. මේ අනුව, 2013 සිට ටියුනීසියාවේ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ නීතිය සහ නීතිය මගින් නිර්මාණය කරන ලද සත්‍ය සහ ගරුත්ව කොමිසම රටේ පැතිර යන දූෂණය සහ මානව හිමිකම් පිළිබඳ රටට උරුම වූ තත්ත්වය සඳහා වගවීම තහවුරු කරයි. මෙවැනි අප්‍රිකානු කලාපයේ සිදු වූ දූෂණ විරෝධි කැරලි තුළින් සමහර රටවල් තුළ පෙර තිබුණාටත් වැඩි ව්‍යවසනකාරී තත්වයක් උදා වීම හඳුනා ගත හැකි වනු ඇත. මේ නිසා ආසියානු කලාපයේ දූෂණ වංචා නිසා ඇති කරවන ලද ගැටුම් පිළිබඳ ඉතිහාසයක් ඉන්දියාව, පාකිස්තානය වැනි රටවලින් වාර්තා වේ. මේ සඳහා වඩාත් ම සමීප උදාහරණය මෑත කාලීන ලංකාව තුළින් ද හමු වේ. ආරාබි වසන්තය තරම් ප්‍රචණ්ඩකාරී නො වුණ ද ජනතාව විසින් පාලන ආණ්ඩුවට එරෙහිව වීදි බැස විරෝධතා ව්‍යාපාර සංවිධානය කිරීම පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි ය. මේ නිසා ශ්‍රී ලංකාවේ 2022 වර්ෂය පුරාවට දිගින් දිගට රාජ්‍ය නායකින්ට ධූරවලින් ඉවත් වීමට සිදු විය. රටක් අස්ථාවර වීම සම්බන්ධයෙන් මෙම ප්‍රබල නිදර්ශනයකි. එලෙස ම, දූෂණ නිසා සමාජය වියවුල් සහගත බවට පත් වීමට ලබා දිය හැකි ආසියාතික මෑත කාලීන ම උදාහරණය එය යි. මේ නිසා ආසියාව මේ අවධානයෙන් ගලවා ගැනීමට නම් දූෂණ අපරාධවල නිරත වූ ආයතන ප්‍රතිසංස්කරණය කිරීම කළ යුතු ය.

මීට අමතර ව, සංවිධිත අපරාධ සහ ත්‍රස්තවාදය වැනි සමාජයේ අශික්ෂිත මූලද්‍රව්‍ය වර්ධනය වන්නේ ලැබෙන ආදායම විශුද්ධිකරණයට, අරමුදල් වෙස්වලා ගැනීම සහ අධිකරණ නිලධාරීන් සහ දේශපාලනඥයන් අල්ලස් මගින් දූෂිත කිරීම (තෑගි, අනුග්‍රහය සහ වෙනත් ප්‍රතිලාභ ඇතුළුව) හේතුවෙනි. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ වසර තිහක කාලයක් තිස්සේ පැවති යුද්ධය සඳහා හේතු සාධක ද දූෂණය මූලික කොට ගත් මේ හේතු නිසා සිදු වී ඇත. මුල් කාලීන මහ ජාතියේ ජාතිවාදයෙන් විශාල වශයෙන් දෙමළ ජනතාව බැට කෑව ද ඒ සඳහා රාජ්‍ය ස්වාධීන ආයතන වන පොලීසිය, අධිකරණය වැනි ආයතන ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීම උදාසීන වී ඇත. මේ නිසා ශ්‍රී ලංකාවේ සංවර්ධනය වසර තිහකින් පස්සට ඇද දමන දීර්ඝ යුද්ධයක් ඇති විය. ආසියාව තුළ බොහෝ රටවල සිදු වන සුළු ජාතීන්ට එරෙහි පීඩාවන් දූෂණය තුළින් යට කිරීම නිසා මෙවැනි තත්වයන් වාර්තා වේ. ප්‍රචණ්ඩත්වය,

නීති විරෝධී මත්ද්‍රව්‍ය, ගණිකා වෘත්තිය, ලිංගික වහල්භාවය, පැහැර ගැනීම් සහ බිය ගැන්වීම් ඒ අනුව ඉහළ යයි. සංවිධානාත්මක අපරාධ දූෂණයට හේතු වනවා පමණක් නොව, දුර්වල, නොසැලකිලිමත් හෝ අසමත් රාජ්‍යයක් විසින් විවෘත කරන ලද දූෂණයට ඇති අවස්ථා සංවිධානාත්මක අපරාධවලට ද හේතු විය හැක. මේ නිසා ආසියාවේ සංවර්ධනය සියවස් ගණනක් පිටුපසට ඇද දැමීමේ බලයක් දූෂණ, වංචා, අල්ලස් සඳහා පවතී.

### 8. දේශගුණික විපර්යාස සහ ජෛව විවිධත්වයට සිදු වන හානි

දූෂණය දේශගුණික විපර්යාස විරෝධී අරමුදල් සහ මුලපිරීම්, වන සංරක්ෂණය සහ තිරසාර වන කළමනාකරණ වැඩසටහන්, වනජීවී සහ ධීවර අපරාධවලට එරෙහි ව ගන්නා ක්‍රියාමාර්ග දූෂණයට යටපත් වීම නිසා විශාල ජෛව පද්ධතියකට හිමිකම් කියන ආසියාතික ජෛව පරිසරය ශීඝ්‍රයෙන් විනාශ වෙමින් පවතී. දේශගුණික විපර්යාස සහ පරිසරය මත දූෂණයේ මෙම සහ අනෙකුත් අහිතකර බලපෑම් 2011 සිට Transparency International වාර්තාවකින් සහ අතිරේක Transparency International ප්‍රකාශනවල අවධාරණය කර ඇත. පුළුල් මට්ටමින්, නයෝමී ක්ලේන් (Naomi Klein, 2014) විසින් රචිත This Changes Everything යන ග්‍රන්ථය, එක්සත් ජනපදයේ දේශගුණික විපර්යාස ආමන්ත්‍රණය කිරීමේ ව්‍යවස්ථාදායක ප්‍රයත්නයන් මූල්‍යමය අවශ්‍යතා මගින් රාජ්‍ය ග්‍රහණයට ලක් කර ඇති ආකාරය විස්තර කරයි. ඇගේ විශ්ලේෂණය ලොව පුරා බොහෝ රටවලට අදාළ වේ. ෆොසිල ඉන්ධන සහ මෝටර් රථ කර්මාන්තවල බලය මත - තේරී පත් වූ සහ තේරී පත් නොවූ - ලොව පුරා රජයන් Rotten Fish ප්‍රකාශනයේ විස්තරාත්මකව සාකච්ඡා කර ඇති අතර ආසියාව සෘජු ව දූෂණය නිසා පරිසරය පවා දෙන කලාපයක් ලෙස හඳුනා ගැනීම ඒ මගින් පහසු කරයි. ස්වභාවික ප්‍රාග්ධනයෙන් ආඪ්‍ය ආසියාව නෛතික නො වන හා ශක්‍යතා වාර්තාවන්ට පිටින් සිදු කරන පරිසර විනාශයන් නිසා සංවර්ධනය අතින් ආසියාවට හිමි වී ඇති විසල් සම්පතක් අහිමි කර ගනී.

### 9. මහජන කලකිරීම සහ නරුමත්වය

ආසියාතික සමාජය සම්ප්‍රදායික සමාජයකි. ඔවුන් තවමත් සමස්තයක් ලෙස නවීකරණ ක්‍රියාවලියට ලක් ව නැත. ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියට 100%ක් ඔවුන් හැඩ ගැසී නොමැති අතර ම ලිබරල් වෙළඳපොළ ක්‍රමයට ද සමස්ත වශයෙන් හුරු වී නැත. මෙවැනි තත්වයක් තුළ දූෂණය පුළුල් ව පැතිරී ඇති බවත් දූෂිත ක්‍රියාකරුවන්ට වග නො කියන බවත් දැනෙන විට මිනිසුන්ට නායකයින්, සමාජ පද්ධති (රාජ්‍ය ආයතන) සහ සමහර විට සමාජය සහ ආචාර

ධර්ම කෙරෙහි පවා විශ්වාසය නැති වී යයි. දේශපාලන වගකීම් විරහිතභාවය වැඩි වන විට, එවැනි සංජානන දිගු කාලයක් පවතින අතර දේශපාලන සහභාගීත්වය අඩු වේ. මහජන කලකිරීම සහ දූෂණය පුළුල් ලෙස පැතිරී ඇති බවට හැඟීම පුරවැසියන්ට ම දූෂිත ගනුදෙනුවලට සහභාගී වීමට මග පෑදිය හැකි ය. වෙනත් වචන වලින් කිව හොත්, සමාජ සම්මතයන් දූෂිත හැසිරීම් දිරිමත් කළ හැකි ය. මන්ද මිනිසුන් සිතන්නේ "හැමෝ ම එය කරන්නේ නම්, මටත් එය කළ හැකි ය." යනුවෙනි. දූෂණය නො ඉවසීම සඳහා මහජන අපේක්ෂාවන් සපුරාලීමට අපොහොසත් වීම රාජ්‍ය ආයතනවල නීත්‍යානුකූල භාවයට සහ පුරවැසියන් සහ සමාගම් අනුගමනය කිරීමට අපේක්ෂා කරන විධිමත් ප්‍රමිතිවල උපයෝගීතාවයට හානිකර ප්‍රතිවිපාක ඇති කරයි. තව ද, මිනිසාගේ සාමූහිකත්වය පිළිබඳ අදහස මැකී ගොස් පුද්ගල ආත්මාර්ථය ඉහළ පැමිණිය හැකි ය. විශාල ආසියාතික තරුණ ප්‍රජාවක් දේශපාලනය ප්‍රතික්ෂේප කරන්නේ ද මෙහි එක්තරා දිගුවක් ලෙස ය. සියලු දෑ තුළින් ආසියාවට අහිමි වන්නේ අනාගත ශක්තිමත් මානව ප්‍රාග්ධනයක සංවර්ධන ශක්‍යතාවයි.

ඉහත සඳහන් කළ දූෂණයේ ආසියාතික බලපෑම් ආර්ථික, දේශපාලනික, සදාචාරාත්මක, මනෝවිද්‍යාත්මක, මානුෂීය, පාරිසරික, ආරක්ෂක යනාදී වශයෙන් වර්ගීකරණය කළ හැකි ය. එනම් ආසියානු කලාපයේ දූෂණය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වීමට මෙම සියලු අංශවල සංවර්ධනය සඳහා දූෂණය විසින් සිදු කොට ඇති විශාල හානිය අවබෝධ කර ගත යුතු ය. ආසියානු කලාපයට තිරසර සංවර්ධනයක් අරමුණු කර ගනිමින් නව කාර්මික කලාපයක් ලෙස සංවර්ධනය ළඟා කර ගැනීමට මෙවැනි අල්ලස, දූෂණය, වංචාව මගින් උත්සන්න කරන අර්බුද සහිත ව නො හැකි වීම අනිවාර්ය බව කනස්සලු දායක කරුණකි.

## නිගමනය

අසූව දශකයේ සිට ලෝකයේ වේගවත් ම සංවර්ධනයට හිමිකම් කියන්නේ ආසියාවයි. ආසියාවේ මෙම වේගවත් සංවර්ධනය බොහෝ ජාතීන්ට විස්මය දනවන සුළු විය. යටත්විජිතභාවයෙන් මිදීමත් සමඟ දශක කිහිපයක ඉතිහාසය තුළ ආසියාව වේගවත් දීර්ඝ ගමනක් පැමිණ ඇත. යුරෝපයට සාපේක්ෂව හා නව සංවර්ධන දෘෂ්ටිකෝණයට සාපේක්ෂව තව දුර ගමනක් යෑමට ද ආසියාවට සිදු වේ. එබැවින් එක තැනක පැටලී සිටීමට කාලයක් තවදුරටත් ආසියාවට ඉතිරි වී නැත. මේ පිළිබඳ ව මනා වැටහීමකින් යුතු ව අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමයේ (ASEAN) සාධාරණ ව්‍යාපාරික පරිසරයක් ප්‍රවර්ධනය කිරීමේ

ව්‍යාපෘතියේ කළමනාකරු ඩයනා ටෝරස් (Diana Torres) විසින් මෙසේ සඳහන් කර ඇත. (UNDP, 2019)

"අනාගතය ආසියාවයි. නමුත් දූෂණය විසින් එය අතීතයේ ගිල්වා දමා ඇත."

ඇගේ ප්‍රකාශය තුළින් ආසියාතික කලාපයේ වැදගත්කමත් ඒ අතර ම අද වන විට ආසියානු කලාපය විසින් මුහුණු දෙන ප්‍රබල අභියෝගයත් අතිශය ප්‍රබලව දක්වා ඇත. ඉහත වියමන තුළින් ද න්‍යායාත්මකව, සංකල්ප සහිත ව මෙන් ම දත්ත සමගාමීව ආසියාවේ සංවර්ධනය සඳහා දූෂණ, අල්ලස්, වංචා විසින් කර ඇති හානිය සාක්ෂි සහිත ව ප්‍රකාශ වී ඇත. ඉදිරි දශක කිහිපයේ දී ලෝක සංවර්ධන දිශානතිය ආසියාව  හරහා ගොඩනගා  ගැනීමට නම් ආසියාව විසින් ආර්ථික , සමාජ, දේශපාලන, සංස්කෘතික යන සියලු මානයන්ගෙන් විශාල දූෂණ, වංචා, අල්ලස් විරෝධී දැඩි පිළිවෙතක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය  වේ.

## ආශ්‍රිත මූලාශ්‍ර


1. 2020 Corruption Perceptions Index - Explore Indiaâ€ ™s results. (2021, January 28). Transparency.Org. https://www.transparency.org/en/cpi/2020/index/ind
2. Balisacan, R. (2017, October 3). The Link Between Corruption and the Global Surge of Populism. GAB | The Global Anticorruption Blog. https://globalanticorruptionblog.com/2017/10/06/the-link-between-corruption-and-the-global-surge-of-populism/#more-10383
3. Bhargava, V. K., Bolongaita, E. P., World Bank, World Bank Staff, World Bank, International Bank for Reconstruction and Development, World Bank Group, & Staff, W. B. (2004). Challenging Corruption in Asia. World Bank.
4. Cambridge Dictionary. (2022, April 27). bribe definition: 1. to try to make someone do something for you by giving them money, presents, or something else. . .. Learn more. https://dictionary.cambridge.org/dictionary/english/bribe
5. corruption | law. (2022). Encyclopedia Britannica. https://www.britannica.com/topic/corruption-law
6. M., Chassagne, T., M., M., M., M., & M. (2020, August 11). Peace, justice and strong institutions. United Nations Sustainable Development. https://www.un.org/sustainabledevelopment/peace-justice/

7. Mo, P. H. (2001). Corruption and Economic Growth. Journal of Comparative Economics, 29(1), 66–79. https://doi.org/10.1006/jcec.2000.1703
8. R. (2019, November 7). The Future is Asian, but Corruption Keeps it Mired in the Past. UNDP. https://www.asia-pacific.undp.org/content/rbap/en/home/blog/2019/the-future-is-asian-but-corruption.html
9. A snapshot of poverty and inequality in Asia. (2020, June 10). UNU-WIDER. https://www.wider.unu.edu/publication/snapshot-poverty-and-inequality-asia
10. Transparency International. (2020, April 6). Corruption and inequality: how populists mislead people - News. Transparency.Org. https://www.transparency.org/en/news/corruption-and-inequality-how-populists-mislead-people
11. Transparency International. (2021a). The Global Corruption Barometer Asia 2020.
12. Transparency International. (2021b, June 1). How does corruption shape Asia? - News. Transparency.Org. https://www.transparency.org/en/news/how-does-corruption-shape-asia
13. TRANSPARENCY INTERNATIONAL. (2022). CORRUPTION PERCEPTIONS INDEX 2021. TRANSPARENCY INTERNATIONAL.
14. Transparency International. (2022, January 27). CPI 2021 for Asia Pacific: Grand corruption and lack of freedoms holding back progress - News. Transparency.Org. https://www.transparency.org/en/news/cpi-2021-for-asia-pacific-grand-corruption-holding-back-progress
15. United Nations. (2022). Research Guides: UN Documentation: Development: Introduction. United Nations Research. https://research.un.org/en/docs/dev